# රසවාහිනී ගාථාසන්නය.

සාමදාන විනිශ්චයකාර ධුරන්ධර

**ජේ. ආර්. ගුණරත්න**

වාසල මුදලි මන්ත්‍රීශ්වරයාණන් විසින් ආරාධනාකරණලදින්

ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය

## හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන

ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරෝත්තමයාණන් වහන්සේගේ

ශිෂ්‍යවූ

පමිකාවත්තේ අභයසිංහාරාම විහාරාධිපති කළුතර බුද්ධරක්ෂිත

**ශ්‍රී ඥානානන්දාභිධාන**

කොළඹ නවකෝරළේ විනීත සඞ්ඝනායක ස්ථවිරපාදයන්වහන්සේ

සහ

ගල්වාණේ විහාරාධිපති මුල්ලේරියාවේ

**විපුලසාර ස්ථවිරපාදයන්වහන්සේ විසින්**

ලියනලදී.

---

විද්‍යෝදය පරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය

## ශ්‍රී ඥානේශ්වරාභිධාන

**ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරපාදයන්වහන්සේ විසින්**

අන්තිම සිඞ්පත්‍ර බලා පිළිගන්නාලදී.

---


**ඩී. පී. කුරුප්පු, කේ. ඩබ්ලිව්. බස්තියන්**

සහ අප විසින්

ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවනලදී.

---

ශ්‍රී. බු. ව. 2457.

---

ක්‍රි. ව. 1913.

# RASAWAHINI-GATHA-SANNAYA

BY

## K. Sri Sarananda

*Second High Priest of Nine Korales of Colombo,*

*Incumbent of Abayasinharama, Panchikawatte, Colombo,*

AND

## M. Wipulasara Thera

*Incumbent of Galwane Vihara.*

---

APPROVED BY

CHIEF HIGH PRIEST SRI NANISSARA

*Principal of Vidyodaya Oriental College, Colombo.*

---

PUBLISHED BY

**D. P. Kuruppu & K. W. Bastian**

AT

LANKABHINAWA VISRUTA PRESS, COLOMBO.

---

1913.

# සංඥාපනය.

---

පාලිභාෂාව ඉගෙණගන්නා ශිෂ්‍යයන්ට නාමවරනැගිලි ආඛ්‍යාතවරනැගිලි පුහුණුකරවීමෙන් අනතුරුව භාෂාපරිචිතිය පිණිස රසවාහිනිය අර්ථඇස්වීම ලඞ්කාවේ කොයි ආචාර්‍ය්‍ය පරම්පරාවලත් මේ දක්වාම කරණු ලැබේ.

පාලි ව්‍යාකරණ පොත්වල බහුලවිධානවශයෙන් නොදක්වන ලද විශෙෂව්‍යාකරණක්‍රමානුගත පදභෙද වාක්‍යයොජනාදිය හා ලිපිකරප්‍රමාදපාඨද රසවාහිනියේ දක්නුලැබෙන බැවින් එබඳු තන්හි සමහර ආචාර්‍ය්‍යවරු පවා මුළාවෙත්, නවීනවූ ඇතැම්කෙනෙක් තමන්ගේ අවිශෙෂඥතාව කරණකොටගෙණම තරයේ මුළාවී ග්‍රන්ථරචනාවට පිරිහෙළෙත්, විශෙෂඥනුවූවන්ට දුර්බොධවූ එබඳුතැන් වැඩිකොටම යෙදී තිබෙන්නේ රසවාහිනියේ පද්‍යරචනා (ගාථාබන්ධන) වලයි, නුමුත් ජිනවචනානුකූලව තනා තිබෙන මාගධශබ්දානුශාසනා නයින් එබඳු තැන් දුස්සාධ්‍යනොවන බැව් විශෙෂඥවූ පණ්ඩිතයෝ දනිත්.

මේ රසවාහිනිය අර්ථ අස්වන බාලශිෂ්‍යයන්ට මෙහි ගාථාර්ථ වර්ණනාවක් නැතුව තිබීම ඉතා පාඩුවක් බව හැඟී රසවාහිනියේ ගාථාසන්නයක් ලියා ප්‍රසිද්ධකලොත් මැනවැයි යන කල්පනාවෙන් වසන අතර පුරාතනාචාර්‍ය්‍ය කෙණෙකු විසින් ලියනලද ගාථාසන්නයක් තිබෙයි යනු අසන්ට ලැබී එය සොයාගෙණ බැලුවෙමු, එය වනාහි වැඩිදුර නූගත් ගුරුවරයෙකුගෙන් අර්ථ අස්වා ගන්න කෙණෙක් විසින් ගුරුවරයා කියන හැටින් වරද්ද වරද්දා එවේලාවට ලියාගත් ලියවිල්ලකි, එහිත් ලියවී තිබෙන්නේ රසවාහිනීගාථා කොටසකට පමණි. අතරතුර අර්ථකීම දුෂ්කරවූ ගාථාවලට කිසිත් ලියානොමැතියි, එහෙයින් එය රසවාහිනී ගාථාසන්නයක් ලෙස අපි කිසිසේත් නොසැලකුවෙමු. ඒ ගැන පණ්ඩිත සථවිරවරුන් විචාළකල ඒ උතුමන්ගේ අදහසුත් අප අදහස් හා සමවිය, නුමුත් අපගේ උත්සාහය එයින් පසුනොබස්වා එඞ්ගලන්තයේ පාලිපොත් සමාගමේ ලඞ්කාවේ ලේකම්තැන්පත් ලඞ්කාවේ රාජකීය ආසියාතික සමාගමේ හා ලඞ්කාණ්ඩුවේ ඉගැන්වීම් පිළිබඳ සභාවේද සාමාජික ධුරඋසුලන්නාවූ, සමාදන විනිශ්චයකාර ධුරන්ධර **ඇඩ්මන් රොලැන්ඩ් ජයතිලක ගුණරත්න** වාසල මුදලි මන්ත්‍රීශ්වරයාණන් විසින් මේ සඳහා කරණලද ආරාධනාව පිළිගෙණ රසවාහිනීගාථාසන්නයක් ඇතිවීමේ ප්‍රයොජනාතිශය වැඩිදුරත් සලකා විද්‍යොදය

පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය ශ්‍රී ඥානෙශ්වරාභිධාන ප්‍රධාන නායක ස්ථවිරයන්ගෙන් ලබනලද උපකාර ඇතිව පෙලත් වැඩිදුර සකස්කරගණිමින් අප විසින් මේ සන්නය ලියනලදී.

ඒ අපගේ අර්ථවර්ණනාවෙහි කිසිතැනක පාඨාන්තර අධෝලිපි වශයෙන් යොදද කිසිතැනක එසේ නොයොදද ඒ පාඨාන්තර සම්බන්ධ අර්ථව්‍යාඛ්‍යානත් එහිම යොද ලීමු.

මෙසේ මේ සඳහා අප විසින් ගන්නාලද ප්‍රයාසය ලෝකශාසනානුග්‍රහය පිණිසම වේවා.

K. Sri Sarananda, H. P.

M. Wipulasara.

## අථ ලඞ්කාදීපුප්පත්තිවණ්ණනා කථීයතෙ.

1 යො ගන්ත්වා පුරිසො දිස්වා තීරට්ඨො ’ව මහම්බුධිං;
සමුද්දො ’යං මයා දිට්ඨො භාසතෙ ’ව අපඤ්ඤවා.

අපඤ්ඤවා, නුවණැත්තෙක් නොවූ; යො පුරිසො; යම් පුරුෂයෙක්තෙම, මහම්බුධිං, මහ සයුර කරා; ගන්ත්වා, ගොස්; තීරට්ඨොව, ඉවුරෙහි සිටියේම; දිස්වා (ජලය පමණක්) දැක; (දසවිධ රුවන් හා මස් කැසුප් ආදී වෙසෙස් නොදැක); මයා, මා විසින්; අයං සමුද්දො, මේ මුහුදු තෙම, දිට්ඨො, දක්නාලද්දේයයි; භාසති එව, කියසිද:-

2 එවමෙවිධ යො භික්ඛු කිලෙසෙ කෙචි අත්තනි,
වික්ඛම්භෙත්වාන ’භිඤ්ඤාණබලං ලද්ධාන අද්ධුවං.

එවං එව, එපරිද්දෙන්ම; ඉධ; මේ ශාසනයෙහි; යො භික්ඛු, යම් මහණෙක්තෙම; අත්තනි; තමා කෙරෙහිවූ; කෙචි කිලෙසෙ, කිසියම් කෙලෙසුන්; වික්ඛම්භෙත්වාන, විෂ්කම්භනයකොට(ඔබා); අද්ධුවං; නිර නුවූ; අභිඤ්ඤාණබලං, (පව) අභිඥා බලය; ලද්ධාන, ලැබ:-

3 අප්පහන්ත්වා කිලෙසානං ලද්ධෙසො ’සමී ති මඤ්ඤති;
තණ්හාදුසව්‍යපෙථා හොති අමුත්තොයෙව වත්තති.

කිලෙසානං, (සියලු) කෙලෙසුන්; අප්පහන්ත්වා, නොනසා; ලද්ධෙසො අස්මි ඉති, ලැබූ අභිඥාඇත්තේ වෙමියි; මඤ්ඤති, හඟිසිද (හේතෙම); තණ්හාදුසව්‍යපෙථා හොති, තෘෂ්ණාවට දුන්ව නදීය පීඩා ඇත්තේ වෙයි; අමුත්තො එව; (කෙලෙසුන් කෙරෙන්) නොමිදුනේම; වත්තති, පවතියි;

4 අලක්ඛිං අසිවං භීමං අනපායිං අනත්ථදං;
යො තණ්හං පජහෙ භික්ඛු සො මුත්තො මාරබන්ධනා.

යො භික්ඛු, යම් මහණෙක්තෙම; අලක්ඛිං, නිශ්‍රීකවූ; අසිවං, අස්හපත්වූ; භීමං, භයානකවූ; අනපායිං, පහව නොයන්නාවූ(දුකසේ පහ කටයුතුවූ); අනත්ථදං, අවැඩ දෙන්නාවූ; තණ්හං, තෘෂ්ණාව; පජහෙ, පහකෙරේද; සො; ඒ මහණතෙම; මාරබන්ධනා, මාර බන්ධනයෙන්; මුත්තො, මිදුනේ වෙයි;

5 දෙසෙන්තං විපිනජමිගා සද්දමත්තෙන නිමිත්තං
ලද්ධා ධම්මං මනුජත්තභවං චාපවග්ගං ලභන්ති,
සද්ධා බුද්ධෙ විහිතමහිමා සාධු සුත්වාන ධම්මං
කිං නො සග්ගෙ රමති මුනිනා වණ්ණනීයෙ විමානෙ.

එවං, මෙසේ; විපිනජමිගා, වනයෙහි උපන් මෘගයෝ; ධම්මං දෙසෙන්තෙන, දහම්දෙසන කල්හි; සද්දමත්තෙන, ශබ්දමාත්‍රයෙහි; නිමිත්තං ලද්ධා, නිමිති ලැබ; මනුජත්තභවං ච, මිනිස් සැපත්ද; අපවග්ගං ච, නිවන්සැපද; ලභන්ති, ලබත්; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; බුද්ධෙ, බුදුන් කෙරෙහි; විහිතමහිමා, පිහිටි සිත් ඇත්තාවූ; සාධු, සත්පුරුෂතෙම; ධම්මං, ධර්මය; සුත්වාන, අසා; මුනිනා, බුදුන් විසින්; වණ්ණනීයෙ, වැණුම් කටයුතුවූ; සග්ගෙ විමානෙ, සගවිමනෙහි; කිං නො රමති, කුමැයි ඒකාන්තාභිරමණය නොකෙරෙයිද?

## මිගපොතක වත්ථු—1.

6 යෙන සච්චෙන'හං බුද්ධසරණෙ සුප්පතිට්ඨිතා,
තෙන සච්චෙන මෙ පුත්තො සුඛිතො හොතු නිබ්බිසො.

යෙන සච්චෙන, යම් සැබවකින්; අහං, මම; බුද්ධසරණෙ, බුත්සරණෙහි; සුප්පතිට්ඨිතා, මොනවට පිහිටියෙම්ද; තෙන සච්චෙන, ඒ සැබවින්; මෙ, මාගේ; පුත්තො, පුත්‍රතෙම; නිබ්බිසො, විෂරහිතවූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

7 යෙන සච්චෙන'හං ධම්මසරණෙ සුප්පතිට්ඨිතා,
තෙන සච්චෙන මෙ පුත්තො සුඛිතො හොතු නිබ්බිසො.

යෙන සච්චෙන, යම් සත්‍යයක් කාරණකොටගෙණ; අහං, මම; ධම්මසරණෙ, දහම්සරණෙහි; සුප්පතිට්ඨිතා, මොනවට පිහිටියෙම්ද; තෙන සච්චෙන, ඒ සත්‍යය කාරණකොටගෙණ; මෙ, මාගේ; පුත්තො, පුත්‍රතෙම; නිබ්බිසො, විෂරහිතවූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

8 යෙන සච්චෙන'හං සඞ්ඝසරණෙ සුප්පතිට්ඨිතා,
තෙන සච්චෙන මෙ පුත්තො සුඛිතො හොතු නිබ්බිසො.

යෙන සච්චෙන, යම් සත්‍යයකින්; අහං, මම; සඞ්ඝසරණෙ, සඟ සරණෙහි; සුප්පතිට්ඨිතා, සගපත්ව පිහිටියෙම්ද; තෙන සච්චෙන, ඒ සත්‍යයෙන්; මෙ, මාගේ; පුත්තො, පුත්‍රතෙම; නිබ්බිසො, නිර්විෂවූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

9 යෙන සච්චෙන'හං ධම්මං සුණමානා භණම්පි ච,
අනඤ්ඤවිහිතා ආසිං තෙන ගච්ඡතු නිබ්බිසං.

යෙන සච්චෙන, යම් සත්‍යයකින්; අහං, මම; ධම්මං, ධර්මය; සුණමානා, අසන්නි; ඛණමපි ච, ක්‍ෂණයකුත්, අනාඥාවිහිතා ආසිං, අන්‍යවිහිත නොවූවාමෙමිද; තෙන, ඒ සත්‍යයෙන්; කිබ්බිසං, නපුරු විෂ; හඤ්ඤතු, නැසේවා.

10 අක්ඛරං වා පදං වා'පි කථාමග්ගං අනාප්පයං,
අසෙසාසිං පවරං ධම්මං තෙන හඤ්ඤතු කිබ්බිසං.

කථාමග්ගං, ධර්මකථාමාර්ගය (එනම් කථාමාර්ගයෙහි); අක්ඛරං වා, අකුරක් හෝ; පදං වා අපි, පදයක් හෝ; අනාපයං, නොපිරිහෙලමින්; පවරං ධම්මං, උතුම් දහම්; අසෙසාසිං, ඇසූයෙමිද; තෙන, ඒ සත්‍යයෙන්; කිබ්බිසං, නපුරු විෂ; හඤ්ඤතු, නැසේවා.

11 බුද්ධො නීයානිකො ධම්මො සන්දිට්ඨිකමකාලිකො,
තෙන සච්චෙන මෙ පුත්තො සුඛිතො හොතු නිබ්බිසො.

බුද්ධො, සර්වඥතෙම; නීයානිකො, (සත්වයා) නිර්වාණට පමුණුවන සේක; ධම්මො, ධර්මයතෙම; සන්දිට්ඨිකං, මෙලෙව්හි තමා විසින් දක්කයුතුවූ ඵල ඇත්තේය; අකාලිකො, කල් නොයවා දෙන විපාක ඇත්තේය; තෙන සච්චෙන, ඒ සැබැවින්; මෙ, මාගේ; පුත්තො, පුත්‍රතෙම; නිබ්බිසො, විෂ රහිතවූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

12 සඞ්ඝො සුපටිපන්නො ච චතුමග්ග ඵලෙ ඨිතො
තෙන සච්චෙන මෙ පුත්තො සුඛිතො හොතු නිබ්බිසො.

සඞ්ඝො, සඞ්ඝතෙම; සුපටිපන්නො ච, සුපිළිපන්නෝ; චතුමග්ග ඵලෙ, සතරමග සතර ඵලයෙහි; ඨිතො, සිටිසේක; තෙන සච්චෙන, ඒ සත්‍යයෙන්; මෙ, මාගේ; පුත්තො, පුත්‍රතෙම; නිබ්බිසො, විෂ රහිතවූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

13 පඤ්චවස්සසහස්සානි සච්චෙ තිට්ඨති සාසනං,
තෙන සච්චෙන මෙ පුත්තො සුඛිතො හොතු නිබ්බිසො.

සච්චෙ, ඉදින්; සාසනං, බුදුසස්න; පඤ්චවස්සසහස්සානි, පන්දහසක් හවුරුදු; තිට්ඨති, සිටීද (හෙවත් පවතීද); තෙන සච්චෙන, ඒ සත්‍යය කරණකොටගෙණ; මෙ, මාගේ; පුත්තො, පුත්‍රතෙම; නිබ්බිසො, විෂ නැත්තෙක්වූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

14 සුත්වා ධම්මං පමුදිතම්හො මාතුගාමො'පි එවං
උප්පජ්ජිත්වා රමති තිදිවෙ කිබ්බිසං වාපහාති,
සබ්බාබුද්ධිප්පමුඛජනතා සාධු ධම්මෙ චරන්තා
නිබ්බාණං වා දිබ්බමනුජං සම්පදං වානුභොන්ති.

එවං, මෙසේ; පමුදිතමනො, සතුටු සිත් ඇති; මාතුගාමො අපිලාගම්ද; ධම්මං සුත්වා, දහම් අසා; කිබ්බිසං ච, උග්‍ර විෂද; අපහානි, පහකරයි; තිදිවෙ ච, දෙව්ලොවෙහිද; උප්පජ්ජිත්වා, ඉපිද; රමති, අභිරමනය කරයි; ධම්මෙ, ධර්මයෙහි; සාධු, මනාකොට; චරන්තා, හැසිරෙන්නාවූ; සද්ධාබුද්ධිපමුඛජනතා, ශ්‍රද්ධාප්‍රඥාප්‍රමුඛකොට ඇති ජනසමූහයෝ; දිබ්බමනුජං, දෙව්මිනිස්ලෙව්හිවූ; සම්පදං ච, සැපද; නිබ්බාණං වා, නිවන්සැපද; අනුභොන්ති, වළඳත්.

### ධම්මස්සුත උපාසිකා වස්තුව—2.

---

15 ධම්මං * මයා ලොකහිතස්ස තස්ස
සුභාසිතං සුස්සුතමජ්ජ යස්මා,
සච්චෙන මෙතෙන විසං විනාසං
පයාතු ආපො විය පොක්ඛරස්මා.

යස්මා, යම්හෙයකින්; ලොකහිතස්ස, ලොකහිතවූ; තස්ස, ඒ සර්වඥයන්වහන්සේ විසින්; සුභාසිතං, මොනවට දෙශනාකරණලද; ධම්මං, ධර්මය; මයා, මා විසින්; අජ්ජ, අද; සුස්සුතං, මොනවට අසනලද්දේද; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන්; පොක්ඛරස්මා; පොකුරු පතින් (පහව යන); ආපො විය, ජලයමෙන්; මෙ, මාගේ; විසං, (සිරුරුවන්) විෂය; විනාසං පයාතු, විනාසයට යේවා.

16 පදක්ඛරං තස්ස න නාසයන්තො
අඤ්ඤාව ධම්මං මනසි කරොන්තො,
යස්මා සුතං තෙන විසං විනාසං
පයාතු තොයං විය පොක්ඛරස්මා.

යස්මා, යම්හෙයකින්; තස්ස, ඒ ධර්මයාගේ; පදක්ඛරං, පදයක් අකුරක්; න නාසයන්තො, නොනසමින්; අඤ්ඤාව, අර්ථයද; ධම්මඤ්ඤාව; පාලි ධර්මයද; මනසිකරොන්තො, මෙනෙහිකරමින්; සුතං, (දහම්) අසනලද්දේද, තෙන, ඒ සත්‍යයෙන්; පොක්ඛරස්මා, පොකුරුපතින් (පහව යන); තොයං විය, ජලය මෙන්; විසං, (ශරීරගත) විෂය; විනාසං පයාතු, විනාසයට යේවා.

17 ගුණානුභාවා පණිධානතො ච
ජිනස්ස තෙනෙව සුදෙසිතෙන,
ධම්මානුභාවෙන 'පි සබ්බතෙජා
විසං විනාසං සමුපෙතු ඛිප්පන්ති.

පණිධානතො, ප්‍රණිධියෙහි පටන් (හෙවත් නියත විවරණ ලැබූ කාලයේ පටන් හෝ); ජිනස්ස, (පස්මරුන්) දිනූ බුදුන්ගේ; ගුණා,

නුභාවා වා, (අර්ගදාදී) ගුණයෙන් හා ආනුභාවයෙන්ද; තෙන එව, ඒ බුදුන් විසින්ම; සුදෙසිතෙන, (ආදිකල්‍යාණතාදි වශයෙන්) මනාව දෙශනාකරණලද; ධම්මානුභාවෙනපි, ධර්මානුභාවයෙන්ද; සඞ්ඝතෙජා, (දහම්වූ නියායෙන් පිළිපදින) සඞ්ඝයාගේ තෙජසින්ද; විසං, (සිරුරුවන්) විෂය; ඛිප්පං, වහා; විනාසං සමුපෙතු, විනාසයට පැමිණේවා.

18 ධම්මො පනෙසො සුගතප්පසත්‍ථො
තරො'ව සංසාරමහණ්ණවස්ස,
බ්‍රහ්මාසුරාදීහි නමස්සනීයො
රසො රසානං පරමො තිලොකෙ.

සුගතප්පසත්‍ථො, බුදුන් විසින් පසස්නාලද; එසො පන ධම්මො, මේ ධර්මයතෙම වනාහි; සංසාරමහණ්ණවස්ස, සසර නමැති මහ සයුරට; තරො ඉව, (නෞකාදි)තරණොපකරණයක් වැන්න; බ්‍රහ්මාසුරාදීහි, බ්‍රහ්මාසුරාදීන් විසින්; නමස්සනීයො, නමස්කාර කටයුත්තේය; තිලොකෙ, තුන්ලෙව්හි; රසානං, රසයන් අතුරෙන්; පරමො රසො, උතුම් රසයයි.

19 මහාගදො මච්චුජරාපහානො
සබ්බීතිනාසාය විසෙසමන්තො,
සබ්බාභිප්පෙතෙන ච කප්පරුක්ඛො
චින්තාමණී භද්දඝටො'ව ධම්මො.

ධම්මො, ධර්මයතෙම; මච්චුජරාපහානො, මරණ හා ජරා පහකරන්නාවූ; මහාගදො, මහ බෙහෙදක් වැන්න; සබ්බීතිනාසාය, සියලු උවදුරු නැසීම පිණිස; විසෙසමන්තො, විසෙස්මතුරක් වැන්න; සබ්බාභිප්පෙතෙන, සියලු අභීෂ්ටාර්‍ථ දීමෙන්; කප්පරුක්ඛො, කප්තුරක් වැන්න; චින්තාමණී, සිතුමිණක් වැන්න; භද්දඝටො ඉව, බඳුරුකලක් වැන්න.

20 ධම්මං විනා නත්‍ථි පිතා ච මාතා
තමෙව තාණං සරණං පතිට්ඨා,
තස්මා හි භො කිච්චමඤ්ඤප්පහාය
සුණාථ ධාරෙථ චරාථ ධම්මෙ.

ධම්මං විනා, දහම් හැර (හෙවත් දහමට වැඩි); පිතා ච, පියෙක්ද; මාතා ච, මවක්ද; නත්‍ථි, නැත; තං එව, ඒ දහම්ම; තාණං, රක්ෂාස්ථානයි; සරණං, ශරණයි (භයසන්ත්‍රාසාදි නිවාරණ කාරණයි); ප්‍රතිට්ඨා, ප්‍රතිෂ්ඨා නම්වූ වෙයි; භො, පින්වත්නි; තස්මා හි, එහෙයින්ම;

අඤ්ඤං කිච්චං පහාය, සෙසු කටයුතු හැර; සුණාථ, (දහම්) අසව්; ධාරෙථ, දරව්; ධම්මෙ, දහම්හි; චරාථ, හැසිරෙව්.

21 එවංහෙසො පමුදිතමනො භික්ඛු සුත්වාන ධම්මං
පාපෙසා'හං විසමතිභූසං තස්ස ධම්මානුභාවා,
සුත්වා ධම්මං භජථ භවන්තා කිච්චමඤ්ඤප්පහාය
තං වො සග්ගෙ දදාති විභවං මොක්ඛමග්ගඤ්ඤෙව කාමං.

භො, පින්වත්නි; එවං, මෙසේ, සො භික්ඛු, ඒ මහණතෙම; පමුදිතමනො, අතිශයින් සතුටු සිත් ඇත්තේ; ධම්මං සුත්වාන, දහම් අසා; තස්ස, උන්වහන්සේගේ; ධම්මානුභාවා, ධර්මානුභාවයෙන්; අතිභූසං, ඉතා දූශිවූ; විසං, විෂය; අහං පාපෙසි, නැසීමට පැමිණවූයේය; භවන්තා, පින්වත්නි (තෙපි;) අඤ්ඤං කිච්චං පහාය, අන් කටයුතු හැර; ධම්මං සුත්වා, දහම් අසා; භජථ, (දහම්) බජව්; තං, ඒ භජනය; වො, තොපට; සග්ගෙ, සගෙහි; විභවං, සැපද; මොක්ඛමග්ගඤ්ඤෙව, නිවන් මගද-දෝහෝ නොහොත්-උතුම් නිවන් සැපද; කාමං, එකාන්තයෙන්; දදාති, දෙයි.

## කුඩ්ඩරජ්ජවාසිත්ථෙරවත්ථුව. 3

---

22 එසො මය්හං සහායොති උපකාරං කරොති යො,
න තං සො සරතෙ චොරො නත්ථි චොරෙ සහායතා.

යො, යමෙක්තෙම (යම් සත්පුරුෂයෙක්තෙම); එසො, මේතෙම; මය්හං, මාගේ; සහායො ඉති, යහළුවෙකැයි; උපකාරං කරොති,(සොරෙකුට) උපකාරකෙරේද; සො චොරො, ඒ සොරතෙම; තං, ඒ උපකාරය; න සරතෙ, සිහිනොකරයි (එහෙයින්); චොරෙ, සොරා කෙරෙහි; සහායතා, යහළු බවක්; නත්ථි, නැත.

23 ඛාදන්තො'පි පිවන්තො'පි සයන්තො'පිච එකතො,
න ජහාත'ත්තනො ධම්මං නත්ථි චොරෙ සහායතා.

එකතො, එකට; ඛාදන්තො අපි, (සොරතෙම) බුදින්නේද; පිවන්තො අපි, පානය කරන්නේද; සයන්තො අපිච, හොවින්නේද; අත්තනො, තමාගේ; ධම්මං, වචා ස්වභාව; න ජහාති, නොහරී (එහෙයින්); චොරෙ, සොරා කෙරෙහි; සහායතා, යහළු බවක්; නත්ථි, නැත.

24 මුඛෙනෙකං ලපෙ චොරො කායෙනෙකං කරොති සො,
ලද්ධොකාසො හරන්තො'ව නත්ථි චොරෙ සහායතා.

සො චොරො, ඒ චෞරතෙම; මුඛෙන, මුවෙන්; එකං, එකක්; ලපෙ, කියයි; කායෙන, කයින්; එකං, (අන්) එකක්; කරොති, කරයි; ලද්ධොකාසො, ලබනලද අවකාශ ඇත්තේ; හරතෙව, (උපකාරකළවුන්ගේ වස්තු) හැරගන්නේම වෙයි (එහෙයින්); චොරෙ, සොරා කෙරෙහි, සහායතා, යහළුබවක්; නත්ථි, නැත.

25 මාතා පිතා ච බන්ධූ ච දිස්වා චොරං සහායකා,
දූරතො පරිවජ්ජෙන්ති රක්ඛසං'ව සකෙ ඝරෙ. *

මාතා ච, මව්තොමෝද; පිතා ච, පියතෙමේද; බන්ධූ ච, නෑයෝද; සහායකා, යහළුවෝද; චොරං දිස්වා, සොරා දැක; සකෙ ඝරෙ, ස්වකීය ගෘහයෙහි; රක්ඛසං ඉව, රාක්ෂසයකු මෙන්; දූරතො පරිවජ්ජෙන්ති, දුරින් දුරලත්; (සඞ්ගමෙ, (සොරා හා) සඞ්ගම කිරීමෙහි; සදා, හැම කල්හි; සඞ්කන්ති, සැකකරත්).

26 යො සා යස්ස ඩංසෙ පාදං තස්ස පාදං න සො ඩංසෙ,
එවමෙව හි දුට්ඨස්ස අදොසො'ව පසංසිතො.

යො සා, යම් සුනඛයෙක්තෙම; යස්ස, යම් සත්පුරුෂයෙකුගේ; පාදං, පය; ඩංසෙ, ඩැහගණීද; සො, ඒ සත්පුරුෂතෙම; තස්ස, ඒ බලුගේ; පාදං, පය; න ඩංසෙ, නොම ඩහින්නේය; එවං එව හි, එපරිද්දෙන්ම; දුට්ඨස්ස, දුෂ්ටයාට (අසත්පුරුෂයාට); අදොසො එව, ද්වෙෂ නොකිරීමම; පසංසිතො, පසස්නාලද්දේවේ.

27 අකතඤ්ඤුස්ස පොසස්ස මෙත්තිං යො න කරිස්සති,
තස්ස මෙත්තිං හි සො කයිරා තමාහු වරියං බුධා.

යො, යමෙක්තෙම; හි, යම් හෙයකින්; අකතඤ්ඤුස්ස, කළගුණ නොදන්නාවූ; පොසස්ස, පුරුෂයාට; මෙත්තිං, මෛත්‍රිය; න කරිස්සති, නොකරන්නේනම් (එහෙයින්); සො, හෙතෙම; තස්ස, කවරක්හට; මෙත්තිං කයිරා, මෙත් කරන්නේද; තං, එය (අසත්පුරුෂයා කෙරෙහි මෛත්‍රී කිරීම); බුධා, (බුධාදී) පණ්ඩිතයෝ; වරියං, උත්තමතර මෛත්‍රියයි; ආහු, කීහු.

28 පාපො හුත්වා පඨමසමයෙ පඤ්චකාමානුගිද්ධො,
යො වෙ පච්ඡා පජහති මදං යොනිසොලොකයන්තො,
සොපායම්භා තිභව විභවං කාමමාසාදයිත්වා
නිබ්බාණග්ගං සිවමමතපුරං යාති සත්තුප්පසත්ථං.

යො, යමෙක්තෙම; පඨමසමයෙ, පළමුවන කාලයෙහි; පඤ්චකාමානුගිද්ධො, පස්කම් අනුව ගිජුවූයේ; පාපො හුත්වා, පවිටෙක් වී;

---

* "සඞ්කන්ති සඞ්ගමෙ සදා".

පඤ්ඤා, පඥාව; යොනිසො, නුවණින්, ඔලොකයතො, සලකා බැලමින්; මදං, (සෞවන මදාදී) මදය; වෙ, ඒකාන්තයෙන්; පජහති; පහකෙරේද; හො, පින්වත්නි; සො අපි අයං, ඒ මේ තෙමේද; සම්බුද්ධප්පසත්ථං, ශාස්තෘන් විසින් පසස්නාලද; තිභව විභවං, තුන්ලෝසැප; කාමං, සිත්සේ; ආසාදයිත්වා, ලබා; සිවං, ක්ෂෙමවූ; අග්ගං, අග්‍රවූ; නිබ්බාණං අමතපුරං, නිවන් නමැති අමාපුරයට; යාති, යයි.

## අරණ්‍යක මහාභගසස්ථවිර වස්තුව-4.

---

29 චන්දනාගරුගන්ධෙසු ගන්ධමාඝාය සාධුසු,
විරජ්ජන්ති සුරජ්ජන්ති කුණපෙ නීලමක්ඛිකා.

නීලමක්ඛිකා, නිලමැස්සෝ; සාධුසු, යහපත්වූ; චන්දනාගරුගන්ධෙසු; සඳුන් අගිල් යන ගන්ධ ද්‍රව්‍යයන්හි; ගන්ධං, ගඳ; ආඝාය; ආඝ්‍රාණයකොට; විරජ්ජන්ති, නොඇලෙත්; කුණපෙ, කුණපයෙහි; සුරජ්ජන්ති, අතිශයින් ඇලෙත්.

30 දිස්වා සුත්වා ච බුද්ධඤ්ච ධම්මං සොතරසායනං;
ජනෙන්ති න මනොහාසං තථා සංසාරබන්ධුකා.

තථා, එසේ; සංසාරබන්ධුකා, සසරබන්ධුබඳුවූවෝ (පින් මඳ සත්වයෝ; බුද්ධං, බුදුන් (බුදුරූ ආදිය); දිස්වා ච, දැකද, සොතරසායනං, කණට රස උපදවන්නාවූ; ධම්මං, ධර්මය, සුත්වා ච, අසාද; මනොහාසං, සිත් සතුටක්; න ජනෙන්ති, නොඋපදවත් (සිත් පහදමා පින් සිදුකරනොගණිත්.)

31 සධාතුකං ථූපවරං යො භෙදමුපනෙති සො;
සිරිනාගො'ව වෙ හොති භාගී දුක්ඛස්ස කෙවලං.

යො, යමෙක්තෙම; සධාතුකං, (බුදුන්ගේ ශාරීරික) ධාතු සහිත්වූ; ථූපවරං, උත්තමස්තූපයක්(දාගැබක්); භෙදං, බිඳීමට; උපනෙති, පමුණුවාද; සො, හෙතෙම; සිරිනාගො'ඉව සිරිනාගයා මෙන්; වෙ, ඒකාන්තයෙන්; කෙවලං, හුදෙක්; දුක්ඛස්ස; දුකට; භාගීහොති, හිමිවෙයි.

32 හත්ථපාදාදිසම්භෙදං ජිනබිම්බස්ස යො කරෙ,
සො'පි තාදිසකො හුත්වා අපායෙසූපපජ්ජති.

යො, යමෙක්තෙම; ජිනබිම්බස්ස බුදුරුවක්හුගේ; හත්ථපාදාදිසම්භෙදං, අත්පාආදිය බිඳීම; කරෙ, කරන්නේද; සො අපි, හෙතෙමේද; තාදිසකො හුත්වා, ඒ සිරිනාගයා සමානයෙක්වී; අපායෙසු, (සංජීවාදි) අපායයන්හි; උපපජ්ජති, උපදී.

33 ඡේදනභේදනාදිකං කත්වා යො වෙ බොධිවනිරුහං,
පච්චක්ඛෙ'පි විනාසං සො යාති පෙච්ච'පි රෝරුවං.

යො, යමෙක්තෙම; බොධිවනිරුහං, බෙ රුකක්; ඡේදනභේදනාදිකං, සිඳීම් බිඳීම් ආදිය ඇත්තක් (හෙවත් බෝරුක් සිඳීම් බිඳීමක්); කත්වා, කොට (වෙසේද); සො, හේතෙම; වෙ, එකාන්තයෙන්; පච්චක්ඛෙ අපි, ඉහාත්මයෙහිම; විනාසං යාති, විනාසයට යයි; පෙච්ච අපි, පරලෙව්හිද; රෝරුවං, රෞරවනරකයට යයි.

34 ගණං යො තීහි වාරෙහි නරො'ධ අපරජ්ඣති;
සො භවෙ චතුරොපායෙ දුක්ඛභාගී භවිස්සති.

ඉධ, මෙ ලොකයෙහි; යො නරො, යම් මිනිසෙක් තෙම; තීහි වාරෙහි, (කාය වාග් මනස්) තුන් දොරින්; ගණං, (ආර්‍ය්‍ය) සමූහයා කෙරෙහි; අපරජ්ඣති, අපරාධ කෙරේද; සො, හෙතෙම, භවෙ, එකාන්තයෙන්; චතුරොපායෙ, සිව් අපායෙහි; දුක්ඛභාගී භවිස්සති, දුක් අනුභවකරන්නෙක් වන්නේය.

35 යො නරො'ධ විනාසෙති සම්බුද්ධාගමපොත්ථකං,
ජීනනන්තිනො'පි සො හොති නිරයස්ස නිගච්ඡති.

ඉධ, මේ ලොකයෙහි, යො නරො, යම් මිනිසෙක්තෙම; සම්බුද්ධාගමපොත්ථකං, සම්බුදුන්ගේ ආගම පොත්; විනාසෙති, වනසයිද; සො, හෙතෙම; ජීනන්නිනොපි හොති, සුන්බුන්නේදවේ; නිරයස්ස නිගච්ඡති, නරකයටද යයි.

36 මහාන්ධකාරං පාපං ඉති විඤ්ඤාය පණ්ඩිතො;
දූරතො පරිවජ්ජෙය්‍ය මග්ගං පටිභයං යථා.

පණ්ඩිතො, (මෙලෝ පරලෝ දන්නාවූ) නුවණැතිතෙම; ඉති, මෙසේ (උක්තප්‍රකාරයෙන්); මහාන්ධකාරං පාපං, මහත් අඳුරක් රූපවූ; විඤ්ඤාය, දැන; පටිභයං, ප්‍රතිභය ඇත්තාවූ; මග්ගං, මාර්ගය; යථා, යම්සේද එසේ; දූරතො පරිවජ්ජෙය්‍ය, දුරින් දුරුකරන්නේය.

37 පූජෙන්තෙ'වං කතසුචරිතං සාධු චණ්ඩාලකම්පි
නෙත්වා කාමං තිදිවමමරා සඞ්ඝසම්පත්ති දූනා,
ගච්ඡන්ත'ථො අකතසුකතා භූමිපාලාපි කාමං
ඝොරාපායං ජගති භජථාපුඤ්ඤපුඤ්ඤානි පඤ්ඤා.

එවං, මෙසේ; අමරා, දෙවියෝ; කතසුචරිතං, කරණලද සුසිරිත් ඇති (කුසල් ඇති); චණ්ඩාලකං අපි, සැඩොලාද; තිදිවං, දෙව්ලොවට; නෙත්වා, ගෙණගොස්, කාමං, සිත්සේ; සඞ්ඝසම්පත්ති දූනා, සඟසැපදීමෙන්; පූජෙන්ති, පුදත්; අථො, වැලිදු; අකතසුකතා, නොකරණ

ලද කුසල් ඇති; භූමිපාලා අපි, මිහිපල්හුද; කාමං, එකාන්තයෙන්; ඝෝරාපායං, භයානක අපායට; ගච්ඡන්ති, යෙත්; (එහෙයින්) පඤ්ඤා, පැණැත්තෙනි (තෙපි); අපුඤ්ඤං, අකුසල්; ජහථ, හරිව්; පුඤ්ඤානි, පින්; භජථ, බජව්.

**සිරිනාගවත්ථුව--5.**

---

38 නේසො උපාසකො තිස්ස පිතා භාතා ච මාතුලො,
න ඤාති සුහදෙ හොති දිට්ඨසම්භත්තකො තව.

තිස්ස, තිස්සය; එසො උපාසකො, මේ උවසුතෙම; තව, තාගේ; න පිතා, පියා නොවේ; න භාතා ච, සොහොවුරෙකුත් නොවේ; න මාතුලො ච, මයිලනුකෙණෙකුත් නොවේ; න ඤාති, වෙන නෑයෙක්ද නොවේ; දිට්ඨසම්භත්තකො, සඳිඨවූද සම්භක්තවූද (දෘෂ්මිත්‍රවූද); සුහදෙ න හොති, සහල්ලුවෙක්ද නොවේ.

39 කිඤ්චි තස්සා කතං නත්ථි උපකාරං පුරෙ තයා,
සීලවන්තො'ති තං ඤත්වා තුය්හං දස්සති භොජනං.

තයා, තා විසින්, පුරෙ, පෙර; තස්ස, ඒ ඇමතිඋවසුහට; කතං, කරණලද; කිඤ්චි උපකාරං, කිසි උපකාරයක්; නත්ථි, නැත; තං, තා, සීලවන්තො ඉති, සිල්වතෙකැයි; ඤත්වා, දැන; තුය්හං, තට; භොජනං, බොජුන; දස්සති, දෙන්නේය.

40 මහන්තතරං ආනිසංසං තස්ස ත්වං යදි ඉච්ඡසි,
සරාගො ත්වං න භුඤ්ජාහි මීයමානො'පි භොජනං.

ත්වං, තෝ; තස්ස, ඕහට; මහන්තතරං, අනිසයින් මහත්වූ; ආනිසංසං; ඉෂ්ටවිපාකයක්; යදි ඉච්ඡසි; ඉදින් කැමැත්තෙහි නම්; ත්වං, තෝ, මීයමානො අපි, මැරෙන්නේනමුදු; සරාගො, රාගසහිතවූයේ; භොජනං, බොජුන; නභුඤ්ජාහි, නොවලඳුව.

41 ඔවදිත්වාන සො අත්තානං කත්වා දුක්ඛක්ඛයං තදා,
භත්තකිච්චං අකා ධීරො බුද්ධසාසනසොභකො.

බුද්ධසාසනසොභකො, බුදුසසුන හොබවන්නාවූ; සො ධීරො; ඒ ප්‍රාඥතෙම; තදා, එකල; අත්තානං, තමහට; ඔවදිත්වාන, අවවාදකොට; දුක්ඛක්ඛයං කත්වා, දුඃඛක්ෂයකොට (රහත්වී); භත්තකිච්චං අකා, බත්කිස කළසේක්.

42 අච්ඡෙරමෙතං කතසුචරිතං නිජ්ජරා චාභිගන්ත්වා
මානෙතොන්තං අථ ප්‍රත්ථුතා වණ්ණිතං වණ්ණයන්ති,
එවං ඤත්වා විබුධමනුජා භජමානා සුගන්ධිං
ලොකෙ පුඤ්ඤං කුරුථ සතතං මා බණ්ඩං යාතු තුම්හං.

අමෙහා, පින්වත්නි; අචිරං, ආශ්‍රවයයිසි; නිජ්ජරා ච, දෙවියෝද; කතසුචරිතං, කරණලද සුසිරි ඇති (යොවත් පින් ඇති); එතං, මේ සැදැළුවසු ඇමතියා කරා; අභිගන්ත්වා, එළඹී; මානෙන්ති, (සාධුකාරදෙමින් ඔහු) පුදත්; අථ, වැලිදු; පුතිමුඛා, තුති මුවඇත්තාහු; වණ්ණිතං, (ඔහු)ගුණ; වණ්ණෙයන්ති, වණ්ණනා කරත්; විබුධමනුජා, පණ්ඩිතජනයෙනි (තෙපි); එවං ඤත්වා, මෙසේ දැන; සුගතිං භජමානා, සුගතිය භජනය කරමින්; ලොකෙ, ලොකයෙහි; සතතං, අනවරතයෙන්; පුඤ්ඤං කුරුථ, පින්කරව්; ඛණං, ක්ෂණයකුත්; තුච්ඡං, නිස්ඵලව (නිකරුණේ); මා යාතු, නොයාවා.

**සඬානිසස අමාත්‍යයාගේ වස්තුව-6.**

---

43 සකිදෙව සුතසොම සබ්භි හොති සමාගමො,
සා නං සඞ්ගති පාලෙති නාසබ්භි බහුසඞ්ගමො.

සුතසොම, සුතසොම මහරජානෙනි; සබ්භි, සත්පුරුෂයන්හා; සකිං එව, එකවරක් (බිණීම) ම; සමාගමො හොති, සඞ්ගමය (එක්වී ම) වෙයි, සා සඞ්ගති, ඒ එක්වීම්තොම; නං, ඔහු; පාලෙති, (දෙලොවින්) රකී; අසබ්භි, අසත්පුරුෂයන් හා; බහුසඞ්ගමො, බොහෝවර (බිණීමෙන්වූ) සඞ්ගමයතෙම; න, (දෙලොවින්) නොරකී .

44 සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය සෙය්‍යො හොති න පාපියො.

සබ්භි එව, සත්පුරිසන්සමගම; සමාසෙථ, එක්වව්; සබ්භි, සත්පුරිසන් හා; සන්ථවං කුබ්බෙථ. (මිත්‍ර) සන්ථවය කරව්; සතං, (බුද්ධාදි) සත්පුරුෂයන්ගේ; සද්ධම්මං, සදහම්; අඤ්ඤාය, දැන (වෙසේනම්); සෙය්‍යො හොති, (තමා) ශ්‍රෙෂ්ඨයෙක් වෙයි; න පාපියො, ලාමකයෙක් නොවේ-දෙලෙහි නොහොත්-යහපත වෙයි අයහපත නොවෙයි.

45 ජීරන්ති වෙ රාජරථා සුචිත්තා
අථො සරීරම්පි ජරං උපෙති,
සතං ච ධම්මො න ජරං උපෙති
සන්තො හවෙ සබ්භි පවෙදයන්ති.

සුචිත්තා, මනා විසිතුරුවූ; රාජරථා, රජදරුවන්ගේ රථයෝ (පවා); වෙ, එකාන්තයෙන්; ජීරන්ති, දිරත්; අථො, වැලිදු; සරීරං අපි, සිරුරද; ජරං උපෙති, දිරීමට පැමිණෙයි; සතං ච ධම්මො, සත්පුරුෂයන්ගේ (එක්වීමෙන් උපදනා ගුණ)ධර්මයතෙම; ජරං, දිරීමට; න උපෙති, නොපැමිණෙයි; සන්තො, සජ්ජනයෝ තුමූ; සබ්භි, සත්පුරුෂයන්හා (එක්ව විසීම); හවෙ, එකාන්තයෙන්; පවෙදයන්ති, උතුමැයි කියත්.

46 නභං ච දූරෙ පඨවී ච දූරෙ
පාරං සමුද්දස්ස තදාහු දූරෙ,
තතො හවෙ දූරතරං වදන්ති
සතඤ්ච ධම්මං අසතඤ්ච රාජා'ති.

රාජ, රජ්ජුරුවන්වහන්ස; නභං ච, අහසද; දූරෙ, දුරෙහිය; පඨවී ච, පෘථිවිතොමෝද; දූරෙ, දුරෙහිය (එකිනෙක දුරෙහි වේ); සමුද්දස්ස, සමුද්‍රයාගේ (මෙතරට); තං පාරං, ඒ එතරද; දූරෙ, දුරෙහියයි; ආහු, කියත්; තතො, ඊටත්වඩා; සතඤ්ච ධම්මං, සත්පුරුෂයන්ගේ ධර්මයද; අසතඤ්ච, අසත්පුරුෂයන්ගේ ධර්මයද; හවෙ, එකාන්තයෙන්; දූරතරං, අතිශයින් (එකිනෙක) දුරයයි; වදන්ති, (පණ්ඩිතු) කියත්.

47 දෙවිද්ධිපත්තො'සි මහානුභාවො
වණ්ණො ච තෙ සබ්බදිසා පභාසති,
දිබ්බා ච පරිසා පරිවාරයන්ති
නානායුධා චාමරමොරහත්ථා.

දෙව, දිව්‍යපුත්‍රය; ඉද්ධිපත්තො අසි, (නුඹ) සෘද්ධිප්‍රාප්තයෙහිය; මහානුභාවො අසි, මහත් ආනුභාව ඇත්තෙහිය; තෙ, නුඹගේ; වණ්ණො ච, (ශරීර)වර්ණයතෙමේද; සබ්බදිසා, සියලු දිගුන්; පභාසති, බබුලුවයි; නොහොත් සබ්බදිසා, සියලුදික්හි; පභාසති, බබලයි; නානායුධා, නන්අවිඇති; චාමරමොරහත්ථා, මොනරපිලින් විසිතුරුසෙමරගත් අත්ඇත්තාවූ; දිබ්බා ච පරිසා, දෙව්පිරිස්හුද; පරිවාරයන්ති, (නුඹ) පිරිවරත්.

48 සුරඞ්ගනා රඞ්ගගතා * සමන්තා
නච්චෙහි ගීතෙහි සමප්පිතා,
නච්චන්ති ගායන්ති ලය වියුත්තං
සවණාමතං ගීතමුළාරවණ්ණා.

උළාරවණ්ණා, උදාරවෙශ ඇත්තාවූ (දිව්‍යාලඞ්කාරයෙන් සැරසුනාවූ); නච්චෙහි, නැටුම්වලින්ද; ගීතෙහි, ගීතිකාවලින්ද; සමප්පිත, යුක්තවූ; සුරඞ්ගනා, දෙවඟනෝ; රඞ්ගගතා, රඟමඬලට පැමිණියාහු-දෙහෝ නොහොත්- සුරගණා, දිව්‍යපුත්‍ර සමූහයෝ; සමන්තා, හාත්පස; නච්චන්ති, නටත්; සවණාමතං, කණට අමාබඳුවූ; ගීතං, ගීතිකා; ලයාවියුත්තං, (එක්සියූවිසි) ලයින් වෙන්නොවූ; ගායන්ති, ගයත්.

49 පග්ගය්හ වීණාදිසවංසතන්ති
නාභිකසාමං තනනී සරං සගරන,
සමජ්ජමජ්ඣිමයී ච කාචි කඤ්ඤා
ලයනාභියො තා පරිතොසයන්ති.

---

* "සුරගණා" සමහර.

කාචි කඤ්ඤා, ඇතම් (දිව්‍ය) කන්‍යාවෝ; සමජ්ජමණ්ඩම්හි ච, රඟමැඩෙහිද; වීණාදී, වේණා ආදිකොට ඇති; සවංසතන්ති, වස්තුලල් සහිත තන්ත්‍රීන්; පග්ගය්හ, ගෙණ; සරේන, (ගීත) සවරයෙන්; තන්තිසරං, වීණානාදය; න අතික්කමං, නොඉක්මවමින්; නොහොත්– න අතික්කාමම, නො ඉක්මවා; ලයන්තියො, ලලනයකරමින්; තං, තුඹ; පරිතොසයන්ති, සතුටුකරත්.

50 භෙරි මුතිඞ්ගා මුරජා ච දෙණ්ඩිමා
සඞ්ඛා ච නෙකා සුසිරාදයො ච,
පග්ගය්හ වාදෙන්ති පහට්ඨරූපා
නච්චන්ති කීළන්ති ජනා අනෙකා.

අනෙකා ජනා, නොයෙක් (දිව්‍ය) ජනයෝ; භෙරි, බෙරද; මුතිඞ්ගා, මිහිඟුබෙරද; මුරජා ච, පණාබෙරද; දෙණ්ඩිමා, මහුල්බෙරද; නෙකා සඞ්ඛා ච, නොයෙක් සුළුතාලම්ද; සුසිරාදයො ච, සක් වස්තුලල් ආදීන්ද; පග්ගය්හ, ගෙණ; පහට්ඨරූපා, අතිශයින් සතුටු රූ ඇත්තාහු; නච්චන්ති, නටත්, කීළන්ති, කෙළිත්; වාදෙන්ති, (බෙර) වයත්,

51 දිබ්බන්නපානෙහි සුපුණ්ණසොණ්ණ
මයාදිනානාවිධභාජනානි,
පග්ගය්හ තිට්ඨන්ති තිගාවුතස්මිං
ත්වං තෙන මොදෙසි සපාරිසජ්ජො.

දිබ්බන්නපානෙහි, දිව්අහර පැනින්; සුපුණ්ණ, අතිශයින් පිරුණාවූ; සොණ්ණමයාදිනානාවිධභාජනානි, රන්මුවා ආදී නන්වැදෑරුම් බඳුන්; පග්ගය්හ, ගෙණ; තිගාවුතස්මිං, තුන්ගවුවෙක්හි; තිට්ඨන්ති, (දෙවියෝ) සිටිත්; සපාරිසජ්ජො, පිරිවරසහිතවූ; ත්වං, තුඹ; තෙන, එයින්; මොදෙසි, සතුටුවන්නෙහිය.

52 පුච්ඡාමි තං දෙව මහානුභාව
මනුස්සභූතො කිම'කාසි පුඤ්ඤං,
කිං තෙ වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො.

මහානුභාව, මහත් ආනුභාවඇති; දෙව, දෙවතාව; තං, තුඹ; පුච්ඡාමි, විචාරමි; මනුස්සභූතො, මිනිස්වූයෙහි; කිං පුඤ්ඤං අකාසි, කවර පිණක් කෙළෙහිද; තෙ, තුඹගේ; කිං වතං, කුමන ව්‍රතයක්ද; කිං පන බ්‍රහ්මචරියං, කුමන බඹසරක්ද; සුචිණ්ණස්ස, පුරුදුකරණ ලද්දවූ (හෙවත්) කරණලද්දවූ; කිස්ස, කවර (කුශලධර්මය)ක්හුගේ; අයං විපාකො, මේ විපාකය වේද?.

53 ලඞ්කාතලෙ මිස්සකපබ්බතො'ති
පසිද්ධනාමො'සි මහාවිහාරො,
බහූහි ථූපෙහි විරොචමානො
මුනින්දබිම්බාලයපන්තියුත්තො.

ලඞ්කාතලෙ, ලක්දිව්තෙලෙහි; බහූහි ථූපෙහි, බොහෝ ථූපවලින් (බොහෝදාගැබින්); විරොචමානො, බබලන්නාවූ; මුනින්දබිම්බාලය පන්තියුත්තො, බුදුපිළිමගෙපෙළින් යුක්තවූ; මිස්සකපබ්බතො ඉති, මිහින්තලායයි; පසිද්ධනාමො, පසිදුනම් ඇති; මහාවිහාරො අසි, මහවෙහෙරෙක් විය.

54 විභූසිතො බොධිමහීරුහෙහි
විරාජිතො සෙතතමාලකෙහි,
සුඵුල්ලසීතොදකසම්පුණ්ණ
සමාකුලානෙකජලාසයෙහි.

බොධිමහීරුහෙහි, බෝරුක්වලින්; විභූසිතො, (ඒ විහාරස්ථාන ය) වෙසෙසින් අලංකෘතවිය; සෙතතමාලකෙහි, සුදුවැලිමළුවලින්; විරාජිතො, බැබලුනේය; සුඵුල්ල සීතොදකසම්පුණ්ණ සමාකුලානෙකජලාසයෙහි, සුඵුල්ල, මනාපිපි පියුම් ඇති; සීතොදක, සිහිල්දියෙන්; සම්පුණ්ණ, සපිරුණාවූ; සමාකුල, එයින් ගැවසුනාවූ; අනෙකජලාසයෙහි, නොයෙක් පොකුණුවලින්ද (විභූෂිත විය).

55 විසාධිකෙ සත්තසතෙ සමන්තා
අධිකෙහි ඡබ්බීසසතෙහි සත්තහි, *
පරිවෙණපන්තීහි සුදස්සනීයො
පීතිං පවඩ්ඪෙති සදා ජනානං.

සමන්තා, හාත්පස; විසාධිකෙ, විස්සක් අධිකකොට ඇති, සත්තසතෙ, සත්සියයක්තන්හි (පිරිකෙව්කරණලද විහාරයතෙම); සත්තහි අධිකෙහි, හතකින් අධිකවූ; ඡබ්බීසසතෙහි, විසිහයසියයක් පමණවූ; පරිවෙණ පන්තීහි, පිරිවෙන් පෙළින්; සුදස්සනීයො, අතිශයින් දකුම්සවසුතුවූයේ; සදා, හැමකල්හි; ජනානං, දනන්ට; පීතිං ප්‍රීතිය; පවඩ්ඪෙති, ප්‍රකර්ෂයෙන් වඩයි.

56 තහිං වසන්තා යතිරාජපුත්තා
සුපෙසලානෙකගුණාධිවාසා,
කතාදරා සබ්බජනෙහි සම්මා
කරොන්ති අත්තත්ථපරත්ථසිද්ධිං.

---

* "ඡබ්බීසතෙහි පරිවෙණපන්තීහි" ටීකා.

තහිං, ඒ වෙහෙරෙහි; වසන්තා, වාසයකරන්නාවූ; සුපෙසලා, පියසීලිවූ; නෙකගුණාලවාසා, (ශීලාදී) අනෙක ගුණයන්ට වාසස්ථානවූ; සබ්බජනෙහි, සියලු ජනයන් විසින්; කතාදරා, කරණලද ආදර ඇත්තාවූ; යතිරාජපුත්තා, සුගත් සුතනුවෝ (භික්ෂූහු); සම්මා, මනාකොට; අත්තත්ථපරත්ථසිද්ධිං කරොන්ති, අත්වැඩ පරවැඩ සිද්ධකරත්.

57 අහං භදන්තා දුතියත්තභාවෙ
තහිං තදෙකො සමණො අහොසිං,
සද්ධාධුරං සීලධුරං වහන්තො
පටිපත්තියා වත්ථුත්තයං මහන්තො.

භදන්තා, පින්වතුනි; අහං, මම; දුතියත්තභාවෙ, (මීට) දෙවන අත්බැවෙහි; තහිං, ඒ වෙහෙරෙහි, එකො සමණො අහොසිං, එක් මහණෙක් වීමි; තදා, එකල (මම); සද්ධාධුරං; ශ්‍රද්ධාධුරයද; සීලධුරං, ශීලධුරයද, වහන්තො, උසුලමින්; පටිපත්තියා, පිළිවෙතින්, වත්ථුත්තයං, තෙරුවන්; මහන්තො, පුදන්නෙක් වීමි.

58 තතො'පරස්මිං සමයෙ මහාජනා
උද්දිස්ස භික්ඛූ සමුපානයිත්වා,
සුචිං පණීතං පචුරන්නපානං
භොජෙන්ති භික්ඛූ සුමනා සහත්ථා.

තතො අපරස්මිං සමයෙ, ඉන් මතු කලක; මහාජනා, මහාජනයෝ; භික්ඛූ උද්දිස්ස, සඞ්ඝයා උදෙසා; සුචිං, පිරිසිදුවූ; පණීතං, ප්‍රණීතවූ; පචුරන්නපානං, බොහෝ අහරපැන්; සමුපානයිත්වා, මොනවට එළවා; සුමනා, සතුටුසිතැත්තෝ; සහත්ථා, සියතින්, භික්ඛූ, භික්ෂූන්; භොජෙන්ති, වළඳවත්.

59 අහම්පි ලද්ධා පටිවිංසකං මෙ
සඞ්ඝස්සු'පඩ්ඪං අදදිං තතො'පි,
ඵලම්පි දානස්ස ච සද්දහන්තො
බුද්ධානුභාවං මනසීකරොන්තො.

අහම්පි, මමද; පටිවිංසකං, (ඉන්) කොටසක්; ලද්ධා, ලැබ; දානස්ස, දානයාගේ; ඵලම්පි, අනුසස්ද; සද්දහන්තො, අදහමින්, බුද්ධානුභාවං ච, බුද්ධානුභාවයද; මනසීකරොන්තො, මෙනෙහිකරමින්; මෙ, මාගේ; තතො අපි, ඒ කොටසින්ද: උපඩ්ඪං, අඩියක්; සඞ්ඝස්ස, සඞ්ඝනට; අදදිං, දුනිමි.

60 මමිදං පදානං මමිදං වතං තං
අනෙන පුඤ්ඤෙන ච මයා කතෙන,
තතො චුතො භුම්මදෙවෙසු ජාතො
භුඤ්ජාමි'හං දෙවසිරිං අනූනං.

මම, මාගේ; ඉදං පදනං, මේ ප්‍රදානයයි; මම, මාගේ; තං ඉදං විතං, ඒ මේ ව්‍රතයයි; මයා, මාවිසින්; කතෙන, කරණලද; අපනෙන පුණ්‍යෙන, මේ පිණ කරණකොටගෙණ; තතො වුතො, එයින් සැව; භුම්මදෙවෙසු, භූමාටු දෙවියන් කෙරෙහි; ජාතො, උපන්නාවූ; අහං, මම, අනුත්තං, අධූනුවූ (මහත්වූ); දෙවසිරිං, (මේ) දිව්‍යසැප; භුජාමි, වළඳමි.

61 සද්ධාය ඨානෙ පක්තං පදානං
අප්පම්පි හොතෙව මහාවිපාකං;
යථා සුඛෙත්තෙ වපිතප්පබීජං
තොසෙති චිත්තං බලු කස්සකස්ස.

සද්ධාය, ශ්‍රද්ධාවෙන්; ඨානෙ, සුදුසුතැන්හි (සිල්වතුන් කෙරේහි); පක්තං, කරණලද; අප්පං අපි, මදවූද; පදානං, ප්‍රදානය තෙම; මහාවිපාකං හොති එව, මහත්විපාක ඇතිවේමය; (කෙසේද) සුඛෙත්තෙ, යහපත්කෙතෙහි; වපිතං, වපුරණලද; අප්පබීජං, ස්වල්පබීජයද; බලු, නියතින්; කස්සකස්ස, ගොවියාගේ; චිත්තං, සිත; යථා තොසෙති, යම්සේ සතුටුකෙරේද(එමෙනි).

62 එවං භො භො කුසලනිරතා ඛෙත්තමොලොකයිත්වා
දත්වා බීජං අණුමපි අභො'නප්පභොගං ලභන්ති;
ලද්ධානෙකං කබලමපි භො භත්තිනිනතා සුසීලෙ
දත්වා භොගං දිබ්බමනුජං අත්‍ථභාගී සිවඞ්ගව.

භො භො, පින්වත්නි පින්වත්නි; එවං, මෙසේ; කුසලනිරතා, කුශල ක්‍රියා යෙහි ඇලුනෝ; ඛෙත්තං, (පින්) කෙත; ඔලොකයිත්වා, බලා; අණුමපි, මදවූද; බීජං, (දෙයයධර්මසංඛ්‍යාත පුණ්‍ය) බීජය; දත්වා, දී; අනප්පභොගං, මහත් භොගසම්පත්; ලභන්ති, ලබන්; අභො, ආශ්චර්‍ය්‍යයි; (එහෙයින්) භො, පින්වත්නි (තෙපි); ලද්ධාන, (ආහාරයක්) ලැබ; භත්තිනිනතා, භක්තිනරිතව; සුසීලෙ, මනාසිල්වතුන්ට; එකං කබලං අපි, එක්ග්‍රාසයක්(පිඩක්)වත්; දත්වා, දී; දිබ්බමනුජං, දෙවිමිනිස් දෙගතියෙහිවූ; භොගං, භොගසම්පත්ද; සිවඞ්ගව, නිවන්සැපද; භාගී අථ, වළඳන්නෝවව්.

## සමණගාමවත්ථුව.–7

---

63 යො සද්ධං පූරතො කත්වා දනං දෙති නරො ඉධ,
කිපිල්ලක'මුපාදය තිරච්ඡානගතස්ස'පි.

64 විපාකං තස්ස දනස්ස දෙවමානුසිකං සුඛං,
දත්වා නිබ්බාණසම්පත්තිමනෙන දෙති'හි නිච්ඡිතං.

ඉධ, මෙලොව; යො නරො, යම් මිනිසෙක් තෙම; සබ්බං, සැම; පුරතො කත්වා, පෙරටු කොට; කිපිල්ලිකං උපාදය, කුහුඹියෙක් පටන් කොට; තිරච්ඡානගතස්ස අපි, තිරිසන්ගියෙකුට වත්; දනං දෙති, දන් දේද; තස්ස දනස්ස, ඒ දනයාගේ; විපාකං, විපාකය (කෙසේද යත්?); දෙවමානුසිකං සුඛං, දෙව්මිනිස් සැප; දත්වා, දී; අන්තෙ, කෙළවර; නිබ්බාණසම්පත්තිං, නිවන් සැප; දෙති ඉති, දෙත්තේය යනු; නිච්ඡිතං, නිශ්චිතයි.

65 කිමෙස සංසාර මහාවිදුග්ගෙ
අකාසි පුඤ්ඤං භවභොගහෙතු,
කෙනස්ස දනෙ නිරතො මනො තෙ
පුච්ඡාමි තං දෙව වියාකරොහි.

එසො, මේ (භික්ෂු) තෙම; සංසාරමහාවිදුග්ගෙ, සංසාර නමැති මහාදුර්ගමස්ථානයෙහි; භවභොගහෙතු, සම්පත් වැලඳීම හෙතුකොට; කිං පුඤ්ඤං, කවර පිණක්; අකාසි, කෙළේද; අස්ස, උන්වහන්සේට; දනෙ, (අහර) දීමෙහි; කෙන, කුමන හෙතුවකින්; තෙ, නුඹවහන්සේගේ; මනො, සිත; නිරතො, ඇළුණේද; දෙව, දෙවතාව; තං, නුඹ; පුච්ඡාමි, විචාරමි; වියාකරොහි, (මට) ප්‍රකාශ කරව.

66 අයං යතීසො දුතියත්තභාවෙ
නාමෙන දෙවො ඉති විස්සුතො'සි,
භොත්තුං තද භත්තමුපට්ඨිතෙ සො
අද්දක්ඛි සොණං තසිතං කිලන්තං.

අයං යතීසො, මම යතිශ්‍රෙෂ්ඨ තෙම; දුතියත්තභාවෙ, (මිට) දෙවන අත්බැව්හි; නාමෙන, නමින්; දෙවො ඉති, දෙවයයි; විස්සුතො ආසි, පතළවූයේ විය; තද, එකල්හි; භත්තං, බත; භොත්තුං, බුදින්ට; උපට්ඨිතෙ, එළඹුකල්හි; සො, හෙතෙම; තසිතං, පිපාසිතවූ; කිලන්තං, (බඩසයින්) ක්ලාන්තවූ; සොණං, බල්ලෙකු; අද්දක්ඛි, දුටුයේය.

67 තෙනෙව භත්තස්ස මහන්තපිණ්ඩං
වට්ටෙත්ව'ද තස්ස බුභුක්ඛිතස්ස,
තෙනස්ස දනෙනි'ධ අනන්තභාවෙ
ඵලං විපච්චිස්සති සාධු භද්දෙ,
අප්පම්පි දනං නහි විත්තකීයං
පරිත්තබීජෙන වටො'ව ජාතො.

තෙනෙව, එහෙයින්ම; භත්තස්ස මහන්තපිණ්ඩං, මහත් බත්පිඩක්; වට්ටෙත්වා, වටා; බුභුක්ඛිතස්ස, බඩසයින් පීඩිතවූ; තස්ස, ඒ සුනඛයාට; අද, දුන්නේය; අස්ස, ඔහුගේ; තෙන දනෙන, ඒ දනයෙන්;

ඉධ අඤ්ඤභාවෙ, මේ අත්බැව්හි; සාධු, මනාකොට; ඵලං, විපාකං; විපච්චිස්සති, විපක්වන්නේය (පලදෙන්නේය); භද්‍ර, සොඳුර; දුනං, (කම්පල අදහා දෙන) දුනය; අප්පං ඉති, ස්වල්පයකි; නත්ථි විඤ්ඤාතියං, නොසිතියයුතුයි; පරිත්තබීජෙන, ඛුඩා බීජුවටින්; ජාතො, හටගත්; වටො ඉව, නුගරුකක්මෙන්; (මහත් විපාක උපන්නේය.)

68 යො යස්ස දණ්ඩති අදණ්ඩියස්ස
ස දණ්ඩියො හොති භවෙ භවෙසු,
යො හනාඛ කොපං න කරොති දණ්ඩං
සනරාමරා තං පරිපාලයන්ති.

යො, යමෙක් තෙම; අදණ්ඩියස්ස, නොහැළියයුතුවූ; යස්ස, යමෙක්හට; දණ්ඩති, දඬුවම් හෙරේද; සො, හෙතෙම; භවෙභවෙසු, ජාති ජාතියෙහි; දණ්ඩියො හොති, දඬුවම් කටයුත්තේ (දඬුවම් ලබන්නේ) වෙයි; යො, යමෙක් තෙම; කොපං, (තමා සිතතුළ උපන්) කිපිම; හනාඛා, නසා; දණ්ඩං න කරොති, දණ්ඩනය නොකෙරේද; තං, ඔහු; සනරාමරා, මිනිසුන් සහිත දෙවියෝ; පරිපාලයන්ති, රැකගණිත්.

69 දත්වානෙකං කබලම්පි සො ජාතකස්සෙකස්සානො
දිබ්බාහාරං ලභි සිවමථො සීතිභූතං යතින්ද,
තුම්හෙපෙ'වං දදථ සතතං යස්ස කස්සාපි දෙය්‍යං
තං වො වට්ටෙ භවති සරණං හොති නිබ්බාණමන්තෙ.

සො යතින්ද, ඒ යතිඳුතෙම; ජාතකස්ස, බඩසාපත්වූ; එකස්සානො, එක් බල්ලෙකුට; එකං කබලං අපි, එක් කබලකුදු (එක් බත් පිඩක්;) දත්වාන, දී; දිබ්බාහාරං, දිව්‍යඅහරද; අථො, වැළිදු; සීතිභූතං, (රාගාදීන් විනිර්මුක්ත හෙයින්) සිහිල්වූ; සිවං, නිවණද; ලභි, ලැබූයේය; තුම්හෙ අපි, තෙපිද; එවං, මෙසේ; යස්ස කස්ස අපි, යම්කිසි වෙකුට උවත්; දෙය්‍යං, දෙය්‍යධර්මය (දියයුතුදෙය); සතතං, අනවරතයෙන්; දදථ, දෙව්; තං, ඒ දීම; වො, තොපට; වට්ටෙ, සසරෙහි; සරණං භවති, පිහිට වෙයි; අන්තෙ, කෙළවර; නිබ්බාණං හොති, නිර්වාණය (සිඩ) වෙයි.

අභයස්ථවිරවස්තුව. 8

——xx——

70 සම්බුද්ධො විනතමාසස්ස ඛාලපක්ඛෙ උපොසථෙ,
පාතොයෙව සමාදය පවරං පත්තචීවරං.

සම්බුද්ධො, සම්බුදුතෙම; මිගසිරමාසස්ස, බක්මස සම්බන්ධවූ; කාලපක්ඛෙ, කළුවරපක්ෂයෙහි; උපොසථෙ, පොහෝදවසෙහි (අව පසළොස්වක් දවසෙහි); පාතො එව, උදැසනම; පවරං, උතුම්වූ; පත්තචීවරං, පාසිවුරු; සමාදාය, රැගෙණ:-

71 සහ රුක්ඛෙන සුමනෙන ජලන්තො නභසා ජිනො,
අනුකම්පාය නාගානං නාගදීපමුපාගමි.

ජිනො, පස්මරුන් දිනූ ඒ තථාගතතෙම; නාගානං, නාගීන්ට; අනුකම්පාය, කරුණා පිණිස; සහරුක්ඛෙන සුමනෙන, රුක සහ සුමන දෙවියන් සමග; ජලන්තො, දිලිසෙමින්; නභසා, අහසින්; නාගදීපං, නාගදිවයිනට; උපාගමි, වැඩිසේක.

72 තෙසං ධම්මමදෙසෙසි සාමග්ගිකරණං ජිනො,
උභො'පි තෙ පතීතා තං පල්ලඞ්කං මුනිනො අදුං.

ජිනො, සර්වඥතෙම; තෙසං, ඔවුන්ට (නාගයන්ට); සාමග්ගිකරණං, සමගිය ඇතිකරන්නාවූ; ධම්මං, ධර්මය; අදෙසෙසි, දෙශනාකළසේක; පතීතා, (ඊට) සතුටුවූ; තෙ උභො අපි, ඒ (නාරජූ) දෙදෙනම; තං පල්ලඞ්කං, ඒ (මිණි) පලඟ; මුනිනො, සර්වඥයන්වහන්සේට; අදුං, දුන්නාහුය.

73 සත්ථා භූමිගතො තත්ථ නිසීදි රතනාසනෙ,
තෙහි දිබ්බන්නපානෙහි නාගරාජෙහි තප්පිතො.

සත්ථා, ශාස්තෘතෙම; භූමිගතො, බිමට වැඩිසේක්; රතනාසනෙ, ඒ රුවන් අස්නෙහි; නිසීදි, වැඩහුන්සේක; තත්ථ, එහිදී; තෙහි නාගරාජෙහි, ඒ නාරදුන් විසින්; දිබ්බන්නපානෙහි, දිව්‍යඅහර පැනින්; තප්පිතො, සන්තර්පිතය කරණලද්දේවිය.

74 තෙ ජලට්ඨෙ ථලට්ඨෙ ච භුජගෙ'සීති කොටියො,
සරණෙසු ච සීලෙසු පතිට්ඨාපෙසි නායකො.

නායකො, සර්වඥතෙම; තෙ, ඒ (සටනට පැමිණියාවූ); ජලට්ඨෙ, දියෙහි වැසිවූද; ථලට්ඨෙ ච, ගොඩවැසිවූද; අසීති කොටියො, අසූකොළක්; භුජගෙ, නයින්; සරණෙසු ච, තුන්සරණෙහිද; සීලෙසු, ශිලයන්හිද; පතිට්ඨාපෙසි, පිහිටෙවූසේක.

75 තත්ථාපි රාජායතනං පල්ලඞ්කඤ්ච මහාරහං,
අප්පෙසි නාගරාජූනං ලොකනාථො නමස්සිතුං.

ලොකනාථො, ලොකස්වාමිතෙම; තත්ථාපි රාජායතනං, ඒ කිරිපළුරුකද; මහාරහං, මාහැඟිවූ; පල්ලඞ්කඤ්ච, (මිණි) පලඟද; නාගරජ්ජූනං, නාරජ්ජුන්ට; නමස්සිතුං, වඳින්ට; අප්පෙසි, හැඹූසේක.

76 පරිභොගචෙතියං මය්හං නාගරාජා නමිස්සථ,
තං භවිස්සන්ති වො නාගා හිතාය ච සුඛාය චා'ති.

නාගරාජා, නාරජුනි; මය්හං, මාගේ; පරිභොගචෙතියං, පාරිභොගික චෛත්‍යය; නමස්සථ, නමදිව්; නාගා, නාගයෙනි; තං, ඒ නමස්කාරකිරීම; වො, නොපට; හිතාය ච, හිතපිණිසද; සුඛාය ච, සැපපිණිසද; භවිස්සති, වන්නේය.

77 පාදෙ වන්දිය අය්‍යානං පවක්ඛාමි සුණාථ මෙ,
නත්ථි වෙ මාදිසී අඤ්ඤා කපණතරා භූතලෙ.

අය්‍යානං, ආය්‍යීයන්ගේ; පාදෙ, පාදයන්; වන්දිය, වැඳ; පවක්ඛාමි, කියන්නෙමි; මෙ, මාගේ (වචනය); සුණාථ, අසනු මැනවි; භූතලෙ, පොළෝතලෙහි; වෙ, එකාන්තයෙන්; කපණතරා, දිළිඳුබැවින්; මාදිසී, මාවැනිවූ; අඤ්ඤා, අනික් ස්ත්‍රියක්; නත්ථි, නැත.

78 ඉණං දාතුමසක්කොන්ති ඉණදාසි අහොස'හං,
අනාලම්බිකා අප්පභොගා විහරාමි අබන්ධවා.

අහං, මම; ඉණං, (පළමුගත්) ණය; දාතුං, දෙන්ට; අසක්කොන්ති, නොහැක්කී; ඉණදාසී අහොසිං, ණය දාසියක් වීමි; අබන්ධවා, නෑයෙක් නැත්තාවූ (මම); අප්පභොගා, වස්තුවකුත් නැතිව; අනාලම්බිකා, (හාල්) නැලියකුත් නැතිව; විහරාමි, වෙසෙමි.

79 දානං දදන්ති අජ්ජාපි රත්තිදුසිත්තමාගමිං,
පරිභුඤ්ජන්තු අය්‍යා මෙ දින්නං දුග්ගතපාභතන්ති.

අජ්ජ අපි, අද (දඟවල්) පවා; දානං දදන්ති, දන් දෙන්නි; රත්තිදුසිත්තං, රෑ දුසිබවට; ආගමිං, පැමිණියෙමි; අය්‍යා, ආය්‍යීයන්වහන්සේලා; මෙ, මාවිසින්; දින්නං, දෙනලද; දුග්ගතපාභතං, දිළිඳුපඬුර; පරිභුඤ්ජන්තු, වළඳනසේක්වා.

80 භමෙහා මාතා න නො එසා නො චායං භගිනී ච නො,
න සස්සු සුණිසා එසා න ඤාති නව සොභද.

භමෙහා, එම්බා ඇවැත්නි; එසා, මෝතොමෝ; නො, අපගේ; න මාතා, මව් නොවේ; අයං, මෝතොමෝ; නො, අපගේ; නො භගිනී ච, නැගනියකුත් නොවේ; න සස්සු, නැන්දම්මයකුත් නොවේ; එසා, මෝතොම; න සුණිසා, යෙහෙළියකුත් නොවේ; න ඤාති, (වෙන) ඤාතියෙකුත් නොවේ; නව සොභද, යහලු මාගමකුත් නොවේ.

81 සීලවන්තා ගුණවන්තා සුබ්බතා යතයො ඉමෙ,
එතෙසං දින්නමප්පම්පි අනන්තඵලදං සියා.

ඉමෙ යතයො, මේ යතිහු; සීලවන්තා, සිල්වත්වූ; ගුණවන්තා, ගුණවත්වූ; සුබ්බතා, සුන්දරව්‍රත ඇත්තෝවූ; එතෙසං, මුන්වහන් සේලාට; දින්නං, දෙනලද; අප්පං අපි, සවල්පයද; අනන්තඵලදං සියා, (නොයෙක් අත්බැව්හි) නොයෙක් ඵල දෙන්නේවනැයි.

82 ඉති මනත්වාන සා දිනා දලිද්දා පාරකම්මිකා,
අත්තානං විකකිණිත්වාන දානමජ්ජමදාසි නො.

ඉති, මෙසේ; මනත්වාන, සිතා; දිනා, බැගෑපත්වූ; දලිද්දා, දිළිඳුවූ; පාරකම්මිකා, අනුන්ගේ කර්මයෙහි (දාස්මෙහෙවරෙහි) යෙදුනාවූ; සා, ඕතොමෝ; අත්තානං, තමන්; විකකිණිත්වාන, විකුට; අජ්ජ, අද, නො, අපට; දානං අදාසි, දන් දින.

83 පරිසොධෙම අත්තානං ආකඞ්ඛන්තා මහප්ඵලං,.
සරාගා තං න භුඤ්ජාම අප්පහන්ත්වාන ආසවෙ.

මහප්ඵලං, (ඇට) මහත්ඵලය; ආකඞ්ඛන්තා, කැමැත්තාවූ (අපි); අත්තානං, තමන්; පරිසොධෙම, (කෙලෙස් නැසීමෙන්) පිරිසිදු කරමු; ආසවෙ, (කාමාදි) ආශ්‍රවයන්; අප්පහන්ත්වාන, නොනසා; සරාගා, රාගසහිතවූවෝ; තං, ඒ දානය; න භුඤ්ජාම, නොබුදිමු.

84 සාධු සාධු මහාසඞ්ඝ සාධු සාධු තයා කතං,
දානං ඛෙත්තගතං ආසි සුලාභං අජ්ජ තෙ අහු.

මහාසඞ්ඝ, මහ සැදෑගැත්තිය; සාධු සාධු, යහපත යහපති; තයා, තිවිසින්; සාධු, යහපතක්; සාධු, මොනවට; කතං, කරණලදී; දානං, (තී දුන්) දානය (හෙවත් දානසඞ්ඛ්‍යාත බීජවට); ඛෙත්තගතං ආසි, (යඟුරුවන් නමැති) ක්ෂෙත්‍ර ගතවිය; තෙ, තිට; අජ්ජ, අද; සුලාභං අහු, අතිශය ලාභයක් විය.

85 ඡෙජ්ජභෙජ්ජාදිනා යො තු කත්වාන පරපීළනං,
මහායාගං පවත්තෙති න තං හොති මහප්ඵලං.

යො තු, යමෙක් තෙම වනාහි; ඡෙජ්ජභෙජ්ජාදිනා, සිඳිම් බිඳිම් ආදිවශයෙන්; පරපීළනං කත්වාන, අනුන් පෙළීම කොට; මහායාගං පවත්තෙති, මහයාගයක් පවත්වන්නේද; තං, ඒ යාගය; න මහප්ඵලං හොති, මහත්ඵල ඇති නොවේ.

86 අනාදරං පුරක්ඛත්වා අසද්ධාය අයොනිසො,
අඛෙත්තෙ යො දදෙ දානං න තං හොති මහප්ඵලං.

යො, යමෙක්තෙම; අනාදරං පුරක්ඛත්වා, අනාදර පෙරටුකොට (ආදර රහිතව); අසද්ධාය, (කම්පල) නොඇදහීමෙන්; අයොනිසො, නුනුවනින්; අඛෙත්තෙ, ක්ෂෙත්‍රනුවූවන්ට; දානං දදෙ, දන් දෙන්නේ ද; තං, ඒ දානය; න මහප්ඵලං හොති, මහත්ඵල ඇතිනොවේ.

87 දළිද්දො'පි මහාසයො සාදරො සුඛමානසො,
දෙති අප්පම්පි සො හොති අනන්තඵලදො සදා.

දළිද්දො අපි, දිළිඳුවූයේ නමුත්; මහාසයො, මහ සැදැහැත්තේ; සාදරො, ආදරසහිතවූයේ; සුඛමානසො, පිරිසිදු සිතැත්තේ; අප්පං අපි, ස්වල්පයක්වත්; දෙති, දේද; සො, ඒ දනය; සදා, හැමකල්හි; අනන්තඵලදො හොති, අනත් පලදෙන්නේ වේ.

88 එවං පඤ්ඤුයු'පගතමනො ආතුමං කත්ව දාසං
දත්වා දානං පයති තිදිවං හොති පාසංසියො ච,
තස්මා දානං සුරතරුසමං ඉච්ඡිතත්ථප්පදානං
මච්ඡෙරාරිං හනථ භවතා දානමිත්තං භජෙථ.

එවං, මෙසේ; පඤ්ඤායඋපගතමනො, නුවනින් යුක්තවූ සිත් ඇති තැනැත්තේ; ආතුමං, තමා; දාසං කත්වා, දාසකොට; දානං දත්වා, දන්දී; පාසංසියො හොති, පැසසියයුත්තෙක්වේ; තිදිවං ච, දෙව්ලොවටද; පයාති, යයි; භවන්තා, පින්වත්නි; තස්මා, එහෙයින්; දානං, දානය; ඉච්ඡිතත්ථප්පදානං, අභිමතාර්ථ ප්‍රදානයකරන්නාවූ; සුරතරු සමං, කප්රුකක් සමානය; මච්ඡෙරාරිං, මසුරුකම නමැති සතුරා; හනථ, නසව්; දානමිත්තං, දන නමැති මිතුරා; භජෙථ, භජනය කරව්.

## නාගවස්තුව. 9

———

89 යං චින්තිතං පුඤ්ඤවතං සම්බානං සමිජ්ඣති,
න තථා අප්පපුඤ්ඤානං ඊහන්තානම්පි සිජ්ඣති.

සම්බානං, ධනාදීයෙන් සමෘද්ධවූ; පුඤ්ඤවතං, පිණැත්තවුන් විසින්; යං, යමක්; චින්තිතං, සිතනලද්දේද (එය); සමිජ්ඣති, සමෘද්ධවෙයි; ඊහන්තානං අපි, උත්සාහ කරන්නාවූද; අප්පපුඤ්ඤානං, පින් මදවූවන්ට; තථා, එසේ; න සිජ්ඣති, සිද්ධනොවෙයි.

90 චිරදින්නස්ස අයස්ස දාතුමජ්ජතනායපි,
පණ්ණමත්තම්පි නො ලද්ධං අහො නො මන්දපුඤ්ඤතා.

චිරදින්නස්ස, බොහෝකලකින් දක්නාලද්දවූ; අයස්ස, ආර්යයන් වහන්සේට; අජ්ජතනාය අපි, අද දවස අහරපිණිසවත්; දාතුං, දෙන්ට; පණ්ණමත්තම්පි, කොළපතක්වත්, නො ලද්ධං, නොලබනලදී; නො, අපගේ; මන්දපුඤ්ඤතා, පින්මදබව; අහො, ඛෙදයකි.

91 සභාවමෙතං ලොකස්මිං කතපුඤ්ඤස්ස ජන්තුනො,
සයමෙව සමායන්ති මුත්තාවෙළුරියාදයො.

කහපුඤ්ඤස්ස, කළුපින් ඇත්තාවූ; ජන්තුනො, සත්වයාගේ; මුත්තා වෙළුරියාදයො, මුතු වෙරළුම්ණිආදීහු; සයං එව, තුමූම; සමාගතානි, රැස්වෙත්; ලොකස්මිං, ලොකයෙහි; එතං සභාවං, මේ ස්වභාවයි.

92 අලක්ඛිනා අබ්භෙඤ්ඤෙන දුබ්භගෙනිධ මානුසෙ,
පරක්කමෙන යං තථ සම්තඤ්ච හනිස්සති.

ඉධ මානුසෙ, මේ මිනිස්ලෙව්හි; දුබ්භගෙන, දුර්භාග්‍යවූ (අවාසනාවන්තවූ); අබ්භෙඤ්ඤෙන, පින්නැත්තාවූ; අලක්ඛිනා, නිශ්‍රිකයා විසින් (කාලකණ්නියා විසින්); පරක්කමෙන, උත්සාහයෙන්; යං, යමක්; සම්තච, රැස්කරණලද්දේද (එය); තථ, එහිම; හනිස්සති, නැසේ.

93 එවං ධනපතීනන්තු ධනෙව රමතෙ මනො,
දෙනෙන අජ්ඣත්තිකං ධනං බාහිරෙසු කථාව කා.

එවං, මෙසේ; ධනපතීනන්තු, ධනපතීන්ගේ වනාහී; මනො, සිත; ධනෙ එව, ධනයෙහිම; රමතෙ, ඇලේ; අජ්ඣත්තිකං ධනං, ආධ්‍යාත්මිකධනය (සිරුරුමස්); දෙනෙන, දෙනකල්හි; බාහිරෙසු, (ගෙවත් ආදී) බාහිරවස්තූන්හි; කා කථාව, කවර කථාද (කියනුම කවරේද).

94 අහං අහං පදස්සාමි මඤ්ඤමානෙව'වං උභොජනෙ,
තෙසං සද්ධාබලෙනෙව * සක්කො පාතුරහූ තහිං.

එවං, මෙසේ; උභොජනෙ, අඹු සැමි දෙදෙන; අහං අහං, මම මම; පදස්සං ඉති, දෙන්නෙමියි; මඤ්ඤමානෙ, මතුරණකලැ; තෙසං, ඔවුන්ගේ; සද්ධාබලෙනෙව, සැදූබෙලෙන්ම; ඥේහෝ නොහොත්- තෙසං, ඔවුන්ගේ (ප්‍රයොජනය පිණිස); සම්බලගතෙන, (සහල් ආදී) මාර්ගෝපකරණ ගත් අතින් යුක්තව; සක්කො, ශක්‍රතෙම; තහිං, එහි; පාතුරහු, පහළවිය.

95 සද්ධාබලං පස්සථ භො ජයම්පතී
සමංසදනෙනාපි ධනමානසං,
පුරෙත්ථ ධනස්ස ඵලං ලභිංසු තෙ
තුම්හෙපි සද්ධාධුර සෙවථා'ති.

භො, පින්වත්නි; සද්ධාබලං, ශ්‍රද්ධාබලය; පස්සථ, බලව්; තෙ ජයම්පතී, ඒ අඹුසැමි දෙදෙන; සමංසදනෙනාපි, සියමඟදීමෙන්ද; ධනමානසං, ධනචෙතනාව; පුරත්ථා, පුරා; ධනස්ස, ධනයාගේ; ඵලං, විපාකය; ලභිංසු, ලැබූවාහුය; තුම්හෙපි, තෙපිද; සද්ධාධුරං, ශ්‍රද්ධාධුරය; සෙවථ, සෙවනය කරව්.

චුල්ලපබ්බත වස්තුව–10

මිගපොතකවග්ගො පචමො.

---

* “සම්බලගතෙන”

1 සාධූනං කරුණානාම ඊදිසෙසු පවත්තති,
එසො ජිනත්‍රජො දිස්වා පිල්ලකං'තීව දුක්ඛිතං.

සාධූනං, (බුද්ධාදි) සත්පුරුෂයන්ගේ; කරුණානාම, (අනුන් දුකෙහි තමන් ලයසැලීමවූ) කරුණාවනම්; ඊදිසෙසු, මෙබන්දන් කෙරෙහි; පවත්තති, පවති; එසො ජිනත්‍රජො, මේ සුගත් පුත්‍රානුතෙම; අතීව දුක්ඛිතං, ඉතාම දුකට පත්වූ; පිල්ලකං, දිළිඳු දරුවා; දිස්වා, දැක:-

2 අසක්ඛරං පරිවාසං නිබ්බොතං කරසාහතං,
භූත්වා ආලුවඛණ්ඩන්තං සුඛාපෙසි යතිස්සරො.

යතිස්සරො, (ඒ) යතිශ්‍රෙෂ්ඨතෙම; අසක්ඛරං, සකුරුනොවූ (මිහිරිනොවූ); පරිවාසං, පෙරදවසෙහිවූ (හෙවත්) පිලුනුවූ; නිබ්බොතං, සුබොපිතනොවූ; කරසාහතං, අතින් ගෙණෙනලද්දවූ; ද්‍රෙඝෝනොහොත්–නිබ්බොතක්කාරසං, සුබොනනොවූ පුනිරසයක්වූ; ආහතං, (අනුභවය පිණිස) ගෙණෙනලද්දවූ; තං ආලුවඛණ්ඩං, ඒ ආලුවකඩ (හෙවත්) කටුඅලය; භූත්වා, වළඳා; සුඛාපෙසි, (ඒ දරුවා) සැපයට පැමිණවූයේය.

3 න විසං විසමිච්චාහු අක්ඛාතං රාජදණ්ඩං විසමුච්චතෙ,
නාසෙති විසමෙකංව රාජදණ්ඩං කෙවලං කුලං.

විසං, (අන්‍යසාමාන්‍ය) විෂයක් තෙම; විසං ඉති, විෂයයි; න අක්ඛාතං, ප්‍රකාශ නොකරණලදී; රාජදණ්ඩං, රාජකොපය; විසං උච්චතෙ, විෂයයි කියනුලැබේ (කුමක්හෙයින්ද); විසං, (සර්පාදීන්ගේ) විෂය තෙම; එකංව, (කෑ) එකෙකුම; නාසෙති, නසයි; රාජදණ්ඩං, රජහුගේ කොප විෂය වනාහි; කෙවලං කුලං, මුලු කුලයම (නසයි).

4 තිඨන්ති දහනා දඩ්ඪා පාදපා නූන කානනෙ,
රාජකොපානලා දඩ්ඪා න තිඨන්ති නරා තථා.

කානනෙ, මහවෙනෙහි; දහනා, ලැව්ගින්නෙන්; දඩ්ඪා, දනලද්දවූ; පාදපා, වෘක්ෂයෝ; නූන, එකාන්තයෙන්; තිඨන්ති, සිටිත්; රාජකොපානලා, රජහුගේ කොපනමැති ගින්නෙන්; දඩ්ඪා, දනලද්දවූ; නරා, මනුෂ්‍යයෝ; තථා, එසේ; න තිඨන්ති, නොසිටිත්.

5 කාලොවා කාරණං රඤ්ඤො රාජාවා කාලකාරණං,
මා තු තෙ සංසයො හොතු රාජාවා කාලකාරණන්ති.

කාලොවා, මෘත්‍යුහෝ; රඤ්ඤො, රජහට; කාරණං, කාරණයි; රාජාවා, රජහෝ; කාලකාරණං, මරහුට කාරණයි; තෙ, තිට; මා සංසයො හොතු, (මරණයගැන) සැකයක් නොවේවා; රාජාව, රජතෙමේම; කාලකාරණං, මරහුට කාරණයි.

6 යං යෙන චිත්තං අනයෙන ලද්ධං
තං දෙන්ති රාජාදිභයං හි තස්ස,
නයෙන පප්පෝති ච යො මහාධනං
සක්කොන්ති නාසං න හි දෙවතා'පීති.

යෙන, යමක්හු විසින්; යං චිත්තං; යම් වස්තුවක් තෙම; අන් යෙන, අයුක්තියෙන්; ලද්ධං, ලබනලද්දේද; තං හි, ඒ ධනය් තෙමේ ම; තස්ස, ඔහට; රාජාදි භයං; රජ ආදීන්ගෙන් වන බිය; දෙන්ති, දෙයි; යො; යමෙක් තෙම; නයෙන, යුක්තියෙන්; මහාධනං, මහත් ධනයට; පප්පෝති ච, පැමිණේද (ඔහුගේ ඒ ධනය); නාසං, නැසීමට (පමුණුවන්ට); දෙවතා අපි, දෙවියෝ පවා; නහි සක්කොන්ති; නොහැකිමෙන්.

7 යො වෙ ගුණාධාරජිනත්‍රජානං
අප්පම්පි සද්ධාය දදාති දෙය්‍යං,
සො පෙච්ච සංසාරමහාවිදුග්ගෙ
සම්පත්ති නාවාය පතිට්ඨමෙති.

යො; යමෙක්තෙම; වෙ; ඒකාන්තයෙන්; ගුණාධාරජිනත්‍රජානං, (සුප්‍රතිපන්නතාදී) ගුණයන්ට ආධාරවූ සර්වඥපුත්‍රයන්ට; අප්පං අපි, ස්වල්පවූද; දෙය්‍යං, දෙයධර්මයක් (දියයුතු දෙයක්); සද්ධාය, කම්පල ඇදහීමෙන්; දදාති, දේද; සො, හෙතෙම; පෙච්ච, පර ලොව ගොස්; සංසාරමහාවිදුග්ගෙ, සසර මහ සයුරෙහි, සම්පත්ති නාවාය, (දෙව් මිනිස්) සැපත් නැමැති නැවෙහි; පතිට්ඨං එති, පිහිටීමට පැමිණෙයි.

**උනහරොලිස වස්තුව-1.**

---

8 දෙව'දානි අයං ලඞ්කා දුබ්භික්ඛා ආසි කෙවලා;
සුසසිතා එලිතා ආසුං තලාකරහදාදයො.

දෙව, (පින්වත්) දෙවියනි; ඉදානි, දැන්; අයං කේවලා ලඞ්කා; මේ මුළු ලක්දිව; දුබ්භික්ඛා ආසි, දුර්භික්ෂවූවාය; තලාකරහදාදයො, විල් ජලාශයාදීහු; සුසසිතා; වියලුනාහු; එලිතා ආසුං, පැළුනෝවූහ;

9 ගතා විනාසං ජලජා පිපාසා මිගසූකරා,
ධාවන්ති දිස්වා ආරාච මරීචිං තොයසඤ්ඤිනො.

ජලජා, දියෙහි උපන් සත්වයෝ; විනාසං ගතා, විනාසයට ගියාහුය; මිගසූකරා, මුවහූරෝ; පිපාසා, පවස් ඇත්තාහු; මරීචිං,

ගිරිනු; දිස්වා, දක; නොයෙකසැඳැඹිනො, ජලසංඝ ඇත්තාහු; ධාවන්ති, දුවත්.

10 සිතපණ්ණා වනා ආසුං භුජිතා ච තිණොසධා,
භුසංව විකිරිංසු චණ්ඩානිලසමාගතා.

වනා, වනයෝ හෙවත් වනජවෘක්‍ෂයෝ; සීනපණ්ණා ආසුං, වියළුපත් ඇතිවූහ; භුජිතා, හැකුලුනාවූ; තිණොසධා ච, තෘණෞෂධයෝද; චණ්ඩානිලසමාගතා, සැඩපවනට එක්වූවාහු; භුසං ඉව, බොල්මෙන්; විකිරිංසු, විසුරුණාහුය.

11 දුබ්භාජනෙන දීපස්මිං පීළිතා පන මානුසා,
අට්ඨිචම්මාවසෙසාසුං ඛීණලොහිතමංසකා.

දීපස්මිං, ලක්දිවිහි; මානුසා පන, මිනිස්හු වනාහි; දුබ්භොජනෙන, දුර්භික්‍ෂයෙන්; පීළිතා, පෙළුනාහු; ඛීණලොහිතමංසකා, වැරී ගිය ලේ මස් ඇත්තාහු; අට්ඨිචම්ම අවසෙසා ආසුං, ඇට සම් (පමණක්) ඉතුරුකොට ඇත්තෝ වූහ.

12 ජීවිතාසෙ * නරා දෙව ගහෙත්වා පුත්තදාරකෙ,
තත්‍ථ තත්‍ථ ගතා ආසුං යත්‍ථ සක්කොන්ති ජීවිතුං.

දෙව, දෙවතාවෙනි; ජීවිතාසෙ, ජීවත්වනු පිණිස; නොහොත්– ජීවිතාසා, දිවි ආසා ඇත්තාවූ; නරා, මිනිස්සු; පුත්තදාරකෙ, අඹු දරුවන්, ගහෙත්වා, ගෙණ; යත්‍ථ, යම් තැනක; ජීවිතුං සක්කොන්ති, ජීවත්වන්ට හැක්වෙත්ද; තත්‍ථ තත්‍ථ, ඒ ඒ තැන; ගතා ආසුං, ගියෝ වූහ.

13 යස්මා තස්මා මහාදෙව න සක්කොම'ධ සීහලෙ,
ජීවිතුං ජම්බුදීපස්ස යාම'දානි'ති අබ්‍රවි.

මහාදෙව, මහ දෙවිය; යස්මා, යම් හෙයකින්; ඉධ සීහලෙ, මේ හෙළදිව්හි; ජීවිතුං, ජීවත්වන්ට; න සක්කොම, නොහැක්කමෝද, තස්මා, එහෙයින්; ඉදානි, දැන්; ජම්බුදීපස්ස, දඹදිවට; යාම ඉති, යම්හයි; අබ්‍රවි, කීසේක.

14 අතීතම්හි තුවං භන්තෙ අදාසෙකස්ස භික්ඛුනො,
සද්දහන්තො දානඵලං ඝතෙන සහ භොජනං.

භන්තෙ, ස්වාමිනි; තුවං, තුඹවහන්සේ; අතීතම්හි, ඉකුත් කාලයෙහි, දානඵලං, දානානිසංසය; සද්දහන්තො, අදහමින්; එකස්ස භික්ඛුනො, එක් භික්‍ෂු නමෙකුට; ඝතෙන සහ, ගිතෙල් සමග; භොජනං අදාසි, බොජුනක් දුන්නේය.

* "ජීවිතාසා"

15 තතො චුතො තුවං තස්ස පුඤ්ඤකම්මස්ස වාහසා,
දුතියත්තභාවෙ එතස්මිං ජායිත්වාන සුඛෙධිතො.

තුවං, නුඹවහන්සේ; තතො චුතො, ඉන් චුතවූයේ; තස්ස පුඤ්ඤකම්මස්ස, ඒ පුණ්‍යකර්මයාගේ; වාහසා, අනුසසින්; එතස්මිං දුතියත්තභාවෙ, මේ දෙවෙනි අත්බැව්හි; ජායිත්වාන, ඉපද; සුඛෙධිතො, සැපයෙහි සිටියේ:-

16 පහාය මාතාපිතරො සහිරඤ්ඤං සකං ඝරං,
පබ්බජිත්වාන සම්බුද්ධසාසනෙ බද්ධමානසො.

සම්බුද්ධසාසනෙ, සම්බුදු සස්නෙහි; බද්ධමානසො, බැඳි සිත් ඇත්තේ, මාතාපිතරො, මව් පියන්ද; සහිරඤ්ඤං, අමුරන් (හෝ කහවණු) සහිතවූ; සකං ඝරං, සිය ගෙදරද; පහාය, හැර; පබ්බජිත්වාන, පැවිදිව:-

17 පටිපත්තිපරො හුත්වා භාවෙත්වාන තිලක්ඛණං,
සො ත්වං ඛීණාසවො ආසි තදෙතං දානඵලං තදා.

පටිපත්තිපරො හුත්වා, ප්‍රතිපත්තියෙහි ඇළුනෙක් වී; තිලක්ඛණං, තිලකුණු; භාවෙත්වාන, වඩා; සො ත්වං, ඒ නුඹවහන්සේ; ඛීණාසවො ආසි, රහත්වූ සේක; තදා, එකල; තෙ, නුඹවහන්සේගේ; තං දානඵලං, ඒ දානානිසංසයයි.

18 අථාපරම්පි මෙ භන්තෙ සුණාථ වචනං සුභං,
යං මයා දීයමානං තං දිබ්බන්නං පරිභුඤ්ජසි,
තයිදම්පි තදා දින්නදානස්සෙව ඵලං සියා.

භන්තෙ, ස්වාමීන් වහන්ස; අථ, වැලි; මෙ, මාගේ; අපරං අපි, අනිකුදු; සුභං, ශොභනවූ, වචනං, කීමක්; සුණාථ, ශ්‍රවණය කරණු මැනවි; මයා, මා විසින්; දීයමානං, දානය කරණු ලබන්නාවූ; යං තං දිබ්බන්නං, යම් ඒ දිව්‍යඅහරක්; පරිභුඤ්ජසි, වළඳන්නෙහිද; තං ඉදං අපි, ඒ මේද; තදා, එකල; දින්නදානස්ස එව, දෙනලද දානයාගේම; ඵලං සියා, ඵලය වන්නේය.

19 වූපසම්මති දුබ්භික්ඛභයං යාවෙත්ථ සීහළෙ,
තාවෙත්ථ වසීසිස්සෙහි වත්තබ්බං කරුණාය මෙ.

යාව, යම්තාක්; එත්ථ සීහළෙ, මේ සිංහලද්වීපයෙහි; දුබ්භික්ඛභයං, දුර්භික්ෂය; වූපසම්මති, සංසිඳේද; තාව, ඒතාක්; එත්ථ, මෙහි; වසීසිස්සෙහි, ශිෂ්‍ය භික්ෂූන් සමග; මෙ, මට; කරුණාය, කරුණා පිණිස; වත්තබ්බං, පිසිය යුතුයි.

20 චීවරං පිණ්ඩපාතඤ්ච භෙසජ්ජං සයනාසනං,
තව පුඤ්ඤානුභාවෙන හොන්ති සාධුතරං සදා.

සදා, හැමකල්හි; සාධුතරං, අතිශයින් යහපත්වූ; චීවරං පිණ්ඩපාතඤ්ච, සිවුරු හා පිණ්ඩපාතයද; භෙසජ්ජං සයනාසනං, බෙහෙත් හා සෙනසුන්ද (යන සිව්පසය); තව, නුඹවහන්සේගේ; පුඤ්ඤානුභාවෙන, පුණ්‍යමහිමයෙන්; හොන්ති, (ලැබෙන්නේ) වෙයි.

21 මා ගච්ඡන්තු භවන්තා හො ජම්බුදීපං කදාචි'පි,
සකිච්චපපසුතා හුත්වා දුක්ඛස්සන්තං කරොන්තු තෙ.

හො, පින්වත්නි; භවන්තා, භවත්හු; කදාචි අපි, කිසිකලෙකත්; ජම්බුදීපං, දඹදිවට; මා ගච්ඡන්තු, (ජීවත්වීම පිණිස) නොවඩිත්වා; තෙ, ඒ භවත්හු; සකිච්චපපසුතා හුත්වා, සිය කටයුත්තෙහි ඇළුනෝ වී, දුක්ඛස්සන්තං කරොන්තු, දුක් අවසන් කරත්වා.

22 පරිත්තකතමත්තස්ස දානෙන ඵලමීදිසං,
යො දෙති බහුභෙසජ්ජං කො ඵලං තස්ස භාසති.

පරිත්තකතමත්තස්ස, සවල්පවූ කෘත මාත්‍රයක්; දානෙන, දීමෙන් (ලැබූ); ඵලං, ඵලය; ඊදිසං, මෙබඳුයි; යො, යමෙක්තෙම; බහුභෙසජ්ජං, බොහෝ බෙහෙත්; දෙති, දේද; තස්ස, ඒ භෛෂජ්‍ය දායාගේ; ඵලං, විපාකය; කො, කවරෙක් තෙම; භාසති, කියාද ?

23 එකස්ස භික්ඛුස්ස'පි එකවාරං
දින්නස්ස දානස්ස ඵලං ඉදන්ති,
මන්ත්වා භවන්තා සති දෙය්‍යධම්මෙ
විචෙය්‍ය සද්ධාය දදන්තු දානං.

භවන්තා, පින්වත්නි තෙපි; එකස්ස භික්ඛුස්ස අපි, එක භික්ෂු කෙණෙකුට; එකවාරං, එකවරක්; දින්නස්ස දානස්ස, දෙනලද දානයාගේ; ඵලං, විපාකය; ඉදං ඉති, මේයයි; මන්ත්වා, දැන; දෙය්‍යධම්මෙ සති, දියයුතු දාන වස්තුව ඇතිකල්හි; විචෙය්‍ය, (සිල්වතුන්) තෝරා; සද්ධාය, සැදැහැයෙන්; දානං දදන්තු, දන් දෙව්.

**තම්බසුමනස්ථවිර වස්තුව-2.**

---

24 අනෙන පුඤ්ඤෙන භවෙ භවෙ'හං
මධූර මංසෙන ඝතෙන භිස්සං,
ලභෙය්‍යමග්ගං සුචි සාලිභත්තං
අනෙන තු නිබ්බාණපුරං භජෙය්‍යන්ති,

අහං, මම; අනෙන පුඤ්ඤෙන, මේ (කළාවූ) කුශල කර්මයෙන්; භවෙ භවෙ, උපනුපන් ජාතියෙහි; ඝතෙන මිස්සං, ගිතෙලින් මිශ්‍රවූ; අග්ගං, උතුම්වූ; සුචි, පිවිතුරුවූ; සාලිභත්තං, හැල් සාලේ බත්; මයූරමංසෙන, මොනර මස් සමග; ලභෙය්‍යං, ලබම්වා; අන්තෙතු, කෙළවර ජාතියෙහි වනාහි; නිබ්බාණපුරං, නිවන්පුරය (නිවන් සැප); භජෙය්‍යං ඉති, සෙවනය කෙරෙම්වා යි (ප්‍රාර්ථනා කෙළේය),

25 ඉමස්මිං භද්දකෙ කප්පෙ කස්සපො නාම නායකො,
උප්පජ්ජි ලොකනයනො සබ්බසත්තහිතෙ රතො.

ඉමස්මිං භද්දකෙ කප්පෙ, මේ මහාභද්‍ර කල්පයෙහි; ලොකනයනො, ලොවට ඇසක් වැනිවූ; සබ්බසත්තහිතෙ රතො, සියලු සත්වයන්ට වැඩ කැමැත්තාවූ; කස්සපො නාම නායකො, කසුප් නම් බුදුරජ් තෙම; උප්පජ්ජි, උපන් සේක.

26 මනොසිලාවික්කයිකො අහොසිං වාණිජො තදා,
තෙන කම්මෙන ජීවාමි ආහිණ්ඩන්තො තහිං තහිං.

තදා, එකල (මම); මනොසිලාවික්කයිකො, රත් සිරියල් සුණු විකුණන්නාවූ; වාණිජො අහොසිං, වෙළෙන්දෙක් වීමි; තහිං තහිං, ඒ ඒ තන්හි; ආහිණ්ඩන්තො, ඇවිදිමින්; තෙන කම්මෙන, ඒ වෙළඳමින්; ජීවාමි, (එකල) ජීවත්වෙමි.

27 අථෙකදා වණිජ්ජත්ථං ගමිං ජනපදං තදා,
තත්ථෙකස්මිං කුලෙ ජාතා දිස්වා මං කුලදාරිකා.

අථ, ඉක්බිති; එකදා, එක් දිනක්; වණිජ්ජත්ථං, වෙළඳම් පිණිස; ජනපදං, දනව්වකට; ගමිං, ගියෙමි; තදා, එකල්හි; තත්ථ, ඒ දනව්වෙහි; එකස්මිං කුලෙ, එක් කුලයෙක්හි; ජාතා, උපන්නාවූ; කුලදාරිකා, කුලදූරියක්, මං, මා; දිස්වා, දැක;–

28 ගහෙත්වාන මයා භණ්ඩං ඡාතජ්ඣත්තං මමද්දස,
තතො සා මොරමංසෙන ගණ්ඩිකෙන ඝතෙන ච,

29 සාලිභත්තං උපට්ඨාසි භුඤ්ජිතුං කරුණාය මෙ,
තතො දිස්වාන'හං භත්තං බුභුක්ඛං සුනඛං තදා.

මයා, මාගෙන්; භණ්ඩං, බඩු; ගහෙත්වාන, (මිලදී) ගෙණ; ඡාතජ්ඣත්තං, ක්ෂුධාවෙන් පීඩිතවූ; මං, මා; අද්දස, දුටුවාය; තතො, ඉක්බිති: සා, ඕතොමෝ; මෙ, මට; කරුණාය, දයාවෙන්; ගණ්ඩිකෙන, සුවඳ ඇත්තාවූ; ඝතෙන ච, ගිතෙලින්ද; මොරමංසෙන, මොනර මසින්ද (යුක්තවූ); සාලිභත්තං, හැල් බතක්; භුඤ්ජිතුං, අනුභව කරන්ට; උපට්ඨාසි, එළවූවාය; තතො, ඉක්බිති; තදා, එකල්හි; අහං, මම;

භත්තං, භ්‍රාන්තවූ; බුභුක්ඛං, බඩසා ඇති; සුනඛං, බල්ලෙකු;
දිස්වාන, දැක:-

30 සසතෙන භත්තපිණ්ඩෙන සහතපෙපන්වාන පත්ථියිං,
තෙනා'හං පුඤ්ඤකම්මෙන ගතො දෙවසහව්‍යතං.

සසතෙන, ගිතෙල් සහිතවූ; භත්තපිණ්ඩෙන, (මොනර මස් ස
හිත) බත් පිඩකින්; සන්තපෙපත්වාන, සතප්වා; පත්ථියිං, (මෙසේ)
ප්‍රාර්ථනා කෙළෙමි; අහං, මම; තෙන පුඤ්ඤකම්මෙන, ඒ කුශල ක
ර්මය කරණකොටගෙණ; දෙවසහව්‍යතං, දෙවියන් හා එකී භාවය
ට; ගතො, ගියේ (වෙමි).

31 රමනෙතා තත්ථ දෙවෙහි පාසාදෙ රතනාමයෙ,
මධුරෙහි නච්චගීතෙහි වාදිතෙහි ච මොදිතො.

තත්ථ, ඒ දෙව්ලොවෙහි; රතනාමයෙ පාසාදෙ, රුවන්මුවා පහ
යෙහි; දෙවෙහි, දෙවියන් හා; රමනෙතා, සිත් අලවමින්; මධුරෙහි,
මිහිරිවූ; නච්චගීතෙහි, නෘත්‍යයෙන් හා ගීතිකා වලින්ද; වාදිතෙහි
ච, වාද්‍යයෙන්ද; මොදිතො, සතුටු වූයෙමි:-

32 දෙවච්ඡරා පරිවුතො දෙවසෙනා පුරක්ඛතො,
භුත්වාන දිබ්බසම්පත්තිං දීඝමද්ධානමබ්භුතං.

දෙවච්ඡරාපරිවුතො, දෙවඟනන් විසින් පිරිවරණ ලද්දේ; දෙ
වසෙනා පුරක්ඛතො, දිව්සෙනග විසින් පෙරටු කරණ ලද්දේ; දීඝං
අද්ධානං, දීර්ඝ කාලයක් මුලුල්ලෙහි; අබ්භුතං, ආශ්චර්‍ය්‍යමත්වූ; දිබ්බ
සම්පත්තිං, දිව්සැපත්; භුත්වාන, අනුභව කොට:-

33 තතො චුතො මනුස්සෙසු පඤ්චජාතිසතෙ අහං,
මහද්ධනෙ මහාභොගෙ විසාලෙ ලොකසම්මතෙ.

34 පූජිතො ඤාතිසඞ්ඝෙහි ජාතො'හං උදිතෙ කුලෙ,
සම්පත්තිමනු භුජාමි කම්මානුච්ඡවිකං මම.

අහං, මම; තතො චුතො, එයින් චුතවූයේ; මනුස්සෙසු, මිනිස්
ලෙව්හි; පඤ්චජාතිසතෙ, පන්සියයක් ජාතියෙහි; මහද්ධනෙ, මහ
ත් ධන ඇති; මහාභොගෙ, මහත් උපභොග පරිභොග වස්තු ඇති;
විසාලෙ, විශාලවූ; ලොකසම්මතෙ, ලොකයා විසින් මැනවැයි සම්ම
තවූ; උදිතෙ කුලෙ, ප්‍රසිද්ධ කුලයෙහි; ජාතො, උපන්නෙමි; අහං, (ඒ)
මම; ඤාතිසඞ්ඝෙහි, බන්ධුවර්ගයා විසින්; පූජිතො, පුදන ලද්දෙමි;
මම, මාගේ; කම්මානුච්ඡවිකං, කුශලකර්මයට අනුරූපවූ; සම්පත්තිං,
(මිනිස්) සැපත්; අනුභුජාමි, අනුභව කෙරෙමි

35 සහ සප්පිමොරමංසෙන සාලිතණ්ඩුලකොදනං,
පඤ්චජාතිසතෙ නිච්චං ලබ්භති මම භොජනං.

පඤ්චජාතිසතෙ, පන්සියයක් ජාතියෙහි; මම, මට; සහ සප්පිමොරමංසෙන, ගිතෙල් හා මොනරමස් සමග; සාලිතණ්ඩුලකොදනං භොජනං, හැල්සාල් බත් බොදුන; නිච්චං, සතතයෙන්; ලබ්භති, ලැබෙයි.

36 චරිමෙ මෙ භවෙ'දානි තාදිසං භොජනං සදා,
ලභාමි පිණ්ඩස්සෙකස්ස * ඵලං පස්සථ භො මම.

ඉදානි, දැන්; මෙ, මාගේ; චරිමෙ භවෙ, (මේ) කෙළවර ආත්මභාවයෙහි; තාදිසං, එබඳුවූ; භොජනං, ආහාරය; සදා, හැම දවස්හි; ලභාමි, ලබමි; භො, භවත්නි; මම, මාගේ; එකස්සපිණ්ඩස්ස, එක බත් පිඩේ; ඵලං, විපාකය; පස්සථ, බලව් (නොහොත්-පිණ්ඩං, (මා දුන්) බත් පිඩද; එකස්ස ඵලං, (ඒ) එක බත් පිඩේ ඵලයද; පස්සථ, බලව්).

37 පුඤ්ඤවතො පුඤ්ඤඵලං මාරො'පි පටිසෙධිතුං,
නසක්කොති'ධ ලොකස්මිං අඤ්ඤො කො තං නිසෙධයෙ.

මාරො අපි, මාර තෙමේද; පුඤ්ඤවතො, පින් ඇත්තහුගේ; පුඤ්ඤඵලං,පි න්පල; පටිසෙධිතුං, ප්‍රතිෂෙධ කරන්ට (වළකන්නට); න සක්කොති, නොහැකිවෙයි; ඉධ ලොකස්මිං, මේ ලෙව්හි; අඤ්ඤො කො, අන් කවරෙක්; තං, ඒ (පින් පල); නිසෙධයෙ, වළකන්නේද? (නොහැක්කේමය).

38 තිරච්ඡානගතස්සා'පි යො භො දානං පදස්සති,
මං'ව භවෙසු සබ්බෙසු වින්දතෙ සො තිසම්පදං.

භො, පින්වත්නි; යො, යමෙක් තෙම; තිරච්ඡානගතස්ස අපි, (බලු කපුටු ආදී යම්කිසි) තිරිසන්ගතයෙකුටවත්; දානං, (කුසගන්නා පමණ) ආහාරයක්; පදස්සති, (කම්පල අදහා) දෙන්නේද; සො, හෙතෙම; මං ඉව, (සැපත් තෙමේ) මා (සගන්නා) සේම; සබ්බෙසු භවෙසු, සියලු භවයන්හි; තිසම්පදං, ත්‍රිවිධසම්පත්තිය; වින්දතෙ, ලබයි.

39 අප්පෙන දානවිධිනා'පි ජනො පනෙවං
අච්ඡෙරමබ්භුතතරං ලභතෙ විපාකං,
දානස්ස දානපතිනො'පි බහුප්පදස්ස
කො වා වදෙය්‍ය සුචිරම්පි ඵලං අබුද්ධො'ති

එවං, මෙසේ; අප්පෙනදානවිධිනා අපි, ස්වල්පවූ දානවිධියෙන් පවා; ජනො පන, (ශ්‍රද්ධාවත්) සත්වතෙම වනාහි; අච්ඡෙරං, ආශ්චර්‍ය්‍යවූ;

* "පිණ්ඩමෙකස්ස"

අබ්භුතතරං, අතිශයින් පුදුමවූ; විපාකං, කුසල්පල; ලභතෙ, ලබයි; සුචිරං, බෝකල් මුලුල්ලෙහි; බහුප්පදස්ස, බොහෝකොට දෙන්නාවූ; දානපතිනො අපි, දානපතීංගේ; දානස්ස, දානය සම්බන්ධ; ඵලං, (කුශල) විපාකය; අබුද්ධො, බුදුනොවූ; කො වා, කවරෙක් නම්; වණ්ණෙය්‍ය, කියන්නේද?

## ධුවපබ්බත භික්ඛුසම්බිර වණ්ණනාව-3.

---

40 තහිං තහිං රුක්ඛමූලෙ නිසින්නා රුක්ඛමූලිකා;
භාවෙන්ති භාවනා යත්ථ විහාරොපවනෙ සුභෙ.

සුභෙ, ශෝභන්වූ; විහාරොපවනෙ, විහාරය සම්බන්ධ සම්පවනයෙහි; තහිං තහිං, රුක්ඛමූලෙ, ඒ ඒ රුක් මුල්හි, නිසින්නා, වැඩඋන්නාවූ; රුක්ඛමූලිකා, වෘක්ෂමූලිකාඞ්ගධර භික්ෂූහු; යත්ථ, යම් විහාරයෙක්හි; භාවනා, භාවනාවන්; භාවෙන්ති, වඩත්ද.

41 තස්මිං තස්මිං විහාරස්මිං අබ්භොකාසික භික්ඛවො,
සුඤ්ඤාගාරෙ'භිරමන්ති ගහෙත්වා භාවනා'සුභං.

විහාරස්මිං, (යම්) විහාරයෙක්හි; අබ්භො කාසික භික්ඛවො, අබ්භොකාසිකාඞ්ගය රක්නා භික්ෂූහු; තස්මිං තස්මිං; ඒ ඒ අභ්‍යවකාශස්ථානයෙහිද; සුඤ්ඤාගාරෙ, ශූන්‍යාගාරවලද; අසුභං භාවනං, අසුභ (කර්මස්ථාන) භාවනාව; ගහෙත්වා, ගෙණ; අභිරමන්ති, සිත් අලවා වෙසෙත්ද.

42 එකචාරිකහත්ථී'ව මණිවමෙමන චම්මිනා,
කසිණාදයො විභාවෙන්තා රමන්ති පංසුකූලිකා.

මණිවමෙමන චම්මිනා, මාණික්‍යසන්නාහයෙන් සන්නද්ධවූ; එකචාරික හත්ථී ඉව, තනිව හැසිරෙණ ගඳැතුන්මෙන්; පංසුකූලිකා, පාංශුකූලිකාඞ්ගය රක්නා භික්ෂූහු; කසිණාදයො, (නීල පීතාදි) කසිණාදිවුන් ඈ; විභාවෙන්තා, වඩමින්; රමන්ති, (යම් විහාරයෙක්හි) සිත් අලවා වෙසෙත්ද.

43 යත්ථ සොසානිකා භික්ඛූ සුසානෙ'භිරමන්ති හි,
බුද්ධපුත්තා මහානාගා නිච්චං මරණසඤ්ඤිනො.

යත්ථ, යම් විහාරයෙක්හිවූ; බුද්ධපුත්තා, සර්වඥපුත්‍රවූ; මහානාගා; මහාශ්‍රේෂ්ඨවූ; සොසානිකා භික්ඛූ, සොසානිකාඞ්ගය රක්‍ෂාකරණ මහණහු; නිච්චං, සතතයෙන්; මරණසඤ්ඤිනො, මරණසංඥ ඇත්තෝ; සුසානෙ, සොහොනෙහි; අභිරමන්ති, අභිරමනය කෙරෙත්ද.

44 මෙත්තාකරුණාමුදිතා ච භාවෙන්තා පිණ්ඩපාතිකා,
රමන්ති තෙ විහාරස්මිං යත්‍ථ සම්බුද්ධසාවකා.

පිණ්ඩපාතිකා, පිණ්ඩපාතිකාඞ්ගය රක්නාවූ; මෙත්තාකරුණා මුදිතා ච, මෙත්තා, (සතුරාට පවා මෙත් කිරීමවූ) මෛත්‍රියද; කරුණා, (අනුන්ගේ දුකට හිතකම්පාවන සවභාවවූ) කරුණාවද; මුදිතා ච; (අනුන්ගේ සම්පතට සතුටුවීමවූ) මුදිතාවද (යන භාවනාවන්); භාවෙන්තා, වඩන්නාවූ; තෙ සම්බුද්ධසාවකා, ඒ සම්බුදුසව්වෝ; යත්‍ථ විහාරස්මිං, යම් විහාරයෙක්හි, රමන්ති, සිත්අලවා වෙසෙත්ද.

45 නෙසජ්ජිකෙකාසනිකා නිසීදිත්වා තහිං තහිං,
යහිං නිච්චං විභාවෙන්ති බුද්ධානුස්සති ආදිකං.

නෙසජ්ජිකෙකාසනිකා, නෙසජ්ජික, නෙසජ්ජිකාඞ්ගධාරීහුය; එකාසනිකා, එකාසනිකාඞ්ගධාරීහුය යන මොහු; යහිං, යම් විහාරයෙක්හි; තහිං තහිං, ඒ ඒ තන්හි; නිසීදිත්වා, වැඩහිඳ; නිච්චං, අනවරතයෙන්; බුද්ධානුස්සති ආදිකං, බුද්ධානුස්මෘති ආදි භාවනා; විභාවෙන්ති, වඩත්ද.

46 සීලවන්තා ගුණවන්තා බුද්ධසාසනකාරකා,
නිවසන්ති යහිං තත්‍ථ සම්පත්තො චූළනිස්සකො.

සීලවන්තා, සිල්වත්වූ; ගුණවන්තා, ගුණවත්වූ; බුද්ධසාසනකාරකා, බුද්ධශාසනාකාරක (බුදුන්ගේ අනුශාසනා පරිද්දෙන් පිළිපදනා) භික්ෂූහු; යහිං, යම් විහාරයෙක්හි; නිවසන්ති, වෙසෙත්ද; තත්‍ථ, එහි (හෙවත් ඒ විහාරයට); චූළනිස්සකො, චූලනිස්ස නම් ඇමති තෙම; සම්පත්තො, පැමිණියේය.

47 අප්පිච්ඡසන්තුට්ඨවිවෙකකාමිනං
තපොධනානං පරිසුද්ධසීලිනං,
දිස්වාන පූතං මධුරං සභාවං
න කස්ස චිත්තස්ස කරොති පීතිං.

අප්පිච්ඡසන්තුට්ඨවිවෙකකාමිනං, අප්පිච්ඡ, (ප්‍රත්‍යය ලාභයෙහි) අපිස්බව ඇත්තාවූ; සන්තුට්ඨ, (යථාලාභ වශයෙන්) සතොස් බව ඇත්තාවූ; විවෙකකාමිනං, විවෙක සැප කැමැතිවූ; තපොධනානං, තපස් ම ධනකොට ඇත්තාවූ; පරිසුද්ධසීලිනං, පිරිසිදු සිල් ඇත්තාවූ; (තපස්වි වරයන්ගේ); පූතං, පවිත්‍රවූ; මධුරං සභාවං, උත්තම ස්වභාවය; දිස්වාන, දැක; කස්ස චිත්තස්ස, කවරෙකුගේ සිතට; පීතිං න කරොති, ප්‍රීති නොකෙරේද?.

48 අහො අච්ඡරියං එතං අබ්භුතං ලොමහංසනං,
අප්පස්ස පුඤ්ඤකම්මස්ස ආනුභාවමහන්තතා.

අප්පස්ස පුඤ්ඤකම්මස්ස, මදවූ කුශලකර්‍මයාගේ; ආනුභාව මහන්තතා, ආනුභාවය සම්බන්ධ මහත්ත්වය; අහො අච්ඡරියං, අහො ආශ්චර්‍ය්‍යයි; එතං, මෙය; අබ්භුතං, පුදුමයි; ලොමහංසනං, (ඇසූවන්) ලොමුදැහැගන්වන්නේ වේ.

49 අතීතෙ භික්ඛුසඞ්ඝස්ස දත්වාන සක්ඛරොදකං,
ලද්ධො සොදධිපානීයං මධුරං පරිවත්තිතං.

අතීතෙ, ඉකුත්කාලයෙහි; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාට; සක්ඛරොදකං, සකුරුපැනක්; දත්වාන, දානය කොට (එම අනුසසින්); සො, හෙතෙම; පරිවත්තිතං, (මධුරබවට) පෙරළුනාවූ; මධුරං, (එහෙයින්) මිහිරිවූ; උදධිපානීයං, මුහුදු පැන්; ලද්ධො, ලැබූයේය.

50 පානීයමත්තෙන'පි කෙචි ලොකෙ
එවං මහන්තං විභවං ලභන්ති,
බහුප්පදානස්ස නරස්ස ලොකෙ
වදෙය්‍ය කො නාම මහාවිපාකං.

ලොකෙ, ලොකයෙහි; කෙචි, කිසිවෙක්; පානීයමත්තෙන අපි, පැන් පමණකිනුදු (දන්දීමෙන්); එවං, මෙසේ; මහන්තං විභවං, මහත්වූ සම්පත්; ලභන්ති, ලබත්: ලොකෙ, ලෙව්හි; බහුප්පදානස්ස නරස්ස, බොහෝ දෑදෙන්නාවූ සත්ත්වයාහට (ලැබෙන්නාවූ); මහාවිපාකං, මහත්වූ විපාකය; කො නාම, කවරෙක් නම්; වදෙය්‍ය, කියන්නේද ?.

## චූලතිස්ස වණ්ණනා—4.

---

51 අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සඞ්ගරන්තෙන මහාසෙනෙන මච්චුනා.

ආතප්පං, උත්සාහය; අජ්ජ එව, අදම; කිච්චං, කටයුතුයි; සුවෙ, සෙටදවස්හි; මරණං, මරණය; කො, කවරෙක් (නම්), ජඤ්ඤා, දන්නේද; මහාසෙනෙන, මහත් සෙනා ඇති; තෙන මච්චුනා, ඒ මරහු හා සමග; නො, අපගේ; සඞ්ගරං, විශ්වාසයක් නොහොත් කතිකාවක්; නහි, නැත්තේය.

52 තස්මා තං සාමි ඵාබං වා පණීතං වා'පි ලද්ධකං,
දානං දදම සඞ්ඝස්ස බණ්ණෙ වෙ මා උපච්චගා.

තස්මා; එහෙයින්; සාමි; ස්වාමීනි; තං, එය; ලූඛං වා, රූක්ෂ වේවයි; පණීතං වා අපි, ප්‍රණීත හෝ වේවයි; ලද්ධකං, ලබනලද්දක්; සඞ්ඝස්ස, සඟහට; දානං දදාම, දන් දෙමු; ඛණො, ක්ෂණ සම්පත්තිය; වෙ, එකාන්තයෙන්; මා උපච්චගා, (අප) ඉක්ම නොයාවා.

53 උචිතං නොචිතං එතං නෙව ජානන්ති මොහිතා,
කාතබ්බඤ්ච න කාතබ්බං කාරණාකාරණං තථා.

මොහිතා, මොහයෙන් මූඪවූ සත්වයෝ; එතං, මෙය; උචිතං, සුදුසුය; නොචිතං, මේ නුසුදුසුයයි; නෙව ජානන්ති, නොදනිත්; කාතබ්බඤ්ච, කටයුතුද; න කාතබ්බං, නොකටයුතුද; තථා, එසේම; කාරණාකාරණං, කරුණු නොකරුණුද; නෙව ජානන්ති, නොදනිත්මය.

54 පස්සන්ති ඉහ ලොකං තෙ න තෙ පස්සන්ති ආයතිං,
න පස්සන්තා තථා මොහා ගරහා තෙ න මුච්චරෙ.

තෙ, ඒ මොහී සත්වයෝ; ඉහ ලොකං, මේ ලොව (පමණක්); පස්සන්ති, බලත්, තෙ, ඔව්හු; ආයතිං, පරලොව; න පස්සන්ති, නොබලත්; තථා, එසේ, න පස්සන්තා, (පරලොව) නොබලන්නාවූ; තෙ මොහා, ඒ මූඪයෝ; ගරහා, ගැරහීමෙන්, න මුච්චරෙ, නොමිදෙත්.

55 එවං අනත්ථදෙ මොහො අනිට්ඨඵලදෙ සදා,
සබ්බෙසං පන සත්තානං මනස්මිං නෙව වත්තතූ'ති.

එවං, මෙසේ; සදා, හැමකල්හි; අනත්ථදෙ, අවැඩදායකවූ; අනිට්ඨඵලදෙ, අනිටුවිපාකදායකවූ; මොහො, මොහය තෙම; සබ්බෙසං සත්තානං පන, හැම සතුන්ගේ; මනස්මිං, සිත්හි; නෙව වත්තතු, නහමක් පවතීවා (හෙවත් සිත්හැර යේවා).

56 කුජ්ඣන්ති භීමා භුජගා සති හෙතුම්හි කාරණෙ,
අසන්තෙ'පිච කුජ්ඣන්ති නරාධමභුජඞ්ගමා'ති.

භීමා, බියඑලවන්නාවූ; භුජගා, සර්පයෝ; කාරණෙ, (කිපෙන්ට නිසි) කාරණයවූ; හෙතුම්හි සති, හෙතුවක් ඇතිකල්හි; කුජ්ඣන්ති, කිපෙත්; නරාධමභුජඞ්ගමා, මනුෂ්‍යාධම නැමැති සර්පයෝ; කාරණෙ අසන්තෙ අපි ච, කාරණයක් නැති කල්හිද; කුජ්ඣන්ති, කිපෙත්.

57 එවං නරා අප්පධනා දළිද්දා, වඩ්ඪෙත්ව සද්ධං රතනත්තයම්හි,
ලභන්ති සම්පත්තිමනුත්තමග්ගං වඩ්ඪෙථ තස්මා රතනෙසු සද්ධං.

එවං, මෙසේ; අප්පබුද්ධනා, මඳවූ වඤතුඇති; දළිද්ද, දිළිඳුවූ; නරා; මනුෂ්‍යයෝ; රතනත්තයේහි, ත්‍රිවිධ රත්නයෙහි, සද්ධං, ශ්‍රද්ධාව; වඩ්ඪෙ ත්වා, වඩා; අනුත්තං, ඌනනුවූ; අග්ගං, උතුම්වූ; සම්පත්තිං, සැප; ල භන්ති, ලබත්; තස්මා, එහෙයින් (තෙපි); රතනෙසු, තුන්රුවන් කෙරෙහි; සද්ධං, සැදෑ; වඩ්ඪෙථ, වඩව්.

**තිස්සාය වසනාව—5.**

---

58 සද්ධෙන කුලපුත්තෙන පබ්බජිත්වාන සාසනෙ,
පාලෙතබ්බමසෙසෙන පාතිමොක්ඛං ච සංවරං.

සද්ධෙන කුලපුත්තෙන, සැදැහැවත් කුලපුත්‍රයා විසින්; සාස නෙ, බුදුසස්නෙහි; පබ්බජිත්වාන, පැවිදිව; පාතිමොක්ඛං ච සංවරං, ප්‍රාතිමොක්ෂ සංවරශීලය; අසෙසෙන, නිරවශෙෂයෙන්; පාලෙතබ්බං, රක්ෂා කටයුත්තේය.

59 චක්ඛුසොතාදිවාරානි රූපසද්දාදිගොචරෙ,
වාරෙතබ්බා සදා තෙන සද්ධෙන්ද්‍රියසංවරං.

රූපසද්දාදිගොචරෙ, රූප ශබ්දාදි පංචාලම්බනයෙහිවූ; චක්ඛුසො තාදිවාරානි, චක්ෂුශ්ශ්‍රොත්‍රාදි පංචද්වාරයෝ; වාරෙතබ්බා, (ශුභනිමිත්ත ග්‍රහණ නොවනසේ) සංවරණය කටයුතුයි; සද්ධෙන, සැදැහැති; තෙ න, ඔහු විසින්; සදා, හැමකල්හි; ඉන්ද්‍රියසංවරං, ඉන්ද්‍රියසංවරශීලය (රක්ක යුත්තේය).

60 අනෙසනං පහත්වාන සුද්ධාජීවෙන සබ්බදා,
ආජීවසීලං පාතබ්බං ජීවිතං විය අත්තනො.

සුද්ධාජීවෙන. පිරිසිදු ආජීවය ඇත්තාහු විසින්; අනෙසනං, (වෙ ළඳනාදි එක්විසි) අනෙසනයන්; පහත්වාන, දුරුකොට; අත්තනො, තමාගේ; ජීවිතං විය, ජීවිතයමෙන්; සබ්බදා, හැමකල්හි; ආජීව සී ලං, ආජීවපාරිශුද්ධිශීලය; පාතබ්බං, රක්කයුතුයි.

61 චත්තාරො පච්චයෙ නිච්චං සෙවමානෙන යොනිසො,
පච්චයසන්නිස්සිතං සීලං පාලෙතබ්බං සදාදරා.

චත්තාරො පච්චයෙ, සතර පස; යොනිසො, නුවනින් (ප්‍රත්‍ය වෙක්ෂාකොට); නිච්චං, නිතර; සෙවමානෙන, සෙවනකරන්නහු විසින්; ආදරා, ආදරයෙන්; පච්චයසන්නිස්සිතං සීලං, ප්‍රත්‍යයසංනිශ්‍රිත ශීල ය; සදා, හැමකල්හි; පාලෙතබ්බං, රක්ෂා කටයුත්තේය.

62 එතං චතුබ්බිධං සීලං පූරයන්තො ජිනත්‍රජො,
සග්ගාපවග්ගසම්පත්තිමවස්සමනුභොස්සති.

එතං, මේ; චතුබ්බිධං සීලං, සිව්වැදෑරුම් ශිලය; පූරයන්තො, (නිර්මලකොට) පූරන්නාවූ; ජිනත්‍රජො, සර්‍වඥපුත්‍රතෙම; සග්ගාපව ග්ගසම්පත්තිං, සගපවග සැප; අවස්සං, එකාන්තයෙන්; අනුභො ස්සති, වළඳන්නේය.

63 යො රාගදොසමොහෙහි අපූරෙන්තො අනාදරා,
සීලෙස්වාලසිකො හුත්වා නිරයං සොපපජ්ජති.

යො, යමෙක්තෙම; සීලෙසු, ශිලයන්හි; ආලසිකො හුත්වා, අල ස බැව් ඇත්තෙක් වී; රාගදොසමොහෙහි, රාගද්වෙෂමොහවලින් යුක්තවූයේ; අනාදරා; අනාදරින්; අපූරෙන්තො, (සිල්) නොපුරන් නේ වේද; සො, හෙතෙම; නිරයං, නරකයෙහි; උපපජ්ජති, උපදී.

64 දායකෙ සො න තොසෙති සයං වා සො න තුස්සති,
ජිවාලාතසමො හොති නින්දිතො හොති විඤ්ඤුනා.

සො, ඒ මහණතෙම; දායකෙ, (සිවුපසයෙන් උවටැන්කරණ) දායකයන්; න තොසෙති, සතුටුනොකෙරෙයි; සයං වා, තෙමේ හෝ; න තුස්සති, සතුටු නොවේ; සො, හෙතෙම; ජිවාලාතසමො හොති, සොහොන්පෙනෙල්ලක් සමානවෙයි; විඤ්ඤුනා, නුවණැත්තන් වි සින්, නින්දිතො හොති, නින්දාකරණලද්දෙක් වෙයි.

65 තස්මා තං පරිපූරෙතුමසක්කොන්තෙන භික්ඛුනා,
නාලිම්පිත්වාන මීළ්හෙන ගන්තබ්බං සත්‍ථුසාසනං'ති.

තස්මා, එහෙයින්; තං, ඒ(චතුපාරිශුද්ධි ශිලය); පරිපූරෙතුං, පරිපූ රණය කරන්නට; අසක්කොන්තෙන, නොහැක්කාවූ; භික්ඛුනා, මහණ විසින්; සත්‍ථුසාසනං, බුදුසස්න; මීළ්හෙන, (දුශ්චරිත නැමැති) අමෙධ්‍යයෙන්; නාලිම්පිත්වාන, ආලිම්පනය නොකොට (අශුචි නො ගා); ගන්තබ්බං, යායුතුයි (මහණවෙස් හැර ගිහිභාවයට පැමිණිය යුතුයි සේයි).

66 කසිං වාථ වණිජ්ජං වා අකත්වා තව සාමිකො,
කුලවංසං පතිට්ඨෙති කථං නික්කම්මසීලකො.

නික්කම්මසීලකො, නිෂ්කර්මසිල්වූ (ජීවනොපාය කර්මයක් නැත් තාවූ); තව, තීගේ; සාමිකො, හිමිතෙම; කසිං වා, ගොවිතැනක් හෝ; අථ, නවද; වණිජ්ජං වා, වෙළඳාමක් හෝ; අකත්වා, නොකොට; කුල වංසං, කුලවංශය; කථං, කෙසේ; පතිට්ඨෙති, පිහිටුවයිද. ?

67 පුත්තදාරෙහි ඤාතීහි කුලං වඩ්ඪෙතුමිච්ඡතා;
සබ්බදා නාලසො හුත්වා වායිතබ්බං සබ්බකම්මසු.

පුත්තදාරෙහි, අඹුදරුවන්ගෙන් හා; ඤාතීහි, නෑයන්ගෙන්; කුලං, කුලය; වඩ්ඪෙතුං; වර්ධනය කරන්ට; ඉච්ඡතා, කැමැත්තහු විසින්; සබ්බදා, සියලු කල්හි; සබ්බකම්මසු, සියලු කර්මයන්හි; අනලසො හුත්වා, (යම්සේ) අලසනුවූවෙක් (වේ නම් එබන්දෙක්) වී; වායිතබ්බං, විසිය යුතුයි.

68 ඛෙත්තවත්ථූසු දාසෙසු ගොමහිසෙසු වනෙසු ච,
නාලසො පූජිතො හොති සජනෙ පරජනෙහි සො.

ඛෙත්තවත්ථූසු, කෙත් වත්හිද; දාසෙසු, දාසුන් කෙරෙහිද; ගොමහිසෙසු, ගවමහිසයන් කෙරෙහිද; වනෙසු ච, වනයෙහිද (යන මේ සියල්ලෙහි); න අලසො, අලස නොවූ; සො, හෙතෙම; සජනෙ, ස්වකීය ජනයා කෙරෙහි; පූජිතො හොති, පුදනලද්දේ වේ; පරජනෙහි, සෙසුජනයන් විසින්ද; පූජිතො හොති, පුදනලද්දේ වේ.

69 සිතුණ්හාදිමචින්තයතා සහතා කායිකං දුඛං,
කාලාකාලං සමඤ්ඤාය කාතබ්බං විරියං සදා.

සීතුණ්හාදිං, ශීතොෂ්ණාදිය; අචින්තයතා, නොසිතමින්; කායිකං දුඛං, කායික දුක; සහතා, ඉවසන්නහු විසින්; කාලාකාලං, කල්නොකල්; සමඤ්ඤාය, දැන; සදා, හැමකල්හි; විරියං, වීර්යය; කාතබ්බං, කටයුත්තේය.

70 තථා වණිජ්ජකම්මෙහි සිප්පුග්ගහණධාරණෙ,
අතන්දිතෙන කත්තබ්බං අමරතා විය සබ්බදා'ති.

තථා, එපරිද්දෙන්ම; වණිජ්ජකම්මෙහි, වෙළඳාම් කිරීමෙහිද; සිප්පුග්ගහණධාරණෙ, සිප්උගැන්මය දැරීමය යන මෙහිද; අතන්දිතෙන, අලසනොවූවහු විසින්; සබ්බදා, හැමකල්හි; අමරතා විය, නොමැරෙන්නෙකු මෙන්; කත්තබ්බං ඉති, (වීර්ය) කටයුත්තේමැයි.

71 මාතාපිතා ච භාතා ච පුත්තදාරා ච ඤාතකා,
දළිද්දං නෙව කාමෙන්ති එවං ලොකෙසධම්මතා.

මාතාපිතා ච, මව්ද පියාද; භාතා ච, සොහොවුරුද; පුත්තදාරා ච, පුත්‍ර භාර්යාවෝද; ඤාතකා, නෑයෝද; දළිද්දං, දිළින්දා; නෙව කාමෙන්ති, නොකැමැති වෙත්; එවං, මෙසේ; එසො, මෙය; ලොකෙ, ලොකයෙහි; ධම්මතා, ස්වභාවධර්මයි.

72 අකුලීනො'පි චෙ හොති සධනී චාථ සො පහූ,
තං වෙ සබ්බෙ උපාසන්ති එවං ලොකෙස ධම්මතා'ති.

අකුලීනොපි, කුලීනනොවූයේ නමුදු (චණ්ඩාලාදී නීචකුලයෙහි උපන්නේ නමුත්);වෙ,ඉදින්;සො, හෙතෙම; භොගී, භොගසම්පත් ඇත්තේද;සො,හෙතෙම; ධනීවා, ධන ඇත්තේහෝ වේද;අථ,යලිදු;පභූ, අධිපතියෙක් වේද; තං, ඔහු (එසේවූ ඉසුරුමත් නැනැත්තා), වෙ, එකාන්තයෙන්; සබ්බෙ, සියල්ලෝම; උපාසන්ති, සෙවනය කෙරෙත් (හෙවත් ඔහුකරා එලඹෙත්);එවං, මෙසේ, එසො, මෙය; ලොකෙ, ලෙව්හි; ධම්මතා, සවභාවධර්මයයි.

73 ඉදඤ්චිදඤ්ච බො අජ්ජ දින්නං මෙ චීවරාදිකං,
සුඛුමං සුඛසම්ඵස්සං මඤ්චපීඨාදිකං තථා.

මෙ, මා විසින්; අජ්ජ, අද; සුඛුමං, සියුම්වූ; චීවරාදිකං, සිවුරු පිළී ආදී පරිෂ්කාරද; තථා, එසේම; සුඛුමං, සියුම්වූ; සුඛසම්ඵස්සං, (ශරීරයට) සුවපහස් දෙන්නාවූ; මඤ්චපීඨාදිකං, ඇඳ පුටු ආදි සෙනසුන්ද (යන); ඉදඤ්ච ඉදඤ්ච බො, මේ මේ දෙය වනාහි; දින්නං, දෙනලද්දේය.

74 මධුරෙහි අන්නපානෙහි ඛජ්ජභොජ්ජෙහි තප්පිතො,
තම්බූලමුඛවාසාදි භෙසජ්ජෙහි ච සාධුකං.

මධුරෙහි, මිහිරිවූ; අන්නපානෙහි, ආහාරපානවලින්ද; ඛජ්ජභොජ්ජෙහි, ඛාද්‍යභොජ්‍යවලින්ද; තම්බූලමුඛවාසාදි, මුඛ සුගන්ධකරණ (කපුරුතකුල්ආදී පස්පලවතින් යුත්) බුලත් ආදිකොට ඇති; භෙසජ්ජෙහි ච, (ගිතෙල් මී උක්සකුරු ආදීවූ) බෙහෙත්වලින්ද; සාධුකං, මොනවට; තප්පිතො, සන්තර්පණය කරණලද්දේය.

75 ඉතො'ධිකං කථං සෙව'හං සම්පාදෙත්වාන සාධුකං,
දස්සාමී'ති විචාරෙන්තී අච්ඡි දසිගණෙහි සා'හි.

අහං, මම; සෙව, සෙට; ඉතො අධිකං, මීටවඩා (දානොපකරණයක්); කථං, කෙසේ; සම්පාදෙත්වාන, සපයාගෙණ; සාධුකං, මනාකොට; දස්සාමි ඉති, දෙන්නෙම්දැයි; සා, ඕතොමෝ; දසිගණෙහි, දසී සමූහයා සමග; විචාරෙන්තී, විචාරණය කරමින්; අච්ඡි, උන්නාය.

76 කතපුඤ්ඤො යදා මච්චුවෙගෙන අද්දිතො පන,
එඤ්ජන්තො සයිතො හොති සයනෙ මාරණන්තිකෙ.

කතපුඤ්ඤො පන, කරණලද පින් ඇත්තේ වනාහි; යදා, යම් කලෙක්හි; මච්චුවෙගෙන, මරණ වෙගයෙන්; අද්දිතො, පීඩිතවූයේ; එඤ්ජන්තො, සැලෙමින්; මාරණන්තිකෙ සයනෙ, මරණාන්තයෙහිවූ යහනෙහි; සයිතො හොති, හොත්තේ වේද.

77 යානිස්ස තම්හි සමයෙ කල්‍යාණානි කතානි හි,
තානිස්ස තම්හි සමයෙ අජ්ඣාලම්බන්ති මානසං.

තම්හි සමයෙ, එසමයෙහි; අස්ස, ඔහු විසින්; කතානි, කරණ ලද; යානි කල්‍යාණානි, යම් පුණ්‍යයෝ වෙද්ද; තානි හි, ඒ කුශලධර්මයෝ වනාහි; තම්හි සමයෙ, ඒ කාලයෙහි; අස්ස, ඔහුගේ, මානසං, සිත; අජ්ඣාලම්බන්ති, ආලම්බනය කෙරෙත් (එල්බගෙණ සිටිත්).

78 තදා ඉට්ඨනිමිත්තානි අනුකූලානි දිස්සරෙ,
අග්ගයානවිමානාදී සග්ගගාමිස්ස ජන්තුනො.

තදා, එවේලෙහි; සග්ගගාමිස්ස, ස්වර්ගයට යන්නාවූ; ජන්තුනො, සත්වයාහට; අග්ගයානවිමානාදි, උතුම් දිව්‍යරථ දිව්‍යවිමාන ආදි; අනුකූලානි, (ඊට) අනුරූපවූ; ඉට්ඨනිමිත්තානි, ඉෂ්ටනිමිත්තයෝ; දිස්සරෙ, පෙණෙත්.

79 අච්ඡරාගණසංඝුට්ඨෙ අච්ඡරාසතමණ්ඩිතෙ,
විමානයානෙ දිස්වාන හොති තස්ස උදග්ගතා.

අච්ඡරාගණසංඝුට්ඨෙ, දිව්‍යාප්සරා සමූහයා විසින්ද නෘත්‍යගීතවාද්‍යාදියෙන් ඝොෂිතවූ; අච්ඡරාසතමණ්ඩිතෙ, සියගණන් දිව්‍යාඞ්ගනාවන්ගෙන් ප්‍රතිමණ්ඩිතවූ; විමානයානෙ, දෙව්විමන් හා දිව්‍යරථයන්; දිස්වාන, දැක; තස්ස, ඕහට; උදග්ගතා හොති, ඔද වැඩි සිත් ඇති බව වෙයි.

80 තදා සො පරමස්සාසං ලභතෙ දායකො නරො,
චජිත්වා ජිණ්ණකං සාලං පාසාදාරොහණෙ විය.

තදා, එකල්හි; දායකො, දායකවූ; සො නරො, ඒ මිනිස්තෙම; ජිණ්ණකං සාලං, දිරාගිය ගෙයක්; චජිත්වා, හැර; පාසාදාරොහණෙ විය, පහයකට නැගීමෙහි මෙන්, පරමස්සාසං, උත්කෘෂ්ටවූ ආශ්වාසයක් (උතුම් සැනසීමක්); ලභතෙ, ලබයි,

81 සුකතං වත කල්‍යාණං භීරුත්තාණං කතං මයා,
උළාරං අනුභොස්සාමි සග්ගෙ කුසලජං ඵලං.

මයා, මා විසින්; කල්‍යාණං, පින්; වත, ඒකාන්තයෙන්; සුකතං, මොනවට කරණ ලද්දේය; භීරුත්තාණං, භයට රක්ෂාස්ථානයක්; කතං, කරණ ලද්දේය (එහෙයින්); සග්ගෙ, ස්වර්ගයෙහි; කුසලජං, කුශලයෙන් උපන්නාවූ; උළාරං ඵලං, උදාරවූ විපාක ඵල; අනුභොස්සාමි, අනුභව කරන්නෙමි.

82 ඉති සො සම්පහට්ඨොව අභීතො සම්පමොදිතො,
සකෙන පුඤ්ඤකම්මෙන අච්චනතමුපලාලිතො.

ඉති, මෙසේ; සො, හෙතෙම; සම්පහට්ඨො එව, සතුටුවූයේම; අභීතො, බියපත්නුවූයේ; සම්පමොදිතො, අත්‍යන්තනම්යෙන්මුදිතවූයේ; සකෙන පුඤ්ඤකම්මෙන, ස්වකීය පුණ්‍යකර්‍මය කරණකොටගෙණ; අච්චනතං, අතිශයින්; උපලාලිතො, උපලාලනය (සන්‍තර්පණය) කරණලද්දේවේ.

83 පුඤ්ඤකම්මරතාවාසං සග්ගං නියාති පණ්ඩිතො,
අමුළ්හමරණං තස්ස නියතං පුඤ්ඤකම්මිනො'ති.

පණ්ඩිතො, (ඒ) පණ්ඩිතතෙම; පුඤ්ඤකම්මරතාවාසං, පුණ්‍යකර්මයෙහි ඇලුනාවුන්ට වාසස්ථානවූ; සග්ගං, දෙව්ලොවට; නියාති, පැමිණෙයි; තස්ස පුඤ්ඤකම්මිනො, ඒ පින්කම්කළාහට; අමුළ්හමරණං, අසම්මූළ්හමරණය; නියතං, එකාන්තයි.

84 කිං චිරායසි තත්ථෙව නිස්සාරෙ මානුසෙ භවෙ,
ජහිත්වා අසුචිං පූතිං දෙහං කිමිකුලාලයං.

85 ආගච්ඡථා'සු එත්ථෙදං සුඛං දෙවසිරිං වරං,
අහමාගතා පුරෙයෙව තුසිතං යාමි'දානි හො'ති.

නිස්සාරෙ, කිසි සාරයක් නැත්තාවූ; මානුසෙ භවෙ, මිනිසත්බැවිහි; කිං චිරායසි, කුමක්පිණිස පමාවන්නෙහිද; කිමිකුලාලයං, (අසූකුලයෙහි) පණුවන්ට වාසස්ථානවූ; අසුචිං, අපවිත්‍රවූ; පූතිං දෙහං, කුණුවූ ශරීරය; තත්ථෙව, එහිම; ජහිත්වා, හැර;—ආසු, වහා; ආගච්ඡථ, අවමැනව; එත්ථ, මෙහි; වරං, උතුම්වූ; දෙවසිරිං, දිව්‍යශ්‍රී; ඉදං, මේ; සුඛං, (දිව)සැප(බලනුමැනව); අහං, මම; පුරෙ එව, පළමුකොටම; ආගතා, ආයෙමි, හො, පින්වත් හිමියානෙනි; ඉදානි, දැන්; තුසිතං, තුෂිතදිව්‍යලොකයට, යාමි ඉති, යමියි කීවාය.

86 පරමචරිතමෙතං ඤාණවතානං විදිත්වා
දිවිමනුජසුඛං වා නිබ්බුතිං පත්ථයනතා,
දදථ විමලසීලෙ බුද්ධපුත්තෙසු දානං
සුරතරුසදිසං භො කාමදං ආභවග්ගං'ති.

ඤාණවතානං, නුවණැත්තන්ගේ; එතං පරමචරිතං, මේ උතුම්චරිතය; විදිත්වා, දැන; දිවිමනුජසුඛං වා, දෙව්මිනිස්සැපද; නිබ්බුතිං වා, නිර්‍වාණසම්පත්තියද; පත්ථයනතා, ප්‍රාර්ථනාකරන්නාවූ (තෙපි); විමලසීලෙ, පිරිසිදුසිල්ඇති; බුද්ධපුත්තෙසු, බුදුසුතනුවන්ට; දානං දදථ,

දන්දෙව්, හො, භවන්ති (ඒ දනය); ආභවග්ගං, භවාග්‍රයදක්වා; කා මදං, කාමාභිදයකවූ; සුරතරුසදිසං, දිව්‍යවෘක්ෂයක්මෙනි.

## අජිසශාලතිස්ස වස්තුව—6.

87 සද්ධාව මූලං දනස්ස සද්ධාමූලා හි සම්පදා,
සද්ධෙන කතමප්පම්පි දනං හොති අකාලිකං.

දනස්ස, දන්දීමට; සද්ධා එව, ශ්‍රද්ධාවම; මූලං, මුල්වන්නේය; සම්පදා, (සියලු) සම්පත්; සද්ධාමූලා හි, ශ්‍රද්ධාවම මුල්කොට ඇතිවය; සද්ධෙන, සැදූ ඇත්තහු විසින්; කතං, කරණලද; අප්පම්පි දනං, මඳවූද දනය; අකාලිකං හොති, කල්නොයවාවිපාකදෙන්නේවෙයි

88 දනං නිදනං සග්ගස්ස නිධානං අනුගාමිකං,
සබ්බලොකවසීකාරං මන්තං තං පරමොසධං.

දනං, දන්දීම නම්; සග්ගස්ස, සගසැප (ලැබීම) ට; නිදනං, මූල කාරණයි; අනුගාමිකං නිධානං, (ඒපින් තමන්කැටුව යනහෙයින්) අනුගාමිකනිධානයෙකි; තං, ඒ දනය; සබ්බලොකවසීකාරං, සියලු ලෝවැස්සන්වසඟකරන්නාවූ; මන්තං, (උතුම්) මන්ත්‍රයෙකි; පරමොසධං, උතුම් ඖෂධයක් සමානවන්නේය.

89 ආපදාසු සහායො තං කාමදො මණිමුත්තමො,
දනං භද්දඝටො කාමං දනං වෙ සුරපාදපො.

තං, ඒ දනය; ආපදාසු, විපත් පැමිණිකල්හි; සහායො, මිත්‍රයෙකු සමානය; කාමදො, කැමැති කැමැති වස්තුප්‍රදනයකරණ; උත්තමො මණි, උතුම් මිණිරුවනක් සමානය; දනං, දනයනම්; කාමං, එකාන්තයෙන්; භද්දඝටො, බදුරුකළක් සමානය, දනං, දනයනම්; වෙ, එකාන්තයෙන්; සුරපාදපො, සුරතුරක් සමානවන්නේය.

90 පානීයමත්තං සද්ධාය දත්වා නෙසා කුමාරිකා,
මුහුත්තෙනෙව සා'ලත්ථ අක්ඛයං සීතලොදකං.

සා එසා කුමාරිකා, ඒ මේ කුමාරිකාතොමෝ: සද්ධාය, සැදූසෙන්: පානීයමත්තං, දියත්තක්පමණක්; දත්වාන, දී; මුහුත්තෙන එව, ඇසිල්ලකින්ම; අක්ඛයං, ක්ෂයනොවන්නාවූ; සීතලොදකං, සිහිල්දිය; අලත්ථ, ලැබීය.

91 දතබ්බං හි සදා දනං උත්තමාධමමජ්ඣිමෙ,
ආදිමජ්ඣාවසානම්හි සද්ධංව පුරතො කරෙ'ති.

උත්තමාධමමජ්ඣිමෙ, උත්තම අධම මධ්‍යම යන සියල්ලන්ට; සදා, හැමකල්හි; දනං, දනවස්තු; දතබ්බං හි, දියයුතුමය; ආදිමජ්ඣාවසානම්හි, ආදිමධ්‍ය අවසාන්‍යන ත්‍රිවිධචෙතනාවෙහි; සද්ධංව, ශ්‍රද්ධාවම; පුරතො කරෙ, පෙරදූරිකරන්නේය.

92 සද්ධාය එවං සුජනා'පදනං දත්වාන වින්දන්ති මහාවිභූතිං,
සක්කොන්ති කො වත්තුමසෙසයිත්වා අබුද්ධසන්තො'බහුදයකස්සා'ති.

එවං, මෙසේ; සුජනා, සජ්ජනයෝ; සද්ධාය, සැදැසිතින්; ආපදනං දත්වාන, පැන්පමණක්දී; මහාවිභූතිං, මහත්වූ සම්පත්; වින්දන්ති, විඳිත්; බහුදයකස්ස. බොහෝදදෙන්නවුන්ට (ලැබෙනවිපාකය); කො අබුද්ධසන්තො,බුදුනොවූ කවරනම් සත්වකෙණෙක්;අසෙසයිත්වා, නිරවශෙෂකොට; වත්තුං, කථනයකරන්ට, සක්කොන්ති, පොහොසත්වේද-?

## ගාමදාරිකා වත්ථුව—7

---

93 රාගානලෙන සංදඩ්ඪා දොසරක්ඛසපීළිතා,
මොහෙන මුච්ඡිතා හුත්වා සංසාරෙ සංසරිං චිරං.

රාගානලෙන, රාගාග්නියෙන්; සංදඩ්ඪා, දනලදුව; දොසරක්ඛසපීළිතා, ද්වෙෂනැමැතිරක්ෂස්විසින්පීඩාකරණලදුව; මොහෙන, මොහයෙන්; මුච්ඡිතා හුත්වා, මුළාව; චිරං, බොහෝකලක්; සංසාරෙ, සසර; සංසරිං, (ච්‍යුතිප්‍රතිසන්ධිවශයෙන්) සැරිසැරුයෙමි.

94 නාකං නූන පුරෙ පුඤ්ඤං කිඤ්චි ආයති කාරණා,
කතං නූන මයා පාපම්පප්පභොගස්ස කාරණා.

ආයති කාරණා, මතුසැපලැබීමහෙතුකොට; කිඤ්චි පුඤ්ඤං, කිසිපිණක්; පුරෙ, පූර්වජන්මයෙහි; නූන, ඒකාන්තයෙන්; නාකං, නොකෙළෙමි; මයා, මාවිසින්; නූන, ඒකාන්තයෙන්; අප්පභොගස්සකාරණා, අල්පභොගහෙතුකොට; පාපං කතං, පව්කරණලදි.

95 තස්මා'හං පරගෙහෙසු භතිං කත්වාන කිච්ඡතො,
ජීවිස්සාමි සුඛං මය්හං නභන්තො පඨවී යථා.

තස්මා, එහෙයින්; අහං, මම පරගෙහෙසු, අනුන්ගේගෙහි; භතිං කත්වාන, බැළමෙහෙකොට; කිච්ඡතො, දුකසේ; ජීවිස්සාමි, ජීවත්වන්නෙමි; මය්හං,මට; සුඛං, සැප; නභන්තො පඨවී යථා, අහසට පොළොව මෙනි.

96 බුද්ධුප්පාදෙ අයං'දානි ධම්මො ලොකෙ සුදිප්පති,
බුද්ධපුත්තා ච ලොකස්මිං වත්තන්ති ගුණසාගරා.

ඉදානි, දැන්; අයං බුද්ධුප්පාදෙ, මේ බුද්ධොත්පාදකාලය වෙයි; ධම්මො, ධර්මයතෙම;ලොකෙ, ලොකයෙහි; සුදිප්පති, මනාව බබලයි; ගුණසාගරා, ගුණයෙන් සයුරවැනිවූ; බුද්ධපුත්තා ච, සර්වඥපුත්‍රයෝ'ද; ලොකස්මිං; ලොකයෙහි; වත්තන්ති, පවතිත්.

97 ඛණෙණ කාමං මයා ලද්ධො ඉදානත්තං න උද්ධරෙ,
සංසාරෙසු නිමුග්ගා'හං කදා සීසං සමුක්ඛිපෙ.

මයා, මාවිසින්ද; කාමං, ඒකාන්තයෙන්; ඛණෙණ, ක්ෂණසම්පත්තිය; ලද්ධො, ලබනලද්දේය(එසේවූමාවිසින්);ඉදානි, දැන්; අත්තානං, තමා; න උද්ධරෙ, (මම) ගොඩනගානොගන්නෙම්නම්; සංසාරෙසු, සංසාර සාගරයෙහි; නිමුග්ගා, නිමග්නවූ;අහං, මම; කදා, කවරකාලෙක්හි, සීසං සමුක්ඛිපෙ,හිස ඔසවන්නෙම්ද–?

98 දුක්ඛෙ'නුප්පාදිතං එකං සාටකං මම විජ්ජති,
තෙන'දානි කරිස්සාමි පතිට්ඨං භවසාගරෙ.

දුක්ඛෙන උප්පාදිතං; (බැලමෙහෙකොට) දුකින් උපයාගන්නා ලද; එකං සාටකං, එක් වස්ත්‍රයක්; මම, මට;විජ්ජති, ඇත්තේය; ඉදානි, දැන්; තෙන, ඒ වස්ත්‍රය කාරණකොටගෙණ; භවසාගරෙ, සංසාර නැමැතිසාගරයෙහි; පතිට්ඨං, ප්‍රතිෂ්ඨාවක්;කරිස්සාමි,කරන්නෙමියි.

99 ඉති චින්තිය සා ධම්මා සඞ්ඝමුද්දිස්ස තං තදා,
අදා සද්ධාය දානස්ස සද්දහන්තී මහප්ඵලතං.

සා ධම්මා;ඒ ධම්මානම් ස්ත්‍රීතොමෝ;ඉති චින්තිය,මෙසේ සිතා;තදා, එකල්හි; දානස්ස, දානයසම්බන්ධ. මහප්ඵලං, මහත්විපාක; සද්දහන්තී, අදහන්නී; සද්ධාය, සැදැයෙන්; සඞ්ඝං උද්දිස්ස,සඞ්ඝයා උදෙසා; තං, ඒ වස්ත්‍රය, අදා, දුන්නිය.

100 මක්ඛිතං මලමුත්තෙහි අපවිද්ධං පිලොතිකං,
දිස්වා ඉසිද්ධජං යත්ථ කරණීයො නනා'දරො.

යත්ථ, යම්තැනෙක්හි: මලමුත්තෙහි, මලමූත්‍රවලින්; මක්ඛිතං, වැකුනාවූ; අපවිද්ධං, අපවිත්‍රවූ; පිලොතිකං, කඩරෙද්දක්වූ; ඉසිද්ධජං, ඍෂිධ්වජයක් (කසාපිළියක්);දිස්වා, දැක; ආදරො, ආදර; කරණීයො නනු, කටයුතුනොවේද—?

101 පාපෙත්වා පන තං ඛෙමං වන්දමානෙන ජන්තුනා,
ආදරො එව කාතබ්බො තං හොති අරහද්ධජං.

තං, ඒ සිවුරුකඩ; ඛෙමං, යහපත්ස්ථානයකට; පාපෙත්වා, පමුණුවා තබා, වන්දමානෙන, වැඳීම්පිදීම්කරන්නාවූ; ජන්තුනා පන, සත්වයාවිසින් වනාහි; ආදරො කාතබ්බො එව, ආදරකටයුතුමය; තං අරහද්ධජං, ඒ අර්හද්ධ්වජය; හොති, (මෙසේ) වෙයි.

102 යො'යං සො නන්තකො රාජ උස්සිතො අරහද්ධජො,
පරිභුත්තො'රහන්තෙහි තස්මා සො පූජනාරහො'ති.

රාජ, මහරජ; යො අයං නන්තකො; යම් මේ (කඩකැබලි එක් කොට ගෙත්තම්කරණලද) දලකඩක්තෙම; උස්සිතො, ඔසවා

තබනලද්දේද; සො අරගඩජො, ඒ අභිද්ධවජයවූසිවුර; අරහතෙත ගි, රහතුන්ගේසින්;පරිභුතොනා, පරිභොගකරණලද්දේය;තස්මා,එහෙ සින්;සො, ඒ චීවරයතෙම; පූජනාරහොති, පූජාවට සුදුසුවන්නේයි.

103 අහො'නුභාවං කපණාය දිනන
වජ්ජස්ස සඞ්ඝස්ස සුපෙසලස්ස,
ලද්ධා'සි ධම්මා භවභොගසම්පදං
භික්ඛු'පි ඛීණාසවතං ගතාසුං'ති.

කපණාය, දිළිඳුවූදියවිසින්; සුපෙසලස්ස, පියසීලිවූ; සඞ්ඝස්ස, සඟනට; දිනනවජ්ජස්ස, දෙනලදවිසතුදුනයාගේ; ආනුභාවං, ආනුභාවය; අහො, විස්මය; ධම්මා, (ඒ) ධම්මානම් සත්‍රීතොංවෝ; භවභොගසම්පදං, භවභොගසම්පත්තිය;ලද්ධා අසි, ලැබුවා විය; භික්ඛු අපි, භික්ෂුහුද; ඛීණාසවතං, ක්‍ෂයකරණලද ආශ්‍රවඇතිබවට (රහත්බවට); ගතාසුං, ගියෝවූහ.

**ධම්මාශ වස්තුව-8.**

---

104 භාතුනො මෙ'භිවාදෙත්වා පවත්තිං ඉධ පණ්ණං,
කථෙමි භාත රාජානො සෙවිතබ්බා අවචයා.

මෙ, මාගේ; භාතුනො, භ්‍රාතෘන්වහන්සේට; අභිවාදෙත්වා, නමස්කාරකොට; ඉධ, මේ නුවර; පණ්ණං, පතළාවූ; පවත්තිං, ප්‍රවෘත්තිය, කථෙමි; කියමි; භාත, බෑයන්වහන්ස: රාජානො, රජදරුවෝතුමූ; අවචයා, අවචාවෙන් (වචාරහිතව); සෙවිතබ්බා, සෙවනයකටයුත්තාහුය.

105 නිම්මිතා විය රාජානො චරන්ති ඡහි භූතලෙ,
යමාදිච්චිඤ්ඤමච්චූහි කුවෙරදහනෙහි ච.

රාජානො, රජදරුවෝ (වනාහි); යමාදිච්චිඤ්ඤමච්චූහි, යම; යමරජ්ජුරුවෝ; ආදිච්ච,සූර්‍ය්‍යයාය; ඉන්ද්‍ර, චන්ද්‍රයාය; මච්චූහි, මාරයාය යන මොවුන්ගෙන්ද;කුවෙරදහනෙහි ච, කුවෙර, වෛශ්‍රවණයාය;දහනෙහි ච, වහනිය යන මොවුන්ගෙන්දුයි; ඡහි, (මේ) සය එක්කිරීමෙන්; නිම්මිතා විය, නිර්මිතවූවන්මෙන්; භූතලෙ, පෘථිවීතලයෙහි; චරන්ති, හැසිරෙත්.

106 පුඤ්ඤාපුඤ්ඤානුරූපෙන සග්ගාපායං යථා යමො,
පාපෙති සතෙත රාජා'පි තථෙව යමසාදිසො.

යථා, යම්සේ; යමො, යමරජතෙම; පුඤ්ඤාපුඤ්ඤානුරූපෙන (සත්ත්වයන්කළ)පින්පව්දෙකට සුදුසුපරිද්දෙන්; සග්ගාපායං,සගඅපායදෙකට;

සතෙන, සබ්බසත්; පාපෙති, පමුණුවාද; තථා, එපරිද්දෙන්; රජා අපි, රජතෙමේද (සැපදුක් දෙකට පමුණුවනහෙයින්); යමසාදිසො, යමරජසමානවන්නේය.

107 බොධෙතබ්බෙ පබොධෙති සොසෙති සොසනාරහෙ,
ලොකමා'ලොකයෙ භානු රාජා'පි භානුසාදිසො·

භානු, සූය‍ර්‍යතෙම; ලොකං, ලොකය; ආලොකයෙ, භාත්පස එලියකරන්නේය; බොධෙතබ්බෙ, ප්‍රබොධකටයුතු (පද්මයන්); පබොධෙති, ප්‍රබුඩකරයි; සොසනාරහෙ, වියලන්නටසුදුසුදේ; සොසෙති, වියලවයි (එපරිද්දෙන්); රාජා අපි, රජතෙමේද (රෞද්‍රගුණසෞම්‍යගුණඇතිහෙයින්); භානුසාදිසො, සූය‍ර්‍යයා සමානවන්නේය.

108 පඤ්ජරං දිසි සීතංසු ගහාලිපරිවාරිතො,
ලොකං තොසෙති සීතංසු චන්‍ද්‍රො'ව භුවි භූපති.

සීතංසු, චන්‍ද්‍රතෙම; ගහාලිපරිවාරිතො, තාරකාසමූහය විසින් පිරිවරණලදුව; දිසි, සියලුදිශාවන්හි; සීතංසු, සීතලවූරශ්මීන්, පඤ්ජරං, පතුරුවමින්; ලොකං, ලොකය; තොසෙති, සතුටුකෙරෙයි; භූපති, රජතෙමේද; භුවි, පෘථිවියෙහි (සෞම්‍යගුණ පතුරුවනහෙයින්); චන්‍ද්‍ර ඉව, චන්ද්‍රයා මෙනි.

109 මාරෙතබ්බං යථා මච්චු මාරෙති අදයාපරො,
මච්චූ'ව ජගතීපාලා නිග්ගහෙසුං අසාධුනං.

යථා, යම්සේ; මච්චු, මෘත්‍යුතෙම; අදයාපරො, දයාවක්නැතිව; මාරෙතබ්බං, මැරියයුත්තා; මාරෙති, මරාද (එසේම);ජගතීපාලා, ජගත්පාලයෝ; මච්චු ඉව, මරුමෙන්; අසාධුනං, (අපරාධකළ) අසත්පුරුෂයන්ට, නිග්ගහෙසුං, නිග්‍රහකළාහුය.

110 ධනදනෙන තොසෙති සොසෙත'ච්ඡින්දනෙන තං,
මිත්තා'මිත්තෙ යථා එවං කුවෙරොයෙව භූපති.

යථා, යම්සේ; (වෙසමුණුතෙම); මිත්තෙ, (කුවෙරයාගේ) මිත්‍රයන්, ධනදනෙන, ධනය දීමෙන්, තොසෙති, සතුටුකෙරේද; අමිත්තෙ, අමිත්‍රයන්; තං, ඒ ධනය; අච්ඡින්දනෙන,පැහැරගැන්මෙන්; සොසෙති, වියලවාද; එවං, මෙසේ(මිත්‍රාමිත්‍රයන් සතුටුනොසතුටුකරණහෙයින්); භූපති, පෘථිවිපාලතෙම; කුවෙරො එව, වෛශ්‍රවණයා මෙනි.

111 යථා'දහති ලොකස්මිං සබ්බභූතානි පාවකො,
අග්ගීව දහතෙ රාජා පදුට්ඨං සකලං පජං.

යථා, යම්සේ;ලොකස්මිං,ලොකයෙහි;පාවකො, වහ්නියතෙම;සබ්බභූතානි, සංසකාරසියල්ලම;දහති, දවාද;අග්ගි ඉව,(ඒ) ගින්නමෙන්;

රාජා, රජනෙම; පදුට්ඨං, ප්‍රදුෂ්ටවූ (අපරාධකළාවූ); සකලං පජං, සියලුප්‍රජාව; දහතෙ, දවයි.

112 එකමෙවග්ගි දහති නරං සො දුරුපාසිතං,
කුලං දහති රාජග්ගි සබන්ධුං සපරාවරං.

සො අග්ගි, ඒ වහනියනෙම; දුරුපාසිතං වරදවාආශ්‍රයකළ; එකං එව නරං, එකම මිනිසෙකු; දහති, දවයි; රාජග්ගි, රාජනැමැති වහනිය (එසේනොව); සපරාවරං, ස්ථාවරජඞ්ගමදේ සහිතවූ; සබන්ධුං, නෑයන්සහිතවූ; කුලං, මුලුකුලසම; දහති, දවන්නේයි.

113 තිට්ඨන්ති කෙචි නරවො දහනා දඩ්ඪකානනෙ,
රාජකොපානලා දඩ්ඪා න තිට්ඨන්තපරාධිනො.

දහනා, ලැව්ගින්නෙන්; දඩ්ඪකානනෙ, දනලදවනයෙහි; කෙචි නරවො, කිසියම්වෘක්ෂයෝ; තිට්ඨනති, (නොදා) සිටිත්; රාජකොපානලා, රාජකොපනැමැතිගින්නෙන්; දඩ්ඪා, දනලද; අපරාධිනො, අපරාධකළන්සිවෙක්; න තිට්ඨන්ති, නොසිටිත්.

114 දූරෙති නාවමන්තබ්බා රාජානො දීඝබාහුකා,
ගණ්හන්ති සහසා දළ්හං දිසං ලොකොපපීළකං.

රාජානො, රජදරුවෝ; දූරෙති, දුරෙහියයි; න අවමන්තබ්බා, අවමන්නොකටයුත්තාහුයි; දීඝබාහුකා, දීඝිබාහුඇත්තාවූ ඔහුතුමූ; ලොකොපපීළකං, ලොකවාසීන්ට පීඩාකරන්නාවූ; දිසං, සතුරා; සහසා, වහාම; දළ්හං, දැඩිකොට; ගණ්හන්ති, අල්වාගණිත්.

115 මා පඩචන්තං නිපීළෙථ මා විලුම්පථ ගාමිකෙ,
මා පරස්සහරා හොථ මූලං මා ඛණථ'ත්තනො.

පචචන්තං පසල්දනව්, මා නිපීළෙථ; පීඩානොකරව්; ගාමිකෙ, ගම්වැස්සන්; මා විලුම්පථ, නොනසව් හෙවත් ගම්පැහැරීම්නොකරව්; පරස්සහරා, අනුන්සතුධනයගන්නෝ, මා හොථ, නොවව්; අත්තනො, තමාගේ; මූලං, මූල ස්ථානාන්තරය; මා ඛණථ, නොසිඳිව්.

116 පක්ඛපාතං ච සප්පෙමං උපකාරිං හිතාවහං,
අභිවඩ්ඪන්ති රාජානො යසදානාදිනා නරන්ති.

රාජානො, රජදරුවෝතුමූ; පක්ඛපාතං ච, (තමන්ට) පක්ෂපාතවූ; සප්පෙමං, ප්‍රෙමසහිතවූ; උපකාරිං, උපකාර ඇත්තාවූ; හිතාවහං, හිතඵලවත්නාවූ; නරං, මනුෂ්‍යයා; යසදානාදිනා, යසස්දීම්ආදියෙන්; අභිවඩ්ඪන්ති, විශෙෂයෙන් වඩත්.

117 තථාවිධෙසු දුක්ඛෙසු උප්පන්නෙසු ජනා ඉමෙ,
පෙමං ජහන්ති පුත්තානං නක්කකච්ඡපසාදිසා'ති.

ඉමෙ ජනා, මේ මනුෂ්‍යයෝ; නක්කකච්ඡපසාදිසා, (දරුවන්ක න) කිඹුලුන් හා කැස්බන්සමානවූවාහු; තථාවිධෙසු, එබඳුවූ; දුක්ඛෙසු උප්පන්නෙසු, දුක්උපන්කල්හි; පුත්තානං, දරුවන්කෙරෙහිවූ; පෙමං, ප්‍රෙමය: ජහන්ති, හරිත්.

118 නිලවෙල්ලිතධම්මිල්ලා ඵුල්ලපඞ්කජකානනා,
නිලායතවිසාලක්ඛා ත්වමා'සි නයනුස්සවා.

නිලවෙල්ලිතධම්මිල්ලා, නිල, නිලවර්ණවූ; වෙල්ලිත. අක්බඳු රුවූ; ධම්මිල්ලා, කෙශකලාපයක්ඇති; ඵුල්ලපඞ්කජකානනා, ඵුල්ල පිපියාවූ; පඞ්කජ, පියුමකටබඳුවූ; ආනනා, මුහුනක්ඇති; නිලායත විසාලක්ඛා, නිල, නිල්වූ; ආයත, දික්වූ; විසාල, පුලුල්වූ; අක්ඛා, ඇස් සහලක්ඇති; ත්වං, තී; නයනුස්සවා ආසි; (දුටුදුටුවන් ඇස්පිණවන හෙයින්) නෙත්‍රොත්සවවිය.

119 හෙමවල්ලී'ව ලීලාය දෙවකඤ්ඤා'ව නන්දනෙ,
චන්දලෙඛා විසා'කාසෙ භද්දෙ ත්වම්'ධ තිට්ඨසි.

භද්දෙ, සොඳුර; ත්වං, තී; ලීලාය, විලාසයෙන්; හෙමවල්ලී ඉව, රන්ලියක් මෙන්ද; නන්දනෙ, නන්දනොද්‍යානයෙහි; දෙවකඤ්ඤා ඉව, දිව්‍යකන්‍යාවක් මෙන්ද; ආකාසෙ, ආකාශයෙහි; චන්දලෙඛා විය, චන්ද්‍ර ලෙඛාවක් මෙන්ද; ඉධ, මෙහි; තිට්ඨසි, සිටින්නෙහිය.

120 කා වා ත්වං කස්ස වා ධීතා කුතො ත්වම්'ධ ආගතා,
කිමත්ථායෙත්ථ අට්ඨාසි කො තෙ භත්තා මනොරමෙ.

මනොරමෙ, සිත්අලවන්නිය; ත්වං තී; කා වා, කවරඑකියක්ද;? කස්ස, කවරෙකුගේ; ධීතා වා, දියනිකෙණෙක්හෝ වෙහිද;? ත්වං, තී; කුතො, කොතැනින්; ඉධ ආගතා, මෙහි ආවාද;? එත්ථ, මෙහි; කිමත්ථා ය, කුමක්පිණිස; අට්ඨාසි, සිටියාද; ? තෙ, තීගේ, භත්තා, වල්ලභයා; කො, කවරෙක්ද–?.

121 යුවතිං යුවොව කාමෙති යුවානං යුවති තථා,
ත්වම්'හං ච භද්දෙ'දානී'ධ සමානම්හි වයෙ ඨිතා.

යුවො, තරුණපුරුෂතෙම; යුවතිංව, තරුණියක්ම; කාමෙති, කැමැතිවෙයි; යුවතී, තරුණස්ත්‍රීතොමෝ; යුවානං, තරුණයෙකුම; තථා, එසේම (කැමැතිවන්නීය එහෙයින්); භද්දෙ, සොඳුර; ඉදානි, දැන්; ත්වං, තීද; අහං ච, මමද; ඉධ, මෙහි; සමානම්හි වයෙ, සමානවයස්හි; ඨිතා, සිටියෝවම්හ.

122 පොසෙමි භරියත්තෙන තුවමජ්ජතනා සදා,
අහං තෙ පති හෙස්සාමි තුවං මෙ භරියා භවා'ති.

තුවං, තී; අජ්ජතනා, අදපටන්; සදා, හැම කල්හි; භරියත්තෙන, අඹුකාභාවයෙන්; පොසෙමි, පොෂණය කෙරෙමි; අහං, මම; තෙ, තීගේ; පති හෙස්සාමි, ස්වාමිවන්නෙමි; තුවං, තී; මෙ, මට; භරියා භව ඉති, භාර්‍ය්‍යා වෙවයි (කීයේය).

123 යං ත්වං මෙ භණසී සම්ම කාරණං විය දිස්සති,
න සොභන්තිත්ථියො ලොකෙ පුරිසාභරණං විනා.

සම්ම, යහළුව; ත්වං, නුඹ; මෙ, මට; යං භණසි, යමක් කියන්නෙහිද (එය); කාරණං විය, කාරණයක් මෙන්; දිස්සති, දක්නාලැබේ; ලොකෙ, ලොකයෙහි; පුරිසාභරණං විනා, පුරුෂ නැමැති ආභරණය නැතිව; ඉත්ථියො, ස්ත්‍රීහු; න සොභන්ති, නොහොබිත්.

124 යස්සා නත්ථි ධවො සා තු විධවා'ති පවුච්චති,
විධවා සබ්බදුක්ඛස්ස භාගී භවති සබ්බදා.

යස්සා, යම් තැනැත්තියකට; ධවො, ස්වාමිපුරුෂයෙක්, නත්ථි, නැත්තේද; සා තු, ඕතොමෝ වනාහි; විධවා ඉති, වැන්දඹුයයි (සැමියා නැත්තීයයි); පවුච්චති, කියනුලැබේ; විධවා, සැමියා නැත්තී; සබ්බදුක්ඛස්ස, සියලු දුකට; සබ්බදා, සැමකල්හි; භාගී භවති, හිමිවෙයි.

125 මය්හං අත්ථි පිතාමාතා මමෙවනෙත'නුසාසයුං,
යාවායාම මයං පුත්තී තාව එත්ථෙව හොහී'ති.

මය්හං, මාගේ; මාතාපිතා, මව්ද පියාද; අත්ථි, ඇත; තෙ, උන්වහන්සේලා; පුත්ති, දියනිය; මයං, අපි; යාව, යම්තාක්: ආයාම, එන්නෙමුද; තාව, ඒතාක්කල්; එත්ථෙව, මෙහිම; හොහි ඉති, සිටුවයි; මං, මට; එවං, මෙසේ; අනුසාසයුං, අවවාදකළාහුය.

126 මාතාපිතූනනං වචනං න කරොන්තා නරා ඉධ,
විනාසං ඉධ ලොකෙ ච යන්ති පෙච්ච'පි දුග්ගතිං.

ඉධ, මේ ලොකයෙහි; මාතාපිතූනනං, මව්පියන්ගේ; වචනං, වචනය; න කරොන්තා, නොකරන්නාවූ; නරා, මනුෂ්‍යයෝ; ඉධ ලොකෙ ච, ඉහලොකයෙහිද; විනාසං යන්ති, විනාශයට පැමිණෙත්; පෙච්ච අපි, පරලෙව්හිද, දුග්ගතිං යන්ති, දුගතියට පැමිණෙත්.

127 යදි මාතාපිතා මය්හං අනුජානන්ති මාණව,
තථා තෙ සඞ්ගමො හොත් නො චෙ භවතු සඞ්ගමො'ති.

මාණව, එම්බා මාණවකය; යදි, ඉදින්, මය්හං, මාගේ; මාතාපිතා, මව්ද පියාද යන දෙදෙන; අනුජානන්ති, අනුදන්නාහු නම්;

තෙ, නුඹගේ; සඞ්ගමො හොති, (මාගා) එක්වීම වන්නේය; වෙ, ඉදින් (අනුනොදන්නාහුනම්); තථා, එසේ; සඞ්ගමො නො භවතු ඉති, සංසර්ගය නොවේවායි (කීව).

128 සාධු සාධු කුමාරිකෙ සද්ධා'සි ධම්ම ජීවිනී,
සාධු දානං අදාසි ත්වං සාධු පූජා සදා භවා'ති.

කුමාරිකෙ, එම්බා කුමාරිකාව; ත්වං, තී; ධම්මජීවිනී, දැහැමින් ජීවත්වන්නීය; සද්ධා ආසි, සැදැඇත්තීය; සාධුදානං, යහපත්දානයක්; අදාසි, දුන්නීය; සාධුසාධු, යහපත යහපත; සදා, හැමකල්හි; සාධු පූජාභව ඉති, සාධුන්ට පිදීම්ඇත්තියක් වෙවයි (සාධුකාර දුන්නීය).

129 දානෙන සත්තා තිදිවං වජන්ති
දානෙන වින්දන්ති සිරිං නරෙසු,
ලභන්ති දානෙන සිවං පුරම්පි
නෙය්‍යාථ තස්මා සතතං පදානෙ'ති.

සත්තා, සත්වයෝ; දානෙන, දන්දීම කරණකොටගෙණ; තිදිවං, දෙව්ලොවට; වජන්ති, යන්නාහුය; දානෙන, දන්දීමෙන්; නරෙසු, මිනිස්ලෙව්හි; සිරිං, ඓශ්වර්‍ය්‍ය සම්පත්තිය; වින්දන්ති, විඳිත්; දානෙන, දන්දීම් හෙතුවෙන්; සිවං පුරං අපි, නිවන්පුර සැපද; ලභන්ති, ලබත්; තස්මා, එහෙයින්; පදානෙ, දන්දීමෙහි; සතතං, නිරන්තරයෙන්; නෙය්‍යාථ, (මෙරමාද) පමුණුවව්.

## කිච්ඡසඞ්ඛාවසතුව-9.

130 අයං කණ්ටකරුක්ඛොති විසරුක්ඛොති වා අයං,
අයං චන්දනරුක්ඛොති න විසෙසෙති යථා ලතා.
131 කාමන්ධා වනිතා ලොකෙ හීන උක්කට්ඨමජ්ඣිමෙ,
කුලීනෙ දුක්කුලීනෙපි න ජහන්ති ලතා වියා'ති.

ලතා, ලියතොමෝ; අයං, මේ; කණ්ටකරුක්ඛො ඉති, කටුඇති රුකැයි කියා හෝ; අයං, මේ; විසරුක්ඛො ඉති වා, විෂ වෘක්ෂයයි කියාගෝ; අයං, මේ, චන්දනරුක්ඛො ඉති, සඳුන්රුකයයි කියාහෝ; යථා, යම්සේ; න විසෙසෙති, වෙනසක් නොකෙරේද (සියලු රුක් වැළඳගණීද එපරිද්දෙන්); ලොකෙ, ලොකයෙහි; කාමන්ධා, කාමයෙන් අන්ධවූ; වනිතා, ස්ත්‍රීහුතුමූ; හීන උක්කට්ඨමජ්ඣිමෙ, හීනා උත්කෘෂ්ටමධ්‍යමවූද; කුලීනෙ, උතුම්කුලඇත්තාවූද; දුක්කුලීනෙ අපි, හීනකුලඇත්තාවූද අය (වෙන්කර); න ජහන්ති, අත්නොහරිත්; ලතා විය ඉති, (කටු රුක් ආදී වෙනසක් නොබලා වැළඳගන්නා) ලිය වෙනි.

132 ඛුද්දකං වා මහන්තං වා ඉට්ඨානිට්ඨං ක්‍රියාවිධිං,
මාතාපිතාදිවුඩ්ඪානං අනුඤ්ඤායෙ'ව කාරයෙ.

ඛුද්දකං වා, කුඩාවූ හෝ; මහන්තං වා, මහත්වූ හෝ; ඉට්ඨානිට්ඨං, ඉෂ්ටානිෂ්ටවූ; ක්‍රියාවිධිං, ක්‍රියාවිධියක් (යම් කිසිකටයුත්තක්); මාතාපිතාදිවුඩ්ඪානං, මව්පියාදී වෘද්ධයන් ගේ; අනුඤ්ඤාය එව, අනු දැනීමෙන්ම; කාරයෙ, කරන්නේය.

133 ලභන්තො'පි චෙ රජ්ජං නිච්ඡාය ජනකො ජනෙ,
බහුමන්තබ්බො න සො ලාභො අනුජාතෙන සූනුනා.

ජනකෙ ජනෙ, මව්පියන්; න ඉච්ඡාය, නොකැමැත්තෙහි (අැතිකල්හි);චෙ, ඉදින්;රජ්ජං, රාජ්‍යසම්පත්තිය; ලභන්තො අපි, ලබන්නාවූද; අනුජාතෙන, (මව්පියන්) අනුව පවත්නාවූ; සූනුනා, දරුවා විසින්; සො ලාභො, ඒලාභය; න බහුමන්තබ්බො, බුහුමනින් සැලකිය යුතුනොවේ.

134 අනනුඤ්ඤාය වුඩ්ඪෙහි කතං යං අබ්භුතං'පිච,
ගරහන්තෙව තස්මාසො සෙරිවාරී'ති ඤාතකා.

වුඩ්ඪෙහි, (මව්පියාදී) වැඩිමහල්ලන් විසින්; අනනුඤ්ඤාය, අනු නොදන්නාලදුව; අබ්භුතං අපි ච, ආශ්චර්යවූද; යං, යමක්; කතං, කරණලද්ද; තස්මා, එහෙයින්; එසො, මේතෙම; සෙරිවාරී ඉති, සෙ ඃවාරීයයි; ඤාතකා, නෑයෝ; ගරහන්ති එව, (බහුව) නින්දාකරත්මය

135 අනුද්ධතො අචපලො නිපකො සංවුතින්‍ද්‍රියො,
පසංසං ලභතෙ පුත්තො වුඩ්ඪිං පප්පොති සබ්බසො'ති.

අනුද්ධතො, උඩඟුනොවූ; අචපලො, චපලනොවූ (ගික්මුනාවූ); නිපකො; නුවණ ඇත්තාවූ; සංවුතින්‍ද්‍රියො, සංවරණය කරණලද ඉඳුරන් ඇති; පුත්තො, පුත්‍රතෙම; පසංසං ලභතෙ, ප්‍රශංසා ලබයි; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; වුඩ්ඪිං, අභිවෘද්ධියට; පප්පොති, පැමිණේ.

136 සද්ධාබලං පස්සථ භො ජනානං
ඉධෙව දෙවා තමුපාසයන්ති,
කථන්නු දෙවෙසු ච මානුසෙසු
පරත්‍ථ තෙසං මහතිං විභූතිං.

භො, භවත්නි; ජනානං, (ශ්‍රද්ධාවත්) ජනයන්ගේ; සද්ධාබලං, ශ්‍රද්ධාබලය; පස්සථ, බලව්; ඉධ එව, මේ ජාතියෙහිම; දෙවා, දෙවියෝ; තං, ඔහුතරා, උපාසයන්ති, එළඹ උවැටැන් කෙරෙත්; පරත්‍ථ,

පරලෙව්හි; දෙවෙසු ච, දිව්‍යලොකයෙහිද; මානුසෙසු ච, මිනිස්ලෙව්හිද; තෙසං, ඔවුන්ගේ; මහනිං විභූතිං, මහත්වූ සම්පත්තිය; කථනානු, කෙසේනම් (වණ්ණනා කරමුද ?).

## සබ්බාසුමනා වසතුව–10.

## උත්තරොලිය වග්ගො ජඣො.

---

1 චින්තාසමො නත්‍ථි සරීර සොසනං
නෙව'ත්‍ථි අධිකසමාපි ච ආපදුහි,
තණ්හාසමො නත්‍ථි නිහිත ලජ්ජා
බුද්ධසමො නත්‍ථි ජනස්ස දුක්ඛං.

ජනස්ස, ජනයාට; චින්තාසමො, සිතිවිලි සමානවූ; සරීරසොසනං, සිරුර වියලීමට කරුණක්; නත්‍ථි, නැත; අධිකසමාපි, මාගීප්‍රතිපන්නතා සමානවූ; ආපදුහි ච, ආපදාවකුත්; නෙව අත්‍ථි, නොමඇති; තණ්හාසමො, තෘෂ්ණාව සමාන; නිහිනලජ්ජා, ලජ්ජා නැත්තකුත්; නත්‍ථි, නැත; බුද්ධසමො, බඩගිනි සමාන. දුක්ඛං, දුකකුත්; නත්‍ථි, නැත්තේය.

2 එතස්ස සබ්බස්සහමජ්ජපතෙනා
බුද්ධ භදනෙනා අතිපීළති මෙ,
දනස්ස ජානනති ඵලං වසීසා
මනත්‍වාන ඉධෙව'වම්'ධාගතොසම්'ති.

එතස්ස සබ්බස්ස, මේ සියල්ලට; අහං, මම; අජ්ජ, අද; පත්තො, පැමිණියෙමි; භදනෙත, ස්වාමින්වහන්ස; මෙ, මාගේ; බුද්ධ, බඩසය; අතිපීළති, (මා) අතිශයින් පෙළයි; වසීසා, සතීශ්වරයන් වහන්සේලා; දනස්ස, දනයාගේ; ඵලං, විපාක; ජානනති ඉති, දනි ත්යයි එවං, මෙසේ; මනත්‍වාන, සිතා; ඉධ, මෙහි; ආගතො අසම් ඉති; ආයේ වෙමියි කීයේය.

3 මා ධංකො චපලො එසො තිරච්ඡානගතො'ති වා,
මඤ්ඤිතබ්බො සදා භන්තෙ පුත්තං ඤත්‍වාන ගාහියං.

භන්තෙ, ස්වාමීනි; එසො ධංකො, මේ කවුඩුතෙම; චපලො, චපලයයි හෝ; තිරච්ඡානගතො ඉති වා, තිරිසන්ගත සත්වයෙකැයි කියා; මා මඤ්ඤිතබ්බො, නොසිතිය යුත්තේය; සදා, හැමකල්හි; පුත්තං, පුතුවූවක්; ඤත්‍වාන, දැන; ගාහියං, (කාගෙන් වුවත්) ගතයුතුය.

4 ගණ්හීයං මණිං මීළ්හෙ තථා කද්දමතුප්පලං,
ගොහි ගොරොචනා චෙව මතොනාචා'පි සුභාසිතං.

මීළ්හෙ, අමෙධ්‍යයෙහි (වූයේ නමුත්); මණිං, මාණික්‍යය; ගණ්හීයං, ගතයුත්තේය; කද්දමතො, කදීමයෙන්; උප්පලං, උපුල්; තථා, එසේම (ගතයුත්තේය); ගොහි, ගෙරින්ගෙන්; ගොරොචනා ච එව, ගොරොචනද (ගතයුතුය); මතොනාචඅපි, මාගෙන් නමුත්; සුභාසිතං, සුභාෂිත වචනය (ගතයුත්තේය).

5 උපට්ඨිස්සමහං භන්තෙ යථාසත්ති යථාබලං,
මයා සහෙ'ව ගන්තබ්බං මමානුග්ගහබුද්ධියා'ති.

භන්තෙ, ස්වාමීනි; අහං, මම; යථාසත්ති, ශක්තිවූ පරිද්දෙන්; යථාබලං, බලවූ පරිද්දෙන්; උපට්ඨිස්සං, උපස්ථාන කරන්නෙමි; මමානුග්ගහබුද්ධියා, මට අනුකම්පා පිණිස; මයා සහ එව, මා හා සම ගම; ගන්තබ්බං ඉති, වැඩිය යුතුයි (මැනවැයි කීය).

6 කතූපකාරං හදයෙ කරොන්තා,
කරොන්ති කාකා'පි පුනො'පකාරං.
කත්වාන එතං හදයෙ සපඤ්ඤා
මිත්තද්දු මා හොථ කතඤ්ඤූ හොථා'ති.

කාකා අපි, (තිරිසන් යොනියෙහි උපන්) කවුඩුවෝ පවා; කතූපකාරං, කෘතොපකාරය; හදයෙ කරොන්තා, සිත්හි කරමින්; පුන, නැවත; උපකාරං කරොන්ති, (ප්‍රති) උපකාර කෙරෙත්; සපඤ්ඤා, සප්‍රාඥයෙනි (තෙපි); එතං, මේ කාරණය: හදයෙ කත්වාන, සිත්හිකොටගෙණ; මිත්තද්දු මා හොථ, මිත්‍රද්‍රොහී නොවව්; කතඤ්ඤූ හොථ, කෘතඥවව්

**කාකවත්ථුව-1.**

---

7 ඉතො චවිත්වාන භවෙ භවෙ'හං
මහිද්ධිකො ධනවා සීලවා ච,
සද්ධො මුදූ දානපතී ච හුත්වා
සග්ගාපවග්ගං අභිසම්භුණෙය්‍යං'ති.

අහං, මම; ඉතො චවිත්වාන, මෙයින් චුතව; භවෙ භවෙ, භවයක් භවයක් පාසා; මහිද්ධිකො හුත්වා, මහත් සෘද්ධි ඇත්තෙක්ව; ධනවා, ධනධාන්‍ය ඇත්තෙක්ව; සීලවා ච, ශීලාචාරගුණඇත්තෙක්ව; සද්ධො, (තුණුරුවන් කෙරෙහි අචල) ශ්‍රද්ධා ඇත්තෙක්ව; මුදු, මෘදු සිත් ඇත්තෙක්ව; දානපතී ච හුත්වා, දානපතියෙක්වී; සග්ගාපවග්ගං, ස්වර්ගමොක්ෂ සම්පත්; අභිසම්භුණෙය්‍යං ඉති, සිද්ධකරගන්නෙමැයි (ප්‍රාර්ථනාකළහ).

8 නනු නාම මනුස්සෙන භුත්වා කාමං යථාසුඛං,
යොබ්බනං අවිරාධෙත්වා පච්ඡා තපසි වත්තියං.

මනුස්සෙන නාම, මනුෂ්‍යයා විසින්නම්; යොබ්බනං, තරුණ අවස්ථාව; අවිරාධෙත්වා, නොඉක්මවා; යථා සුඛං, සැපවූපරිද්දෙන්; කාමං, පංචකාම සම්පත්තිය; භුත්වා, අනුභව කොට; පච්ඡා, පසුව (වයොවෘද්ධඅවස්ථාවෙහි); තපසි වත්තියං නනු, තපශ්සහි පැවතිය යුතුනොවේද ?.

9 ජිණ්ණෙන චරිතො ධම්මො න නස්සති න දුස්සති,
චිත්තස්සෙකග්ගතා හොති ලොකෙන ච පසංසියො.

ජිණ්ණෙන, වයොවෘද්ධයා විසින්; චරිතො, කරණලද; ධම්මො, (ශීලසමාධ්‍යාදි ගුණ) ධර්මය තෙම; න නස්සති, නොනසී; න දුස්සති, (කාමක්‍රොධාදීන් විසින්) දූෂිතද නොවේ; චිත්තස්ස, චිත්තයාගේ; එකග්ගතා හොති, එකගබව වේ; ලොකෙන ච, ලොකවාසීන් විසින්ද; පසංසියො, පැසසිය යුතුවේ.

10 මත්තෙභරාජං යො මොහා බන්ධෙය්‍ය මක්කටං'සුනා,
යොබ්බනෙ රාගමත්තෙභ බන්ධනං තපසා තථා.

යො, යමෙක්තෙම; මොහා, මොහය හෙතුකොටගෙණ; මත්තෙභරාජං, මත්ත හස්තිරාජයෙකු; මක්කටංසුනා, මකුළු හුයකින්; බන්ධෙය්‍ය, බඳින්නේ (යම්සේ) ද; යොබ්බනෙ, යෞවන අවස්ථාවෙහි; තපසා, තපස් නැමැති රැහැනින්; රාගමත්තෙභ, රාග නැමැති මඇත්නු; බන්ධනං, බැඳීම; තථා, එසේමය.

11 නත්‍ථ'ඤ්ඤං මධුරං භන්තෙ පංචකාම සමං භුවි,
මා මොහෙන විරාධෙථ උභො භන්තෙ රමාමසෙ'ති.

භන්තෙ, ස්වාමිනි; භුවි, (මේ) ලොකයෙහි; පංචකාමසමං, පස්කම්සැප සමානවූ; මධුරං, මිහිරිවූ; අඤ්ඤං, අන්‍යවූ සැපයක්; නත්‍ථි, නැත; මොහෙන, මොහයෙන්; මා විරාධෙථ, නොවරදවව් (පංචකාමසෙවනය නොඉක්මවනු මැනවි); භන්තෙ, වහන්ස; උභො, (අපි) දෙදෙනා; රමාමසෙ ඉති, (කම් සැපෙහි) සිත් අලවම්හයි (කීවාය).

12 අට්ඨිසඞ්ඛලූපමා කාමා සප්පසීසූපමා'පිච,
අග්ගිකාසූපමා කාමා කාමා සත්තිසූලූපමා.

කාමා, පංචකාමයෝ නම්; අට්ඨිසඞ්ඛලූපමා, (ස්වල්පවූ ආස්වාද ඇති හෙයින්) ඇටසැකිල්ලකට උපමා ඇතිසහ; අපිච, වැලිදු;

සප්පසීසූපමා, (භයඑලවන හෙයින්) සර්පමුඛයක් වැනියහ; කාමා, පඤ්චකාමයෝ; අග්ගිකාසූපමා,(ශරීරය දහකරවන හෙයින්) ගිනිවලක් වැනියහ; කාමා,පඤ්චකාමයෝනම්; සත්තිසූලූපමා,(ශරීරයවිනිවිද වෙද නාඋපදවන හෙයින්) අඬයටි හුල්වැනියහ.

13 යෙ කාමං පටිසෙවන්ති මොහෙහෙනෙ,ඉධ පුථුජ්ජනා,
භාගිනො සබ්බදුක්ඛස්ස හොන්ති ආපායිකා තථා 'ති.

ඉධ, මේ ලොකයෙහි; යෙ පුථුජ්ජනා,යම්පෘථග්ජනයෝ; කාමං, පඤ්චකාමසම්පත්; පටිසෙවන්ති, සෙවනයකෙරෙද්ද (ඔව්හු); සබ්බදුක්ඛස්ස, සියලු දුකට; භාගිනො හොන්ති, හිමිවෙත්;තථා, එසේම; ආපායිකා හොන්ති, අපායෙහි උපදනාහුද වෙත්.

14 ථොකෙනෙව තුලාකොටි යාති උන්නතිමොනතිං,
තථා පුථුජ්ජනො ලොකෙ යාති කොපප්පසාදනං'ති.

තුලාකොටි, තුලාකෙළවර; ථොකෙන එව, මදකින්ම; උන්නතිං ඔනතිං, උස්වීමටහා පහත්වීමට, යාති, යේ; තථා,එසේම; ලොකෙ ලොකයෙහි;පුථුජ්ජනො, පෘථග්ජනතෙම;කොපප්පසාදනං, (ස්වල්පය කින්ම) කොපයටහා පැහැදීමට;යාති,පැමිණෙයි.

15 නෙකසතසහස්සෙ හි උත්තමාධමමජ්ඣිමෙ,
නහායන්තෙ යථා ගඞ්ගා තිත්තිං නායාති සබ්බදා,

සබ්බදා, හැමකල්හි; නෙක සතසහස්සෙ හි, නොයෙක් සියදහස් ගණන්; උත්තමාධමමජ්ඣිමෙ, උත්තම අධම මධ්‍යමජනයා; නහායන්තෙ,(බැස) නහනකල්හිදු; ගඞ්ගා, නදීතොමෝ; යථා,යම්සේ; තිත්තිං, (මේ පමණැයි) තෘප්තියට; නායාති, නොයාද:—

16 තථා තිත්තිං න ගච්ඡන්ති න විජානන්ති කුලාකුලං,
දුප්පූරා වනිතා නාම එකස්සෙකා න විජ්ජති.

තථා, එපරිද්දෙන් (ස්ත්‍රීහු); තිත්තිං,(මෙවුන්සෙවිමෙහි) තෘප්තිය කට; න ගච්ඡන්ති, නොයෙත්; කුලාකුලං, හීනොත්කෘෂ්ඨකුල විශෙෂයක්; න විජානන්ති, නොසිතත්;වනිතා නාම, ස්ත්‍රීහු නම්; දුප්පූරා, (වස්ත්‍රාලඞ්කාර මෛථුනාදීන්) නොපිරවියහැකි අදහස් ඇතියහ;එකස්ස එකා, එක්ස්ත්‍රියක් එක්පුරුෂයෙකුටය කියාත්; නවිජ්ජති, නැත්තේය.

17 ගච්ඡන්තා අඤ්ජසෙ ලොකෙ ජන්තුනො උත්තමාධමා,
සාධාරණා තා පථෙව පියො ලොකෙ අසඤ්ඤතා,

ලොකෙ, ලොකයෙහි; උත්තමාධමා,උත්තම අධම යන; ජන්තුනො, (සියලු) ජනයෝ; අඤ්ජසෙ, මාර්ගයෙහි; ගච්ඡන්තා, යම්සේ

යන්නාහුවෙද්ද (එපරිද්දෙන්); ලොකෙ, ලොකයෙහි; අසඤ්ඤතා, සංයමනැත්තාවූ; තා ඉත්ථියො, ඒ ස්ත්‍රීහු; පථෙව, (සර්වසාධාරණ) මාර්ගය මෙන්; සාධාරණා, (උත්තමාධමයන්ට) සාධාරණ වෙත්.

18 පානාගාරං යථා සොණ්ඩා පවිසිත්වා අනෙකකා,
පිවන්ති තං'ව සබ්බා තා සහන්ති සකලං පජං.

යථා, යම්සේ; අනෙකකා සොණ්ඩා, නොයෙක් රාසොඬහු; පානාගාරං, සුරාපානශාලාවට; පවිසිත්වා, පිවිස; පිවන්ති, සුරාපානය කෙරෙද්ද; තං ඉව, එමෙන්; තා සබ්බා, ඒසියලු (මාගම්හු); සකලං පජං; සියලු(සල්ලාල)ජනයා; සහන්ති, ඉවසත් (ඔවුන් මනදෙල පුරත්).

19 යථා සභායමා'ගම්ම විස්සමන්ති පුථුජ්ජනා,
සභා සමා ඉමා කාමා නත්ථි තාසු විචාරණා.

යථා, යම්සේ; පුථුජ්ජනා, බොහෝජනයෝ; සභායං, (චතුෂ්පථයෙහි කරණ ලද) ශාලාවට; ආගම්ම, පැමිණ; විස්සමන්ති, විශ්‍රාම කෙරෙද්ද (එසේම); ඉමා කාමා, මේ ස්ත්‍රීහු; සභා සමා, (සර්වසාධාරණ) ශාලා සමානය; තාසු, ඔවුන් කෙරෙහි; විචාරණා, විචාරණයක්; නත්ථි, නැත්තේය.

20 සබ්බසාධාරණා එතා අඩ්ඪකානං පපා යථා,
අනග්ඝා'නුභොන්තානං ජනානං කිම්ඵලං යථා.

පපා, පැන්හල (පින්තාලිය); අඩ්ඪකානං, මගීන්ට; යථා, යම්සේ; සබ්බසාධාරණා, සර්වසාධාරණද (එසේම); එතා, මේ ස්ත්‍රීහුද (සර්වසාධාරණය); කිම්ඵලං (වර්ණ ගන්ධයෙන් ආම්‍රඵලසදෘශවූ) කිම්ඵල නම්වූ විෂඵල; යථා, යම්සේ නම් එසේ; අනුභොන්තානං, තමාවැලඳගන්නාවූ; ජනානං, සත්ත්වයන්ට; අනත්ථා, අනර්ථගෙණ දෙන්නාහුවෙත්.

21 අලිකං භණන්ති සච්චං'ව සච්චං තා අලිකං කරෙ,
කරොන්ත'කස්ස පෙමං තා වචසා සඤ්ඤමං පරං හි'

තා, ඒ ස්ත්‍රීහු; සච්චං ඉව, සත්‍යයක්මෙන්; අලිකං භණන්ති, බොරුකියත්; සච්චං, සැබව; අලිකං කරෙ, (ස්ත්‍රීජනයා), බොරුකෙරෙයි; තා, ඒස්ත්‍රීහු; එකස්ස, එකෙකුට; පෙමං කරොන්ති, (සිතින්) ප්‍රෙම කෙරෙත්; වචසා, වචනයෙන්; පරං, අනිකෙකු; සඤ්ඤමං කරොන්ති, සඤ්ඤමකෙරෙත් (සංයමවශයෙන් බැඳුනෙකුකෙරෙත්).

22 නිසම්ම ඛත්තියො කයිරා නානිසම්ම දිසම්පති,
නිසම්ම කාරිනො රඤ්ඤො යසො කිත්ති ච වඩ්ඪති.

දිසම්පති, රජ්ජුරුවන් වහන්ස; ඛත්තියො, හැත්තෙම; නිසම්ම, පරීක්ෂා කාරිව; කයිරා, (කටයුතු) කරන්නේය; අනිසම්ම,

අපරීක්‍ෂාකාරීව, න, නොකරන්නේය; නිසම්මකාරිනො, පරීක්‍ෂා කා රීවූ; රඤ්ඤො, රජහුගේ; යසො, පිරිවර යසසද; කිත්ති ච, කීර්ති සද; වඩ්ඪන්ති, වැඩේ.

23 අනිසාමෙත්වාන යො දෙසං යස්ස කුබ්බති නිග්ගහං,
මෙඡ්ඣිරඤ්ඤො'ව භූපාල සරට්ඨො ස විනස්සති.

භූපාල, පෘථිවිපාලයන් වහන්ස; යො, යම් රජෙක්තෙම; යස්ස, යමෙකුගේ; දෙසං, දෝෂය; අනිසාමෙත්වාන, පිරික්සා නොකොට; නිග්ගහං කුබ්බති, (යමෙකුට) නිග්‍රහකෙරේද; සරට්ඨො, රටසහිතවූ; සො, ඒ රජතෙම; මෙඡ්ඣිරඤ්ඤො ඉව, මෙඡ්ඣිනම් රජහුටවූ විපත මෙන්, විනස්සති, වැනසෙයි.

24 අති සීතං වා'තිමුදුං දීනා ච දීඝසොත්තියං,
විසයෙසු නිරතං ලොකො රාජානම'වමඤ්ඤති.

ලොකො, ලෝවැසිතෙම; අති භීමං, ඉතා භය එලවන්නාවූද; අති මුදුං, ඉතා මොළොක්වූද; දීනංච, (ධන ධාන්‍යයෙන්) දිළිඳු (බැගෑපත්වූ)ද; දීඝසොත්තියං, ප්‍රාරබ්ධ ක්‍රියායෙහි කාලක්‍ෂෙප කරන්නාවූද; විසයෙසු, පඤ්චකාමයෙහි; නිරතං, නිබඳ ඇලුනාවූද; රාජානං, රජුට; අවමඤ්ඤති, අවමන් කෙරේ.

25 තික්ඛං ඛරං අදාතාරං පමත්තං ගබ්බිතං සඨං,
කුසීතං ව්‍යසනෙ භීරුං රාජානම'ව මඤ්ඤති.

තික්ඛං, තියුණුබස් ඇත්තාවූ; ඛරං, (කියනකින් කපන්නාසේ) ක්‍රූරවචන ඇත්තාවූ; අදාතාරං, අන්හට කිසිවක් නොදෙන්නාවූ; පමත්තං, (කටයුත්තෙහි) පමාවූ, ගබ්බිතං, ගර්විත (ආඩම්බර ඇත්තා)වූ; සඨං, කෛරාටිකවූ; කුසීතං, (රාජ කෘත්‍යයෙහි) අලසවූ; ව්‍යසනෙ, විපත්තියක් පැමිණි කල්හි; භීරුං, බියපත් වෙන්නාවූ; රාජානං, රජුට; අවමඤ්ඤති, (ලෝවැසිතෙම) අවමන්කෙරේ.

26 ධූමකෙතු'ව සපෙපා'ව රක්ඛසො විය යො ජනෙ,
සංකුචෙති යසො තස්ස ඝතබින්දුම්'වම්භසි.

යො, යම්රජෙක්තෙම; ධූමකෙතු ඉව, වහ්නියක්මෙන්; සප්පො ඉව, සර්පයෙකුමෙන්; රක්ඛසො විය, රාක්‍ෂසයෙකුමෙන්; ජනෙ, ජනයන්; සංකුචෙති, (බියගන්වා) හකුලුවාද; තස්ස, ඒ රජහුගේ; යසො; යසස; අම්භසි, ජලයෙහි (වන්කළ); ඝත බින්දුං ඉව, ගිතෙල් බිඳමෙන් (හැකිලෙයි නොපැතිරෙයිසේයි).

27 රාජධම්මො පජාරක්ඛා වුඩ්ඪපඤ්ඤූපසෙවනං,
ලොකවොහාරවිඤ්ඤුත්ති අත්තනො පරිපාලනං.

28 ධම්මෙන පාලනං රට්ඨං සුහදෙසු අජිම්හතා,
ඛමාච සමණෙ සාධු රඤ්ඤො එතෙ විභූසනා.

රාජධම්මො, රාජධර්මය නම්; පජාරක්ඛා, රටවැස්සන් රැකීම ය; වුඩ්ඪපඤ්ඤූපසෙවනං, ඥානවෘද්ධ වයොවෘද්ධයන් සෙවනය කිරීම ය; ලොකවොහාර විඤ්ඤුත්ති, ලොකව්‍යවහාර දැනීමය; අත්තනො පරිපාලනං, (මෙලෝ පරලෝ දෙකින්) තමා පාලනය කිරීමය; ධම්මෙන, දැහැමෙන්; රට්ඨං, රට; පාලනං, රැකීමය; සුහදෙසු, මිත්‍රයන් කෙරෙහි; අජිම්හතා, සෘජුබවය; සමණෙ, ශ්‍රමණයන් කෙරෙහි; සාධු, මනාකොට; ඛමාච, ක්ෂාන්තිය (යන); එතෙ, මේ ගුණ; රඤ්ඤො, රජහුට; විභූසනා, අභරණයෝයි.

29 අමිත්තමපිච යො දීනං අත්තනො සරණං ගතං,
ව්‍යසනෙසව'නුගණ්හාති සවෙ භූපති භූපති.

සො භූපති, යම් රජෙක්තෙම; අත්තනො, තමාගේ; සරණං ගතං, සරණගියාවූ; දීනං, බැගෑපත්වූ; අමිත්තං අපිච, සතුරෙකුට නමුදු; ව්‍යසනෙසු, විපත් පැමිණිකල්හි; අනුගණ්හාති, අනුග්‍රහ කෙරේද; සො, ඒ පෘථිවීපාලතෙම; වෙ, එකාන්තයෙන්; භූපති, භූපති නම් වේ.

30 පජානං පාලනෙ සම්මා ධම්මිකෙ භරණෙන ච,
දීනානං විත්තදානෙන රාජානො තිදිවං ගතා.

රාජානො, (පෙර) රජදරුවෝ තුමූ; පජානං, සත්ත්වයන්; සම්මා, මොනවට; පාලනෙ, රැකීම නිමිතිකොටද; ධම්මිකෙ, ධාර්මිකවූ (මහණ බමුණන්); භරණෙන ච, පොෂණය කිරීම කරණකොටගෙණද; දීනානං, දිළිඳුන්ට; විත්තදානෙන, වස්තුදීම කරණකොටගෙණද; තිදිවං, දෙව්ලොවට; ගතා, ගියාහුය.

31 රාගො'රගො මහාරාජ එරුසො කොධ රක්ඛසො,
හදයෙ වෙ සමුට්ඨාති ඛන්තිමන්තෙන වාරියා'ති.

මහාරාජ, මහරජ්ජුරුවන් වහන්ස; රාගොරගො, රාගනැමැති සර්පතෙමේද; එරුසො, දරුණුවූ; කොධරක්ඛසො, ක්‍රොධ නැමැති රාක්ෂස්තෙමේද; හදයෙ, (නුඹවහන්සේගේ) හෘදයෙහි; වෙ, ඉදින්; සමුට්ඨාති, (යම්කලෙක) නැගිට සිටිද (එකල්හි ඔව්හු තුමූ); ඛන්තිම

නෙනාන, ඤාණයි නැමැති මනාත්‍රයෙන්; වාරියා ඉති, වැළැක්වියයුත්තානුයයි (අවවාද කෙළේය).

32 ඉච්චබහුතං සුචරිතං සුජනෙහි සිඩං
සුත්‍වාන සාධු මතිමා සුඛමේ'සමානො,
පාපං අකත්‍වා සතතං නරකොපගාමිං
සග්ගාපවග්ගසුඛදං කුසලං කරෙය්‍යා'ති.

ඉති, මෙසේ; සුජනෙහි, සත්පුරුෂයන් විසින්; සිඬං, සිදුකරණ ලද; අබ්භුතං, ආශ්චය්‍ය්‍යවූ; සුචරිතං, සුචරිත ධර්මය; සුත්‍වාන, අසා; සුඛං, සැප; එසමානො, සොයන්නාවූ; මතිමා, ප්‍රාඥවූ; සාධු, සජ්ජන තෙම; නරකොපගාමිං, අපායගාමිවූ; පාපං අකත්‍වා, පව් නොකොට; සතතං, අනවරතයෙන්; සග්ගාපවග්ගසුඛදං, සගපවග සැප දෙන්නාවූ; කුසලං, (දනාදී) කුසල්; කරෙය්‍ය, කරන්නේය.

## කාකවණ්ණතිස්ස වස්තුව-2.

---

33 මහාසම්පත්ති තුම්හෙහි ලද්ධායං පුඤ්ඤකම්මුනා,
අප්පමාදෙව කාතබ්බා පුඤ්ඤකමෙම ඉදනි'පිති.

තුම්හෙහි, තොප විසින්; අයං මහාසම්පත්ති, මේ මහා සම්පත්; පුඤ්ඤකම්මුනා, (පුණ්) පුණ්‍යකර්මහෙතුවෙන්; ලද්ධා, ලබනලදී; ඉදනි අපි, දනුදු; පුඤ්ඤකම්මෙ, පින්කිරීමෙහි; අප්පමාදෙව, අප්‍රමාදයම; කාතබ්බා, කටයුත්තේය.

34 තස්සෙවං දෙහලො ආසි මහාපුඤ්ඤාය දෙවියා,
උසභමත්තානං මධුගණ්ඩං කත්‍වා උස්සීසකෙ සයං.

35 වාමෙතරෙන පස්සෙන නිපන්නා සයනෙ සුභෙ,
ද්වාදසන්නං සහස්සානං භික්ඛූනං දිත්‍වා සෙසකං.

36 මධුං භුඤ්ජිතුකාමාසි අථ එළාල රාජිනො,
යොධානමග්ගයොධස්ස සීසඡින්නානාසි ධොවනං.

37 තස්සෙ'වසීසෙ ඨත්‍වාන පාතුං චෙව අකාමයි,
අනුරාධපුරස්ස'ච උප්පලක්ඛෙත්තතො පන.

38 ආනිතුප්පලමාලංච අමිලාතං පිළන්ධිතුං,
සිනාතුං පාතුමා'නීතපානීයං තිස්සවාපියා'ති.

මහාපුඤ්ඤාය, මහ පින්ඇත්තාවූ; තස්සා දෙවියා, ඒ මෙහෙසියට; එවං, මෙසේ; දෙහලො ආසි, දෙළෙක්වූයේය; (කෙසේද?) උස

හමතනං, ඉස්බක් පමණ (දිග ඇති); මධුග ණ්ඩං, මීපටලයක්; සගං, තමා; උසසීසංකෙ, ඉසඉද්දර; කත්වා, කොට (තබා);–වාමෙතරෙන ප සෙසන, දකුණැලයෙන්; සුභෙ, යහපත්වූ; සයනෙ, යහනෙහි; නි පනනා, වැදහොත්තී; වාදසනනං සහසසානං, දොළොස් දහසක්; භිකඛුනං, භික්ෂූන්ට; දිනනසෙසකං, දී ඉතිරිවූ;—මධුං, මී; භුජිතුකා මා ආසි, අනුභවකරණු කැමැත්විය; අථ, ඉක්බිති; එලාලරාජිනො, එලාල රජහුගේ; යොධානං, යොධයන් අතුරෙන්; අඟයොධසස, ප්‍රධාන යොධයාගේ; සීසච්ඡිනනාසි ධොවනං, හිසසුන් කඩුව සේදූ ජලය;–තසස එව, ඔහුගේම; සිසෙ, හිසෙහි (හිසමැඬගෙණ); ඨපෙ‍ාන, සිට; පාතුංච එව, පානයකරන්ටද; අකාමයි, කැමැතිවිය; අනුරාධ පුරසස එව, අනුරාධපුරයාගේම; උපපලකෙඛතතතො පන, උපුල් කෙතින්;–ආනීත, ගෙණෙනලද; අමිලාතං, නොමැලවුනු; උපපලමා ලං, උපුල්මල් මාලාවක්; පිලන්ධිතුංච, පලඳින්ටද; තිසසවාපියා, තිසා වැවෙන්; ආනිත, ගෙණෙනලද; පානීයං, පැන්; පාතුං, බොන්ටද; සිනාතුං, (එයින්) නාන්ටද; (දොළදුක් වූහ).

39 සූරවීරබලූපෙතො මෙරුසාරො ගුණාකරො,
ධීරො සුමතිවිකකනෙතා පුතෙතා තෙ දෙව ජායති.

දෙව, දෙවයන් වහන්ස; තෙ, නුඹවහන්සේට; සූරවිරබලූපෙ තො, ශෞරවීර්‍ය්‍ය බලයෙන් යුක්තවූ; මෙරුසාරො, මහමෙරසේ සාර වූ; ගුණාකරො, ගුණයන්ට ආකරවූ; ධීරො, ධෛර්‍ය්‍ය සම්පන්නවූ; සුමතිවිකකනෙතා, සුන්දර ප්‍රඥ, වික්‍රම ඇත්තාවූ; පුතෙතා, පුත්‍රයෙක්; ජායතී, උපදී.

40 චතතිංසදමිලෙ හනතවා කතවා යුධං අසාදිසං,
වසෙ කාතවානිමං ලඞකං එකරජජං කරිසසති.

අසාදිසං, අසදෘශවූ; යුධං කතවා, යුද්දකොට, චතතිංසදමිලෙ, දෙ මළ දෙතිස්කඳවුරෙහි ඇතිලාළුන් දෙළුන්; හනතවා, නසා; ඉමං ලඞකං, මේ ලක්දිව; වසෙකාතවා, (තමන්) සටතෙහි කොට; එකර ජජං, අසහායරාජ්‍යය; කරිසසති, කරන්නේය.

41 අනුරාධපුරෙ රමෙම වසනෙතා සාසනං ඉමං,
සොභෙසසති යථා'සොක ධමමරාජා'ව සාසනං'ති.

රමෙම, රම්‍යවූ; අනුරාධපුරෙ, අනුරාධපුරයෙහි; වසනෙතා,(මේ කුමරතෙම) වාසය කරන්නේ; අසොකධමමරාජා, ධර්මාශොක රජ තෙම; සාසනං, බුදුසස්න; යථා, යම්සේ (බැබලවූයේද එපරිද්දෙන්); ඉමං සාසනං, මේ(ලක්දිව) බුදුසසුන; සොභෙසසති, බබලවන්නේය.

42 දෙය්‍යධම්මෙසු මා රාජ ඔස්සක්කාපය මානසං,
උප්පන්නං කුසලං චිත්තං නෙවොස්සක්කන්ති පණ්ඩිතා.

රාජ, රජ්ජුරුවන් වහන්ස; දෙය්‍යධම්මෙසු, දියයුතු වස්තුවෙහි; මානසං, සිත; මා ඔස්සක්කාපය, පසුනොබස්සව; පණ්ඩිතා, පණ්ඩිතයෝ තුමූ; උප්පන්නං, උපන්නාවූ; කුසලං චිත්තං, කුසල් සිත; නෙව ඔස්සක්කන්ති, පසුනොබස්වති.

43 දෙහි දානං යථාකාමං තව චිත්තානුකූලකං,
අහං තෙ ආහරිං පඤ්ච සාසනං තුට්ඨිදායකං'ති.

තව, තුඹවහන්සේගේ; චිත්තානුකූලකං, සිතට අනුකූලවූ; දානං, දානවස්තු; යථාකාමං, කැමැතිපරිද්දෙන්; දෙහි, දුනමැනව; තෙ, තුඹවහන්සේට; තුට්ඨිදායකං, සන්තුෂ්ටි ගෙණදෙන්නාවූ; පඤ්ච සාසනං, හසුන්පසක්; අහං, මම; ආහරිං, ගෙණආයෙමි.

44 එසොයං යදි මෙ පුත්තො අස්මිං ලඞ්කාතලෙ'ඛිලෙ,
රජ්ජං ගහෙත්වා සම්බුද්ධසාසනං ජොතයිස්සති.

යදි, ඉදින්; මෙ, මාගේ; එසො අයං පුත්තො, ඒ මේ පුත්‍රතෙම; අඛිලෙ, සියලු; අස්මිං ලඞ්කාතලෙ, මේ ලක්දිව; රජ්ජං ගහෙත්වා, රජයගෙණ; සම්බුද්ධසාසනං, සම්බුදුසස්න; ජොතයිස්සති, බබුලුවන්නේද–

45 අට්ඨුත්තරසහස්සං ච භික්ඛවො පවිසන්තු ච,
සබ්බෙ තෙ උද්ධපත්තාව චීවරං පාරුපන්තු ච.

අට්ඨුත්තරසහස්සංච, අටතුරාදහසක්ම; භික්ඛවො, භික්ෂූහු; චීවරං, සිවුරු; පාරුපන්තු ච, (ගැටවවුගන්වා) පොරෝනා සේක්වා; තෙ සබ්බෙ, ඔව්හු සියලුදෙනා වහන්සේම; උද්ධපත්තාව, පාත්‍ර උඩුකුරුකොට ඇත්තෝම; පවිසන්තු ච, (මෙහි) වඩනාසේක්වා.

46 පඨමං දක්ඛිණං පාදං උම්මාරන්තො ඨපෙන්තු ච,
එකං ඡත්තයුතං ධම්මකරකං නීහරන්තු ච.

පඨමං, පළමුකොට; දක්ඛිණං පාදං, දකුණු පය; උම්මාරන්තො, එලිපත මැද; ඨපෙන්තුව, තබත්වා; ඡත්තයුතං, ඡත්‍රයෙන් යුක්තවූ; ධම්මකරකං, ඩබරාව; එකං, එකවටම; නීහරන්තුව, බැහැර කෙරෙත්වා.

47 ගොතමො නාම ථෙරො ච පතිගණ්හාතු පුත්තකං,
ථෙරා ච සරණසික්ඛායො දෙන්තු සබ්බං තථා අහූ'ති.

ගොතමො නාම, ගොතම නම්වූ; ථෙරො ච, ස්ථවිර කෙණෙක් ම; පුත්තකං, (මාගේ) පුත්‍රයා; පතිගණ්හාතු, පිළිගණීවා; සො ච, උත්වහන්සේම; සරණසික්ඛායො, සරණ හා සික්ෂාපදයන්; දෙතු ඉති, දෙන සේක්වයි (සිතුයේය); සබ්බං, සියල්ල; තථා අහු, එසේම වීය.

48 මහාගාමෙ නායකත්තං පිතු නාමං ච අත්තනො,
උභො කත්වාන එකජ්ඣං ගාමණී අභයො ඉති'ති.

මහාගාමෙ, මාගම්හි; නායකත්තං, නායකබවද; අත්තනො, තමාගේ; පිතු නාමං ච, පියරජහුගේ නාමයද (යන): උභො, දෙක; එකජ්ඣං කත්වාන, එකතුකොටගෙණ; ගාමිණීඅභයො ඉති, ගාමණී අභයකුමාරයයි (නම්කෙළේය).

49 ලොකසාසනහාරං හි (යදි) තුම්හෙ ජඩෙස්ථ පුත්තකා,
මා ජීරතු කුච්ජිගතං ඉදං වො'ති අදාප'සි.

පුත්තකා, දරුවෙනි; තුම්හෙ, තෙපි; ලොකසාසනහාරං හි, ලෝස සුන්බර;(යදි, ඉදින්;) මා ජඩෙස්ථ, බැහැරනොකරන්නහු නම්; වො, තොපගේ; කුච්ජිගතං, කුක්ෂිගතවූ; ඉදං, මේ (ආහාරය); ජීරතු, දිරාවා; ඉති, මෙසේ කියා; අදාපසි, දෙවූයේය.

50 විඤ්ඤාය භාසිතත්ථං තෙ උභො රාජකුමාරකා,
පායාසං තං අභුඤ්ජිංසු තුට්ඨචිත්තා'මතං විය'ති.

තෙ උභො රාජකුමාරකා, ඒ රජකුමරුවෝ දෙදෙන; භාසිතත්ථං, කියනලද කාරණය; විඤ්ඤාය, දැන; තුට්ඨචිත්තා, සතුටු සිත් ඇත්තාහු; තං පායාසං, ඒ කිරිබත; අමතං විය, දිව බොජුනක් මෙන්, අභුඤ්ජිංසු, අනුභවකළාහුය.

51 කුලදෙවතානං නො තාතා භික්ඛූනං විමුඛා මයං,
න හෙස්සාමාති චින්තෙත්වා භාගං භුඤ්ජථිමං'ති ච.

තාතා, දරුවෙනි; නො, අපගේ; කුලදෙවතානං, කුලදෙවතාවූ; භික්ඛූනං, භික්ෂූන්වහන්සේලාට; මයං, අපි; විමුඛා න හෙස්සාම ඉති, විමුඛ (අහිත) නොවන්නෙමුයි; චින්තෙත්වා, සිතා; ඉමං භාගං, මේ කොටස; භුඤ්ජථ ඉති ච, අනුභවකරව් කියාද:-

52 ෙව භාතරො මයං නිච්චං අඤ්ඤමඤ්ඤං ම'දූහකා,
භවිස්සාමා'ති චින්තෙත්වා භාගං භුඤ්ජථි'මං'ති ච.

ෙව භාතරො මයං, දෙබෑ අපි දෙදෙන; අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්; අදූහකා භවිස්සාම ඉති, විපක්ෂ නොවන්නෙමුයි; චින්තෙ

තා, සිතා; ඉමං භාගං, මේ කොටස; භුඤ්ජථ ඉති ච, අනුභව කරවිත්සාද:–

53 න යුජ්ඣිස්සාම දමිළෙහි ඉති භුඤ්ජථි'මං ඉති,
නියොජෙසි මහාරාජා එවං රාජකුමාරකෙ'ති.

දමිළෙහි, දෙමළුන් සමග; න යුජ්ඣිස්සාම ඉති, යුද නොකරන් නෙමුයි කියා; ඉමං, මේ භාගය; භුඤ්ජථ ඉති, අනුභව කරව්යයිද; මහාරාජා, මහරජතෙම; කුමාරකෙ, කුමරුවන්ට; එවං, මෙසේ; නියොජෙසි, නියෝග කෙළේය.

54 ගඞ්ගාපාරං හි දමිළා වසන්තඞ්ගිසිඛා විය,
ඉතො ගොඨසමුද්දොව කථං සෙමි සුඛං අහං'ති.

දමිළා, දෙමළු; ගඞ්ගාපාරං හි, ගඟින් එතර; අඞ්ගිසිඛා විය, ගිනිසිළුමෙන්; වසන්ති, වෙසෙත්; ඉතො, මැතින්; ගොඨසමුද්දොව, ගොළුමුහුදම වේ; අහං, මම; කථං, කෙසේ; සුඛං සෙමි ඉති, (ප්‍රසාරිතාඞ්ග ප්‍රත්‍යඞ්ග ඇතිව) සුවසේ නිදම්දූයි (කීයේය).

55 සො කමෙනාභිවඩ්ඪන්තො අහු සොළසවස්සිකො,
පුඤ්ඤවා යසවා ධීමා තෙජොබලපරක්කමො.

පුඤ්ඤවා, පින් ඇත්තාවූ; යසවා, කීර්ති ඇත්තාවූ; ධීමා, ප්‍රඥා ඇත්තාවූ: තෙජො; ප්‍රතාප ඇත්තාවූ; බලපරක්කමො, බලපරාක්‍රම ඇත්තාවූ; සො, ඒ ගාමණී කුමාරතෙම; කමෙන, ක්‍රමයෙන්; අභිවඩ්ඪන්තො, මනාකොට වැඩෙන්නේ; සොළසවස්සිකො අහු; සොළසැවිරිදි වයස් ඇතිවිය,

56 හත්ථස්සථරුකම්මස්ස කුසලො කතුපාසනො,
සො ගාමණී රාජසුතො මහාගාමෙ වසී තදා'ති.

හත්ථස්සථරුකම්මස්ස—හත්ථි, හස්තිශිල්පය; අස්ස, රථ ශිල්පය; ථරුකම්මස්ස, ඛඞ්ගශිල්පය යන මිට; කුසලො, දක්‍ෂවූ; කතූපාසනො, කරණලද ශිල්පදූක්වීම් ඇත්තාවූ; සො ගාමණීරාජසුතො, ඒ ගාමණී රාජපුත්‍රතෙම; තදා, එකල්හි; මහාගාමෙ, මාගම්හි; වසී, විසූයේය.

57 නන්දිමිත්තො සුරනිමලො මහාසොණො ගොඨයිම්බරො,
ථෙරපුත්තාභයො භරණො වෙළුසුමනො තථෙව ච.

58 ඛඤ්ජදෙවො ඵුස්සදෙවො ලභියවසභො පි ච,
එතෙ දස මහායොධා තස්සාහෙසුං මහබ්බලා'ති.

නන්දිමිත්තො, නන්දිමිත්‍රය; සුරනිමලො, සුරනිම්ලය; මහාසොණො, මහාසොණය; ගොඨයිම්බරො, ගොඨයිම්බරය; ථෙරපුත්තාභයො, ථෙරපුත්‍රාභයය; භරණො, භරණය; වෙළුසුමනො, වෙළුසුමනය; තථා එව, එසේම; ඛඤ්ජදෙවො, ඛඤ්ජදෙවය; ඵුස්සදෙවො, ඵුස්සදෙවය; ලභියවසභොපිච, ලභිය වසභය යන; එතෙදස, මේ දසදෙන; තස්ස, ඔහුගේ; මහබ්බලා, මහත් බලඇත්තාවූ; මහා යොධා අහෙසුං, මහා යොධයෝ වූහ.

59 එකාදසසහස්සං ච දසුත්තරසතම්පි ච,
අහෙසුං පිණ්ඩිතා යොධා මහබ්බලපරක්කමා'ති.

මහබ්බලපරක්කමා, මහත් බලපරාක්‍රම ඇත්තාවූ; පිණ්ඩිතා, රැස්කරණලද; යොධා, යොධයෝ; එකාදසසහස්සං ච, එකොළොස්දහසක්ද; දසුත්තරසතම්පිච, දසාධිකසියයක්ද; අහෙසුං, වූවාහුය.

60 පිතා මෙ පුරිසො හොති නෙව වක්ඛති තෙනිදං,
පිළන්ධතූ'ති පෙසෙසි ඉත්ථාලඞ්කාරමස්ස සො.

මෙ පිතා, මපියානන් වහන්සේ; පුරිසො හොති, පුරුෂයෙක් වේ නම්; ඉදං, මේ (සටන); නෙව වක්ඛති, (වළක්වන්ට) නොකියයි; තෙන, එහෙයින්; ඉත්ථාලඞ්කාරං, ස්ත්‍රී ආභරණ; පිළන්ධතු ඉති, පළඳිනසේක්වයි; අස්ස, ඒ පියරජහට; සො, ඒ කුමාරතෙම; පෙසෙසි, (ස්ත්‍රී පළඳනා) යැවූයේය.

61 රාජා හි තස්ස කුජ්ඣිත්වා කරොථ හෙමසඞ්ඛලිං,
තායනං බන්ධයිස්සාමි නාඤ්ඤථා රක්ඛියො හි සො'ති.

රාජා හි, රජතෙමේ වනාහි; තස්ස, ඒ රජකුමරහට; කුජ්ඣිත්වා, කිපී; හෙමසඞ්ඛලිං, රන් ඇකිල්ලක්; කරොථ, කරව්; නං, ඔහු; තාය, ඒ රන් හැකිල්ලෙන්; බන්ධයිස්සාමි, බඳවන්නෙමි; සො, හෙතෙම; අඤ්ඤථා, අනික් පරිද්දකින්; න රක්ඛියො හි ඉති, රැකගත නොහැක්කේමය.

62 අහු චිතනං මහායුද්ධං චූළඞ්ගණියපිට්ඨියං,
තත්‍ථ නෙකසහස්සානි පතිංසු රාජිනො නරා.

චූළඞ්ගණියපිට්ඨියං, සුළුඟුණුපිට්යෙහි; චිතනං, දෙබෑයන්ගේ; මහායුද්ධං, මහත් යුද්ධයෙක්; අහු, වීය; තත්‍ථ, ඒ යුදෙහිදී; රාජිනො, දුටුගැමුණු රජහුගේ; නෙකසහස්සානි, නොයෙක් දහස් ගණන්; නරා, මනුෂ්‍යයෝ; පතිංසු, වැටුනාහුය.

63. රාජා ච තිස්සාමච්චො ච වළවාදීඝගුණිකා,
තයොයෙව පලායිංසු කුමාරො අනුබන්ධි තෙ.

රාජා ච, රජතෙමේද; තිස්සාමච්චො ච, තිස්සනම් අමාත්‍යතෙමේද; දීඝගුණිකා, දීඝගුණිකානම්වූ; වළවා, වෙළඹද යන; තයොඑව, තුන් දෙනම; පලායිංසු, පැනදිවූහ; කුමාරො, තිස්සකුමාරතෙම; තෙ, ඔවුන් (පසුපස්සෙහි); අනුබන්ධි, ලුහුබැන්දේය.

64. උභින්නමනන්තරෙ භික්ඛු මාපයිංසු මහීධරං,
තං දිස්වා භික්ඛුසඞ්ඝස්ස කම්මං ඉති නිවත්ති සො'ති.

භික්ඛු, භික්ෂූහු; උභින්නං අනන්තරෙ, දෙපස අතර; මහීධරං, පර්වතයක්; මාපයිංසු, නිර්මාණකළාහුය; සො, ඒ කුමාරතෙම; තං දිස්වා, ඒ පර්වතය දැක; භික්ඛුසඞ්ඝස්ස, භික්ෂුසඞ්ඝයාගේ; කම්මං ඉති, ක්‍රියාවෙ කැයි දැන; නිවත්ති, නැවැත්තේය.

65. දිස්වා ගතං ගහෙත්වාතං තිස්සො භොජෙසි භූපතිං,
භුඤ්ජිත්වාන සයඤ්චාපි වළවං චා'පි භොජයි,
සන්නාහං චුම්බටං කත්වා රාජා පත්තං විසජ්ජයි.

තිස්සො, තිස්සතෙමේ; ගතං, ආකාශගතවූ; තං දිස්වා, ඒ පාත්‍රය දැක; ගහෙත්වා, ගෙණ; භූපතිං, රජු; භොජෙසි, වැළඳවූයේය; සයංච අපි, තෙමේද; භුඤ්ජිත්වාන, අනුභවකොට; වළවංච අපි, වෙළඹද; භොජයි, අනුභවකෙරෙව්වේය; රාජා, රජතෙම; සන්නාහං, සන්නාහය (යුධඇඳුම); චුම්බටං කත්වා, සුම්බුහුකොට (බහා); පත්තං, පාත්‍රය; විසජ්ජයි, හැරියේය.

66. රාජා වළවමාරුය්හ තිස්සොතු කණ්ඩුලංකරිං,
වෙ භාතරො සමාගඤ්ඡුං යුජ්ඣමානා රණෙ තදා.

තදා, එකල්හි; රාජා, රජතෙමේ; වළවං, වෙළඹපිට; ආරුය්හ, නැගී; තිස්සොතු, තිස්සකුමාරතෙමේද; කණ්ඩුලංකරිං (ආරුය්හ), කඩොලැතුපිට (නැගී); යුජ්ඣමානා, යුදකරන්නාහු; රණෙ, යුධභූමියෙහි; වෙභාතරො, දෙබෑයෝ; සමාගඤ්ඡුං, එක්වූහ.

67. රාජා කරිං කරිත්වනෙතා වළවාමණ්ඩලං අකා,
තථාපි ඡිද්දං නොදිස්වා ලඞ්ඝාපෙතුං මතිං අකා.

රාජා, රජතෙම, කරිං, ඇතු; අන්තොකරිත්වා, ඇතුළුකොට; වළවාමණ්ඩලං, වෙළඹමඬුල්ලක්; අකා, කෙළේය; තථාපි, එසේද; ඡිද්දං නොදිස්වා, අවසර නොදැක; ලඞ්ඝාපෙතුං, පන්වන්ට; මතිං අකා, කල්පනාකෙළේය.

68. වළවාය ලඞ්ඝාපෙත්වාන හත්ථිනං භාතිකොපරි,
තොමරං ඛිපි චම්මං ච යථා ඡිජ්ජති පිට්ඨියං.

හත්ථිනං, ඇතුගේ (මත්තෙහි හා); භාතිකොපරි, සහෝදරයාගේ මත්තෙන්; වලවාය, වෙළඹ; ලඞ්ඝාපෙත්වාන, පන්නවා; චම්මං, සන්නාහය; යථාඡිජ්ජතිච; යම්සේ කැපේද; (එපරිද්දෙන්): පිට්ඨියං, (සන්නාහය) පිට; තොමරං, තොමරය; ඛිපි, දැමිය.

69. අනෙකානි සහස්සානි කුමාරස්ස නරා තහිං,
පතිංසු යුද්ධෙ යුජ්ඣන්තා භිජ්ජිචෙව මහබ්බලං.

යුද්ධෙ, ඒ යුද්ධයෙහි; කුමාරස්ස, තිස්සකුමාරයාගේ; අනෙකානි සහස්සානි, නොයෙක් දහස්ගණන්; නරා, මනුෂ්‍යයෝ; යුජ්ඣන්තා, යුද්ද කෙරෙමින්; තහිං, එහි; පතිංසු, වැටුනාහුය; මහබ්බලං ච එව, (ඔහුගේ) මහත්බලයද; භිජ්ජි, බිඳුනේය.

70. ආරොහකස්ස වෙකල්ලා ඉත්ථි මං ලඞ්ඝයී ඉති,
කුද්ධො කරී තං චාලෙන්තො රුක්ඛමෙකමුපාගමි.

ආරොහකස්ස, ඇතරුවාගේ; වෙකල්ලා, විකලත්වය හෙතුකොට ගෙණ; ඉත්ථි, ස්ත්‍රිය; මං, මා; ලඞ්ඝයී ඉති, ඉක්මවූයේයයි; කුද්ධො, කිපියාවූ; කරී, හස්තිතෙම; තං, ඔහු; චාලෙන්තො, සොලවමින්; එකං රුක්ඛං, එක් රුකක්මූලට; උපාගමි, එළඹියේය.

71. කුමාරො ආරුහි රුක්ඛං හත්ථි සාමිමුපාගමි,
තමාරුය්හ පලායන්තං කුමාරං අනුබන්ධි සො'හි.

කුමාරො, තිස්සකුමාරතෙම; රුක්ඛං, රුකට; ආරුහි, නැංගේය; හත්ථි, ඇත්තෙම; සාමිං, හිමියාවෙත; උපාගමි, ගියේය; සො, ඒගැමුණු රජතෙම; තං ආරුය්හ, ඒ ඇතුපිට නැගී; පලායන්තං, පලායන්නාවූ; කුමාරං, තිස්සකුමාරයා, අනුබන්ධි, ලුහුබැන්දේය.

72. නියමානන්තු තං ඤත්වා ඉදමාහ මහිපති,
තිස්ස ත්වං කුලදෙවානං සීසෙ හුත්වාන නීයසි.

මහිපති, මිහිපල්තෙමේ; නියමානන්තු, (එසේ) ගෙණයනුලබන්නාවූ; තං, ඔහු; ඤත්වා, දැන; ඉදං ආහ, මේ කියේය; තිස්ස, තිස්සය; ත්වං, තෝ; කුලදෙවානං, කුලදෙවතාවූ භික්ෂූන්ගේ; සීසෙ හුත්වාන, ඉස හිඳගෙණ; නීයසි, ගෙණයනුලැබෙහිය.

73. බලක්කාරෙන ගහණං කුලදෙවෙහි නත්ථි මෙ,
ගුණං ත්වං කුලදෙවානං සරෙය්‍යාසි කදාචි'පි.

මෙ, මාගේ; කුලදෙවෙහි, කුලදෙවයන්ගෙන්; බලක්කාරෙන, බලාත්කාරයෙන්; ගහණං, පැහැරගැන්මක්; නත්ථි, නැත; ත්වං, තුඹ; කදාචි අපි, කොයිදවසත්; කුලදෙවානං, කුලදෙවියන්ගේ; ගුණං, ගුණ; සරෙය්‍යාසි, සිහිකරන්නෙහිය.

74. රාජාහ ථෙරං ඤාතො වො දසභාවො ඉදානි නො,
සාමණෙරං පෙසයෙථ තුම්හෙ වෙ සත්තවස්සිකං.

75. ජනක්ඛයං විනායෙව කලහො න භවෙය්‍ය නො,
රාජා සඞ්ඝස්ස දෙසෙ සො සඞ්ඝො දණ්ඩං කරිස්සති.

76. හෙස්සතා'ගන්තබ්බං වො යාගාදිං ගණ්හථා'ති සො,
දත්වා තං භික්ඛුසඞ්ඝස්ස පක්කොසිත්වාන භාතරං.

77. තථෙව සඞ්ඝමජ්ඣම්හි නිසින්නො භාතරා සහ,
භුඤ්ජිත්වා එකතොයෙව භික්ඛුසඞ්ඝං විසජ්ජයී'ති.

රාජා, රජතෙමේ; වො, නුඹවහන්සේලා විසින්; නො, අපගේ; දස භාවො, දසභාවය; ඉදානි, දැන්; ඤාතො, දන්නාලද්දේය; වෙ, ඉදින්; තුම්හෙ, නුඹවහන්සේලා; සත්තවස්සිකං, සත්හැවිරිදිවූ; සාමණෙරං, හෙරණකෙණෙක්; පෙසයෙථ, එව්වාහුනම්;—ජනක්ඛයං විනායෙව, ජනක්ෂයෙන් තොරවම; නො, අපගේ; කලහො, කලහයෙක්; නභවෙය්‍ය, නොවන්නේයයි; ථෙරං, ස්ථවිරයන්ට; ආහ, කීයේය—සො රාජා, ඒ මිහිපල්තෙමේ; සඞ්ඝස්ස, සඞ්ඝයාගේ; දෙසෙ, දෝෂයෙහි; සඞ්ඝො, සඞ්ඝතෙම; දණ්ඩංකරිස්සති, දඬුවම්කරන්නේයයිද;—වො, නුඹවහන්සේලා; ආගන්තබ්බං, ආගන්තව්‍යය (ඊමේ කටයුතු); හෙස්සති, වන්නේය; යාගාදිං, කැඳආදිය; ගණ්හථ ඉති, පිළිගන්නමැන වැයිද කියා; සො, ඒ රජතෙම; භික්ඛුසඞ්ඝස්ස, භික්සඟනට; දත්වා, දන්දී; තං භාතරං, ඒ බෑයා; පක්කොසිත්වාන, කැඳවාගෙණ;—තථෙව, එසිම, සඞ්ඝමජ්ඣම්හි, සඟමැද; නිසින්නො, හුන්නේ; භාතරාසහ, මලුහා; එකතො එව, එක්වම; භුඤ්ජිත්වා, අනුභවකොට; භික්ඛුසඞ්ඝං, භික්ෂුසඞ්ඝයා; විසජ්ජයි, යැවීය.

78. දුට්ඨගාමණිරාජා'ථ කත්වාන ජනසඞ්ගහං,
ඛුණෙන ධාතුං නිධාපෙත්වා සයොග්ගබලවාහනො.

79. ගන්ත්වා තිස්සමහාරාමං වන්දිත්වා සඞ්ඝමබ්‍රවි,
පාරගඞ්ගං ගමිස්සාමි ජොතෙතුං සාසනං අහං.

80. සක්කාතුං භික්ඛවො දෙථ අම්හෙහි සහගාමිනො,
මඞ්ගලංචෙව රක්ඛාච භික්ඛූනං දස්සනං හි නො.

අථ, ඉක්බිති; දුට්ඨගාමණිරාජා, දුටුගැමුණුරජ; ජනසඞ්ගහං කත්වාන, ජනසඞ්ග්‍රහකොට; ඛුණෙන, ඛුණනයෙහි; ධාතුං නිධාපෙත්වා, ධාතුනිදන්කරවාගෙණ; සයොග්ගබලවාහනො, යානවාහන හා බල සෙන් සහිතවූයේ;—තිස්සමහාරාමං, තිස්සමහාරාමයට; ගන්ත්වා, ගොස්; සඞ්ඝං, සඞ්ඝයා; වන්දිත්වා, වැඳ; සාසනං, ශාසනය; ජොතෙතුං, බබුළු වන්ට; අහං, මම; පාරගඞ්ගං, ගඟඑතරට; ගමිස්සාමි, යන්නෙමි;—සක්කාතුං, සත්කාරකරණුපිණිස; අම්හෙහි සහගාමිනො, අපකැටුව

යන; භික්ඛවෙ, භික්ෂූන්; දෙථ, දුනමැනව; භික්ඛූනං, භික්ෂූන්ගේ; දස්සනං හි, දර්ශනයවනාහි; නො, අපට; මඞ්ගලංච එව, මගුල්ද, රක්ඛා ච, ආරක්ෂාද වන්නේයයි; අබ්‍රැවි, කීයේය.

81. අදාසි දණ්ඩකම්මත්ථං සඞ්ඝා පඤ්චසතෙ යති,
භික්ඛුසඞ්ඝං තමාදාය තතො නික්ඛම්ම භූපති.

82. සොධාපෙත්වාන මලයෙ ඉධා'ගමනමඤ්ජසං,
කණ්ඩුලං හත්ථිමාරුය්හ යොධෙහි පරිවාරිතො,
මහතා බලකායෙන යුද්ධාය අභිනික්ඛමි'ති.

සඞ්ඝා, සඞ්ඝතෙමේ; දණ්ඩකම්මත්ථං, (පළමු දෙබෑරජුන් කරණ සටන් නොවැළකීමේ) දඬුවම් පිණිස; පඤ්චසතෙ යතී, පන්සියයක් භික්ෂූන්; අදාසි, දුන්නේය; භූපති, මිහිපල්තෙමේ; තං භික්ඛුසඞ්ඝං, ඒ භික්ෂුසඞ්ඝයා; ආදාය, ගෙණ; තතො, එයින්; නික්ඛම්ම, පිටත්ව;— මලයෙ, මලයරට; ඉධ, මෙහි (අනුරාධපුරපටන්); ආගමනං අඤ්ජසං, ආගමන (එන) මාර්ගය; සොධාපෙත්වාන, ශුද්ධකරවා; කණ්ඩුලංහත්ථිං ආරුය්හ, කඩොලෑතුපිටනැගී; යොධෙහි, යොධයන්විසින්; පරිවාරිතො, පිරිවරණලදුයේ; මහතා, මහත්වූ; බලකායෙන, බලසෙන් සමග; යුද්ධාය, යුදපිණිස; අභිනික්ඛමි, නික්මුනේය.

83. ආහු තෙ සුගතං යක්ඛා දෙම මාරිස තෙ ඉමං,
සබ්බෙපි සකලං දීපං දෙහි නො අභයං තුවං.

මාරිස, නිදුකාණෙනි; තෙ, තුඹවහන්සේට; ඉමං සකලං දීපං, මේ සියලු ලක්දිව; දෙම, දෙම්හ; තුවං, තුඹවහන්සේ; නො, අපට; අභයං, අභය; දෙහි, දුනමැනවැයි; තෙ සබ්බෙපියක්ඛා, ඒ සියලුම යක්ෂයෝ; සුගතං, සුගතයන්වහන්සේට; ආහු, කීහු.

84. භයං සීතං තමං තෙසං හන්ත්වා තං දින්නභූමියං,
චම්මඛණ්ඩං අත්ථරිත්වා තත්ථා'සි මාරජී ජිනො'ති.

තෙසං, ඔවුන්ගේ; භයං, බියද; සීතං, ශීතද; තමං, අන්ධකාරයද; හන්ත්වා, නසා; තං දින්නභූමියං, ඒ දෙනලද භූමියෙහි; චම්මඛණ්ඩං, පත්කඩ; අත්ථරිත්වා, අතුට; තත්ථ, එහි; මාරජී, පස්මරුන් දිනූ; ජිනො, සර්වඥ තෙමෙ; ආසි, වැඩඋන්නේය.

85. නෙකෙසං පාණකොටීනං ධම්මාභිසමයො අහු,
සරණෙසු ච සීලෙසු ඨිතා ආසුං අසඞ්ඛියා.

නෙකෙසං පාණකොටීනං, නොයෙක් කෙළගණන් සත්වයන්ට; ධම්මාභිසමයො අහු, (සොවාන්මාර්ගඵලාදියෙන්) ධර්මාවබොධය විය; අසඞ්ඛියා, සඞ්ඛ්‍යාපථාතීත සත්වයෝ; සරණෙසු ච, (තුන්) සරණෙහිද; සීලෙසු, ශීලයන්හිද; ඨිතා ආසුං, සිටියෝ වූහ.

86. සොතාපත්තිඵලං පත්වා සෙලෙ සුමනකූටකෙ,
මහාසුමනදෙවින්දො පූජියං යාචි පූජියං.

සුමනකූටකෙ සෙලෙ, සමන්කූළුපව්වාසිවූ; මහාසුමනදෙවින්දො, මහ සමන්දෙව්රජතෙම; සොතාපත්තිඵලං, සෝවාන්ඵලයට; පත්වා, පැමිණ; පූජියං, පූජාර්හවූ සර්වඥයන්වහන්සේ (ගෙන්); පූජියං, පූජනිය වස්තුවක්; යාචි, ඉල්වූයේය.

87. චීරං පරාමසිත්වාන නීලාමලසිරොරුහො,
පානි මත්තෙන අදා කෙසෙ තස්ස පාණහිතො ජිනො.

පාණහිතො, සත්වයන්ට හිතවූ; නීලාමලසිරොරුහො, නීල, නිල්වූ; අමල, නිර්මලවූ; සිරොරුහො; කෙශයන් ඇත්තාවූ; ජිනො, සර්වඥ තෙම; චීරං, හිස; 'පරාමසිත්වාන, පරාමශීනයකොට; පානිමත්තෙන කෙසෙ, මිටක්පමණ කෙහෙ; තස්ස, ඔහට, අදා, දුන්සේක.

88. සො තං සුවණ්ණචඞ්ගොටවරෙනා'දාය සත්ථුනො,
නිසින්නඨානරචිතෙ නානාරතනසඤ්චයෙ.

89. සබ්බතො සත්තරතනෙ තෙ ඨපෙත්වා සිරොරුහෙ,
සො ඉන්දනීලථූපෙන පිදහෙසි නමස්සි චා'ති.

සො, හෙතෙම; තං, ඒ කෙහෙම්ට; සුවණ්ණචඞ්ගොටවරෙන, සවර්ණ මයවූ උතුම් කරඬුවකින්; ආදාය, (පිළි)ගෙණ; සත්ථුනො, ශාස්තෘන්ව හන්සේ; නිසින්නඨානරචිතෙ, වැඩඋන්තැන්හි කරණලද; සබ්බතො සත්තරතනෙ, අයම්විතරින් සත්රියන්වූ; නානාරතනසඤ්චයෙ, නන් වැදෑරුම් රුවන්රැසෙහි; තෙ සිරොරුහෙ, ඒ කෙශධාතූන්; ඨපෙත්වා, තබා; සො, හෙතෙම; ඉන්දනීලථූපෙන, ඉඳුනිල්මිණිමුවා ථූපයකින්; පිදහෙසි, වැසුයේය; නමස්සි ච ඉති, නමස්කාරද කෙළේය.

90. අජානිත්වා සකා සෙනා ඝාතෙන්තී සජනං ඉති,
සුත්වාන සච්චකිරියං අකරි තත්ථ භූපති.

සකාසෙනා, සියසෙන්තුමූ; සජනං, ස්වකීයජනයා; අජානිත්වා, නොහැඳින; ඝාතෙන්ති ඉති, නසන්යයි; සුත්වාන, අසා; භූපති, මිහිපල් තෙමේ; තත්ථ, එහිදී; සච්චකිරියං, සත්‍යක්‍රියා, අකරි, කෙළේය; (කෙසේද)?

91. රජ්ජසුඛාය වායාමො නා'යං මම් කදාචිපි,
සම්බුද්ධසාසනස්සෙව ඨපනාය අයං මම.

මම, මාගේ; අයං වායාමො, මේ ව්‍යායාමය තෙම; කදාචිපි, කිසිකලෙ කත්; රජ්ජසුඛාය, රජසැපපිණිස; න, නොවේද; මම, මාගේ; අයං, මේ (උත්සාහය;) සම්බුද්ධසාසනස්ස එව, සම්බුද්ධශාසනයම; ඨපනාය, පිහිටුවීම පිණිසම වේද:—

92. තෙන සච්චෙන මෙ සෙනා කායොපගතභණ්ඩකං,
ජාලවණ්ණං'ව හොතූති තං තථෙව තදා අහු'ති.

තෙන සච්චෙන, ඒ සත්‍යය කරණකොටගෙණ; මෙ, මාගේ; සෙනා, සෙනාවගේ; කායොපගත භණ්ඩකං, ශරීරොපගත භාණ්ඩ; ජාලවණ්ණංඑව හොතූති, (ගිනි) දූල්වන් ඇතිවේවා කියායි; තදා, එකල්හි; තං, එය; තථාඑව, එසේම; අහූ ඉති, වූයේයි.

93. ගණ්හිතුං ආගතං හත්ථිං නන්දිමිත්තො කරෙහි තං,
උභොදන්තෙ පීළයිත්වා උක්කුටිකං නිසීදයි.

නන්දිමිත්තො, නන්දිමිත්‍රතෙමේ; ගණ්හිතුං, (තමා) අල්වාගන්ට; ආගතං, ආවාවූ; තං හත්ථිං, ඒ ඇතු; කරෙහි, දෙඅතින්; උභොදන්තෙ, දෙදළ, පීළයිත්වා, පෙළා; උක්කුටිකං, උක්කුටුකව; නිසීදයි, හිඳවී.

94. හත්ථිනා නන්දිමිත්තොතු යස්මා යත්ථ අයුජ්ඣි සො,
තස්මා තත්ථ කතො ගාමො හත්ථිපොරො'ති වුච්චති.

සො නන්දිමිත්තොතු, ඒ නන්දිමිත්‍රතෙමේ වනාහි; හත්ථිනා, ඇතුහා; යස්මා, යම්හෙයකින්; යත්ථ, යම්තැනෙක්හි; අයුජ්ඣි, යුද්ධකෙළේද; තස්මා, එහෙයින්; තත්ථ, එහි; කතො, කරණලද; ගාමො, ගම; හත්ථිපොරො ඉති, හත්ථිපොරයයි (ඇතුපොරයයි); වුච්චති, කියනු ලැබේ.

95. අසනී විය ගජ්ජන්තො සො ගන්ත්වා'පද්දවෙ සහං,
පදරං විජ්ඣි දාඨාහි උම්මාරං පදසා හනි,
සමාරබාහං තං මාරං භූමියං සරවං පති'ති.

සො, ඒ හස්තිරාජතෙමේ; අසනී විය, සෙනහඬමෙන්; ගජ්ජන්තො, ගුගුරමින්; උපද්දවෙ, උපද්‍රවයන්; සහං, ඉවසමින්; ගන්ත්වා, ගොස්; දාඨාහි, දෙදළින්; පදරං, පුවරු (ලෑහැලි); විජ්ඣි, බින්දේය; උම්මාරං, එලිපතට; පදසා, පයින්; හනි, ඇන්නේය; සමාරබාහං, දොරබා සහිතවූ; තං මාරං, ඒ යදොර; සරවං, ගුගුරාගෙණ; භූමියං, බිම; පති, වැටුනේය.

96. හත්ථි ගහෙත්වා රථචක්කං මිත්තො සකටපඤ්ජරං,
නාළිකෙරතරුං ගොධො නිම්මලො ඛග්ගමුත්තමං.

97. තාලරුක්ඛං මහාසොණො ථෙරපුත්තො මහාගදං,
විසුං විසුං වීථිගතා දමිළෙ තත්ථ චුණ්ණයුං'ති.

හත්ථි, ඇත්තෙමේ; රථචක්කං, රියසකක්ද; මිත්තො, නන්දිමිත්‍රතෙමේ; සකටපඤ්ජරං, ගැලපත්තක්ද; ගොධො, ගොඨයිම්බර තෙම; නාළිකෙරතරුං, නෙරළුතුරක්ද; නිම්මලො, සුරනිමිලතෙමේ; උත්තමං ඛග්ගං, උතුම්කඩුවක්ද;—මහාසොණො, මහාසොණතෙමේ; තාලරුක්ඛං, තල්රුකක්ද; ථෙරපුත්තො, ථෙරපුත්තාභයතෙමේ; මහාගදං,

මහාගදායුධයක්ද; ගහෙත්වා, ගෙණ; විසුං විසුං, වෙන්වෙන්වම; වීථිගතා, වීථිගතවූවාහු; තත්‍ථ, එහි; දමිළෙ, දෙමළුන්; චුණ්ණයුං ඉති, සුණුකළාහුයි.

98. තං යුද්ධායා' ගතං සුත්වා රාජානං දුට්ඨගාමණිං,
අමච්චෙ සන්නිපාතෙත්වා එළාරො ආහ භූමිපො.

එළාරොභූමිපො, එළාර රජතෙම; තං දුට්ඨගාමණිං රාජානං, ඒ දුටුගැමුණුරජු; යුද්ධාය, යුදපිණිස; ආගතං, ආවහු; සුත්වා, අසා; අමච්චෙ, ඇමතියන්; සන්නිපාතෙත්වා, රැස්කරවා; ආහ, මෙසේ කීයේය.

99. සො රාජා ච සයං යොධො යොධාචස්ස බහු ථිර,
අමච්චා කිංනු කාතබ්බං කිංනුමඤ්ඤන්ති නො ඉති.

සො රජා ච, ඒ රජතෙමේද; සයං, තෙමේත්; යොධො, යොධය; අස්ස, ඔහුගේ; යොධා ච, යොධයෝත්; බහුථිර, බොහෝල; අමච්චා, ඇමැතියෙනි; කිංනුකාතබ්බං, කුමක් කටයුතුද?; නො, අපගේ; (මේ පිරිස්); කිංනුමඤ්ඤන්ති ඉති, කුමක් සිතද්දැයි කීයේය.

100. දීඝජන්තුප්පභුතයො යොධා එළාළරාජිනො,
සුවෙ යුද්ධං කරිස්සාම ඉති තෙ නිච්ඡයං කරුං'ති.

එළාළරාජිනො, එළාළරජහුගේ; දීඝජන්තුප්පභුතයො, දීඝජන්තු ආදිවූ; තෙ යොධා, ඒ යොධයෝ; සුවෙ, සෙට; යුද්ධං කරිස්සාම ඉති, යුධ කරන්නමෝයයි; නිච්ඡයං කරුං, නිශ්චයකළෝය.

101. තත්‍ථ වාපිජලං ආසි හතානං ලොහිතා'විලං,
තස්මා කුලත්‍ථවාපී'ති නාමතො විස්සුතා අහු.

තත්‍ථ, එහි; වාපිජලං, වැවදිය; හතානං, මරණලද දෙමළුන්ගේ; ලොහිත, ලෙයින්; ආවිලං ආසි, කැළඹුනක් විය; තස්මා, එහෙයින්; නාමතො, නමින්; කුලත්‍ථවාපි ඉති, කලත්වැවයයි; විස්සුතා අහු, ප්‍රසිද්ධවිය.

102. චරාපෙත්වා තහිං භෙරිං දුට්ඨගාමණිභූපති,
න හනිස්සතු එළාරං මං මුඤ්චිය පරො ඉති.

තහිං, එහිදී; දුට්ඨගාමණිභූපති, දුටුගැමුණු මිහිපල් තෙමේ; මං මුඤ්චිය; මාහැර; පරො, අනිකෙක්; එළාරං, එළාළරජු, න හනිස්සතු ඉති, නොමරාවයි, භෙරිං චරාපෙත්වා, බෙරහසුරුවා:—

103. සන්නද්ධො සයමා'රුය්හ සන්නද්ධං කණ්ඩුලං කරිං,
එළාරං අනුබන්ධන්තො දක්ඛිණද්වාරමාගමි.

සයං, තෙමේ; සන්නද්ධො, සන්නාහසන්නද්ධවූයේ; සන්නද්ධං, (එසේම) සන්නද්ධවූ; කණ්ඩුලංකරිං, කඩොලැතුපිට; ආරුය්හ, නැගී; එළාරං, එළාළරජු; අනුබන්ධන්තො, ලුහුබඳිමින්; දක්ඛිණද්වාරං, දකුණු වහසල් දොරට; ආගමි, ආයේය.

104. පුරෙ දක්ඛිණ ද්වාරම්හි උභො යුජ්ඣිංසු භූමිපා,
තොමරං ඛිපි එළාරො ගාමණී තමවඤ්චයි.

පුරෙ, නුවර; දක්ඛිණද්වාරම්හි, දකුණු වාහසල් දොරදී; උභොභූමිපා, මිහිපල්ලු දෙදෙන; යුජ්ඣිංසු, යුද්ධකළාහුය; එළාරො, එළාළරජ තෙමේ; තොමරං, තොමරය; ඛිපි, දැමිය; ගාමණී, ගැමුණුරජ; තං, එය; අවඤ්චයි, වැළකීය.

105. විජ්ඣාපෙසිච දන්තෙහි තං හත්ථිං සකහත්ථිනා,
තොමරං ඛිපි එළාරං සහත්ථි තත්ථ සො පතී.

තං හත්ථිං, ඒ (පමිතනම්) ඇතු; සකහත්ථිනා, සිය කඩොලැතු ලවා; දන්තෙහි, දෙදළින්; විජ්ඣාපෙසිච; ඇන්නවී; එළාරං, එළාළරජවෙ තට; තොමරං, තොමරය; ඛිපි, දැමිය; සහත්ථි, ඇතුසහිත; සො, හෙතෙම; තත්ථ, එහි; පතී, වැටුනේය.

106. තතො විජිතසඞ්ගාමො සයොග්ගබලවාහනො,
ලඞ්කං එකාතපත්තං සො කත්වාන පාවිසී පුරන්තී.

තතො, ඉක්බිති; විජිතසඞ්ගාමො; දිනනලද සඞ්ග්‍රාම ඇති; සො, හෙතෙම; සයොග්ගබලවාහනො, යාන වාහන බලසෙන් සහිතව; ලඞ්කං, ලක්දිව; එකාතපත්තං කත්වාන, එක්සත්කොට; පුරං, නුවරට; පාවිසි, ප්‍රවිෂ්ටවූයේය.

107. රඤ්ඤොදූ පච්ඡා තිසිතෙනා සො ඵුස්සදෙවො මහබ්බලො,
කණ්ඩං ඛිපි මුඛෙ තස්ස ඝට්ටෙනෙතා රාජකුණ්ඩලං.

රඤ්ඤොදූ, රජහට; පච්ඡා, පසුඅස්නෙහි; තිසිතෙනා, හුන්නාවූ; මහබ්බලො, මහත් බලඇති; සො ඵුස්සදෙවො, ඒ ඵුස්සදෙව තෙමේ; රාජකුණ්ඩලං, රජහු කණ මිණිකොඩොල; ඝට්ටෙනෙතා, ගටමින්; තස්ස මුඛෙ, ඒ හලුකයාගේ මුඛයෙහි; කණ්ඩං, හියක්; ඛිපි, විද්දේය.

108. රාජානං පාදතො කත්වා පතමානස්ස තස්ස තු,
ඛිපිත්වා අපරං කණ්ඩං විජ්ඣිත්වා තස්ස ජන්නුකං.

109. රාජානං සීසතො කත්වා පාතෙසි ලහුහත්ථකො,
හලුකෙ පතිතෙ තස්මිං ජයනාදෙ අවත්ථරී'ති.

රාජානං, රජු; පාදතොකත්වා, පාදෙසෙහිකොට; තස්ස, ඔහු; පත මානස්ස, වැටෙද්දී; ලහුහත්ථකො, ක්‍ෂනහස්තවූයේ; අපරං කණ්ඩං, අනික් හීයක්; ඛිපිත්වා, බහා; තස්ස, ඔහුගේ; ජන්නුකං, දනට; විජ් ඣිත්වා, විද; රාජානං, රජු; සීසතොකත්වා, හිස්දෙසෙහිකොට; පාතෙසි, හෙළීය; හලුකෙ, හලුකයා; පතිතෙ, වැටුනුකල්හි; තස්මිං, ඒ යුධා ඞ්ගනයෙහි; ජයනාදෙ, මහත්වූ ජයනාද; අවත්ථරි, පැතිරියේය.

110. කථන්නු භන්තෙ අස්සාසො මම හෙස්සති යෙන මෙ,
අක්ඛොහිණී මහාසෙනා හතා ඝාතා පිතා ඉති.

භන්තෙ, ස්වාමිනි; යෙන, යම්හෙයකින්; මෙ, මාවිසින්; අක්ඛොහිණීමහාසෙනා, අක්ෂෞහිණියක් මහාසෙනාව; හතා, නැසුනා; ඝාතාපිතා, මරවනලද්ද; ඉති, එසේහෙයින්; මම, මට; කථන්නු, කෙසේනම්; අස්සාසො, ආශ්වාසයෙක් (සැනසීමක්); හෙස්සති, වන්නේදැයි කියේය.

111. සග්ගමග්ගන්තරායො ච නත්ථි තෙ තෙන කම්මුනා,
දියඩ්ඪා මනුජාවෙත්ථ ඝාතිතා මනුජාධිප.

තෙන කම්මුනා, ඒ කර්මයෙන්; තෙ, තොපට; සග්ගමග්ගන්තරායො ච, ස්වර්ගමාර්ගාන්තරායෙකුත්; නත්ථි, නැත්තේය; මනුජාධිප, නරශ්‍රෙෂ්ඨය; එත්ථ, මෙහි; ඝාතිතා, මරණලද; මනුජා ච, මිනිස්සුද; දියඩ්ඪා, එකෙක් හා අඩක්.

112. සරණෙසු ඨිතො එකො පඤ්චසීලෙ ‘පි චා ’පරො,
මිච්ඡාදිට්ඨී ච දුස්සීලා සෙසා පසුසමා හතා.

සරණෙසු, ශරණයෙහි; ඨිතො, පිහිටියාවූ; එකො, එකෙක; පඤ්චසීලෙඅපිච, පන්සිල් පිහිටි; අපරො, අනිකෙක; හතා, මරණලද්දාවූ; මිච්ඡාදිට්ඨී ච, මිසදිටුවූද; දුස්සීලා, දුස්සීලවූද; සෙසා, සෙස්සෝ; පසුසමා, සිව්පාවුන් සමානවෙත්.

113. ජොතයිස්සසි සො ච ත්වං බහුධා බුද්ධසාසනං,
මනොවිලෙඛං තස්මා ත්වං විනොදය නරිස්සරා ‘ති.

නරිස්සර, නරෙශ්වරය; සො ච ත්වං, ඒ තුඹ; බුද්ධසාසනං, බුදුසස්න; බහුධා, නොයෙක් පරිද්දෙන්; ජොතයිස්සසි, බබුළුවන්නෙහිය; තස්මා, එහෙයින්; ත්වං, තුඹ; මනොවිලෙඛං, චිත්තඛෙදය; විනොදය, දුරලවයි කියේය.

114. දෙවත්තං උපනිට්ඨිතං ගතිවසා හිත්වා භවෙ සාධවො
දුක්ඛං ‘නෙකවිධං’ නුභුය සතතං කත්වා විරියං චිරං,
ඉච්ඡන්තා ජිනසාසනස්ස සුචිරං ඨානං සදා සාදරා
කුබ්බන්තෙ‘ව ම‘නන්තමග්ගකුසලං පප්පොන්ති සග්ගං සුඛං‘ති.

එවං, මෙසේ; සාධවො, සත්පුරුෂයෝ; උපනිට්ඨිතං, පැමිණ සිටියාවූ; දෙවත්තං, දිව්‍යාත්මය; හිත්වා, හැර; ගතිවසා, ගතිවශයෙන්; භවෙ, භවයෙහි; අනෙකවිධං, නොයෙක්ප්‍රකාරවූ; දුක්ඛං, දුක්; අනුභුය, අනුභවකොට; සතතං, නිරන්තරයෙන්; චිරං, සචිරවූ; විරියං කත්වා, වීර්‍ය්‍යකොට; ජිනසාසනස්ස, සර්‍වඥශාසනයාගේ; සුචිරංඨානං, චිරස්ථායීව පැවැත්ම; ඉච්ඡන්තා, කැමැත්තාහු; සදා, හැමකල්හි;

සාදරා, ආදරසහිතවූ; අග්ගං, අග්‍රවූ; අනන්තං කුසලං, අපමණ කුසල්; කුබ්බන්ති, කෙරෙත්; සග්ගං සුඛං, ස්වර්ගසැපයටද; පපොන්ති, පැමිණෙත්.

## දුට්ඨගාමණී අභයමහාරාජවංසනුව.—8.

115. නන්දිජනනභාවෙන නන්දිමිත්තො'ති සො අහු,
කමසො සො 'භිවඩ්ඪන්තො දසනාගබලො අහු'ති.

සො, හෙතෙම; නන්දිජනනභාවෙන, වරපට සිදුහරණබැවින්; නන්දිමිත්තො ඉති, නන්දිමිත්‍රයයි; අහු, (නම්) වී; සො, හෙතෙම; කමසො, ක්‍රමයෙන්; අභිවඩ්ඪන්තො, වැඩෙන්නේ; දසනාගබලො, ඇතුන් දසදෙනෙකුගේ බලඇත්තේ; අහු, විය.

116. අනුරාධපුරං රම්මං සග්ගඛණ්ඩං'ව භාසුරං,
අකංසු දමිළා සබ්බං සුසානං විය ආමකං.

සග්ගඛණ්ඩං ඉව, දෙව්ලොව්කඩක්මෙන්; භාසුරං, බබලන්නාවූ; රම්මං, රම්‍යවූ; සබ්බං අනුරාධපුරං. සියලු අනුරාධපුරය; දමිළා, දෙමළු; ආමකං සුසානං විය, අමුසොහොනක්මෙන්; අකංසු, කළාහුය.

117. චෙතියානි ච භින්දිංසු මාලකාපි මනොරමා,
ඡඩ්ඩිතා'සුං සමන්තා තා මනුස්සකුණපා'කුලා.

චෙතියානි ච, චෛත්‍යයන්ද; භින්දිංසු, බිඳලූහ; මනොරමා, සිත්කලුවූ; මාලකාඅපි, මාලකයන්ද (බිඳලූහ); සමන්තා, හාත්පස; මනුස්සකුණපාකුලා, මිනීකුණුවලින් ගැවසුනාවූ; තා, ඒ මාලකයෝ; ඡඩ්ඩිතා ආසුං, හරණලද්දෝ වූහ.

118. ඡින්දන්ති ආරුහිත්වාන මහිතං සුරනරාදිහි,
දුමින්දං තස්ස සාඛා ච සන්දූසෙන්ති මලාදිහි.

සුරනරාදිහි, දෙව්මිනිස්ආදීන් විසින්; මහිතං, පුදනලද; දුමින්දං, බෝරුකට; ආරුහිත්වාන, නැගී; තස්ස, ඒ බොධිවෘක්ෂයාගේ; සාඛා ච, අතුද; ඡින්දන්ති, කපත්; මලාදිහි, මලාදියෙන්; සන්දූසෙන්ති, දූෂණයද කෙරෙත්.

119. බුද්ධරූපානි භින්දන්තා වසන්තා පටිමාඝරෙ,
අනාචාරං කරොන්තෙ'කෙ නිරච්ඡානා'ව දමිළා.

බුද්ධරූපානි, බුදුරූ; භින්දන්තා, බිඳිමින්; පටිමාඝරෙ, පිළිම්ගෙවල; වසන්තා, වෙසෙමින්; එකෙ දමිළා, ඇතම් දෙමළු; තිරච්ඡානා ඉව, තිරිසනුන් මෙන්; අනාචාරං කරොන්ති, අනාචාර කෙරෙත්.

120. දිස්වාන භික්ඛවො තත්‍ථ අවජිඤ්ඤන්ති ච චීවරෙ,
භින්දන්ති ජිණ්ණපත්තෙ'පි ඛිපන්තා කඨලාදයො'ති.

තත්‍ථ, එහි; භික්ඛවො, භික්‍ෂූන්; දිස්වාන, දැක; චීවරෙ ච, සිවුරුද; අවජිඤ්ඤන්ති, පැහැරගණීත්; කඨලාදයො, කැටආදින්; ඛිපන්තා, දමා ගසමින්; ජිණ්ණපත්තෙන අපි, ජීර්ණ හා පාත්‍රයන්ද; භින්දන්ති, බිඳිත්.

121. දෙවබ්‍රහ්මා'සුරාදීහි මුද්ධනා නිච්චම'ච්චිතං,
සග්ගා'පවග්ගසුඛදං සම්මාසම්බුද්ධසාසනං,
නාසෙන්ති දමිළා'දනි කප්පරුක්ඛං'ව අග්ගිනා.

දෙවබ්‍රහ්මාසුරාදීහි, දෙව් බඹ අසුර ආදීන් විසින්; නිච්චං, සතතයෙන්; මුද්ධනා, මස්තකයෙන්; අච්චිතං, පුදනලද්දාවූ; සග්ගාපවග්ගසුඛදං, සග්පවග්සැපදෙන්නාවූ; සම්මාසම්බුද්ධසාසනං, සම්මාසම්බුදුසස්න; ඉදානි, දැන්; දමිළා, දෙමළු; අග්ගිනා, ගින්නෙන්; කප්පරුක්ඛං ඉව, කප්රුකක් (දවා වනසන්නාක්) මෙන්; නාසෙන්ති, නසත්.

122. අසුත්තං තං උදික්ඛිත්වා සද්ධෙනෙ'ධ උපෙක්ඛිතුං,
මඤ්ඤිත්වාන නන්දි තෙ දමිළෙ ගහෙත්වා ජාතකොධසා.

123. ඌරුං අක්කම්ම පාදෙන හත්‍ථෙන ඉතරන්තු සො,
ගහෙත්වා සම්පදාලෙත්වා බහික්ඛිපති ථාමවා.

ඉධ, මෙහි; සද්ධෙන, සැදැහැවතුහුවිසින්; තං, එය; උදික්ඛිත්වා, දැක; උපෙක්ඛිතුං, උපෙක්‍ෂාකරන්ට; අසුත්තං, යුතුනොවෙයි; මඤ්ඤිත්වාන, දැන; සො නන්දි, ඒ නන්දිමිත්‍රතෙම; ථාමවා, ශක්තිසම්පන්නාවූයේ; ජාතකොධසා, හටගත්ක්‍රොධයෙන්; තෙ දමිළෙ, ඒ දෙමළුන්; ගහෙත්වා, අල්වාගෙණ; පාදෙන, එක්පයකින්; ඌරුං, කලවය; අක්කම්ම, පාගා; හත්‍ථෙන, අතින්; ඉතරන්තු, ඉතිරි කලවය; ගහෙත්වා, ගෙණ; සම්පදාලෙත්වා, දෙපලුකොට; බහික්ඛිපති, බැහැරලයි.

124. දෙවා අන්තරධාපෙන්ති තෙන ඛිත්තං කලෙබරං,
එවමෙවං නිසා'ගම්ම කරොන්තෙන තෙන අන්වහං.

125. දමිළානං ඛයං දිස්වා ජනා රඤ්ඤො නිවෙදයුං,
සහසා ගණ්හථෙ'තන්ති රාජා තෙසං නියොජයී'ති.

තෙන, ඔහුවිසින්; ඛිත්තං, දමනලද; කලෙබරං, සිරුරු; දෙවා, දෙවියෝ; අන්තරධාපෙන්ති, අතුරුදහන්කෙරෙත්; අන්වහං, දවස් පතා; නිසිආගම්ම, රෑ අවුත්; එවමෙවං, මෙපරිද්දෙන්; කරොන්තෙන, කරණකල්හි; තෙන, එයින්; දමිළානං, දෙමළුන්ගේ; ඛයං, විනාශය;

දිස්වා, දැක; ජනා, ජනයෝ; රඤ්ඤො, රජහට; නිවෙදයුං, දැන්වූහ; රාජා, රජතෙම; එනං, ඔහු; සහසා, වහාම; ගණ්හථ ඉති, ගණිවයයි; තෙසං, ඔවුන්ට; නියොජයී, නියොගකෙළේය.

126. චින්තෙසි නන්දිමිත්තො සො එවමපි කරොන්තො මම,
ජනක්ඛයො කෙවලං හි නත්ථි සාසනජොතනං.

සො නන්දිමිත්තො, ඒ නන්දිමිත්‍රතෙම; චින්තෙසි, (මෙසේ) සිතුයේය; මම, මා; එවමපිකරොන්තො, මෙසේ කරද්දීත්; කෙවලං, හුදෙක්; ජනක්ඛයො හි; ජනක්ෂයමැයි; සාසනජොතනං, සස්න බැබලීමක්; නත්ථි, නැත්තේය.

127. රොහණෙ ඛත්තියා සන්ති පසන්නා රතනත්තයෙ,
තත්ථ කත්වා රාජසෙවං ගණ්හිත්වා දමිළෙ'ඛිලෙ,
රජ්ජං දත්වා ඛත්තියානං ජොතෙස්සං බුද්ධසාසනං'ති.

රොහණෙ, රුහුණුරට; රතනත්තයෙ, තුන්රුවන්හි; පසන්නා, ප්‍රසන්නවූ; ඛත්තියා, රජදරුවෝ; සන්ති, ඇත්තාහුය; තත්ථ, එහි (ගොස්); රාජසෙවං කත්වා, රාජසෙවයකොට; අඛිලෙ දමිළෙ, සියලු දෙමළුන්; ගණ්හිත්වා, ගෙණ; ඛත්තියානං, ඒ ක්ෂත්‍රියයන්ට; රජ්ජං දත්වා, රජයදී; බුද්ධසාසනං, බුදුසසුන්; ජොතෙස්සං ඉති, බබුළුවන්නෙමියි (සිතිය).

128. එවං මහාථාමබලූපපන්නා
කතූපාසනා ථාමමදං පහාය,
කරොන්ති ලොකස්ස ච සාසනස්ස
අත්ථං සුධීමා'පි තථා කරෙය්‍යා'ති.

එවං, මෙසේ; කතූපාසනා, (ආයුධශිල්පාදියෙහි) කරණලද අභ්‍යාස ඇති; මහාථාමබලූපපන්නා, මහත්වූ ශක්තිබලසම්පන්නවූවෝ; ථාම මදං, බලඇත්තෙමි යන අභිමාන මදය; පහාය, හැර; ලොකස්ස ච, ලොකයටද; සාසනස්ස, ශාසනයටද; අත්ථං, වැඩ; කරොන්ති, කෙරෙත්; සුධීමා අපි, නුවනැත්තේද; තථා කරෙය්‍ය, එසේ කරන්නේය.

## නන්දිමිත්‍ර වස්තුව—4.

---

129. සත්තෙ සත්තො'ති සඤ්ඤා ච වධකචිත්තමුපක්කමො,
තෙන ජීවිතනාසො ච සම්භාරා චතුරඞ්ගිකො.

සත්තෙ, සත්ත්වයකෙරෙහි; සත්තො ඉති, සත්වයා යන; සඤ්ඤා ච, සංඥාවද; වධකචිත්තං, මරමි යන සිතද; උපක්කමො, (ඒපිණිසවූ) උපක්‍රමයද (ආයුධ දඬුආදියෙන් ගැසීමද); තෙන, ඒ උපක්‍රමයෙන්;

ජීවිතනාසො ච, දිවිනැසීමදැයි යන; සහත්‍ථා, ස්වහස්තයෙන් (හෙවත් තමාගේ අතින් සිඬවන ප්‍රාණඝාතය); චතුරඞ්ගිකො, සිව්අඟක් ඇත්තේය.

130. යථාධිප්පාය ආණත්ති තථා තං සම්පටිච්ඡනං,
පටිඤ්ඤං අවිනාසෙත්වා තථාව කරණම්පි ච.

131. පයොගං හෙට්ඨාවුත්තෙසු ඡඩ්ඩෙත්වා සහතෙහි ච,
ජළඞ්ගාණත්තියා හොති පාණහිංසා'ති දීපයෙ.

යථාධිප්පාය, අභිප්‍රායවූපරිද්දෙන්; ආණත්ති, නියොගකිරීමද; තථා, එපරිද්දෙන්; තං, ඒ නියොගය; සම්පටිච්ඡනං, ගිවිසීමද; පටිඤ්ඤං, ප්‍රතිඥව; අවිනාසෙත්වා, නොනසා; තථා එව, එපරිද්දෙන්ම; කර ණම්පි ච, කිරීමද (යන තුන්අඟහා); හෙට්ඨාවුත්තෙසු, යට (ස්වාහස්තික ප්‍රයොගයෙහි) කියනලද සතරඅඞ්ගයෙහි; පයොගං, (තමාඅතින් කරණ) ප්‍රයොගය; ඡඩ්ඩෙත්වා, හැර; තෙහි ච සහ, යටකී ඉතුරු තුන් අඟයන් හා එක්ව; ආණත්තියා, ආණත්තියෙන් (සිඬවන); පාණහිංසා, ප්‍රාණහිංසා නොමෝ; ජළඞ්ගං හොති ඉති, ෂඩ්ඟයක් ඇත්තීයයි; දීපයෙ, දක්වන්නේය.

132. හත්‍ථපාදාදිඡේජ්ජං ච තාඩනං ච කසාදිහි,
පාණාතිපාතී ලභති නක්කසප්පාදු'පද්දවං.

පාණාතිපාතී, ප්‍රාණඝාතකළ තැනැත්තේ; හත්‍ථපාදාදිඡේජ්ජං ච, අත්පාආදිය සිඳීමද; කසාදිහි, කසආදියෙන්; තාඩනං ච, තැළීමද; නක්කසප්පාදි, කිඹුල් සප්ආදීන්ගෙන් (පැමිණෙන); උපද්දවං, උපද්‍රව යද; ලභති, ලබයි.

133. තරුණො'ව මරණං යාති සදා පාණහරො නරො,
මාතුකුච්ඡිගතොවා'පි බාලො වා යොබ්බනෙ ඨිතො.

පාණහරො නරො, ප්‍රාණඝාතකළ සත්‍වතෙමේ; සදා, හැමකල්හි; මාතුකුච්ඡිගතො වා; මාතෘකුක්ෂිගතවූයේ හෝ; අපි, නැවත; බාලොවා, ළදරුවූයේ හෝ; යොබ්බනෙ ඨිතො, යොවුනෙහි සිටියේ හෝ; තරු ණොව, තරුණවූයේම; මරණං යාති, මරණයට පැමිණේ.

134. සීසක්ඛිකුච්ඡිරොගො ච වණිකො කච්ඡුකො කිසො,
රොගානමා'කරො හොති අතෙකිච්ඡො'සධාදිහි.

සීසක්ඛිකුච්ඡිරොගො ච, සීස, ශීර්ෂරොගද, අක්ඛි, අක්ෂිරොගද; කුච්ඡි රොගො ච, කුක්ෂිරොගද ඇත්තේවෙයි; වණිකො, ව්‍රණරොගද ඇත් තේවෙයි; කච්ඡුකො, කුෂ්ඨරොගීද වෙයි; කිසො, කෘශද වෙයි; රොගානං, රොගයන්ට; ආකරො හොති, ආකර වේ; ඔසධාදිහි, ඖෂධාදියෙන්; අතෙකිච්ඡො, පිළියම් නොකොට හැකිවෙයි.

135. සදා වියොගී සොකී ච පුත්තදාරෙසු ඛුහිසු,
පාණාතිපාතිකො හොති සදා උබ්බිග්ගමානසො'ති.

පාණාතිපාතිකො, ප්‍රාණඝාතකළ සත්වතෙම; සදා, හැමකල්හි; පුත්තදාරෙසු, අඹුදරුවන් කෙරෙහිද; ඛුහිසු, නෑයන් කෙරෙහිද; වියොගී, වෙන්වීම ඇත්තේ වෙයි; සොකී ච, ශොකඇත්තේද; හොති, වේ; සදා, හැමකල්හි; උබ්බිග්ගමානසො, බියපත්වූ සිත්ඇත්තේ වේ.

136. පරපරිග්ගහ භණ්ඩා ච පරපරිග්ගහසඤ්ඤිතා,
ථෙය්‍යාදිසෙවකචිත්තං ච ඨානාචාවනමෙ'ව ච,
පයොගොවෙ'ති පචඞ්ගම'දින්නං සාහත්ථිකං මතං.

පරපරිග්ගහභණ්ඩා ච, පරාපිළිබඳ භාණ්ඩය; පරපරිග්ගහසඤ්ඤිතා, පරාපිළිබඳය යන සංඥඇති බව්ය; ථෙය්‍යාදිසු, ථෙය්‍යාදීන් අතුරෙහි; එකචිත්තං ච, එක්සිතක් ඇතිවීමය; ඨානාචාවනමෙවච, තුබූතැනින් පහකිරීමය; පයොගොච ඉති, තමාඅතින්කරණ ප්‍රයොගයයි කියා; සාහත්ථිකං, ස්වහස්තයෙන් සිඬවන; අදින්නං, අදත්තාදානය; පචඞ්ගං, පස්අඟක් ඇත්තේයයි; මතං, දන්නාලදී.

137. යථාධිප්පාය ආණත්ති තථා තං සම්පටිච්ඡනං,
පටිඤ්ඤං අවිනාසෙත්වා තථා'ව කරණම්පි ච.

138. ඨානාචාවං පයොගං ච අපනෙත්වාන පච සු,
ඡළඞ්ගාණත්තියා හොති අදින්නං'ති පදීපයෙ.

යථාධිප්පාය, අභිප්‍රායවූපරිද්දෙන්; ආණත්ති, නියොගකිරීමය, තථා, එසේම; තං සම්පටිච්ඡනං, එය ගිවිසීමය; පටිඤ්ඤං, ප්‍රතිඥාව; අවිනාසෙත්වා, නොනසා; තථා එව; එපරිද්දෙන්ම; කරණම්පි ච, කිරීමය; (යන තුන්අඟභා)–පචසු, (යටකී ස්වාහස්තිකප්‍රයොගයෙහි) පස්අඞග යන් අතුරෙහි; ඨානාචාවං, තුබූතැනින් පහකිරීමද; පයොගං ච, (තමාඅතින් කරණ) ප්‍රයොගයද (යනදෙක); අපනෙත්වාන, හැර (එහි කී තුන්අඟ හා එක්ව); ආණත්තියා, ආණත්තියෙන් (සිඬවන); අදින්නං, අදත්තාදානය; ඡළඞ්ගං හොති ඉති, අඞ්ග සයක් ඇතිවේයයි; පදීපයෙ, දක්වන්නේය.

139. දළිද්දො කපණෝ හොති දෙහි දෙහි'ති යාචකො,
කපාලහත්ථො භික්ඛන්තො හොති ථෙය්‍යරතො නරො.

ථෙය්‍යරතො, සොරකම්හි ඇලුනාවූ; නරො, සත්වතෙම; දළිද්දො; දිළිඳුවෙයි; කපණෝ හොති, කෘපණ වේ; දෙහි දෙහි ඉති, දෙවයි දෙවයි කියා; යාචකො, ඉල්ලන්නෙක් වේ; කපාලහත්ථො, කබල්ගත් අත්ඇතිව; භික්ඛන්තො හොති, සිඟන්නෙක් වේ.

140. දිස්වාන මධුරං අන්නපානං වත්ථාදිකං සුභං,
ගිලන්තලාලො අලභන්තො ජීනසාසො යාති ථෙනකො.

ථෙනකො, චෞරකර්මකළතැනැත්තේ; මධුරං, මිහිරිවූ; අනන පානං, ආහාරපානද; සුභං, යහපත්වූ; වත්ථාදිකං, වස්ත්‍රාදියද; දිස්වාන, දැක; ගිලනතලාලො, කෙලගිලිමින්; අලභනෙතා, (එය) නොලබමින්; ජීනනාසො, සුත්ආසාඇත්තේ (කැමැතිදේ නොලද්දේ); යාති, යයි.

141: පරකම්මරතො හොති සබ්බදා පරපෙස්සිකො,
පරදත්තූ'පජීවනෙතා හොති ථෙය්‍යරතො නරො'ති.

ථෙය්‍යරතො, අදත්තාදානයකළාවූ; නරො, මිනිස්තෙම; පරකම්මරතො හොති, (අනුන්මෙහෙකිරීම් වශයෙන්) පරකර්මාන්තයෙහි ඇලුනෙක් වේ; සබ්බදා, හැමකල්හි; පරපෙස්සිකො, අනුන් පනිවිඩපත් ගෙණයන දාසයෙක් වේ; පරදත්තූපජීවනෙතා හොති, අනුන්නිසා ජීවත්වන්නෙක් වේ.

142. පරපරිග්ගහිත'ත්ථී ච පරපරිග්ගහසඤ්ඤිතා,
අතික්කමනචිත්තං ච තථෙවා'තික්කමො'පි ච,
එවං පරස්ස දාරෙසු චතුරඞ්ගා අතික්කමො.

පරපරිග්ගහිත, පරපරිග්‍රහිතවූ; ඉත්ථී ච, ස්ත්‍රියක්ය; පරපරිග්ගහසඤ්ඤිතා, පරාපිළිබඳය යන සංඥඇතිබවය; අතික්කමනචිත්තං ච, (අනාචාරයෙන්) ඉක්මවනසිතය; තථා එව, එසේම; අතික්කමො අපිච, ඉක්මීමදයි (යුක්තිව්‍යතික්‍රමයවූ අනාචාරය); එවං, මෙසේ; පරස්සදාරෙසු; අන් අඹුවන් කෙරෙහි; අතික්කමො, ව්‍යතික්‍රමය; චතුරඞ්ගා, සිව්අඟක් ඇතිවේ.

143. මනුස්සා ච තිරච්ඡානා දෙවතායො ච සබ්බදා,
න රොචනති න තුස්සනති දිස්වාන පාරදාරිකං.

මනුස්සා ච, මිනිස්සුද; තිරච්ඡානා, තිරිසන්නුද; දෙවතායොච, දෙවියෝද; සබ්බදා, හැමකල්හි; පාරදාරිකං, පාරදාරිකසත්වයා; දිස්වාන, දැක; න රොචනති, කැමැතිනොවෙත්; න තුස්සනති, සතුටු නොවෙත්.

144. භණනති ඵරුසං වාචං අසබ්භං සුනිතාපනං,
පහරනති හත්ථපාදෙහි දණ්ඩමුග්ගර ආදිනා.

සුනිතාපනං, කණීණකධෝරවූ; අසබ්භං, අසභ්‍යවූ; ඵරුසං වාචං, පරුෂ වචන; භණනති, (ඔහුට) කියත්; හත්ථපාදෙහි, අත්පාවලින්ද; දණ්ඩමුග්ගරආදිනා, දඬුමුගුරු ආදියෙන්ද; පහරනති, (ඔහුට) ගසත්.

145. යෙසං කෙසං චි නික්ඛිතන කට්ඨං වා කඨල'මපිවා,
තස්සෙ'ව දෙහෙ පතති යො නරො පාරදාරිකො.

යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙමේ; පාරදාරිකො, පාරදාරිකවේද; යෙසං කෙසංචි, යම්කිසිවෙක්හට; නික්ඛිතන, දමාගසනලද; කට්ඨං වා, ලීකඩ හෝ; කඨලම්පි වා, කැට හෝ; තස්සෙව, ඒ පාරදාරිකයාගේම; දෙහෙ, ශරීරයෙහි; පතති, හෙයි.

146. රාජචොරාදිජං භීතිං තිරච්ඡානභයම්පි ච,
අග්ගිනා'සනිජං භීතිං ලභතෙ පාරදාරිකො.

පාරදාරිකො, පරදාර සෙවනකළ තැනැත්තේ; රාජචොරාදිජං, රාජ චොරාදීන්ගෙන් වන; භීතිං, බියද; තිරච්ඡානභයම්පි ච, (සිංහ ව්‍යාඝ්‍රාදී) තිරිසනුන්ගෙන් වන්නාවූ භයද; අග්ගිනා, ගින්නෙන් වන බියද; අසනිජං, හෙනවලින් උපදනාවූ; භීතිං, භීතිද; ලභතෙ, ලබයි.

147. කුට්ඨං ගණ්ඩො කිලාසො ච කාසො සාසො'පමාරකො,
අතෙකිච්ඡො පාපරොගො පිළෙති පාරදාරිකං.

කුට්ඨං, කුෂ්ඨද; ගණ්ඩො, ගෙඩිද; කිලාසො ච, කිලාසද; කාසො, කාසද; සාසො, ශ්වාසද; අපමාරකො, අපස්මාරද යන; අතෙකිච්ඡො, පිළියම් නොකොටහැකිවූ; පාපරොගො, පාපරොග; පාරදාරිකං, පර දාරසෙවනයකළ සත්වයා; පිළෙති, පෙළයි.

148. විවණ්ණො ච විරූපී ච විකටඞ්ගො ච දුද්දසො,
හොති චම්මට්ඨිමත්තොහි පෙතො'ව පාරදාරිකො.

පාරදාරිකො, මෙරමාඅඹුවන්සෙවූ පුඟුල්තෙම; විවණ්ණො ච, විකෘතවර්ණඇත්තේද; විරූපී ච, විකෘතරූපඇත්තේද; විකටඞ්ගො ච, (ශරීරාවයව) විකලවූයේද; හොති, වෙයි; චම්මට්ඨිමත්තොහි, ඇට සම් පමණකින් යුක්තවූයේ; පෙතො ඉව, ප්‍රෙතයෙක්මෙන්; දුද්දසො හොති, දක්කනොහැකි වේ.

149. ථියො න මුච්චරෙ චිත්තා චිත්තං යාති පුමා සදා,
නපුංසකො පණ්ඩකො වා හොති ඛො පාරදාරිකො.

ථියො, (පරපුරුෂ සෙවනයකළ) ස්ත්‍රීහුතුමූ; චිත්තා, ස්ත්‍රීභාවයෙන්; න මුච්චරෙ, නොමිදෙත්; පාරදාරිකො, පරස්ත්‍රීසෙවනයකළාවූ; පුමා, පුරුෂතෙමේ; චිත්තං, ස්ත්‍රීබවට; සදා, හැමකල්හි; යාති, පැමිණේ; නපුංසකො, නපුංසක හෝ වෙයි; පණ්ඩකො වා හොති ඛො, පණ්ඩක හෝ වේමය.

150. ලද්ධිග්ගහණචිත්තං ච වාචා තදනුලොමිකා,
වචනත්ථපටිවෙධො ච මුසාවාදෙ තිවඞ්ගිකො.

ලද්ධිගහණ, ලබ්ධිගුහණයෙහි හෙවත් තම අදහස් සැඟවීමෙහි; චිත්තං ච, සිතය; තදනුලොමිකා, ඒ ලබ්ධිගුහණයට අනුලොම්වූ; වාචා, තෙපුලය; වචනත්ථපටිවෙධො ච, වචනාර්ථප්‍රතිවෙධය (නොහොත් කී තෙපුල් ඇසූඅය ඒ වචනාර්ථ දැනීමයයි මෙසේ); මුසාවාදෙ, මුසාවාදය; තිවඞ්ගිකො, තුන්අඟක් ඇත්තේය.

151\. දන්තොට්ඨමුඛවෙකල්ලං ලාලාපග්ඝරණං සදා,
බධිරත්තං ච මූගත්තං යාති සන්තො මුසාරතො.

මුසාරතො, මෘෂාවෙහි ඇලුනු; සන්තො, සත්වතෙම; දන්තොට්ඨමුඛවෙකල්ලං, දන්ත, දත්ය; ඔට්ඨ, ඔෂ්ඨය; මුඛ, මුඛය (යනමොවුන්ගේ); වෙකල්ලං, විකලත්වයටද; සදා, හැමකල්හි; ලාලාපග්ඝරණං, කෙලවෑගිරීමටද; බධිරත්තං, බිහිරිබවටද; මූගත්තං ච, ගොලුබවටද; යාති, පැමිණේ.

152\. මධුරම්පි යං වදෙ වාචං තං තු කණ්ණකඨොරකං,
හොති ඛො අප්පියො වාචො ජන්තුනො අලිකෙ රතො.

අලිකෙ රතො, බොරුකීමෙහි ඇලුනු ජන්තුතෙම; මධුරම්පි, මිහිරිවූද; යං වාචං, යම් වචනයක්; වදෙ, කියාද; තං තු, ඒ වචනය වනාහි; කණ්ණකඨොරකං හොති, කණට කර්කශ වේ; ජන්තුනො, (බොරුකී) අයගේ; වාචො, බස; අප්පියො හොති ඛො, (සාමාන්‍යයෙන්ම අසන්න වුන්ට) අප්‍රිය වේමය.

153\. අකතං අභාසිතං යං තං අභූතං දොසසඤ්ඤිතං,
තස්සෙ'ව රූහතෙ සො'ව දණ්ඩියො හොති තාළියො.

අකතං, (තමන් විසින්) නොකරණ ලද; අභාසිතං, නොකියනලද; අභූතං, (එහෙයින්) අභූතවූ; දොසසඤ්ඤිතං, දොසැයි සලකණ ලද; යං, යමක්ඇද්ද; තං, (තමන් නොකී නොකළ) ඒ බොරුදොස්; තස්ස එව, ඔහුටම; රූහතෙ, නැගේ; සො එව, හෙතෙමේම; දණ්ඩියො, දණ්ඩනාර්හද වේ, තාළියො හොති, තැළියයුතුද වේ.

154\. මාතාපිතා තස්ස වචං නෙව සද්දෙන්ති සබ්බදා,
න රූහති තස්ස වචො සභාදිසු ච නින්දිතො.

මාතාපිතා, මව්පියෝ; තස්ස, ඔහුගේ; වචං, වචනය; නෙව සද්දෙන්ති, නොඅදහත්; සභාදිසු, සභා ආදියෙහි; තස්ස, ඔහුගේ; වචො, තෙපුල, නරූහති, නොනැගේ; සබ්බදා, හැමකල්හි; නින්දිතො ච, නින්දා කරණලද්දේද වේ.

155\. මුඛතො වායතෙ තස්ස දුග්ගන්ධො ජාතිජාතියං,
අලිකං යො භාසතෙ වාචං පෙච්චා'පායෙසු පච්චතී'ති.

යො, යමෙක්තෙම; අලිකං වාචං, බොරුබස්; භාසතෙ, කියාද; තස්ස, ඔහුගේ; මුඛතො, මුඛයෙන්; දුග්ගන්ධො, දුගඳ; ජාතිජාතියං, උපනුපන් ජාතියෙහි; වායතෙ, හමයි; පෙච්ච, පරලොව; අපායෙසු, (සිව්) අපායෙහි; පච්චති ඉති, පැසෙයි.

156\. යො මජ්ජං පිවතෙ ජන්තු පමාදට්ඨානසඤ්ඤිතං,
ස පච්චතෙව පරත්ථ ච දුක්ඛං විඳති කක්ඛළං.

පමාදට්ඨාන, ප්‍රමාදයට කාරණායයි; සඞ්ඛාදිතං, දන්නාලද; මජ්ජං, මද්‍යය; යො ජන්තු, යම් සත්වයෙක් තෙම; පිවතෙ, පානය කෙරේද; සො, හෙතෙම; පච්චතෙ, ඉහලොකයෙහිද; පරත්ථ, පරලොව්හිද; කක්ඛළං, කර්කශවූ; දුක්ඛං, දුක්; වින්දති, විඳියි.

157. අජානන්තො ඛිත්තචිත්තො භවෙ තං අසුචිං සුචිං,
ගරුතබ්බෙ අජානන්තො උම්මත්තො සුනඛො විය.

තං අසුචිං සුචිං, ඒ පවිත්‍රාපවිත්‍ර; අජානන්තො,(හෙතෙම) නොදන්නේ; ඛිත්තචිත්තො, වික්ෂිප්තවූ සිත්ඇත්තෙක්; භවෙ, වන්නේය; සුනඛො විය, සුනඛයෙක් මෙන්; ගරුතබ්බෙ, ගරුකටයුත්තන්; අජානන්තො, නොදන්නේ; උම්මත්තො භවෙ, වියරුහුනු වන්නේය.

158. සජනෙ පරිජනෙ හෙ'සො අවඤ්ඤාතො මහාජළො,
දිගම්බරො නිච්චුත්තානි හොති පානරතො නරො'ති.

පානරතො, සුරාපානයෙහි ඇලුනු; නරො, මනුෂ්‍යතෙම; දිගම්බරො, අචෙලකයෙක් වේ; නිච්චුත්තානි හොති, යටත්වූ පැවතුම්ඇත්තෙක් වේ; සජන පරිජනෙහි, ස්වකීයජනයන් හා පරිවාරජනයන් විසින්; එසො, මේ තෙමේ; මහාජළො, මහාජඩයෙකැයි; අවඤ්ඤාතො, අවඥා කරණලද්දේ වේ.

159. චෙතියපබ්බතාසන්නෙ මාරමණ්ඩලගාමකෙ,
බ්‍රාහ්මණො කුණ්ඩලො නාම විජ්ජතෙ මෙ සහායකො.

චෙතියපබ්බතාසන්නෙ, සෑගිරිගල සමීපයෙහි; මාරමණ්ඩලගාමකෙ, දෙරමඩලානම් ගමෙහි; මෙ සහායකො, මාගේ යහලුවූ; කුණ්ඩලො නාම, කුණ්ඩලනම්; බ්‍රාහ්මණො, බමුණෙක්; විජ්ජතෙ, ඇත්තේය.

160. සමුද්දපාරෙ භණ්ඩානි තස්ස විජ්ජන්ති සන්තිකෙ,
ගන්ත්වා ත්වං තෙන දින්නානි භණ්ඩකානි ඉධා'හරා'ති.

තස්ස සන්තිකෙ, උහුසමීපයෙහි; සමුද්දපාරෙ, මුහුදුඑතරවූ; භණ්ඩානි, (කපුරු සඳුන් ආදී) බඩු; විජ්ජන්ති, ඇත්තාහුය; ත්වං, තෝ; ගන්ත්වා, (එහි) ගොස්; තෙන, ඔහු විසින්; දින්නානි, දෙනලද; භණ්ඩකානි, (ඒ) බඩු; ඉධ, මෙහි; ආහර ඉන්, ගෙණ එව (යි කියා යැවිය).

161. නිම්මලො දමිළා'සන්නෙ වාසෙතුං නෙ'ව අරහති,
රාජපුත්තස්ස පිතුනො සන්තිකෙ වාස ම'රහති.

නිම්මලො, සුරනිමල තෙම; දමිළාසන්නෙ, දෙමළුන් සමීපයෙහි; වාසෙතුං; වස්වන්ට; නෙව අරහති, සුදුසු නොවෙයි; රාජපුත්තස්ස පිතුනො, රජපිත් පියහුගේ; සන්තිකෙ, සමීපයෙහි; වාසං, විසීම; අරහති, සුදුසුයයි (මෙසේ සිතීය).

162. එවමෙවං ලිඛිත්වාන ලෙඛං තස්ස සමප්පිය,
පුණ්ණවඩ්ඪනවත්ථානි පණ්ණාකාරෙ බහූනි ච,
දත්වා තං භොජයිත්වා ච පෙසෙසි සඛි සන්තිකං.

එවමෙවං, මෙපරිද්දෙන්; ලිඛිත්වාන, ලියා; ලෙඛං, ලියුම්; තස්ස සම පිය, බහුටදී; පුණ්ණවඩ්ඪනවත්ථානි, පූර්ණවර්ධනනම් මාහැඟිවස්ත්‍රද; බහූනි, බොහෝවූ; පණ්ණාකාරෙච, (කස්තුරි කපුරු සඳුන් ආදි) පඬුරුද; දත්වා, දී; තං, ඔහු; භොජයිත්වා, වළඳවා; සකිසහායිකං, මිතුරු කුමරුවෙත; පෙසෙසි, යැවූයේය.

163. සො වඩ්ඪමානච්ඡායායං ගන්ත්වා රාජසුතන්තිකං,
ලෙඛං ච පණ්ණාකාරෙ ච රාජපුත්තස්ස අප්පයී'ති.

සො, හෙතෙමේ; වඩ්ඪමානච්ඡායායං, සවස්වේලෙහි; රාජසුතන්තිකං, රජකුමරු වෙතට; ගන්ත්වා, ගොස්; ලෙඛං ච, ලියුමද; පණ්ණාකාරෙ ච, පඬුරුද; රාජපුත්තස්ස, රජකුමරහට; අප්පයී, දුන්නේය.

164. විහාය පාපං නරකො'පගාමිං
කත්වාන පුඤ්ඤං සුගතප්පසත්ථං,
වින්දන්ති භොගං සනරාමරෙසු
එවම්පි ධීරා බලවා භවන්ති.

එවං අපි, මෙසේද; ධීරා, ප්‍රාඥයෝ; නරකොපගාමිං, නරකයට පමුණුවන්නාවූ; පාපං, පව්; විහාය, හැර; සුගතප්පසත්ථං, බුදුන් විසින් පසස්නාලද; පුඤ්ඤං, පින්; කත්වාන, කොට; සනරාමරෙසු, දෙව්මිනිස් දෙක්හි; භොගං, සම්පත්; වින්දන්ති, විඳිත්; බලවා භවන්ති, ශක්ති සම්පන්නද වෙත්.

**සු ජ නි මම ල ව ස්තු ව – 5.**

---

165. සත්තවස්සිකකාලෙ'පි තාලගච්ඡෙ අලුඤ්චි සො,
දසවාදසවස්සම්හි තාලෙ'ලුඤ්චි මහබ්බලො.

සො, ඒ සොණතෙමේද; සත්තවස්සිකකාලෙ අපි, සත්ගැවිරිදිකල්හිත්; තාලගච්ඡෙ, තල්පැල; අලුඤ්චි, සිඳලීය; දසවාදසවස්සම්හි, දස දෙළොස් හැවිරිදිකල; මහබ්බලො, මහත් බලඇත්තේ; තාලෙ, තල්රුක්; අලුඤ්චි, සිඳලීය.

166. කාලෙන සො මහාසොණො යොබ්බනට්ඨො සුරූපවා,
කාලාවකානං හත්ථීනං දසනාගබලො අහු'ති.

සො මහාසොණො, ඒ මහාසොණතෙමේ; කාලෙන, කල්යාමෙන්; යොබ්බනට්ඨො, යොවුනෙහි පිහිටියේ; සුරූපවා, මනා රූඇත්තේ; කාලාවකානං හත්ථීනං, කාලාවක කුලයෙහි ඇතුන්ගේ; දසනාග බලො අහු ඉති, දසඇත්බල ඇතිවිය.

167. පුඤ්ඤෙන ලද්ධං විභවම්ප ථාමං
න නාසයං පාණවධාදිකෙහි,
කරොති එවං ජිනසාසනස්ස
වුඩ්ඪිං විරූළ්හිං මතිමා කුලීනො.

කුලීනො, උතුම්කුලයෙහි උපන්නාවූ; මතිමා, පණ්ඩිතතෙම; එවං, මෙසේ; පුඤ්ඤෙන, පින්හෙතුකොටගෙණ; ලද්ධං, ලබනලද; විභවං ච, ධනයද; ථාමං, ශරීරශක්තියද; පාණවධාදිකෙහි, ප්‍රාණවධාදි දුශ්චරිත කිරීමෙන්; න නාසයං, නොනසමින්; ජිනසාසනස්ස, සර්වඥ සාසනයාගේ; වුඩ්ඪිං, අභිවෘද්ධියද; විරූළ්හිං, විරූඪීභාවයද; කරොති, කෙරෙයි.

**ම හා සො ණ ව ත්‍ථු ව.—6.**

---

168. ලකුණ්ටකසරීරත්තා අහු ගොඨකනාමකො,
කරොන්ති කෙළිපරිහාසං තස්ස ජෙට්ඨා ච භාතරො.

ලකුණ්ටකසරීරත්තා, මිටි සිරුරුඇතිබැවින්; ගොඨකනාමකො අහු, ගොඨකනම්වී; ජෙට්ඨාභාතරො, දෙටුසබෑයෝ; තස්ස, ඔහුට; කෙළිපරිහාසං, කෙළිසිනා, කරොන්ති, කෙරෙත්.

169. තෙ ගන්ත්වා මාසඛෙත්තත්ථං කොට්ටයිත්වා මහාවනං,
තස්ස භාගං ඨපෙත්වාන ගන්ත්වා තස්ස නිවෙදයුං.

තෙ, ඔව්හු; ගන්ත්වා, ගොස්; මාසඛෙත්තත්ථං, උඳුකෙතක් පිණිස; මහාවනං, මහවනය; කොට්ටයිත්වා, කොටා; තස්ස, ඔහුගේ; භාගං, කොටස; ඨපෙත්වාන, තබා; ගන්ත්වා, ගොස්; තස්ස, ඔහට; නිවෙදයුං, දැන්වූහ.

170. සො ගන්ත්වා තං ඛණං සෙව රුක්ඛෙ ඉම්බරසඤ්ඤිතෙ,
ලුඤ්චිත්වාන සමං කත්වා භූමිං ගන්ත්වා නිවෙදයි.

සො, ඒ තෙමේ; තං ඛණං එව, එකෙණෙහිම; ගන්ත්වා, ගොස්; ඉම්බරසඤ්ඤිතෙ රුක්ඛෙ, ඉඹුරුනම් ගස්; ලුඤ්චිත්වාන, සිඳදමා; භූමිං, බිම; සමං කත්වා, සමකොට; ගන්ත්වා, ගොස්; නිවෙදයි, දැන්වීය.

171. ගන්ත්වාන භාතරො තස්ස දිස්වා කම්මං තමබ්භුතං,
තස්ස කම්මං කිත්තයන්තා ආගච්ඡිංසු තදන්තිකං,
තදුපාදාය සො ආසි ගොඨිම්බරනාමකො'ති.

භාතරො, බෑයෝ; ගන්ත්වාන, ගොස්; තස්ස, උහුගේ; තං අබ්භුතං කම්මං, ඒ අරුම ක්‍රියාව; දිස්වා, දැක; තස්ස, ඔහුගේ; කම්මං, ක්‍රියාව; කිත්තයන්තා, කීර්ත්තනයකෙරෙමින්; තදන්තිකං, ඔහුසමීපයට; ආගච්ඡිංසු, ආවාහුය; තං උපාදාය, ඒ නිමිත්තකොටගෙණ; සො, හෙතෙම; ගොඨිම්බරනාමකො ආසි, ගොඨඹිඹර නම් විය.

172. අරෙ දුස මහාචොර යක්ඛා'සික්ඛිතචෙටක,
අදිස්සමානකො හුත්වා දූරං මෙ කිං විහඤ්ඤසි.

අරේ, බොල; දුස, දූශය; මහාචොර, මහ සොර; අසික්ඛිත, අශික්ෂිතය; යක්ඛ, යක්ෂය; චෙටක, මෙහෙකරුව; අදිස්සමානකො හුත්වා, (තෝ) නොපෙණෙන්නෙක්ව (සිට); මෙ, මාගේ; දූරං, අඹුව; කිං, කුමකට; විහඤ්ඤසි, වෙහෙසන්නෙහිද?.

173. දිස්සමානෙන කායෙන කරොසි කම්ම'මීදිසං,
සියා තෙ දෙහකො භස්මං වාමපාදෙන පොථිතෙ.

ඊදිසං කම්මං, මෙබඳු ක්‍රියාවක්; දිස්සමානෙන කායෙන, දෘශ්‍යමාන ශරිරයෙන් (සිට); කරොසි, කෙරෙහි නම්; වාමපාදෙන, (මාගේ) වම් පයින්; පොථිතෙ, තැළුකල්හි; තෙ, තාගේ; දෙහකො, නින්දිත ශරිරයතෙම; භස්මං සියා, අලුවන්නේය.

174. යදි ත්වං පුරිසො යක්ඛ පස්සාමි තව පොරිසං,
දිස්සමානො ත්ව'මා'ගච්ඡ උභො යුද්ධං කරොමසෙ'ති.

යක්ඛ, එම්බා යක්ෂය; යදි, ඉදින්; ත්වං, තෝ; පුරිසො, පුරුෂයෙක් නම්; තව පොරිසං, තාගේ පුරුෂභාවය; පස්සාමි, බලමි; ත්වං, තෝ; දිස්සමානො, දෘශ්‍යමානව; ආගච්ඡ, මෙහි එව; උභො, (අපි) දෙදෙන; යුද්ධං කරොමසෙ ඉති, යුදකරමුයයි කියේය.

175. අහො හසන්ති'මෙ යක්ඛා තව සුත්වාන භාසිතං,
නදම්බාලසිගාලො කිං කදා ජෙස්සති කෙසරිං.

තව භාසිතං, තාගේ තෙපුල; සුත්වාන, අසා; ඉමෙ යක්ඛා, මේ යක්ෂයෝ; අහො හසන්ති, විස්මයෙනැයි සිනාසෙත්; කිං, කිම; නදං, (ඒ ඒ තැන) අඬගසා ඇවිදින; බාලසිගාලො, අඥනසිවල්තෙමේ; කෙසරිං, කෙශරසිංහයෙකු; කදා, කවරකාලෙක; ජෙස්සති, දිනන්නේදැයි (කියායි).

176. න කදාචි කොචි මං සත්තො පරාජෙසි මමා'ගතො,
ලද්ධජයත්තා සබ්බත්ථ ජයසෙනො'ති මං විදුං.

මං, මා; කොචි සත්තො, කිසියම් සත්ත්වයෙක්; කදාචි, කිසිකලෙකත්; න පරාජෙසි, නොපැරදවූයේය; මං, මා කරා; ආගතො, (කිසියම් සත්තෙක් කිසියම් වාදයක් පිණිස) ආයේනම්; සබ්බත්ථ, ඒ හැමතන්හිම; ලද්ධ ජයත්තා, ලබනලද ජය ඇතිබැවින්; ජයසෙනො ඉති, ජයසෙනයයි; මං, මා; විදුං, දනිත්.

177. මා තුච්ඡගජ්ජිතං ගජ්ජ මා ත්වං විප්පල පිල්ලක,
සසච්ඡාපො කදා යුද්ධෙ ජයං ලභති හත්ථිනා'ති.

පිළලක, එම්බා පැටව; ත්වං, තෝ; මා විප්පල, ප්‍රලාප නොදෙඩව; තුච්ඡගජ්ජනං, සිස්වූ වහසිබස්; මා ගජ්ජ, ගර්ජනා නොකරව; සසවජ්ජා පො, සාපැටිතෙම; හඤ්ඤිනා, ඇතු හා; යුද්ධෙ, යුද්ධයෙහි; කද, කවර කලෙක; ජයං, ජය; ලහති ඉති, ලබාදැයි කියේය.

178. යක්ඛො අසි මහාදෙහො අලං තෙ ඉති ගජ්ජනං,
උග්ගතෙ සුරියෙ එත්ථ අන්ධකාරො කුහිං ගතො.

මහාදෙහො, (තෝ) මහත් දෙහයක් ඇත්තාවූ; යක්ඛො අසි, යක්ෂයෙක් වෙහිය; තෙ, තාගේ; ගජ්ජනං, ගර්ජනාව; අලං ඉති, කම්නැත; එත්ථ, මෙහි; සුරියෙ උග්ගතෙ, ඉර උදාවූ කල්හි; අන්ධකාරො, අන්ධකාරය; කුහිං ගතො, කොයි ගියේද?.

179. ඛග්ගමිගවිසාණේන පරිත්තාවජිරෙන වා,
මෙරුං හනන්ති නො මෙරු කිඤ්චි සක්කොන්ති කාතවෙ.

ඛග්ගමිගවිසාණේන, කඟවෙහෙණ අඟින් හෝ; පරිත්තාවජිරෙන වා, ස්වල්පවූ වජ්‍රයෙන් හෝ; මෙරුං, මහමෙර; හනන්ති, විදිත්; මෙරු, මෙරුපර්වතය; කිඤ්චි කාතවෙ, කිසිවක් කරන්නට; නො සක්කොන්ති, නොහැකියි.

180. තව දෙහබලං යක්ඛ මමේ'කඞ්ගුලිපබ්බතො,
විලයං යාති එහි'ජ්ජ යුජ්ඣ'දානි මයා සහා'ති.

යක්ඛ, එම්බා යක්ෂය; තව, තාගේ; දෙහබලං, ශරීරබලය; මම, මාගේ; එකඞ්ගුලිපබ්බතො, එක් ඇඟිලි පුරුකකින්; විලයං යාති, විනාශයට යේ; එහි, එව; අජ්ජ, අද; ඉදානි, දැන්; මයා සහ, මාහා සමග; යුජ්ඣ, යුදකරව (යි කියේය).

181. නත්ථි'දානි තයා සද්ධිං සංගාමො ගොඨඉම්බර,
පුරිසො ත්වං යදි ආගච්ඡ ඉතො සත්තමවාසරෙ.

ගොඨඉම්බර, එම්බා ගොඨයිම්බරය; තයා සද්ධිං, තාහා සමග; ඉදානි, දැන්; සඞ්ගාමො, සටනක්; නත්ථි, නැත; යදි, ඉදින්; ත්වං, තෝ; පුරිසො, පුරුෂයෙක් නම්; ඉතො, මෙයින්; සත්තමවාසරෙ, සත්වන දවසෙහි; ආගච්ඡ, (සටනට) එව.

182. තම්බපණ්ණිසුසානස්මිං මහායක්ඛසමාගමෙ,
යුද්ධං හොතු උභින්නං නො කො'ධි'ක්ඛති ජයාජයං.

තම්බපණ්ණිසුසානස්මිං, තාම්‍රපර්ණිශ්මශානයෙහි; මහායක්ඛසමාගමෙ, මහායක්ෂසඞ්ගමයෙහිදී; නො උභින්නං, අප දෙදෙනාගේ; යුද්ධං හොතු, යුද්ධය වේවා; ඉධ, මෙහිදී; කො, කවරෙක්; ජයාජයං, ජය පරාජය; ඉක්ඛති, දකිද?.

183. සාපතෙය්‍යං විචාරෙත්වා කත්වාන ඤාතිසඞ්ගහං,
පරලොකත්ථිධං කත්වා යුද්ධායා'ගමනං වරං'ති.

සාපතෙය්‍යං, (තාගේ) වස්තුව; නිවාරෙථා, පරීක්‍ෂාකරවා; ඛුනිඝඞ්ගහං, ඛුනිසඞ්ග්‍රහය; කත්වාන, කොට; පරලොකවිධිං, පරලොවට කට යුතු සුචරිතධම්ම; කත්වා, කොට; යුද්ධාය, සටනට; ආගමිනං, ඒම; වරං ඉති, උතුමැයි කීය.

184\. මොහො තෙ ආවිසී කිනනු කිනනු අක්‍ඛදණකො වසි,
ජීවලොකස්‍ස වාසාය පුක්‍ඛද්‍ඨං බීණං නු තෙ ඉධ.

කිනනු, කිමෙක්ද; මොහො, මොහයතෙම; තෙ, තා; ආවිසී, වැළඳ ගත්තේද; කිනනු, කිමෙක්ද; අක්‍ඛදණකො වසි, නුවන මදවේද?; ඉධ, මෙහි; ජීවලොකස්‍ස, ජීවලොකයාගේ; වාසාය, විසීමට; තෙ, නුඹගේ; පුක්‍ඛද්‍ඨං, පිණ; බීණං නු, ගෙවුනේද?).

185\. න විජ්ජනති නු තෙ මිත්‍තා අත්‍ථකාමා'ථ ඤාතකා,
යෙ තං ඉමං නිවාරෙනති අකත්‍තබ්බ'මිදං ඉති.

තෙ, නුඹට; අත්‍ථකාමා, වැඩකැමැතිවූ; යෙ මිත්‍තා, යම්බඳු මිත්‍රකෙණෙක්වත්; අථ, නොහොත්; ඤාතකා, (යම්) නෑකෙණෙක්වත්; න විජ්ජනති නු, නැත්තාහුද; ඉදං, මේ (සටන); අකත්‍තබ්බං ඉති, නොකටයුතුයයි; යෙ, යමෙක්තුමූ; තං ඉමං, මුඹ; නිවාරෙනති, වළකද්ද? (එබඳු මිත්‍රයෙක්වත් නෑයෙක්වත් නැද්ද?).

186\. යක්‍ඛා'පි බලවා * එතං න සක්කොනති පරාජිතුං,
ගණ්හාතීති ජයං නිච්චං ජයසෙනො'ති වුච්චති.

බලවා, බලසම්පන්නවූ; යක්‍ඛා අපි, යක්‍ෂයෝ පවා; එතං, මොහු; පරාජිතුං, පරදවන්ට; න සක්කොනති, නොහැකිවෙත්; නිච්චං, නිතර; ජයං ගණ්හාති ඉති, ජය ගණීතුයි; ජයසෙනො ඉති, ජයසෙනයයි; වුච්චති, කියනුලැබේ.

187\. මඤ්ඤාමහෙ මයං තුය්හං ජීවිතං අප්පියං ඉති,
සම්පත්තියො ච බන්‍ධු ච අජ්ජතග්ගෙ න සනති තෙ.

තුය්හං, තාගේ; ජීවිතං, ජීවිතය; අප්පියං ඉති, (තට) අප්‍රියද්‍රෙහෝයි; මයං, අපි; මඤ්ඤාමහෙ, සිතම්හ; තෙ, තාගේ; සම්පත්තියො ච, සම්පත්තිද; බන්‍ධු ච, නෑයෝද; අජ්ජතග්ගෙ, අදපටන් මත්තෙහි; න සනති, ඇතිනොවෙත් (යයි සිතම්හ).

188\. අලමෙ'තෙන යුද්ධෙන යක්‍ඛෙන එරුසෙන තෙ,
ගච්ඡ සමානජාතීහි යුද්ධං තෙ සාදිසං සද'හි.

එරුසෙන, චණ්ඩපරුෂවූ; යක්‍ඛෙන, යක්‍ෂයා හා; තෙ, තාගේ; එතෙන යුද්ධෙන, මේ සටනින්; අලං, කම්නැත; ගච්ඡ, යව; තෙ, තට; සමානජාතීහි, සමානජාති ඇත්තවුන් සමග; සාදිසං, (තට) සෑහෙන් නාවූ; යුද්ධං, යුද්ධ; සඳ, හැමද (කරවයිකී).

189\. මය්හම්පි වචනං සබ්බෙ සුණන්තෙ'ත්ථ සමාගතා,
යාව නො'දෙති සො සුරියො ඛජ්ජොතො බලවා භවෙ.

එත්ථ, මෙහි; සමාගතා, රැස්වූ; සබ්බෙ, සියල්ලෝ; මය්හං, මාගේ; වචනං අපි, වචනයද; සුණන්තු, අසත්වා; යාව, යම්තාක්; සො සුරියො, ඒ සූය්‍ර්‍යයා; න උදෙති, නොනගීද; (තාව, ඒතාක්;) ඛජ්ජොතො, කද්‍යෝපැණි; බලවා භවෙ, (ආලොකයෙන්) බලවත්වේ.

190\. ඡින්දිත්වා කදලෙරණ්ඩසණ්ඩං ජුම්භති මාණවො,
තථා න ජුම්භතෙ සාරං පත්වාන ඛදිරං වනං.

මාණවො, තරුණයෙක්; කදලෙරණ්ඩසණ්ඩං, කෙසෙල් හා එරඬුව නය; ඡින්දිත්වා, කපා; ජුම්භති, (යම්සේ) ක්‍රීඩාකෙරේද; සාරං, හරඇත් තාවූ; ඛදිරං වනං, කිහිරිවනයට; පත්වාන, පැමිණ; තථා, එසේ; න ජුම්භතෙ, ක්‍රීඩා නොකරෙයි.

191\. ඛුද්දාවාටනදිවාපි සොසෙන්තො'යං දිවාකරො,
නිමුජ්ජිත්වාපි තාපෙතුං න සක්කොති මහණ්ණවං.

ඛුද්දාවාටනදිවාපි, කුඩා වළවල් හා ගං හෝ වැව් (ජලය); සොසෙන්තො, වියලන්නාවූ; අයං දිවාකරො, මේ සූය්‍ර්‍යතෙම; නිමුජ්ජිත්වා අපි, නිමග්නවීනමුත්; මහණ්ණවං, මහ සයුරු (ජලය); තාපෙතුං, තවන්නට; න සක්කොති, නොහැකිවේ.

192\. ඡින්දං මක්කටසුත්තානි චාලයං බාලපල්ලවෙ,
වායමානා'නිලො නෙ'ව මෙරුං සක්කොති කම්පිතුං.

මක්කටසුත්තානි, මකුළුහු; ඡින්දං, සිඳිමින්; බාලපල්ලවෙ, ලපලු; චාලයං, සොලවමින්; වායමානො, හමන්නාවූ; අනිලො, වාතයතෙම; මෙරුං, මහමෙර; කම්පිතුං, කම්පාකරන්ට; නෙව සක්කොති, නොම හැකිවේ.

193\. මඤ්ඤතෙ සො'හං බලවා අදිස්වා බලවං පුරෙ,
දිස්වාන බලවං අජ්ජ තම්පි මානං ජහාති සො'හි.

සො, ඒ (ජයසෙන නම් යක්‍ෂ) තෙමේ; පුරෙ, පළමු; බලවං, ශක්ති සම්පන්නයෙකු; අදිස්වා, නොදැක; අහං, මම; බලවා, බලඇත්තෙමියි; මඤ්ඤතෙ, හඟියි; සො, හෙතෙම; අජ්ජ, අද; බලවං, ශක්තිසම්පන්න යෙකු; දිස්වාන, දැක; තං මානං අපි, ඒ මානයද; ජහාති, හරියි.

194\. සුණන්තු වචනං මය්හං යක්ඛා එත්ථ සමාගතා,
න මය්හං කිඤ්චි දොස'ත්ථි උදික්ඛන්තු ජයාජයං.

එත්ථ, මෙහි; සමාගතා, රැස්වූ; යක්ඛා, යක්‍ෂයෝ; මය්හං වචනං, මාගේ තෙපුල; සුණන්තු, අසත්වා; මය්හං, මාගේ; කිඤ්චිදොසො, කිසි දොෂයක්; න අත්ථි, නැත; ජයාජයං, (අප දෙදෙනාගේ) ජය පරාජය; උදික්ඛන්තු, බලත්වා.

195 මයා දක්ඛිණපාදෙන උභො හත්ථෙන වා පුන,
ජයසෙනො නාම'යං යක්ඛො චුසිතුං නෙව අරහති.

අයං ජයසෙනො නාම යක්ඛො, මේ ජයසෙන නම් යක්ෂතෙම්; දක්ඛිණපාදෙන, (මාගේ) දකුණු පයින් හෝ; පුන, නැවත; උභො හත්ථෙන වා, දෙඅතින් හෝ; මයා, මා විසින්; චුසිතුං, ඝාගී කරන්ට: නෙව අරහති, සුදුසු නොවෙයි.

196 වාමපාදස්ස මය්හං තෙ අග්ගඅඞ්ගුලියො පන,
කනිට්ඨම'ස්ස ජානන්ති වත්වාන පොථයං භුජෙ.

197 අපෙක්ඛසි යක්ඛ මා'ගමජ්ජ කිං තිට්ඨසි මතො විය,
අජ්ජ තෙ පුරිසාකාරං පස්සතු මම වා තුවං'ති.

අස්ස තෙ, ඒ තට; කනිට්ඨං, කටයුතු; මය්හං,මාගේ;වාමපාදස්ස, වාමපාදයාගේ; අග්ගඅඞ්ගුලියො පන, සුලඟිලි වනාහි; ජානන්ති, දනිත්යයි; වත්වාන, කියා; පොථයං භුජෙ, අත්පොලසන් දෙමින්–යක්ඛ, එම්බා යක්ෂය; තුවං,තෝ; මතො විය, මළඑකෙකු මෙන්; කිං,කුමකට; තිට්ඨසි, සිටින්නෙහිද; මං, මාවෙත; ආගමජ්ජ, එව; අජ්ජ, අද; තෙ, තාගේ; පුරිසාකාරං, පුරුෂවික්‍රමය හෝ; මම වා, මාගේ පුරුෂවික්‍රමය; තුවං වා, තෝ හෝ; පස්සතු ඉති, බලාවයි; අපෙක්ඛසි, කැඳවීය.

198 සඞ්ගාමසොණ්ඩො පරසත්තුමද්දනො
සූරොව වීරො බලවා පරාභිභූ,
රුද්දස්ස යක්ඛස්ස සිරං විනාසයිං
කිලෙසසීසං ච තතො විනාසයිං'ති.

සඞ්ගාමසොණ්ඩො, සංග්‍රාමලොලවූ; පරසත්තුමද්දනො, පරශත්‍රු මර්දනය කරන්නාවූ; වීරො, දක්ෂවූ; බලවා, බල පරාක්‍රම ඇත්තාවූ; පරාභිභූ, අනුන් මැඩ පවත්වන්නාවූ; සූරොව, සාහසික යොධයෙක්වූ (මම); රුද්දස්ස යක්ඛස්ස; රෞද්‍රවූ යක්ෂයාගේ; සිරං, හිස; විනාසයිං, විනාශ කෙළෙමි; තතො, නැවත; කිලෙසසීසං ච, ක්ලෙශශීර්ෂයද; විනාසයිං, වැනසුයෙමි; ඉති, මෙසේ (මේ උදන ගාථාව කීයේ)යි.

199 දත්වා පුරෙ යතිවරෙ සුවිචෙය්‍ය දානං
භුත්වාන දෙවවිභවං ච මනුස්සභූතිං,
කත්වාන සාසනවරස්ස ච පග්ගහන්තෙ
අන්තෙ ලභන්ති සුජනා අමතම්පි එවං.

එවං, මෙසේ; තෙ සුජනා, ඒ සජ්ජනයෝ; පුරෙ, පූර්වයෙහි; විචෙය්‍ය, විචිනනයකොට (පිරික්සාකොට);යතිවරෙසු,ශ්‍රෙෂ්ඨයතීන්ට;

දූතං දත්වා, දන්දී; දේවපිහවං ච; දිවසැපද; මනුස්සභූතිං, මිනිස් සැපද; භුඤ්ජාන, අනුභවකොට; සාසන වරස්සම, උතුම් ශාසනයේද; පග්ගහං කත්වාන, සඞ්ග්‍රහකොට, අන්තෙ, කෙළවර; අමතං අපි, නිර්වාණයද; ලභන්ති, ලබත්.

## ගොඨඉම්බර වස්තුව—7.

---

200 කොට්පබ්බතසාමන්තෙ කිත්තිගාමම්හි ඉස්සරො,
රොහණො නාම ගහපති ජාතං පුත්තකම'ත්තනො.

201 සමාන නාමං කාරෙසි ගොඨකාභයරාජිනො,
දරකො සො බලී ආසි දසමාදසවස්සිකො.

කොට්පබ්බතසාමන්තෙ, කොටගල අසල; කිත්තිගාමම්හි, කිත්ති නම් ගම්හි; ඉස්සරො, අධිපතිවූ; රොහණො නාම ගහපති, රොහණ නම් ගෘහපතියෙක්; අත්තනො, තමහට; ජාතං, දූවළපත්; පුත්තකං, පුත්‍රයෙකු-ගොඨකාභයරාජිනො, ගොළුඅබා රජහට; සමාන නාමං, සමානවූ නම් ඇත්තෙකු; කාරෙසි, කරවූයේය; දසමාදසවස්සිකො, දසදොළොස් ඇවිරිදිවූ; සො දරකො, ඒ දරුතෙමේ; බලී ආසි, බල ඇති වූයේය.

202 අසක්කුණෙය්‍ය පාසාණෙ උබ්බත්තුං චතුපඤ්චහි,
කීළමානො ඛිපි තදා සො කීළාගුළකෙ විය.

තදා, එකල්හි; සො, හෙතෙමේ; චතුපඤ්චහි; සතර පස්දෙනෙකුන් විසින්; උබ්බත්තුං අසක්කුණෙය්‍යෙ, නගාලිය නොහැකිවූ; පාසාණෙ, ගල්; කීළාගුළකෙ විය, ක්‍රීඩාගුඩයන් මෙන්; කීළමානො, කෙළිමින්; ඛිපි, දැමිය.

203 තස්ස සොළසවස්සස්ස පිතා ගදම'කාරයි,
අට්ඨතිංසඞ්ගුලාවට්ටං සොළසහත්ථදීඝකං.

සොළසවස්සස්ස, සොළොස් ඇවිරිදිවූ; තස්ස, උහුට; පිතා, පිය තෙමේ; සොළසහත්ථදීඝකං, සොළොස් රියන් දිග ඇති; අට්ඨතිංසඞ්ගු ලාවට්ටං, අටතිස් අඟුල් වට ඇති; ගදං, ගදාවක්; අකාරයි, කරවී.

204 තාලානං නාළිකෙරානං ඛන්ධෙ ආහච්ච තාය සො,
තෙ පාතයිත්වා තෙනෙ'ව යොධො සො පාකටො අහු'ති.

සො, හෙතෙමේ; තාය, ඒ ගදාවෙන්; තාලානං, තල වෘක්ෂයන් ගේ හා; නාළිකෙරානං, නෙරළුවෘක්ෂයන්ගේ; ඛන්ධෙ, කඳන්; ආහච්ච, පැහැර; තෙ, ඒ තල්පොල්; පාතයිත්වා, බිම හෙළා; තෙනෙව, එයින්ම; සො යොධො, ඒ යොධතෙම; පාකටො අහු ඉති, ප්‍රකටවීය.

205 බුඬුප්පාදෙ මයා ලද්ධා මනුස්සත්තං තථෙවච,
අලබ්භනීයා ලද්ධා මෙ පබ්බජ්ජා ජිනසාසනෙ.

මයා, මා විසින්; බුඬුප්පාදෙ, බුද්ධොත්පාද කාලයෙද; ලද්ධා, ලබන ලදී; තථා එව, එසේම; මනුස්සත්තං ච,මිනිසත් බවද(ලබනලද්දේය); මෙ, මා විසින්; අලබ්භනීයා, නොලැබිය හැකිවූ; ජිනසාසනෙ, බුද්ධ ශාසනයෙහි; පබ්බජ්ජා, ප්‍රව්‍රජ්‍යා කොමෙමි; ලද්ධා, ලබන ලද්දීය.

206 විසුද්ධං පරිපූරෙත්වා තස්මා මෙ සීලසංවරං,
භවක්ඛයාය උස්සාහො කරණීයො සදා'දරා.

තස්මා, එහෙයින්; මෙ, මා විසින්; සීලසංවරං, (චතුපාරිශුද්ධි) ශීලසංවරය; විසුද්ධං, විශුද්ධකොට; පරිපූරෙත්වා, පුරා; සදා, හැමකල්හි; ආදරා, ආදරයෙන්; භවක්ඛයාය, භවක්ෂය පිණිස; උස්සාහො කරණීයො, උත්සාහ කටයුතුවිය.

207 තපනෙන ජහෙ කාමං ජාතං දුක්ඛං භවාවටෙ,
කො බුද්ධො රත්තියං දීපෙ දිවා'වාටෙ පතිස්සති'ති.

භවාවටෙ, සංසාර වෘත්තයෙහි; ජාතං, හටගත්තාවූ; දුක්ඛං, දුක; තපනෙන; සොලශතාපනයෙන්; කාමං, එකාන්තයෙන්; ජහෙ, දුරුකරන්නෙමි; රත්තියං, රාත්‍රියෙහි; දීපෙ, දක්නාලද; ආවාටෙ, වළෙහි; කො බුද්ධො, කවරතම් නුවනැත්තෙක්; දිවා, දවල්;පතිස්සති, වැටෙන්නේද (නොවේළිය).

208 වුය්හමානො යො මහොඝෙහි පස්ස'මත්තං'ව උද්ධරෙ,
නික්කාරුණො'ත'යං පුරිසො ජානන්ති බලු තෙ ජනා.

මහොඝෙහි, මහ වතුරු සැඩපහරින්; වුය්හමාන, (බොහෝදෙන) වහනය කරණු ලබන කල්හි (ගසාගෙණ යන කල්හි); යො, යම් වීර්‍ය්‍යවත් පුරුෂයෙක් තෙමේ; පස්සං, ඒ බලමින්; අත්තානංව, (හුදකලාව) තමන්ම; උද්ධරෙ, ගොඩනගන්නේද; තෙ ජනා, ඒ දුටු ජනයෝ; අයං පුරිසො, මේ පුරුෂතෙමේ; බලු, එකාන්තයෙන්; නික්කාරුණො ඉති, කරුණා නැත්තෙකැයි; ජානන්ති, දනිත්.

209 ලඞ්කායං දමිළා'දනි ඡින්දන්තා බොධිපාදපෙ,
පුප්ඵෙ ච පටිමායො ච විනාසෙසුං අනෙකධා.

ඉදනි, දැන්; ලඞ්කායං, ලක්දිව; දමිළා, ද්‍රවිඩයෝ; බොධිපාදපෙ, බෝරුක්; ඡින්දන්තා, සපන්නාහු; පුප්ඵෙ ච, චෛත්‍යයන්ද; පටිමායො ච, පිළිමද; අනෙකධා, නොයෙක් ප්‍රකාරයෙන්; විනාසෙසුං, (සිඳබිඳ) වැනසූහ.

210 බුද්ධපුත්තා මහානාගා භික්ඛවො සීලසංවුතා,
අවජිණ්ණචීවරා භීතා චරන්ති සරණෙ'සිනො.

සීලසංවුතා, ශීලසංවෘතවූ; බුද්ධපුත්තා, සර්වඥ පුත්‍රවූ; මහානාගා, මහා ශ්‍රේෂ්ඨවූ; භික්ඛවො, භික්ෂූහු; අවජිණ්ණචීවරා, (දෙමළුන් විසින්) හුන්සිවුරු ඇතිව; භීතා, බියපත්වූවාහු; සරණෙසිනො, පිහිට සොයමින්; චරන්ති, හැසිරෙත්.

211 වනං'ව දහතා දඩ්ඪං නිඛිලං සීහලං ඉදං,
දමිළග්ගිනා දඩ්ඪං'ති න නිබ්බාපෙති කොචි තං.

දහතා, ලාවාග්නියෙන්; දඩ්ඪං, දනලද; වනං ඉව, වනාන්තර සක්මෙන්; ඉදං නිඛිලං සීහලං, මේ සියලු ලක්දිව; දමිළග්ගිනා ද්‍රවිඩාග්නියෙන්; දඩ්ඪං ඉති, දන ලද්දේයයි කියා; තං, ඒ ද්‍රවිඩාග්නිය; කොචි, කිසිවෙක්; න නිබ්බාපෙති, නොනිවයි.

212 ගාමා සබ්බ අගාමා'සුං විනට්ඨා රට්ඨවාසිනො,
කාලො'යං පහුනා සබ්බං සමෙතුං ලොකසාසනං.

සබ්බ ගාමා, සියලු ගම්; අගාමා ආසුං, නොගම් වූහ; රට්ඨවාසිනො, රටවැස්සෝ; විනට්ඨා, වැනසුනෝවෙත්; පහුනා, ප්‍රභූකෙණෙක් විසින්; සබ්බං ලොකසාසනං, සියලු ලෝසසුන්; සමෙතුං, සංසිඳුවන්ට; අයං කාලො, මේ කල්වන්නේය.

213 ලද්ධං පහාය නිබ්බාණං යො දීපඞ්කරසන්තිකෙ,
සංසාරං පාවිසි සත්ථා දිස්වා නො දුක්ඛිතෙ ජනෙ.

නො, අපගේ; යො සත්ථා, යම් ශාස්තෘකෙණෙක්වූයේද (උන්වහන්සේ); දීපඞ්කරසන්තිකෙ, දීපඞ්කර ශාස්තෘන් වහන්සේගේ(සමීපයෙහි); ලද්ධං, ලබනලද; නිබ්බාණං, නිර්වාණය; පහාය, හැර; දුක්ඛිතෙ, සසර දුකින් පීඩිතවූ; ජනෙ, සත්ව සමූහයා; දිස්වා, දැක; සංසාරං, සසරට; පාවිසි, ප්‍රවිෂ්ටවූසේක (දස පෙරුම්පුරා ලොව්තුරා බුදුව සත්වයන් සසරදුකින් මුදාලූසේක)-

214 රඤ්ඤො හුත්වා සහායං භො කත්වා සාසනපග්ගහං,
චරිතබ්බො අයං ධම්මො තයා අත්තහිතාවහො'ති.

භො, පින්වතුන් වහන්ස; තයා, නුඹ වහන්සේ විසින්; රඤ්ඤො, රජහට; සහායං හුත්වා, සහායව; සාසනපග්ගහං කත්වා, සර්වඥ ශාසන සඞ්ග්‍රහකොට(ඉක්බිති); අත්තහිතාවහො, තමන්ට වැඩඑලවන්නාවූ; අයං ධම්මො, මේ ශ්‍රමණ ධර්මයතෙම; චරිතබ්බො, කටයුත්තේය.

215 අත්තත්ථමේ'වම්'පහාය දයාලවො හො
ඛ්‍යාතිං පරත්ථචරණාදිහි තණ්හායන්ති,
ලබ්ධාන ථාමවිභවං යදි වො සඛ්‍යාතිං
කප්පසිතිං කුරුථ කාථ පරත්ථමේ'ව.

හො, භවත්නි; එවං, මෙසේ; දයාලවො, කරුණාපරවූ (සත්පුරුෂයෙනි); අත්තත්ථං, ආත්මාර්ථය (තෙමත් තමාගේ ප්‍රයොජනය); අපහාය, හැර; පරත්ථචරණාදීහි, මෙරමාගට වැඩ සිද්ධකිරීම් ආදියෙන්; ඛ්‍යාතිං, (තමන්ගේ සශ්‍රීකමූ) කීර්තිය; තණ්හායන්ති. පතුරුවත් (එපරිද්දෙන්ම); වො, තෙපි; යදි, ඉදින්; ථාමවිභවං, ශරීර ශක්තිය හා ශ්‍රී සම්පත්තිය; ලබ්ධාන, ලැබගෙණ; සඛ්‍යාතිං, (තොපගේ) ස්වකීය කීර්තිය; කප්පසිතිං, කප් ගණන් පැවතුම් ඇත්තක්; කාථ, කරන්නහු නම්; පරත්ථං එව, පරාර්ථයම; කුරුථ, කරව්.

## ථෙරපුත්තාභය වස්තුව—8.

---

216 කප්පකන්දරගාමම්හි කුමාරස්ස සුතො අහු,
හරණො නාම සො කාලෙ දසවාදසවස්සිකෙ.

217 දාරකෙහි වනං ගන්ත්වා'නුබන්ධිත්වා සසෙ බහු,
පාදෙන පහරිත්වාන විඛණ්ඩං භූමියං ඛිපි.

කප්පකන්දරගාමම්හි, කප්කඳුරු නම් ගම්හි; කුමාරස්ස, කුමාර නම් කෙළෙඹියාගේ; හරණො නාම, හරණ නම්; සුතො අහු, පුතෙක් විය; සො, හෙතෙමේ; දසවාදසවයසිකෙ කාලෙ, දසදොළොස් ඇවිරිදි කල්හි;—දාරකෙහි, ගම් දරුවන් හා; වනං, වනයට; ගන්ත්වා, ගොස්; බහු සසෙ, බොහෝ සාවුන්; අනුබන්ධිත්වා, ලුහුබැඳ; පාදෙන, පයින්; පහරිත්වාන, පැහැර; විඛණ්ඩං, දෙකඩකොට; භූමියං ඛිපි, බිම දැමීය.

218 ගාමිකෙහි වනං ගන්ත්වා සොළසවස්සිකො පන,
තථෙව පාතෙසි ලහුං මිගගොකණ්ණසූකරෙ,
හරණො සො මහායොධො තෙනෙව පාකටො අහු'ති.

සොළසවයසිකො පන, සොළොසැවිරිදිවූයේ වනාහි; ගාමිකෙහි, ගම්වැස්සන් හා; වනං ගන්ත්වා, වලට ගොස්; තථා එව, එසේම; මිගගොකණ්ණසූකරෙ, මුවන් ගෝණුන් හා ඌරන්; ලහුං පාතෙසි, වහා පෙරළීය; හරණො, හරණ නම්වූ; සො මහායොධො, ඒ මහායොධ තෙමේ; තෙනෙව, එහින්ම; පාකටො අහු ඉති, ප්‍රකටවීය.

219 කත්වාන එවං කුසලං සුධීමා
පත්වාන දෙවෙසු මනොරමෙසු,
භොති'හි නාගා'ව බලෙනු'පෙතා
තථාවිධෙ වො කුසලෙ රමෙථා'ති.

එවං, මෙසේ; සුධීමා, නුවණැත්තේ; කුසලං කත්වාන, කුසල් කොට; මනොරමෙසු, සිත්කලුවූ; දෙවෙසු, දෙව්ලෙව්හි (සැපතට); පත්වාන, පැමිණ; නාගො ඉව, හස්තින්මෙන්; බලෙන, (මහත්වූ ශරීර) බලයෙන්; උපෙතො භොන්ති, යුක්තවේයයි (දැන); වො, තෙපි; තථාවිධෙ, එබඳුවූ; කුසලෙ, කුසල්කම්හි, රමෙථ ඉති, සිත් අලවව් (යෙදෙව්).

## භරණි වස්තුව—9.

---

220 ගිරිනාමෙ ජනපදෙ කුටුම්බියඩගණගාමකෙ,
කුටුම්බිවසභො නාම අහොසි තත්ථ සම්මතො.

ගිරිනාමෙ ජනපදෙ, ගිරිනම්දනව්වෙහි; කුටුම්බියඩගණගාමකෙ, කුටුම්බියඩගණ නම් ගම්හි; තත්ථ, එහි; සම්මතො, ප්‍රසිද්ධවූ; කුටුම්බිවසභො නාම, කුටුම්බිවසභ නම් (කෙළෙඹියෙක්); අහොසි, වූයේය.

221 වෙළූ ජනපදෙ තස්ස සුමනො ගිරිභොජකො,
සහායස්ස සුතෙ ජාතෙ පණ්ණාකාරපුරස්සරා.

222 ගන්ත්වා උභො සකං නාමං දාරකස්ස අකාරයුං,
තං වුඩ්ඪං අත්තනො ගෙහෙ වාසෙසි ගිරිභොජකො'ති.

ජනපදෙ, දනව්වැසිවූ; වෙළූ, වෙළුනම් වූයේද; ගිරිභොජකො, ගිරිනම් රට අනුභව කරන්නාවූ; සුමනො, සුමනනම්වූයේදැයි; උභො, (යහලු) දෙදෙන; තස්ස සහායස්ස, ඒ යහලු කෙළෙඹියාහට; සුතෙ ජාතෙ, පුතෙක් උපන්කල; පණ්ණාකාරපුරස්සරා, පඬුරු පෙරටු කොට ඇත්තාහු; ගන්ත්වා, ගොස්; සකං නාමං, සියනම් (වෙළු සුමන යන නම); දාරකස්ස, දරුවාහට; අකාරයුං, කරවූහ; ගිරිභොජකො, ගිරිභොජකතෙමේ; තං, ඔහු; වුඩ්ඪං, වැඩූහු; අත්තනො, තමාගේ; ගෙහෙ, ගෙහි; වාසෙසි, වැස්වීය.

223 ගිරිභොජකස්ස එකො සො සින්ධවො'සි මහබ්බලො,
අත්තනො පිඨියං සො හි කම්පි නා'රොහිතුං අදා.

224 දිස්වා තු වෙළුසුමනං අයම්'ආරොහකො මම,
අනුරූපො'හි චින්තෙත්වා පහට්ඨො හෙසිතං අදා.

ගිරිභොජකස්ස, ගිරිභොජකයාගේ; මහබ්බලො, මහත් බල ඇති; එකො සින්ධවො, එක් සෛන්ධවයෙක්; ආසි, වීය; සො, ඒ අශ්වතෙම; කඤ්චි, කිසිමෙකුට; අත්තනො, තමාගේ; පිට්ඨිං ආරොහිතුං, පිට නැගෙන්ට; න අදා, නුදුන්නේය;–සො හි, ඒ සෛන්ධවතෙමේ වනාහි; වෙළුසුමනං, වෙළුසුමනයා; දිස්වා තු, දක; අයං, මේ තෙමේ; මම, මට; අනුරූපො, සුදුසුවූ; ආරොහකො ඉති; අසරුයයි; චින්තෙත්වා, සිතා; පහට්ඨො, සන්තුෂ්ටවූයේ; හෙසිතං, හෙෂාරව; අකා, කෙළේය.

225 තං ඤත්වා භොජකො අස්සං ආරොහා'ති තමා'හ සො,
සො අස්සං ආරුහිත්වා තං සීඝං ධාවයි මණ්ඩලෙ.

තං ඤත්වා, ඒ දැන; සො භොජකො, ඒ ගිරිභොජකතෙමේ; අස්සං ආරොහ ඉති; අසුනැගෙවයි; තං, ඔහුට; ආහ, කීයේය; සො, ඒ වෙළුසුමනයා; අස්සං ආරුහිත්වා, අසුනැගී; තං, ඒ අසු; මණ්ඩලෙ, මණ්ඩලයෙහි; සීඝං, වහා; ධාවයි, දිවෙව්වේය.

226 මණ්ඩලෙ සකලෙ අස්සො එකාබද්ධො අදිස්සි සො,
නිසීදි ධාවතො ච'ස්ස වස්සාභාරො'ව පිට්ඨියං.

සො අස්සො, ඒ අශ්වතෙමේ; සකලෙ මණ්ඩලෙ, සියලු මණ්ඩලයෙහි; එකාබද්ධො, එකාබද්ධවූයේ; අදිස්සි, (අලාත චක්‍රයක්සේ) පෙණිනි; අස්ස, ඒ අසු; ධාවතොච, දුවද්දීත්; පිට්ඨියං, අසුපිට; වස්සාභාරොව, පුරුෂවලල්ලක්සේ; නිසීදි, හුන්නේය.

227 මොචෙති'පි උත්තරියං බන්ධති'පි අනාදරො,
තං දිස්වා පරිසා සබ්බා උක්කුට්ඨිං සම්පවත්තයි.

අනාදරො, සැලකිලි නැත්තේ; උත්තරියං, උතුරු සළුව; මොචෙති අපි, මුදන්නේත්වෙයි; බන්ධති අපි, බඳින්නේත්වෙයි; තං දිස්වා, ඒ දැක; සබ්බා පරිසා, සියලු පිරිස; උක්කුට්ඨිං, ඔල්වරහඬ; සම්පවත්තයි, පැවැත්වීය.

228 දත්වා දසසහස්සානි තස්ස සො ගිරිභොජකො,
රාජානුච්ඡවිකො'ය'න්ති හට්ඨො රඤ්ඤො අදාසි තං.

සො ගිරිභොජකො, ඒ ගිරිභොජක තෙමේ; තස්ස, උහුට; දස සහස්සානි, දසදහසක්; දත්වා, දී; අයං, මේ තෙමේ; රාජානුච්ඡවිකො ඉති, රජහට සුදුසුයයි; හට්ඨො, සතුටුවූයේ; තං, ඔහු; රඤ්ඤො, රජහට; අදාසි, දුන්නේය.

229 රාජා තං වෙළුසුමනං අත්තනොයෙ'ව සන්තිකෙ,
කාරෙත්වා තස්ස සක්කාරං වාසෙසි බහුමානයං'ති.

රාජා, රජතෙමේ; තස්ස, උහුට; සක්කාරං කාරෙත්වා, සත්කාර කරවා; තං වෙළුසුමනං, ඒ වෙළුසුමනයාට; බහුමානයං, බුහුමන් කෙරෙමින්; අත්තනො සන්තිකෙ එව; තමන් වෙතම; වාසෙසි, වැස්වීය.

230 එවං විධා සග්ගසිරී ච ථාමං න හොති පාපා'භිරතස්ස යස්මා,
තස්මා සුචරිතං චරථ'ප්පමත්තා සග්ගාපවග්ගෙසු සිරිංසරන්තා'ති,

එවං විධා, මෙබඳුවූ; සග්ගසිරී ච, සගසැපද; ථාමං, ශරීර බලයද; යස්මා, යම් හෙයකින්; පාපාභිරතස්ස; පාපයෙහි ඇලුනහුට; නහොති නොවේද; තස්මා, එහෙයින්; සග්ගාපවග්ගෙසු සිරිං, සගපවග සැප; සරන්තා, සිහිකරන්නාහු; අප්පමත්තා, නොපමාව; සුචරිතං චරථ, කුසල් කරව්.

වෙළුසුමන වත්ථුව—10.

---

## යොධවග්ගො සත්තමො.

---

1 නකුලනගරකණ්ණිකායං ගාමෙ මහින්දදෙණිකෙ,
අභයස්ස'න්තිමො පුත්තො දෙවො නාමා'සි ථාමවා,
ඊසකං පන බඤ්ජන්තො බඤ්ජදෙවොති තං විදුං.

නකුලනගරකණ්ණිකායං, නකුල්නල් කණ්ණිකායෙහි (මුහුනන් නරුව සමීපයෙහි); මහින්දදෙණිකෙ ගාමෙ; මහෙන්ද්‍රද්‍රොණි නම් ගම (මිදෙනි නම් ගම); අභයස්ස, අභය නම් තැනැත්තහුගේ; අන්තිමො පුත්තො, අන්තිම පුත්‍රවූ; ථාමවා, ශක්තිසම්පන්නවූ; දෙවො නාම, දෙව නම් තැනැත්තෙක්; ආසි, වීය; ඊසකං පන, මදක්; බඤ්ජන්තො, කොරගසන බැවින්; බඤ්ජදෙවො ඉති, බඤ්ජදෙවයයි; තං, උහු; විදුං, දනිත්.

2 මිගවං ගාමවාසීහි සහ ගන්ත්වාන සො තදා,
මහිසෙ අනුබන්ධිත්වා මහන්තෙ උසිතුසිතෙ.

3 හත්ථෙන පාදෙ ගණ්හිත්වා භමෙත්වා සීසමත්ථකෙ,
ආසුම්භ භූමිං චුණ්ණෙති තෙසං අට්ඨීනි මාණවො.

තදා, එකල්හි; සො මාණවො, ඒ මාණවතෙම; ගාමවාසීහි සහ, ගම්වැස්සන් හා; මිගවං, මුවදඩ; ගන්ත්වාන, ගොස්; මහන්තෙ, මහත්වූ; උසිතුසිතෙ මහිසෙ, නැගිනැගී මීවුන්; අනුබන්ධිත්වා, ලුහුබැඳ;—හත්ථෙන, අතින්; පාදෙ ගණ්හිත්වා, (උන්) පා අල්වාගෙණ; සීසමත්ථකෙ භමෙත්වා, ඉසවටා සිසාරා; භූම්ං ආසුම්භ, බිම පැහැර; තෙසං, ඔවුන්ගේ; අට්ඨීනි, ඇට; චුණ්ණෙති, පොඩිකෙරෙයි.

4. මහබ්බලො මහාථාමො ථරුසිප්පෙසු කොවිදො,
අහොසි තෙන යොධො'ති පාකටො ආසි භූතලෙ'ති.

මහබ්බලො, (හෙතෙම) මහත් බල ඇත්තේය; මහාථාමො, මහත් වියඹ ඇත්තේය; ථරුසිප්පෙසු, ඛඩ්ගශිල්පයෙහි; කොවිදො අහොසි, දක්ෂවූයේය; තෙන, එහෙයින්; යොධො ඉති, යොධයයි; භූතලෙ, පෘථිවි තලයෙහි; පාකටො ආසි, ප්‍රසිද්ධ වීය.

5. එවං ආයතනං ගතං සුචරිතං නන්දාවහං නන්දනෙ
සම්පත්තිං නිඛිලං නරෙසු ච අථො නිබ්බාණම්'න්තෙ පුරං,
තස්මා දුනසහායකං භජථ භො සබ්බත්ථ චින්තාමණිං
දිබ්බං මන්තපදං තථෙ'ව අගදං සද්ධිං චරං සබ්බදා'ති.

එවං, මෙසේ; ආයතනංගතං, විස්තාරගතවූ; සුචරිතං, කුශල ධර්මය තෙම; නන්දනෙ, (දෙව්ලොව) නන්දනොද්‍යානයෙහි; නන්දාවහං, සතුටු එලවන්නාවූ; සම්පත්තිං, (දෙව්) සැපත්ද; නරෙසු, මිනිස්ලෙව්හි; නිඛිලං සම්පත්තිං ච, සියලු සම්පත්ද; අථො, තවද; අන්තෙ, කෙළවර; නිබ්බාණං පුරං, නිවන්පුරසිරිද (දෙයි); භො, භවත්නි; තස්මා, එහෙයින්; අගදං, (සසරදුක් නැමැති ව්‍යාධියට) දිවඔසු බඳුවූ; තථෙව, එසේම; දිබ්බං මන්තපදං, දිවමතුරක් බඳුවූ; සබ්බත්ථ, හැමතන්හි; චින්තාමණිං, සිතුමිණක් බඳුවූ; සබ්බදා, හැමකල්හි; සද්ධිං චරං, සමග යන්නාවූ; දුනසහායකං, දුන නැමැති මිත්‍රයා; භජථ, භජනය කරව්.

**ධඤ්ඤ දෙව වත්ථුං —1.**

---

6. චිත්තලපබ්බතාසන්නෙ ගාමෙ කපිට්ඨනාමකෙ,
උප්පලස්ස සුතො ආසි ඵුස්සදෙවො'ති නාමකො.

චිත්තලපබ්බතාසන්නෙ, සිතුල්පව්ව සමීපයෙහි; කපිට්ඨනාමකෙ ගාමෙ, කපිට්ඨනම් ගම (ගොඩිගමුනම් ගම); උප්පලස්ස, උත්පලනම් තැනැත්තහුගේ; ඵුස්සදෙවො ඉති, ඵුස්සදෙවයයි; නාමකො, නම් ඇති; සුතො ආසි, පුතෙක් විය.

7. ගන්ත්වා සහ කුමාරෙහි විහාරං සො කුමාරකො,
බොධියා පූජිතං සඞ්ඛං ආදාය ධමි ථාමසා.

සො කුමාරකො, ඒ කුමාරතෙමේ; කුමාරෙහි සහ, ගම් දරුවන් හා; විහාරං ගන්ත්වා, විහාරයට ගොස්; බොධියා, බොධියට; පූජිතං, පුදන ලද; සඞ්ඛං ආදාය; සකක් ගෙණ; ථාමසා, තරයේ; ධමි, පිඹිය.

8. අසනිපාතසද්දො'ව තස්ස සද්දො මහා අහු,
උම්මත්තා විය ආසුං තෙ සබ්බෙ අපි ච දාරකා.

තස්ස සද්දෙන, ඒ සම්බන්ධ ශබ්දයතෙම; අසනිපාතසද්දො ඉව, හෙනහඬක් මෙන්; මහාඅහු, මහත්විය; තෙ සබ්බෙ දාරකා අපි ච, ඒ සියලු ගම්දරුවෝද (බියවැද); උම්මත්තා විය, උමතුවූවන් මෙන්; ආසුං, වූහ.

9. චතුප්පදා විහඞ්ගා ච හමිංසු චකිතා වනෙ,
තෙන සො ආසි උම්මාදඵුස්සදෙවො'ති පාකටො'ති.

වනෙ, (සමීප) වනයෙහි; චතුප්පදා, සිව්පාවෝද; විහඞ්ගා ච, පක්ෂිජාතිහුද; චකිතා, ත්‍රස්තවූවාහු; හමිංසු, භ්‍රාන්තවූහ (හාත්පස පැන දුවන්ට වන්හ); සො, ඒතෙමේ; තෙන, ඒ හෙතුවින්; උම්මාදඵුස්සදෙවො ඉති, උම්මාදඵුස්සදෙවයයි; පාකටො ආසි, ප්‍රසිද්ධ වීය.

10. හත්ථස්සථරුසිප්පං සො සික්ඛාපෙසි සකං සුතං,
ධනුසිප්පං ච සික්ඛෙසි තස්ස වංසාගතං පිතා.

තස්ස, ඔහුගේ; පිතා, පියවූ; සො, හෙතෙම (උත්පලනම් කෙළෙඹි තෙම); සකං සුතං, ස්වකීය පුත්‍රයාට; හත්ථස්සථරුසිප්පං, හස්තිශිල්ප අශ්වශිල්ප ඛඩ්ගශිල්ප යන මේ; සික්ඛාපෙසි, ඉගැන්විය; වංසාගතං, (ඔහුගේ) වංශයෙහි පැවතආවාවූ; ධනුසිප්පං ච, ධනුශ්ශිල්පයද; සික්ඛෙසි, ඉගැන්විය.

11. සද්දවෙධී විජ්ජුවෙධී වාලවෙධී ච සො අහු,
වාලුකාපුණ්ණසකටං බද්ධචම්මසතං තථා.

12. අසනොදුම්බරමයං අට්ඨසොළසඅඞ්ගුලං,
තථා අයො ලොහමයං පට්ටං ච්චතුරඞ්ගුලං.

13. නිබ්බෙධයති කණ්ඩෙන ඛණ්ඩො තෙන විසජ්ජිතො,
ථලෙ අට්ඨුසභං යාති ජලෙ තු උසභං පන.

සො, ඒතෙමේ; සද්දවෙධී, ශබ්දානුසාරයෙන් විදින සුළුවූයේද; විජ්ජුවෙධී, විදුලිඑලි අනුසාරයෙන් විදින සුලුවූයේද; වාලවෙධී ච, (කරබවුආදී කිසි ලක්ෂණකින්) රොම්විදින සුලුවූයේද; අහු, වීය; වාලුකාපුණ්ණසකටං, වැලි පිරුණු ගැල්ද; තථා, එසේම; බද්ධචම්මසතං; එකාබද්ධ සම්සියක් පටද:—අට්ඨසොළසඅඞ්ගුලං, අටඟුල් සොළසඟුල්වූ; අසනොදුම්බරමයං, පියා ලැහැලි දිඹුල් ලැහැලිද; තථා, එසේම; ච්චතුරඞ්ගුලං, දැඟුල් සතරඟුල්වූ; අයොලොහමයං පට්ටං, යපට ලොහොපටද:—කණ්ඩෙන, හියෙන්; නිබ්බෙධයති, විදියි; ඛණ්ඩො, හීයද; තෙන, ඔහු විසින්; විසජ්ජිතො, විසර්ජනය කරණලද්දේ; ථලෙ, ගොඩ; අට්ඨුසභං, අටඉස්බක් තැන්; යාති, යෙයි; ජලෙ තු, දියෙහි වනාහි; උසභං පන, ඉස්බක්තැන් (යෙයි).

14. නෙකසිප්පානි තස්සා'සුං අබ්භුතච්ඡරියානි ච,
තෙන සො පාකටො ආසි සකලතම්බපණ්ණියං'ති,

තස්ස, ඔහුගේ; අඞ්ගානි ච, (මෙයින්) අනාවූද; අච්ඡරියානි, ආශ්චර්‍ය්‍යවූ; නෙකසිප්පානි, නොයෙක් ශිල්පයෝ; ආසුං, වූහ; තෙන, එහෙයින්; සො, ඒතෙමේ; සකලතම්බපණ්ණියං, සියලු තාම්‍රපර්ණියෙහි; පාකටො ආසි, ප්‍රසිද්ධවිය.

15. කත්වා'යමෙහා ඉති සුචරිතං පුස්සදෙවො අතීතෙ
දිබ්බං භොගං පමුදිතමනො භුඤ්ජ සබ්බඤ්ඤ නිච්චං,
තස්මා තුම්හෙ තිවිධවිභවං පත්ථයන්තා මහන්තං
හිත්වා'ලස්‍යං කුරුථ කුසලං තීසු වත්ථූසු සම්මා'ති.

භො, භවත්නි; ඉති, මෙසේ; අයං පුස්සදෙවො, මේ පුස්සදෙවනම් යොධතෙමේ; අතීතෙ, පූර්ව්ජාතියෙහි; සුචරිතං කත්වා, කුසල්කොට; සබ්බඤ්ඤ, හැමතන්හි; නිච්චං, සතතයෙන්; පමුදිතමනො, ප්‍රමුදිතසිත් ඇත්තේ; දිබ්බං භොගං, දිව (මනුෂ්‍ය) සැප; භුඤ්ජී, අනුභවකෙළේය; තස්මා, එහෙයින්; මහන්තං, මහත්වූ; තිවිධවිභවං, ත්‍රිවිධ සම්පත්තිය; පත්ථයන්තා, කැමැත්තාවූ; තුම්හෙ, තෙපි; ආලස්‍යං, කුසීතභාවය; හිත්වා, හැර; තීසුවත්ථූසු, තුන්රුවන් විෂයෙහි; සම්මා, මොනවට; කුසලං කුරුථ, කුසල් කළමැනවි.

**පුස්සදෙව වත්ථු ව.—2.**

---

16. තුලාධාරපබ්බතාසන්නෙ විහාරවාපි ගාමකෙ,
මත්තකුටිම්බිස්ස සුතො වසභනාමකො අහු.

තුලාධාරපබ්බතාසන්නෙන, තුලාධාර පර්වත සමීපයෙහි; විහාරවාපි ගාමකෙ, වෙහෙරවැගම; මත්තකුටිම්බිස්ස, මත්තනම් කෙළෙඹියාහට; සුතො, පුත්වූ; වසභනාමකො, වසභනම් ඇත්තෙක්; අහු, විය.

17. පුබ්බෙ සො පඤ්චසීලානි සමාදාය සුගොපයි,
තෙන සො පුඤ්ඤකම්මෙන රූපී ආසි මනොරමො.

සො, හෙතෙම; පුබ්බෙ, පූර්ව්ජන්මයෙහි; පඤ්චසීලානි, පන්සිල්; සමාදාය, සමාදන්ව; සුගොපයි, මනාකොට රැක්කේය; සො, හෙතෙමේ; තෙන පුඤ්ඤකම්මෙන, ඒ පින්කමින්; රූපී, රූපශ්‍රී ඇත්තේ; මනොරමො ආසි, සිත්කලු වූයේය.

18. නාතිදීඝො නාතිකිසො ආරොහපරිණාහවා,
අනිඤ්ජිත'ඞ්ගපච්චඞ්ගො අහොසි පියදස්සනො.

නාතිදීඝො, ඉතා සථූලද නොවූයේ; නාතිකිසො, ඉතා කෘශද නොවූයේ; ආරොහපරිණාහවා, ආරොහ පරිණාහ සම්පන්නවූයේ (හෙවත් සිත්පිණවන පරිද්දෙන් උස මහත ඇත්තේ); අනිඤ්ජිත, චණ්නාකාට යුතුවූ; අඞ්ගපච්චඞ්ගො, අඟපසඟ ඇත්තේ; පියදස්සනො අහොසි, පියදක්නුම් ඇත්වූයේය.

19. කෙසා'සස දීඝා කණ්හා සුඛුමා අගගවෙලලිතා,
සමපහඪං මුඛං තසස ඵුලලං කොකාසසාදිසං.

අසස, ඔහුගේ; කෙසා, කෙශයෝ; අගගවෙලලිතා, අක්බඹුරුයහ; දීඝා, දිගිසයහ; සුඛුමා, සිනිඳුය; කණ්හා, කලුය; තසස, ඔහුගේ; මුඛං, මූන; සමපහඪං, (ඔප්නගනලද රන්කැඩපතක්සේ) අතිශයින් ප්‍රහෘෂට වූයේ; ඵුලලං, පිබිදියේ; කොකාසසාදිසං, රත්පියුමක් සමානය.

20. පුච්මඤ්දලාකාරසුබහ්‍රු රාජීච ලොචනා,
නිවාතෙ දිපසඛිකාසා නාසා තසස අනුගගතා.

තසස, ඔහුගේ; පුච්මඤ්දලාකාර, කොසඹපත්‍රාකාරවූ; සුබහ්‍රුරාජී, මනාවූ හැලෙබා දෙක වෙත්; ලොචනාච, නෙත් සඟළද; නිවාතෙ, නිර්වාතස්ථානයෙහි; දිපසඛිකාසා, බබලන ප්‍රදිපසිඛාමෙනි; නාසා, නාසිකාව; අනුගගතා, ක්‍රමයෙන් නැගුනාක් වෙයි.

21. බන්‍ධුජීවදලාකාරා අසසා'සුම'ධරා'රුණා,
දනතා'සසා'සුං සමා 'විවරා දිනතමුතතා'ලිසන්නිහා.

අසස, ඔහුගේ; අරුණා, අරුණවර්ණවූ; අධරා, දෙතොල්; බන්‍ධුජීවද ලාකාරා ආසුං, බදුවදපෙත් බඳුවූහ; අසස, ඔහුගේ; සමා, සමවූ; අවිවරා, විවරනැත්තාවූ; දනතා, දත්; දිනතමුතතාලිසන්නිහා ආසුං, දිමුතු මුතුපෙලක් බඳුවූහ.

22. සොණ්ණාභරණසමපුණණා කණණා'සුං තසස භාසුරා,
බාහූ හෙමලතාකාරා රතනපලලවලඞ්කතා.

තසස, ඔහුගේ; සොණ්ණාභරණසමපුණණා, රන්අබරණින් පිරුණාවූ; කණණා, දෙකන්; භාසුරා ආසුං, බබලනසුලුවූහ; බාහූ, බාහු යුගමය; රතනපලලවලඞ්කතා, රාකතාඞ්ගුල්නැමැති රකතපලලව් යෙන් අලඞ්කෘතවූවෝ; හෙමලතාකාරා, රන්ලියදෙකක් වැනිවූහ.

23. හෙමබිමබනිභං තසස දෙහලකඛණසංයුතං,
ඌරූ කරිකරාකාරා පිවරා අනුපුබබසො.

තසස, ඔහුගේ; දෙහලකඛණසංයුතං, දෙහලක්‍ෂණයෙන් යුකතවූ (ශරීරය); හෙමබිමබනිභං, (දිව්දළින් ඔප්නැගූ) කනකරූපයක් සමානය; ඌරූ, දෙවටොර; අනුපුබබසො, ක්‍රමයෙන්; පිවරා, පිරුණාහු; කරිකරාකාරා, ඇත්සොඬදෙකක් වැනියහ.

24. ජඞෙඝණිමිගජඞඝා'ව තසසා'සුං ගුළ්භගොපඵකා,
කුමමුනනතා පාදපිට්ඨී දීඝා වට්ටුලකඞ්ගුලා,
කමලා තළුණා හත්ථතලා'සුං මුදුකොමලා.

තසස, ඔහුගේ; ජඞඝා, කෙණ්ඩ; එණිමිගජඞඝා ඉව, එණිමෘග යන්ගේ ජඞඝා වැනිවූවාහු; ගුළ්හගොපඵකා ආසුං, සැඟවුනු ගොප්ඇට

ඇතිවූහ; පාදපිට්ඨී, පිටිපතුල්; කුම්මුන්නතා, කුම්පෘෂ්ඨමෙනි; දීඝා, දිගීඝවූ; වට්ටුලකා, වටවූ; අඞ්ගුලා, ඇඟිලිවූහ; මුදූ, මෘදුවූ; කොමලා, කොමලවූ; හත්‍ථතලා, අතුල්; කමලා, නෙලුම්පෙති වැනිවූවාහු; තරුණා ආසුං, තරුණ වූහ.

25. තං සුජාතසරීරත්‍තා දිස්වා'ස්ස රූපසම්පදං,
වොහරන්‍ති ජනා සබ්බෙ ලම්භියවසභො ඉති'ති.

සුජාතසරීරත්‍තා, (මෙසේ) සුලක්‍ෂණව හටගත් සිරුරු ඇතිබැවින්; අස්ස, ඔහුගේ; තං රූපසම්පදං, ඒ රූපසම්පත්තිය; දිස්වා, දැක; සබ්බෙ ජනා, සියලු ජනයෝ; ලම්භියවසභො ඉති, ලම්භියවසභයයි; වොහරන්‍ති, ව්‍යවහාර කෙරෙත්.

26. සො කමෙනා'භිවඩ්ඪන්‍තො ආසි වීසතිවස්සිකො,
දසනාගබලො ආසි ථරුසිප්පෙ ච කොවිදො.

සො, ඒ (ලම්භියවසභ) තෙමේ; කමෙන, ක්‍රමයෙන්; අභිවඩ්ඪන්‍තො, වැඩෙන්නේ; වීසතිවස්සිකො ආසි, විසිවස්ඇත්තේ වී; දසනාගබලො ආසි, ඇතුන් දශදෙනෙකුගේ බලඇත්තේ විය; ථරුසිප්පෙ ච; කඩුසර බෙහිද; කොවිදො ආසි, දක්‍ෂවිය.

27. ආදාය සො කතිපයෙ පුරිසෙයෙව ආරභි,
ඛෙත්‍තත්‍ථිකො මහාවාපිං කරොන්‍තො තං මහබ්බලො.

ඛෙත්‍තත්‍ථිකො, කෙතක් කැමැතිවූ, මහබ්බලො, මහත් බලඇත්තාවූ; සො, ඒ තෙමේ; මහාවාපිං, මහවැවක්; කරොන්‍තො, කරන්නේ; කතිපයෙ පුරිසෙ එව, මිනිසුන් කීපදෙනෙක්ම; ආදාය, ගෙණ; තං, ඒ වැව; ආරභි, (කරන්ට) පටන්ගත්තේය.

28. දසහි වාදසහි වා වහිතබ්බෙ නරෙ හි'පි,
වහන්‍තො පංසුපිණ්ඩෙ සො ලහුං වාපිං සමාපයි.

දසහි වාදසහි නරෙහිවා අපි, මිනිසුන් දසදෙළොස්දෙනා විසින්ද; වහිතබ්බෙ, ඉසිලියයුතු; පංසුපිණ්ඩෙ, මහත් පාංශුපිණ්ඩයන්; සො වහන්‍තො, හෙතෙම උසුලන්නේ; ලහුං, වහා; වාපිං, වැව; සමාපයි, කොට නිමවීය.

29. තෙන සො පාකටො ආසි ලම්භියවසභො තදා,
දීපස්මිං සකලෙ තස්මිං යොධො ඉති මහබ්බලො'ති.

තෙන, ඒ කාරණෙන්; සො ලම්භියවසභො, ඒ ලම්භියවසභතෙමේ; තදා, එකල්හි; මහබ්බලො, මහත් බලඇති, යොධො ඉති, යොධයයි; සකලෙ, සියලු; තස්මිං දීපස්මිං, ඒ ද්වීපයෙහි; පාකටො ආසි, ප්‍රකටවිය.

30. දත්වාන දානං සුගතොරසානං
පාලෙත්වා සම්මා බලු පඤ්චසීලං,
රූපං ච ථාමං ච යසං ච භොගං
ලභන්ති සත්තා වසභො'ව එවං.

එවං, මෙසේ; වසභො ඉව; ලභියවසභනම් යොධයා මෙන්; සත්තා, (මේ ලොකයෙහි) සත්වයෝ; සුගතොරසානං, සම්බුද්ධපුත්‍රයන්ට; දානං දත්වාන, දන්දී; සම්මා, මනාකොට; බලු, එකාන්තයෙන්; පඤ්චසීලං, පන්සිල්; පාලෙත්වා, පාලනයකොට; රූපං ච, (විශිෂ්ට) රූපසම්පත්ති යද; ථාමං ච, (ශරීර) ශක්තියද; යසං ච, කීර්තියද; භොගං, භොගස ම්පත්තියද; ලභන්ති, ලබත්.

**ල භි ය ව ස භ  ව ස්තු ව—3.**

---

31. මාතාපිතුනනං පාදානි'දානි වන්දිත්වා සාදරො,
වත්තුකාමො අහං කිඤ්චි තං සුණන්තු සමාහිතා.

ඉදානි, දැන්; සාදරො, සාදරසිත් ඇති; අහං, මම; මාතාපිතුනනං, මව්පියන්ගේ; පාදානි, පා; වන්දිත්වා, වැඳ; කිඤ්චි, කිසිවක්; වත්තුකාමො, කියනු කැමැත්තේ වෙමි; තං, එය; සමාහිතා, එකඟසිත් ඇත්තාහු; සුණන්තු, අසත්වා.

32. ජිනො නො පාරමී චිත්වා බුද්ධො හුත්වා නිරුත්තරො,
ලොකාභිවුඩ්ඪිං කත්වාන ඉතො සො සුගතිං ගතො,

නො, අපගේ; නිරුත්තරො, නිරුත්තරවූ; සො ජිනො, ඒ බුදුරජ තෙම; පාරමී චිත්වා, සමතිස් පෙරුම් පුරා; බුද්ධො හුත්වා, ලොවුතුරා බුදුව; ලොකාභිවුඩ්ඪිං කත්වාන, ලෝවැඩ වඩා; ඉතො, මෙයින්; සුගතිං ගතො, නිවන්පුර වැඩිසේක.

33. තස්ස ධම්මො ච සඞ්ඝො ච ලොකෙ දිප්පන්ති පත්ථටො,
සග්ගාපවග්ගසම්පත්තිං තිලොකස්ස දදං සදා.

තස්ස, උන්වහන්සේගේ; ධම්මො ච, ධර්මයතෙමේද; සඞ්ඝො ච, සඞ්ඝයතෙමේද; තිලොකස්ස, තුන්ලෝවාසීන්ට; සදා, හැමකල්හි; සග්ගාපවග්ගසම්පත්තිං, සගපවග සැප; දදං, දෙමින්; ලොකෙ, ලොකයෙහි; පත්ථටො, පතලේ; දිප්පන්ති, බබලයි.

34. ධරමානො ජිනො'ගම්ම ලඞ්කායං යක්ඛු'පද්දවං,
සමෙත්වා සාසනං සම්මා පතිට්ඨාපෙසි අත්තනො.

ධරමානො, ජීවමානවූ; ජිනො, සර්‍වඥතෙම; ආගම්ම, (මෙහි) වැඩ; ලඞ්කායං, මේ ලඞ්කාවෙහි; යක්ඛුපද්දවං, යක් උවදුරු; සමෙත්වා, සංසිඳුවා; අත්තනො, තමන්වහන්සේගේ; සාසනං, සස්න; සම්මා, මනාකොට; පතිට්ඨාපෙසි, පිහිටුවාලූ සේක.

35. තදිදං නාසයුං'දානි දමිළා කක්ඛළා ජළා,
භින්දිංසු බුද්ධරූපානි චෙතියානි තහිං තහිං,
ඡින්දිංසු බොධිරුක්ඛෙ ච ඣාපෙසුං පොත්ථකානි ච.

තං ඉදං, ඒ මේ (බුදුසස්න); ඉදානි, දැන්; කක්ඛළා, කර්කශවූ; ජළා, ජඩවූ; දමිළා, දෙමළු; නාසයුං, නැසූහ; තහිං තහිං, ඒ ඒ තන්හි; බුද්ධරූපානි, බුදුරුද; චෙතියානි, චෛත්‍යයන්ද; භින්දිංසු, සිඳබිඳනැසූහ; බොධිරුක්ඛෙ ච, බෝරුක්ද; ඡින්දිංසු, කැපූහ; පොත්ථකානි ච, පොත්පත්ද; ඣාපෙසුං, (ගිනිලා) දැවූහ.

36. භික්ඛූනං භික්ඛුණීනං ච අකාසුං කායිකං දුඛං,
භින්දිංසු පත්තඡත්තාදිං විහෙඨෙසුං අනාදරා.

භික්ඛූනං, භික්ෂූන්වහන්සේලාටද; භික්ඛුණීනං ච, භික්ෂුණීන්වහන්සේලාටද; කායිකං දුඛං, ශරීරවධ; අකාසුං, කළාහුය; පත්තඡත්තාදිං, පාත්‍ර ඡත්‍රආදිය; භින්දිංසු, බිඳලූහ; අනාදරා, ආදර නැතිව; විහෙඨෙසුං, (උන්වහන්සේලා) වෙහෙසූහ.

37. මාදිසෙන සමත්ථෙන න යුත්තං තමු'පෙක්ඛිතුං,
කරොන්තො රාජුපට්ඨානං තෙන සද්ධිං මහබ්බලො.

38. ඝාතෙත්වා දමිළං සෙනං ඛෙමං කත්වාන සීහලං,
චිරට්ඨිතිං කරිස්සාමි ලොකනාථස්ස සාසන'න්ති.

මාදිසෙන, මා වැනිවූ; සමත්ථෙන, සමර්ථයෙකුවිසින්; තං, එය; උපෙක්ඛිතුං, උපෙක්ෂාවෙන් බලා ඉන්ට; න යුත්තං, යුතුනොවෙයි (එහෙයින්); රාජුපට්ඨානං, රජහට උවටැන්; කරොන්තො, කරන්නේ; මහබ්බලො, මහත්බලඇත්තේ; තෙන සද්ධිං, ඔහු හා සමග; දමිළං සෙනං, ද්‍රාවිඩ සෙනාව; ඝාතෙත්වා, නසා; සීහලං, ලක්දිව; ඛෙමං කත්වාන, නිරුපද්‍රවකොට; ලොකනාථස්ස, ලොකස්වාමීන්වහන්සේගේ; සාසනං, සස්න; චිරට්ඨිතිං, බෝකල් පැවතුම් ඇත්තක්; කරිස්සාමි ඉති, කරන්නෙමියි (කීයේය).

39. සමත්ථො'හං වසෙ කාතුං හන්ත්වාන පති'මං පුරං,
තථාහි මෙ කායබලං පඤ්ඤා'පි මම දිස්සති.

40. බහූපකාරො රාජා මෙ පොසෙතා යසදායකො,
අථො සද්ධො පසන්නො ච සාසනස්සො'පකාරකො.

මෙ, මාගේ; කායබලං, ශරීරබලයද; පඤ්ඤාඅපි, (සිතූදෙය සිද්ධ කොට ගන්ට නිසි ස්ථානොචිත) ප්‍රඥාවද; දිස්සති, පෙණෙයි; හන්ත්වාන,

(මේ බලසෙනග) නසාදම්‍යා; ඉමං පුරං, මේ නුවර; මම, මාගේ; වසෙ කාතුං, වසයෙහි කරන්ට (රජයගන්ට නමුත්); අහං පන, මම වනාහි; සමත්‍ථො, සමර්ථවෙමි; තථාහි; ඒ එසේමැයි;—රාජා, රජතෙම; මෙ, මට; බහූපකාරො, බොහෝ උපකාර ඇත්තේය; පොසෙතා, (මා) පොෂණය කරන්නාය; යසදායකො, යශොදානය කරන්නාය; අථො, එපමණක් මතු නොවෙයි; සද්ධො, සැදැහැ ඇත්තෙක; පසන්නො ච, (තුන්රුවන් කෙරෙහි) ප්‍රසන්නය; සාසනස්ස, සර්‍වඥශාසනයට; උපකාරකො, උපකාර කරන්නෙකි.

41. තස්මා සො භූමිපො'දානි න මෙ'රහති දුබ්භිතුං,
කොහි නාම බුධො ලොකෙ වසං කොධස්ස ගච්ඡති.

තස්මා, එසේ හෙයින්; ඉදානි, දැන්; සො භූමිපො, ඒ මහිපාලතෙමේ; මෙ, මා විසින්; දුබ්භිතුං, ජිඝාංසනය කරන්ට (ද්‍රොහකොට නසන්ට); න අරහති, සුදුසුනොවෙයි; ලොකෙ, ලෙව්හි; කොහි නාම බුධො, කවරනම් නුවනැත්තෙක්; කොධස්ස, ක්‍රොධයාගේ; වසං, වසයට; ගච්ඡති, යයිද?.

42. යො කොධස්ස වසං යාති සො යාති නරකං ඉතො,
දුක්ඛිතො ගරහිතො ච පච්චත්ථෙ'පි න මුච්චති.

යො, යමෙක්තෙම; කොධස්ස, ක්‍රොධයාගේ; වසං, වසයට; යාති, යේද; සො, හෙතෙමේ; ඉතො, මෙයින්; නරකං යාති, නරකයට යෙයි; පච්චත්ථෙපි, මේ ලෙව්හිද; ගරහිතො ච, නින්‍දාවෙන්ද; දුක්ඛිතො, (පරලෝ සතර අපා) දුඃඛිත්ද; න මුච්චති, නොමිදෙයි.

43. යො'ධ ජෙති නරො රාගදොසමොහාරිනො බලී,
විජෙතුං ච සමත්‍ථො තෙ සසෙනෙ තිභවුග්ගතෙ.

44. ස සූරො ච ස යොධො ච ජිතො සො'ව ජගත්තයං,
සො'ව සන්තො සුඛී ඛෙමී දීඝායු නිරුපද්දවො.

ඉධ, මේ ලොකයෙහි; යො නරො, (නුවනැති) යම් මනුෂ්‍යයෙක් තෙම; සසෙනෙ, සෙනාසහිතවූ; තිභවුග්ගතෙ, තුන්ලොව ඇතිවූ; තෙ රාගදොසමොහාරිනො, ඒ රාගද්වෙෂමොහ නැමැති කෙලෙස් සතුරන්; බලී, එකාන්තයෙන්; ජෙති, (පරදවා) ජයගණීද; සො, හෙතෙම; විජෙතුං, (නොදිනියහැක්කන්) දිනන්ට; සමත්‍ථො, සමර්ථවූ; සූරො ච, ශූරයෙක්ද වෙයි; සො යොධො ච, යොධ පුරුෂවූයේත් හෙතෙමේය; ජගත්තයං, ලොකත්‍රය; ජිතො, දිනූයේත්; සොව, හෙතෙමේමය; සන්තො, ශාන්තවූයේත්; සුඛී, (සියලු සැපතින්) සුඛිතවූයේත්; ඛෙමී, නිර්භයවූයේත්; දීඝායු, බොහෝ ආයුඇතිවූයේත්; නිරුපද්දවො, උපද්‍රව රහිතවූයේත්; සොව, හෙතෙමේමය.

45. තස්මා තෙසං වසං'දානි අගන්ත්වාන මයා ඉතො,
ගන්ත්වා ඵාසුවිහාරෙන වසතා යත්ථ කත්ථචි.

46. යුත්තං කාතුං පතිට්ඨං මෙ ඉති චින්තිය සො පන,
අපක්කම්ම තතො ඨානා සංයමං අජ්ඣුපාගමි'හි.

තස්මා, එහෙයින්; මයා, මාවිසින්; ඉදානි, දැන්; තෙසං වසං, (අනත්ථ දායකවූ) ඒ ක්‍රොධාදීන්ගේ වසයට; අගන්ත්වාන, නොගොස්; ඉතො ගන්ත්වා, (සියල්ලන් කෙරෙහි මෙත් පතුරුවා) මෙයින් පලාගොස්; යත්ථකත්ථචි, (ගල්ගුහා රුක්මුල් ආදී) යම්කිසි තැනෙක්හි; ඵාසුවිහාරෙන, (භාවනානුයොගයෙහි යෙදී) සැපවිහරණයෙන්; වසතා, වාසය කරමින්:—මෙ, මට; පතිට්ඨං, (සසරදුකින් මිදෙන්ට නිසි) පිහිටක්; කාතුං, කරගන්නට; යුත්තං, සුදුසුයයි; ඉති චින්තිය, මෙසේ සිතා; සො පන, හෙතෙම වනාහි; තතො ඨානා, එතනින්; අපක්කම්ම, පහව; සංයමං, ශීලසංයමාදි සංයමයට; අජ්ඣුපාගමි ඉති, පැමිණියේයි.

47. ඉතො උත්තරතො යත්ථ දිස්සතෙ'යං මහානගො,
මයූරගීවසඞ්කාසො නීලොභාසො මනොරමො.

ඉතො උත්තරතො, මිට උතුරුදිගින්; යත්ථ, යම්තැනෙක්හි; මයූරගීවසඞ්කාසො, මයූර ග්‍රීවයකට බඳුවූ; නීලොභාසො, නිල්පැහැඇති; මනොරමො, සිත්කලුවූ; අයං මහානගො, යම් මේ මහත් පර්වතය; දිස්සතෙ, දක්නාලැබේද (එය).

48. ලබුජම්බජම්බුරම්භාදිතරුරාජිවිරාජිතො,
නාගචම්පකපුන්නාගඵුල්ලපාදපමුජ්ජලො.

ලබුජම්බජම්බුරම්භාදිතරුරාජිවිරාජිතො, ලබුජ, දෙල්ය; අම්බ, අඹය; ජම්බු, දඹය; රම්භාදි, කෙසෙල්ය යනාදිවූ; තරුරාජි, තරුපෙළින්; විරාජිතො, බබලනලද්දේ වෙයි; නාගචම්පකපුන්නාගඵුල්ලපාදපමුජ්ජලො, නාග, නාගස්ය; චම්පක, සපුය; පුන්නාග, දොඹය යන; ඵුල්ලපාදප, සුපුෂ්පිත වෘක්ෂයන්ගෙන්; උජ්ජලො, ශොභමානය.

49. කුටිමණ්ඩපසඞ්කිණ්ණලෙණපබ්භාරභාසුරො,
සිතසෙකතසඞ්කිණ්ණමාලකාලිවිරාජිතො.

කුටිමණ්ඩපසඞ්කිණ්ණලෙණපබ්භාරභාසුරො, කුටි, කුඩා ගෙවල් හා; මණ්ඩප, මණ්ඩපයන්ගෙන්; සඞ්කිණ්ණ, සමාකීර්ණවූ; ලෙණ, ගල්ලෙන් හා; පබ්භාර, ප්‍රාග්භාරයන්ගෙන්; භාසුරො, බබලන්නේය; සිතසෙකතසඞ්කිණ්ණමාලකාලිවිරාජිතො, සිතසෙකත, සුදුවැලි ලෙන්; සඞ්කිණ්ණ, ගැවසිගත්තාවූ; මාලකාලි, මලුපෙළින්; විරාජිතො, බබලනලද්දේ වෙයි.

50. යත්‍ථා'නන්තසකුන්තානං මධුරාලාපනිස්සිතං,
නෙකනිජ්ඣරනිග්ඝොසං දෙවදුන්දුභිසන්නිභං.

යත්‍ථ, යම් පර්වතකූටයෙක්හි; අනන්තසකුන්තානං, නොයෙක් පක්ෂීන්ගේ; මධුරාලාපනිස්සිතං, මිහිරි නාදයෙන්යුක්තද; නෙක නිජ්ඣරනිග්ඝොසං, නොයෙක් ඇලි ගලාබස්නා ජලඝොෂය; දෙව දුන්දුභිසන්නිභං, දිව්‍යභෙරී ශබ්දයන් හා සමානද.

51. යත්‍ථ පබ්බතකූටෙසු නච්චන්ති සිඛිනො මුදා,
කෙකානාදෙහි දෙවානම'ච්ඡරානා'ව සමන්තතො.

යත්‍ථ පබ්බතකූටෙසු, යම් පර්වතකූටයන්හි; සිඛිනො, මොනරු; කෙකානාදෙහි, මයූරනාදයෙන්; දෙවානං, දෙව්ලෝ දෙවියන්; අච්ඡ රානා ඉව, කැඳවන්නාක්මෙන්; මුදා, සන්තොෂයෙන්; සමන්තතො, හාත්පස; නච්චන්ති, නටද්ද.

52. කිලෙසාරිරණෙ සරණො සො'යං පබ්බතවාරණො,
යතීනං තිදසානං'ව රණෙ'රාවණවාරණො.

සො අයං පබ්බතවාරණො, ඒ පර්වතනැමැති හස්තිතෙම; යතීනං, තපස්වීන්ගේ; කිලෙසාරි, කෙලෙස් නැමැති සතුරන් හා; රණෙ, යුද කිරීමෙහි; සරණො, (අසහාය) පිහිටවූයේ වෙයි; තිදසානං, තව්තිසා වැසි දෙවියන්ට; රණෙ, අසුරයුද්ධයෙහි (සහායවසිටි); එරාවණවා රණො ඉව, ඓරාවණහස්තිරාජයා මෙනි.

53. යථෙ'රාවණදන්තග්ගෙ නච්චන්ති සුරසුන්දරී,
යස්මිං නච්චන්ති සෙලග්ගෙ තථා සාඛාසු මඤ්ජරී.

එරාවණදන්තග්ගෙ, ඓරාවණහස්තිදන්තාග්‍රයෙහි; සුරසුන්දරී, දිව්‍ය ස්ත්‍රීහු; යථා, යම්සේ; නච්චන්ති, නටද්ද; තථා, එපරිද්දෙන්ම; යස්මිං සෙලග්ගෙ, යම් ශෛලාග්‍රයෙක්හි (පිහිටි වෘක්ෂරාජයන්ගේ;) සාඛාසු, ශාඛාග්‍රයන්හි; මඤ්ජරී, පුෂ්පමඤ්ජරීහු; නච්චන්ති, ලෙලදෙද්ද.

54. ප්ලවඞ්ගානි විහඞ්ගානි චලිතා ඵුල්ලපාදපා,
යත්‍රු'ග්ගතා'ලිපාලීහි නභං නීලම්බුදෙ'පමං.

යත්‍ථ, යම් ශිඛරයෙක්හි (පිහිටි); ඵුල්ලපාදපා, සුපුෂ්පිතවෘක්ෂයෝ; ප්ලවඞ්ගෙහි, කපීන් හා; විහඞ්ගෙහි, පක්ෂීන් කාරණකොටගෙණ; චලිතා, කම්පිතවෙද්ද; උග්ගත, නැංගාවූ; අලිපාලීහි, භ්‍රමරාවලින් කාරණකොටගෙණ; නභං, ආකාශය; නීලම්බුදෙපමං, නිල් මේඝලක් සමානද.

55. නදීකන්දරබාහාහි සරසීකාමිනී යහිං,
ආලිඞ්ගිතා'ව සොභන්ති ධරාධරනරාධිපං.

යහිං, යම් තැනෙක්හි; සරසීකාමිනී, තඩාගනැමැති ප්‍රියකාන්තාවෝ තුමූ; නදීකන්‍දරබාහාහි, ගඞ්ගා කඳුරැලි නැමැති බාහුවලින්; ධරාධර නරාධිපං, පර්‍වත නැමැති නරශ්‍රෙෂ්ඨයා; ආලිඞ්ගිනා ඉව, වැලඳගන්නාක් මෙන්; සොභන්ති, සොභමානවෙත්ද.

56. තිට්ඨන්ති ඵුල්ලිතා යත්‍ථ කප්පූරා'ගරුචන්‍දනා,
දෙවඞ්ගනාහි සඤ්ජනනජ්ඣායා නන්‍දනසන්නිභා.

යත්‍ථ, යම් පර්‍වතයෙක්හි; ඵුල්ලිතා, සුපුෂ්පිතවූ; කප්පූර, කපුරුය; අගරු, අගිල්ය; චන්‍දනා, සඳුන්ය යන වෘක්‍ෂයෝ; දෙවඞ්ගනාහි සඤ්ජනනජ්ඣායා, දෙවඟනන්ගෙන් ගැවසිගත් සෙවන ඇත්තාහු; නන්‍දනසන්නිභා, (එහෙයින්) නන්‍දනවන සදෘශව; තිට්ඨන්ති, සිටිත්ද.

57. ඵලිනො තාලහින්තාලසිඤ්ඤිසන්තීරසොණකා,
සලීලා යත්‍ථ නච්චන්ති මනුඤ්ඤා මාලුතෙ'රිතා.

යත්‍ථ, යම් පර්‍වතයෙක්හි; ඵලිනො, පලදරන්නාවූ; මනුඤ්ඤා, මනොඥවූ; තාලහින්තාලසිඤ්ඤිසන්තීරසොණකා, තාල, තල්ය; හින්තාල, කිතුල්ය; සිඤ්ඤි, ඉඳිය; සන්තීර, නැඹිලිය; සොණකා, පුවක්ය යන මේ වෘක්‍ෂයෝ; මාලුතෙරිතා, මන්‍දමාරුතයෙන් කම්පිතවූවාහු; සලීලා, ලීලාසහිතව; නච්චන්ති, නටද්ද.

58. බුද්ධපඞ්කජකල්හාරකෙරා උප්පලමාලිනී,
පොක්ඛරඤ්ඤො විරාජෙන්ති රසවන්තා යහිං සදා.

යහිං, යම් පර්‍වතයෙක්හි; බුද්ධපඞ්කජකල්හාරකෙරා, බුද්ධ, ප්‍රබුද්ධවූ; පඞ්කජ, පියුම්ය; කල්හාර, හෙල්මැලිය; කෙරා, කුමුදුය යන මේ හා; උප්පලමාලිනී, උපුල්මල් ඇත්තාවූ; රසවන්තා, (සිහිල්) ජලය ඇත්තාවූ; පොක්ඛරඤ්ඤො, පුෂ්කරණීහු; සදා, හැමකල්හි; විරාජෙන්ති, විරාජමානවෙත්ද.

59. තත්‍ථා'නිවත්තියං නාම සෙනාසනම'නූපමං,
නරොරගසුරාදීහි නිච්චමා'සෙවිතං සුභං.

තත්‍ථ, එහි; අනූපමං, උපමාවිෂයාතික්‍රාන්තවූ; නරොරගසුරාදීහි, නරඋරග දෙවාදීන් විසින්; නිච්චං, සතතයෙන්; ආසෙවිතං, සෙවිනා ලද්දවූ; සුභං, යහපත්වූ; අනිවත්තියං නාම, අනිවත්තිය නම්වූ; සෙනාසනං , සෙනසුනක් (සෙනසුන් ඇති විහාරයක්) වීය.

60. තත්‍ථා'සුං භික්ඛවො සන්තා වීතරාගා ජිනත්‍රජා,
කුරුමානා සදෙවානං මහන්තං කුසලොදයං.

තත්‍ථ, එහි; සදෙවානං, දෙවියන්සහිත ලොකයාට; මහන්තං, මහත්වූ; කුසලොදයං, පුණ්‍යාභිවෘද්ධිය; කුරුමානා, කරන්නාවූ; සන්තා, ශාන්තවූ; වීතරාගා, වීතරාගවූ; ජිනත්‍රජා, සර්‍වඥපුත්‍රවූ; භික්ඛවො, භික්‍ෂූහු; ආසුං, වූහ (හෙවත් වැඩවාසයකරණසේක).

61. පාමොක්ඛො ආසි තෙසං යො භික්ඛූනං යතිපුඞ්ගවො,
වරුණො නාම නාමෙන ධරමානො ජිනො විය.

62. සද්ධාලතං සො වඩ්ඪෙන්තො ජනානං මනනිස්සිතං,
ධම්මම්බුනා සංවඩ්ඪිත්වා සග්ගමොක්ඛඵලා'වහං'ති.

තෙසං භික්ඛූනං, ඒ භික්ෂූන්ට; පාමොක්ඛො, ප්‍රධානවූ; නාමෙන, නාමින්; වරුණො නාම, වරුණ නම්වූ; සො යතිපුඞ්ගවො, යම් යති ශ්‍රෙෂ්ඨ කෙණෙක්; ආසි, වූයේද; සො, උන්වහන්සේ; ධරමානො, ජීවමානවූ; ජිනොවිය, සර්වඥයන්වහන්සේ මෙන්; ජනානං, සත්ව යන්ගේ; මනනිස්සිතං, හෘදය නිශ්‍රිතවූ; සද්ධාලතං, ශ්‍රද්ධානැමැති ලතාව; වඩ්ඪෙන්තො, වඩන්නේ; ධම්මම්බුනා, දහම්නැමැති ජලය ඉසීමෙන්; සංවඩ්ඪිත්වා, වඩා; සග්ගමොක්ඛඵලාවහං, සගමොක් සැප නැමැති පල එලවන්නේ වෙයි.

63. ඉතො උත්තරපස්සම්හි ලොහකූටවහපබ්බතෙ,
විහාරො රමණීයො'සි වීතරාගානමා'ලයො.

ඉතො, මෙයින්; උත්තරපස්සම්හි, උතුරු පැත්තෙහි; ලොහකූටවහ පබ්බතෙ, ලොහකූටනම් පව්වෙහි; වීතරාගානං, වීතරාගීන්ට; ආලයො, වාසස්ථානවූ; රමණීයො, සිත්කලුවූ; විහාරො, වෙහෙරෙක්; ආසි, විය.

64. පුබ්බපච්ඡිමපස්සෙ ච තත්‍ථ දක්ඛිණුත්තරෙ,
චත්තාරො පබ්බතා ආසුං මහන්තා රතනාමයා.

තත්‍ථ, එහි; පුබ්බපච්ඡිමපස්සෙ ච, පූර්වපශ්චිම දිශාහිද; දක්ඛිණුත්තරෙ, දකුණු උතුරුදිශාහිද; මහන්තා, මහත්වූ; රතනාමයා, රත්නමයවූ; චත්තාරො පබ්බතා, පර්වත සතරක්; ආසුං, වූහ.

65. තෙසු පබ්බතපාදෙසු නානාඵලධරා දුමා,
වාතෙරිතා'ති සොභන්ති නීලොභාසා මනොරමා.

තේසු පබ්බතපාදෙසු, ඒ පර්වතපාදයන්හි; නානාඵලධරා, නොයෙක් පල දරන්නාවූ; මනොරමා, මනොරම්‍යවූ; නීලොභාසා, නිල වර්ණවූ; දුමා, වෘක්ෂයෝ; වාතෙරිතා, සුළඟින් කම්පිතවූවාහු; අභිසොභන්ති, අතිශයින් බබලත්.

66. චම්පකා නාගපුන්නාගා සාලා ච සලලා'ගරු,
සීතලගන්ධිකා නීපා අසොකවකුලාදිකා.

67. නානාවණ්ණෙහි පුප්ඵෙහි පුප්ඵිතා දෙවගන්ධිකා,
කීළන්ති ඔකිරන්තා තෙ මධුභිඤ්ජක්ඛිරෙණවො,

චම්පකා, සපුගස්ස; නාග, නාගස්ය; පුනනාග, දෙඹස යන මොහුද; සාලාච, සල්ය; සලලා, හොරය; අගරු, අගිල්ය; සිතල, සඳුන්ය; ගන්ධිකා, කපුරුය යන මොහුද; නීපා, කොළොම්ය; අසොක, හෝපලුය; වකුලාදිකා, මුහුනමල්ය යනාදී වෘක්ෂයෝදයි—නානාවණ්ණෙහි, නානාවණ්වූ; පුපෙඵහි, පුෂ්පයන් කරණකොටගෙණ; දෙවගන්ධිකා, දිව්‍යසුගන්ධ ඇත්තාවූ; පුප්ඵිනා, (එසේ) සුපුෂ්පිතවූ; තෙ, ඒ වෘක්ෂයෝ; මධුකිඤ්ජක්ඛාභරණචො, මල්පැනි හා මල්රොන්; ඔකිරනනා, වගුරු වමින්; තිඪනති, සිටිත්.

68. තාලගිනතාලසනතීරරම්භාපූගාගපනාතියො,
විරොචමානා තිට්ඨන්ති විහාරො'පවනෙ තහිං.

තාලගිනතාලසනතීරරම්භාපූගාගපනාතියො, තාල, තල්ය; හිනතාල, කිතුල්ය; සනතීර, තැඹිලිය; රම්භා, කෙසෙල්ය; පූගාගපනාතියො, කුමුක යන වෘක්ෂපනතීහු; තහිං, එහි; විහාරොපවනෙ, විහාරසමීප වනයෙහි; විරොචමානා, බබලමින්; තිට්ඨනති, සිටිත්.

69. ධොතමුතතාභවණ්ණාභි සනථතා මාලකාවලී,
විභත්තා තත්‍ථ සොභනති දුද්ධසාගරසනතිභා.

තත්‍ථ, ඒ විහාරයෙහි; ධොතමුතතාභවණ්ණාභි, සේදූ මුතුරුසක්බඳු සුදුවැල්ලෙන්; සනථතා, අතුරණලද; මාලකාවලි, මාලකපඞ්කතීහු; විභත්තා, වෙන්වශයෙන් බෙදුනාහු; දුද්ධසාගරසනතිභා, කිරිසයුර වැනිවූවාහු; සොභනති, බබලත්.

70. භොගිනදභොගසඞ්කාසො පාකාරො රතනාමයො,
අබ්භුගගතො විරොචෙනෙතා තත්‍ථා'හොසි මනොරමො.

තත්‍ථ, එහි; භොගිනද, අනනතනම් නාගරාජයාගේ; භොගස ඞ්කාසො, භොගාවලි සමානවූ, රතනාමයො, රතනමයවූ; අබ්භු ගගතො, උස්වනැංගාවූ; පාකාරො, ප්‍රාකාරයතෙම; විරොචෙනෙතා, බබලත්නේ; මනොරමො අහොසි, සිත්කලුවූයේය.

71. අහොසි චඞ්කමො තත්‍ථ සඞ්ඝභගො සුමාපිතො,
සුඛසමඵස්සදෙ ඛෙමො රතනෙහි පරික්ඛිතො.

තත්‍ථ, ඒ විහාරයෙහි; සුමාපිතො, මොනවට කරවන ලද්දවූ; රත නෙහි; රුවන් පව්රකින්; පරික්ඛිතො, පරික්‍ෂෙපකලාවූ; ඛෙමො, ක්‍ෂෙමවූ; සුඛසමඵස්සදෙ, සුවපහස් දෙන්නාවූ; සට්ඨිහත්‍ථො, සැටරියන් දිග ඇති; චඞ්කමො, සක්මන්මලුවක්; අහොසි, වූයේය.

72. කුටිමණ්ඩපපාසාද සබ්බෙ තෙ රතනාමයා,
ඉනදනීලවණ්ණ චාරු චාමිකරජථූපිකා.

කුටිමණ්ඩපපාසාද, කුටිය මණ්ඩපය ප්‍රසාදය යන; සබ්බෙ තෙ, ඒ සියල්ලෝම; රතනාමයා, රත්නමය වෙත්; ඉන්දනීලවණ්ණ, ඉඳුනිල් මිණි සෙවෙනි ඇතිවෙත්; චාරු, මනොඥ්ඥ; චාමිකරජ, සවණ්ණමයවූ; ථූපිකා, කොත් ඇතිවෙත්.

**73.** රත්තිට්ඨානදිවාට්ඨානා තථෙ'ව රතනාමයා,
චඞ්කමපස්සාවකුටියො තථෙ'ව සාධුනිම්මිතා.

රත්තිට්ඨානදිවාට්ඨානා; රාත්‍රිස්ථාන දිවාස්ථානයෝද; තථා එව, එසේම; රතනාමයා, රත්නමයහ; චඞ්කමපස්සාවකුටියො, චඞ්කකුටි මූත්‍ර කුටීහු; තථෙව, එසේම; සාධුනිම්මිතා, මොනවට නිර්මිතයහ.

**74.** පදුමුප්පලසොගන්ධිපුල්ලමුද්දලකෙහි ච,
සමාකුලා පොක්ඛරඤ්ඤො එකතිංසති මණ්ඩිතා.

පදුමුප්පලසොගන්ධිපුල්ලමුද්දලකෙහි ච, පදුම, (පිපි) පියුම්ය; උප්පල, උපුල්ය; සොගන්ධි, හෙල්මැලිය; පුල්ලමුද්දලකෙහි ච, පිපියාවූ ඇඹුල ඉපුල යන මෙයින්; සමාකුලා, ගැවසීගත්තාවූ; මණ්ඩිතා, (එසේ) හෙබියාවූ; පොක්ඛරඤ්ඤො, පොකුණු ; එකතිංසති, එක්තිසක් වූහ.

**75.** දෙවතා ච සමාගන්ත්වා නිච්චං සම්මජ්ජනාදිනා,
පටිජග්ගන්ති විහාරං තං තෙහෙ'ව සාධු ගොපිතං.

දෙවතා ච, දෙවියෝද; සමාගන්ත්වා, එක්ව; නිච්චං, සතතයෙන්; සම්ම ජ්ජනාදිනා, ඇමදීම්ආදියෙන්; පටිජග්ගන්ති, පිළිදූගුම් කෙරෙත්; තං විහාරං, ඒ විහාරය; තෙහි එව, ඒ දෙවතාවන් විසින්ම; සාධු, මනාකොට; ගොපිතං, රක්ෂාකරණලදි.

**76** දුක්ඛො ඛො ආවුසො තත්‍ථ වාසො පුථුජ්ජනෙන තු,
සචෙ ත්වං භික්ඛු සක්කො'සි තත්‍ථ ගන්ත්වාන ආවසා'ති.

ආවුසො, ඇවැත්නී; තත්‍ථ, ඒ විහාරයෙහි; පුථුජ්ජනෙන තු; පුහුදුන් විසින් වනාහි; වාසො, විසීම; දුක්ඛො ඛො, දුක්වන්නේය (හෙවත් නොහැකි වන්නේය); භික්ඛු, මහණ; සචෙ, ඉදින්; ත්වං, ඔබ; සක්කොසි, හැක්කෙහි නම්; තත්‍ථ ගන්ත්වාන, එහි ගොස්; ආවස ඉති, වසවයි කීයේය.

**77** එවං විධං පුඤ්ඤඵලොදයාවහං
යො පුඤ්ඤකම්මං හි කරෙය්‍ය සොභනං,
ස යාති සග්ගං ච පවග්ගසම්පදං
කරොථ තුම්හෙ'පි තථාවිධං සුභං.

එවංවිධං, මෙබඳුවූ; පුඤ්ඤඵලොදයාවහං, පුණ්‍යවිපාක ගෙණදෙන් නාවූ; සොභනං, හොබනාවූ; පුඤ්ඤකම්මංහි, පින්කම්; යො, යමෙක්;

කරෙය්‍ය, කරන්නේ නම්; සො, හෙතෙම; සග්ගං ච, ස්වර්‍ගසම්පත්තිය වද; පවග්ගසම්පදං, නිර්‍වාණසම්පත්තියටද; යාති, පැමිණෙයි; තුම්හෙ අපි, (භවන්නි) තෙපිද; තථාවිධං, එබඳුවූ; සුභං, යහපත්වූ(පින්කම්); කරොථ, කරව.

## ද ඨා සෙ න ව ස්‍ස්‍ස ව 4.

---

78. නත්‍ථි තුය්හං පිතා මාතා භාතා භගිනි බන්‍ධවා,
පුබ්බෙ අකතපුඤ්ඤස්ස භවෙ'තං ලක්ඛණං තව.

තුය්හං, තාගේ; මාතාපිතා, මව්පියකෙණෙක්ද; භාතාභගිනි, බෑබුන්කෙණෙක්ද; බන්‍ධවා, (අන්කිසි) නෑකෙණෙක්ද; නත්‍ථි, නැත; තව, තාගේ; එතං, මේ සවභාව; පුබ්බෙ, පෙර; අකතපුඤ්ඤස්ස, පින් නොකළහුගේ; ලක්ඛණං භවෙ, ලක්‍ෂණ වන්නේය.

79. අහිරඤ්ඤසුවණ්ණො'සි අධඤ්ඤො'සි අනාළ්හිකො,
පුබ්බෙ අකතපුඤ්ඤස්ස භවෙ'තං ලක්ඛණං තව.

අහිරඤ්ඤසුවණ්ණොසි, හිරණ්‍යස්වර්‍ණාදියකුත් නැත්තෙහිය; අධඤ්ඤොඅසි, (ශාලිව්‍රීහි ආදී) ධාන්‍යයකුත් නැත්තෙහිය; අනාළ්හිකො, (එක්වේලක් යැපෙන තරම්)සාල් නැලියකුත් නැත්තෙහිය; තව, තාගේ; එතං, මේ සවභාව; පුබ්බෙ, පෙර; අකතපුඤ්ඤස්ස, පින් නො කළහුගේ; ලක්ඛණං භවෙ, ලක්‍ෂණ වන්නේය.

80. දුනනිවත්‍ථො'සි හො'දනි සහස්‍සුකකුවෙලකං,
පුබ්බෙ අකතපුඤ්ඤස්ස භවෙ'තං ලක්ඛණං තව.

හො, පින්වත්නි; ඉදනි, දැන්; සහස්සුක, ඉනිකුණන්ගෙන් ගැවසී ගත්; කුවෙලකං, කුණුරෙදිකඩක්; දුනනිවත්‍ථො අසි, නපුරුකොට ඇන්දේවෙහිය; තව, තාගේ; එතං, මේ සවභාව; පුබ්බෙ, පෙර; අකත පුඤ්ඤස්ස, පින් නොකළහුගේ; ලක්ඛණං භවෙ, ලක්‍ෂණ වන්නේය.

81. කිලඤ්ජමපි න සෙය්‍යත්‍ථ'මාසි සෙය්‍යා ඡමා'ව තෙ,
පුබ්බෙ අකතපුඤ්ඤස්ස භවෙ'තං ලක්ඛණං තව.

තෙ, තට; සෙය්‍යත්‍ථං, සයනය පිණිස; කිලඤ්ජමපි, පැදුරුකඩකුදු; න ආසී, නැත; ඡමා එව, භූමියම; සෙය්‍යා, සයනය වීය; තව, තාගේ; එතං, මේ සවභාව; පුබ්බෙ, පෙර; අකතපුඤ්ඤස්ස, පින් නොකළ හුගේ; ලක්ඛණං භවෙ, ලක්‍ෂණ වන්නේය.

82. කපාලහත්‍ථො භික්ඛන්තො චරසි ත්‍වං ඝරෙ ඝරෙ,
විඝාසාදෙ'සි පෙතො'ව අට්ඨිචම්මා'වසෙසකො.

ත්‍වං, තෝ; කපාලහත්‍ථො, කබල්ගත් අත්ඇත්තේ; ඝරෙ ඝරෙ, ගෙයක් පාසා; භික්‍ඛනෙතා, සිඟමින්; විඝාසාදෙ, ඉඳුල්කන්නෙක්ව; චරසි, හැසිරෙහි; අට්ඨිචම්මාවසෙසකො, අස්ථිචර්මාවශෙෂ ශරීර ඇත්තේ; පෙතො ඉව, ප්‍රෙතයෙකු මෙන්; අසි, වෙහිය.

83. මධුරන්නපානෙ භුඤ්ජන්තො පස්සන්තො 'පුඤ්ඤවා ජනෙ,
පරිගිලන්තබෙලෙන ඝරචාරෙසු තිට්ඨසි.

අපුඤ්ඤවා, පින් නැත්තාවූ නුඹ; ජනෙ, පුණ්‍යවන්තජනයන්; මධුරන්නපානෙ, මිහිරි ආහාරපානයන්; භුඤ්ජන්තො, අනුභවකරණ කල්හි; පස්සන්තො, (ඒ) දකිමින්; පරිගිලන්තබෙලෙන, ගලනා කෙලින් සුතුව හෙවත් කෙලගිලිමින්; ඝරචාරෙසු, ගෘහචාරයන්හි; තිට්ඨසි, සිටින්නෙහිය.

84. අලභන්තො තහිං කිඤ්චි අස්සසන්තො රුදම්මුඛො,
ඡින්නාසො යාසි සොචන්තො අහො තුය්හ'මධඤ්ඤතා.

තහිං, එහි; කිඤ්චි, කිසිවක්; අලභන්තො, නොලබමින්; අස්සසන්තො, සුසුන්ලමින්; රුදම්මුඛො, කඳුලුමුසු මුහුනු ඇත්තේ; ඡින්නාසො, සුන් ආසාඇත්තේ; සොචන්තො, ශොක කරමින්; යාසි, යන්නෙහිය; තුය්හං, තාගේ; අධඤ්ඤතා, අපුණ්‍යවද්භාවය; අහො, විස්මයෙකි.

85. තථාවිධො'පි න කරොසි හිතං ආයතිපච්චයා,
අහො තයා සමො නත්‍ථි තිභවෙ අත්තසත්තුකො'ති.

තථාවිධො අපි, එබඳුවූත් (තෝ); ආයතිපච්චයා, ආයතිභවය හෙතු කොට; හිතං, වැඩක්; න කරොසි, නොකෙරෙහිය; තයා සමො, තා හා සමානවූ; අත්තසත්තුකො, ආත්මද්‍රොහියෙක් (තමහට හතුරෙක්); තිභවෙ, තුන්භවයෙහි; නත්‍ථි, නැත; අහො, ඛෙදයකි.

86. නිද්ධනො කපණො දීනො කරිස්සං කුසලං කථං,
පුට්ඨො භන්තෙ මයා'චික්ඛ යම'හං ගච්ඡාමි නිබ්බුතිං'ති.

භන්තෙ, ස්වාමිනි; නිද්ධනො, නිර්ධනවූ; කපණො, කෘපණවූ; දීනො, බැගෑපත්වූ; අහං, මම; කථං, කෙසේ; කුසලං කරිස්සං, කුසල් කරන්නෙම්ද; යං, යම් හෙයකින්; නිබ්බුතිං, නිවණට; ගච්ඡාමි, යෙම්ද (ඊට උපායක්); මයා, මාවිසින්; පුට්ඨො, විචාරණලද්දේ; ආචික්ඛ ඉති, වදාළ මැනවැයි (කියේය).

87. කීලන්ත'නිමිසා එත්‍ථ නජ්ජායං ජලගොචරා,
පාඨිනා පාවුසා සිඞ්ගු සවඞ්කා රොහිතාදයො.

එත්‍ථ, මෙහි; නජ්ජායං, නදියෙහි; ජලගොචරා, ජලය ගොචරකොට වසන්නාවූ; පාඨිනා, පෙතියෝය; පාවුසා, ලූල්ලුය; සිඞ්ගු, සුංගෝය; සවඞ්කා, ඉස්සෝය; රොහිතාදයො, රේමස්සුය යනාදී; අනිමිසා, මත්ස්‍යයෝ; කීලන්ති, ක්‍රීඩාකෙරෙත්.

88. ත්වං හො සිකඛිතකං හත්ථා ගහෙත්වා භුත්තසෙසකං,
මච්ඡානං දෙති දානානි තං තෙ සග්ගසුඛා'වහං.

හො, පින්වත; ත්වං, තෝ; සිකඛිතකං හත්ථං, සිඟාගත්තාලද බත; භුත්තසෙසකං, කා ඉතිරිවූවක්; ගහෙත්වා, ගෙණගොස්; මච්ඡානං, මසුන්ට; දානානි දෙති, දන්දෙව; තං, ඒ දානය; තෙ, තට; සග්ගසුඛාවහං, සගසැප එලවයි.

89. ගහෙත්වා පඤ්චසීලානි පාලය ත්වං සුනිම්මලං,
අලං තෙ භවභොගත්ථං නිබ්බාණත්ථං ච තං අල'න්ති.

ත්වං, තෝ; පඤ්චසීලානි, පන්සිල්; ගහෙත්වා, (සමාදන්ව) ගෙණ; සුනිම්මලං, අතිනිර්මලකොට; පාලය, රක්‍ෂාකරව; තං, ඒ ශීලය; තෙ, තට; භවභොගත්ථං, භවසම්පත්තිය පිණිස; අලං, පමණි; නිබ්බාණත්ථංච, නිවන් පිණිසද; අලං ඉති, පමණැයි (වදාළේය).

90. නෙදිසං මාදිසා රාජ පුරිසා කම්මං කරොන්ති ච,
ඊදිසානි ච කම්මානි පුරිසානං න සොභනි.

රාජ, රජ්ජුරුවන්වහන්ස; ඊදිසං කම්මං, මෙසේවූ ක්‍රියා; මාදිසා පුරිසා, මා වැනි පුරුෂයෝ; න කරොන්ති ච, නොකෙරෙත්මය; ඊදිසානි කම්මානි ච, මෙබඳු කර්‍මයෝ; පුරිසානං, පුරුෂයන්ට; න සොභනි, නොහොබිත්.

91. කරීනං මත්ථලුඞ්ගසු ලුද්ධො උත්තමකෙසරී,
පිළිතො'පි ජිඝච්ඡාය කිනනු සො ඛාදතෙ තිණ'න්ති.

කරීනං, හස්තීන්ගේ; මත්ථලුඞ්ගසු, හිස්මොලඅනුභවකිරීමෙහි; ලුද්ධො, ලුබ්ධවූ; උත්තමකෙසරී, උත්තමවංශඇති කෙශරසිංහරාජතෙමේ; ජිඝච්ඡාය, බඩසයින්; පිළිතො අපි, පීඩිතවූයේ නමුත්; කිනනු, කිමෙක්ද?; සො, ඒ සිංහරාජ තෙමේ; තිණං ඛාදතෙ, තණ අනුභව කෙරේද (නොකෙරේමැයි).

92. සීලං සමාදාය පරිත්තදානං
දත්වා'නිමෙසාන'මත්තකාලෙ,
නෙලො ඉධෙ'වං විපුලං ච භොගං
අලත්ථ සග්ගුපගතො අහොසි'ති.

එවං, මෙසේ; නෙලො, මහානෙලනම් යොධතෙමේ; අතීතකාලෙ, ඉකුත්කාලයෙහි; සීලං, ශීලය; සමාදාය, සමාදන්ව; අනිමෙසානං, මත්ස්‍යයන්ට; පරිත්තදානං, ස්වල්පමාත්‍රවූ දානයක්; දත්වා, දී; ඉධ, මෙහි (මේ දෙවනජාතියෙහි); විපුලං, විපුලවූ; භොගං ච, (ශක්තිසම්පත්තිය හා) භොගසම්පත්තියද; අලත්ථ, ලැබීය; සග්ගුපගතො අහොසි, ස්වර්‍ගපරායනද (සගෙහි උපන්නේද) වූයේය.

**ම හා නෙ ල ව ත්‍ථු ව—5.**

93. දුට්ඨගාමණිභූපස්ස පුත්තො සාලිකුමාරකො,
ධඤ්ඤලක්ඛණසම්පන්නො ආසි තෙජබ්බික්කමො.

දුට්ඨගාමණිභූපස්ස, දුටුගැමුණුමහරජහුගේ; පුත්තො, පුත්‍රවූ; සාලිකුමාරකො, ශාලිරාජකුමාරතෙමේ; ධඤ්ඤලක්ඛණසම්පන්නො, පුණ්‍යලක්ෂණයෙන් සමන්විතවූයේ; තෙජබ්බික්කමො, තෙජස් හා රාජර්ෂි වික්‍රම ඇත්තේ; ආසි, විය.

94. භූරිමෙධො ච සො ආසි රූපෙන මකරධජො,
මඤ්ජුවාණී ච සො ආසි සච්චසන්ධො විසාරදො.

සො, ඒ කුමාරතෙම; භූරිමෙධොච, මහත්වූ ප්‍රඥාඇත්තේද; රූපෙන, රූපයෙන්; මකරධජො, අනඞ්ගයාසමානවූයේද; ආසී, විය; සො, හෙතෙම; මඤ්ජුවාණී ච, මිහිරි තෙපුල් ඇත්තේද; සච්චසන්ධො, සත්‍යයෙන් සත්‍යය ගලපන්නේද; විසාරදො, නිර්භීතවූයේද; ආසි, විය,

95. චාගී භොගී බලී චා'සි හිතෙසි සබ්බපාණිනං,
අතිත්තො ආසි දානෙන වත්ථුත්තයපරායනො.

චාගී, වස්තුපරිත්‍යාග ඇත්තේද; භොගී, භොගසම්පත් ඇත්තේද; බලි, බලඇත්තේද; සබ්බපාණිනං, සියලුසතුන්ට; හිතෙසි ආසි, වැඩකැමැත්තේද විය; වත්ථුත්තයපරායනො, තුන්රුවන් පිහිටකොට ඇත්තේ; දානෙන, දන්දීමෙන්; අතිත්තො ආසි, තෘප්තිරහිතවූයේය.

96. සහස්සමූලකං භණ්ඩං පුබ්බණ්හෙ දෙවමානුසා,
දිනෙ දිනෙ ආහරන්ති සො තං දානෙ පවෙච්ඡති.

දෙවමානුසා, දිව්‍යමනුෂ්‍යයෝ; දිනෙ දිනෙ, දවස දවස; සහස්සමූලකං, දහසක් අගනා; භණ්ඩං, බඩු (හෙවත් දහසක් මුදල්ඇති පොදියක්); පුබ්බණ්හෙ, පෙරවරු කාලයෙහි; ආහරන්ති, ගෙණඑත්; සො, ඒ කුමාරතෙම; තං; ඒ වස්තුව; දානෙ, දානයෙහි; පවෙච්ඡති, යොදදෙයි.

97. තතො සො පචසතිකං ලභන්තො අපරණ්හකෙ,
අලග්ගො යාචකෙ දෙති සබ්බකාලං මහායසො'ති.

තතො, නැවත; අපරණ්හකෙ, පස්වරුකල්හි; පචසතිකං, පන්සියයක මුදල්පොදියක්; ලභන්තො, ලබමින්; සො මහායසො, ඒ මහත්වූ යශස් ඇති කුමාරතෙමේ; අලග්ගො, එයිදු නොඇලුනේ; සබ්බකාලං, සියලුකල්හි; යාචකෙ; යාචකයන්ට; දෙති, දන්දෙයි.

98. පුබ්බෙචසන්නිවාසෙන පච්චුප්පන්නහිතෙන වා,
එවං තං ජායතෙ පෙමං උප්පලංව යථො'දකෙ'ති.

පුබ්බෙ, පූර්වජන්මයෙහි; සන්නිවාසෙන වා, සමග විසීමෙන් හෝ; පච්චුප්පන්නහිතෙන වා, මේ ජාතියෙහි කරණලද උපකාරහෙතුකොට

ගෙණ හෝ; එවං, මෙසේ; තං පෙමං, ඒ ප්‍රේමය; ජායතෙ, උපදී (කෙසේද); උදකෙ, දියෙහි (හටගන්නාවූ); උප්පලං වා යථා, උත්පල කුමුදු ආදි පුෂ්පජාතීහු මෙනි.

99. කුතො ත්වං ආගතා කා ත්වං දෙවතානු'සි මානු'සි,
න තෙ සමසමං පස්සෙ අස්මිං පුථුවිමණ්ඩලෙ.

ත්වං, තී; කුතො, කොතැනින්; ආගතා, ආවාද; ත්වං, තී; කා, කවර එකියක්ද; දෙවතානුසි, දෙවඟනක් වෙහිද; මානුසි, මිනිස්මාගමක් වෙහිද; අස්මිං පුථුවිමණ්ඩලෙ, මේ පොළෝතෙලෙහි; තෙ සමසමං, තීහා සමාන (රූපශ්‍රීඇති අන්ස්ත්‍රියක්); න පස්සෙ, නොදකිමි.

100. පාදා තෙ පදුමා'කාරා සුරත්තා මුදුකොමලා,
හෙමමොරස්ස ගීවා'ව ජඞ්ඝා නෙත්තරසායනා.

තෙ, තීගේ; සුරත්තා, අතිරක්තවූ; මුදු, මෘදුවූ; කොමලා, කොමලවූ; පාදා, පතුල්; පදුමාකාරා, රත්පියුම් ආකාරය; ජඞ්ඝා, (ක්‍රමයෙන් සිහින්වගිය තීගේ) කෙණ්ඩාසගල; හෙමමොරස්ස, රන්මොනරෙකු ගේ; ගීවා ඉව, ග්‍රීවයමෙ න්; නෙත්තරසායනා, නෙත්‍රප්‍රසාද එලවන්නීය.

101. භද්දෙ තෙ පීවරා ඌරූ හෙමරම්භො'ප මා සුභා,
හත්ථෙන පමිතබ්බං තෙ මජ්ඣිමඞ්ගං විරාජති.

භද්දෙ, සොඳුර; තෙ, තීගේ; පීවරා, පිරුණාවූ; සුභා, යහපත්වූ; ඌරූ, දෙවටොර; හෙමරම්භාපමා, ස්වර්ණකදලිස්කන්ධ සමානය; හත්ථෙන, අතින්; පමිතබ්බං, ප්‍රමාණකටයුතුවූ; තෙ, තීගේ; මජ්ඣිමඞ්ගං, මධ්‍යප්‍රදෙශය (ඉඟටිය); විරාජති, (ඉතා සොභමානව) බබලයි.

102. තරඞ්ගභඞ්ගිං සාධෙති භද්දෙ තෙ රූපසාගරෙ,
වලිත්තය'මවිච්ඡින්නං රොමරාජිවිරාජිතං.

භද්දෙ, සොඳුර; තෙ, තීගේ; රොමරාජිවිරාජිතං, වසාරොඳින් බබලන ලද්දාවූ; අවිච්ඡින්නං, නොකඩවූ; වලිත්තයං, (මධ්‍යමාඞ්ගයෙහි) රැළිතුණ; රූපසාගරෙ, (තීගේ) රූපනැමැති සාගරයෙහි; තරඞ්ගභඞ්ගිං, රළපතර (ශොභාව); සාධෙති, සිඬකෙරෙයි.

103. උරොරුහානි සොභන්ති භද්දෙ තෙ රූපසාගරෙ,
සොණ්ණබුබ්බුලකද්වන්දසමා උත්තරසාගරෙ.

භද්දෙ, සොඳුර; උත්තරසාගරෙ, ස්වර්ණසාගරයෙහි (පැනනැගී); සොණ්ණබුබ්බුලකද්වන්දසමා' රන් බුබුළුදෙකක් සමානවූ; තෙ, තීගේ; රූපසාගරෙ, රූපනැමැති සාගරයෙහි, (පැනනැංගාවූ); උරොරුහානි, පයොධර දෙක; සොභන්ති, බබලත්.

104. බාහු සොභන්ති තෙ භද්දෙ පාණිපල්ලවලඞ්කතා,
කප්පලතාය සඤ්ජාතා පාරොහා ව මහබ්භුතා.

භද්දෙ, සුන්දරිය; තෙ, තිගේ; පාණිපල්ලවලඞ්කතා, (මොලොක්වූ) අත් නැමැති පල්ලවයෙන් අලඞ්කෘතවූ; බාහු, බාහුයුගමය; කප්පලතාය, කල්පලතායෙහි; සඤ්ජාතා, හටගත්තාවූ; මහබ්භුතා, මහත් ආශ්චර්‍යයීමත්වූ; පාරොහා ඉව, අරළුදෙකක්මෙන්; සොභන්ති, සොභමානවෙත්.

105. වන්තසාරදචන්දො තෙ හාසරංසි විම්සසිතො,
විකාසයන්ති මෙ භද්දෙ මනොකෙරවකානනං.

භද්දෙ, සොඳුර; තෙ, තිගේ; හාසරංසිවිම්සසිතො, මදමදසිනා නැමැති කාන්තීන් යුක්තවූ; වන්තසාරදචන්දෙ, මුඛනැමැති ශරච්චන්ද්‍ර තෙම; මෙ, මාගේ, මනොකෙරවකානනං, සිත්නැමැති කෞමුද වනය; විකාසයන්ති, විශෙෂයෙන් පුබුදුවයි.

106. පක්කාකරකබීජානං පන්ති'ව දන්තපන්තියො,
හාසමානාය තෙ භද්දෙ රතෙනාධරංසු විම්සයිතා.

භද්දෙ, සොඳුර; හාසමානාය, (මදමද) සිනාකරන්නාවූ; තෙ, තිගේ; රතෙනාධරංසු, අතිරක්තවූ අධරයුගමයෙහි රශ්මින්; විම්සයිතා, මනාව රුඳුනාවූ; දන්තපන්තියො, දත්පෙළ; පක්කකරකබීජානං පන්ති ඉව, විලිකුන් දෙළුම්බිජුපෙළක්මෙන් (බබලයි).

107. සිඞ්ගාරමන්දිරෙ බද්ධකෙතු'ව හෙමයට්ඨියං,
විලලිවලලි විරාජෙන්ති අවෙහන්තා විය කාමුකෙ.

සිඞ්ගාරමන්දිරෙ, ශෘඞ්ගාරමන්දිරයෙහි හෙවත් අනඞ්ගයාගේ මාලිගා දොර; හෙමයට්ඨියං, රන්යටෙක; බද්ධ, බඳනාලද; කෙතු ඉව, ධවජයක් සමානවූ; විලලිවලලි, (තිගේ) එකාවලිතුමූ; කාමුකෙ, කාමී පුරුෂයන්; අවෙහන්තාවිය, (තමාකරා) කැඳවන්නාක්මෙන්; විරාජෙන්ති, විරාජමානවෙත්.

108. නීලවෙල්ලිනධම්මිල්ලං තාපිඤ්ජගුම්බකොපමං,
සෙවිතං මාලතිමාලාදමෙනා'ති මනොරමං.

තාපිඤ්ජගුම්බකොපමං, තමලුගොල්ලක් හෝ මොනරපිල්කලඹක් සමානවූ; නීල, නිල්වූ; වෙල්ලිත, අක්බඹුරුවූ; ධම්මිල්ලං, (තිගේ) කෙහෙවැටිය; මාලතීමාලාදමෙන, දැසමන් මාලාදමයෙන්; සෙවිතං, සෙවනාලද්දේ; අතිමනොරමං, ඉතා සිත්කලුය.

109. නාමං තෙ වද මෙ භද්දෙ කො තෙ මාතා පිතා සුභෙ,
මයා පුට්ඨා වියාචික්ඛ සභත්තා'සි අභත්තුකා'ති.

භද්දෙ, සොඳුර; තෙ, තිගේ; නාමං, නම; මෙ, මට; වද, කියව; සුභෙ, යහපත් තැනැත්තිය; තෙ, තිගේ; පිතා, පියා; කො, කවරෙක්ද;

මානා, මව් කවුද; සහනනාඅසි, සඝවාමිකයෙහිද; අභතතුකා ඉනි, අසවාමිකද්දයි; මයා, මාවිසින්; පුටඨා, විචාරණලද්දී; වියාඑකබි, ඒහැම කියව.

110 සාමි හෙලෙලාලිගාමඤම්ං ඉසසරසස සුතා අහං,
කම්මාරධීතා චණ්ඩාලී ඉති මඤ්ඤනති මං ජනා'ති.

සාමි, සවාමිනි; අහං, මම; හෙලෙලාලගාමියම්ං, හෙලෙලාලනම් ගම; ඉසසරසස, අධිපතියාගේ (ප්‍රධානනෑවැමියාගේ); සුතා, දූය; කම්මාර ධීතා, කම්මාර දුහිතෘවූ; චණ්ඩාලිඉනි, සැඩොල් අගනෙකැයි; ජනා, ජනයෝ; මං, මා; මඤ්ඤනති ඉති, දනිත්යයි කීය.

111. න පරිච්චජති ලොකො'යං අමෙජෙඣ මණිමුතතමං,
පීරතනං යුවානිව දුකකුලා අපි ගාහියා'ති.

අයං ලොකො, මෙලෝවැසි තෙමේ; අමෙජෙඣ, අමෙධ්‍යයෙහි වූද; උතතමං මණිං, උතුම් මැණික; න පරිච්චජති, අත්නොහරී (එපරිද් දෙන්ම); පීරතනං, සත්‍රීරතනයවූ; යුවානිව, තරුණිද; දුකකුලා අපි, හිනකුලයෙන්උවත්; ගාහියා ඉති, ගතයුතුයයි කීය.

112. ඉදම'පපතරං පාපං න මයහං ආගමිසසති,
ඉචෙච'වං නා'වමනතබබං විපාකො කටුකො හි තං.

මයහං, මාගේ; අපපතරං, අතිශයින් සවල්පවූ; ඉදං පාපං, මේ පාපය; න ආගමිසසති ඉති, විපාකදෙමින් නොඑන්නේයයි; එවං, මෙසේ; න අවමනතබබං, ලඝුකොට නොසිතියයුතුයි; තං, එය; කටුකො, කකීශවූ; විපාකො හි, විපාකයක් වේමය.

113. ඉදම'පපතරං පුඤ්ඤං න මයහං ආගමිසසති,
ඉචෙච'වං නා'වමනතබබං විපාකො මධුරො හි තං.

මයහං, මාගේ; අපපතරං, ඉතා සවල්පවූ; ඉදං පුඤ්ඤං, මේ පිණ; න ආගමිසසති ඉති, විපාකදෙමින් නොඑන්නේයයි; එවං, මෙසේ; න අවමනතබබං, ලඝුකොට නොසිතිය යුතුයි; තං, එය; මධුරො, මිහිරිවූ; විපාකො හි, විපාකයක් වේමය;

114. මාතු චණ්ඩාලවාදෙන චණ්ඩාලී ආසි සා ඉධ,
සම්මජ්ජනාදි පුඤ්ඤෙන ධඤ්ඤා ආසි සුරූපවා'ති

සා, ඕතොමෝ; මාතු, මැනියන්ට; චණ්ඩාලවාදෙන, චණ්ඩාලකෙල් ලයයි කිණුහෙයින්; ඉධ, මෙහි; චණ්ඩාලීආසි, සැඩොලියක් විය; සම්ම ජ්ජනාදිපුඤ්ඤෙන, (බෝමලු) ඇමදීම්ආදි පුණ්‍යහෙතුවින්; සුරූපවා, මනාරූඇති; ධඤ්ඤා ආසි, පින්ලකුණු ඇත්තියක්විය.

115. හොනතුකාමා දෙහළිනි සුපකකං දඩිමං ඵලං,
කිනානු සා පීණිතා හොනි ලඩා සහකාරජං ඵලං.

සුපක්කං, යහපත්ව විලිකුත්වූ; දාඩිමං ඵලං, දෙළුම්පල; භොත්තු කාමා, කනුකැමැත්වූ; දෙහළිනී, දොළදුක් ඇති ස්ත්‍රියක්තොමෝ, සහකාරජංඵලං, (මනාවිලිකුත්) මීඅඹපල; ලද්ධා, ලැබ; සා, ඕතොමෝ; කින්නු, කිම; පිණිතා හොති, ප්‍රණීතවේද හෙවත් සංසිඳුනු දොළ ඇත්තියක් වේද නොවේමය.

116. එවං මෙ නෙව පූරෙති අඤ්ඤං ලද්ධාන මානසං,
කදා බුජ්ඣති දිස්වාන චන්දං පඞ්කජකානනං'ති.

එවං, එපරිද්දෙන්ම; අඤ්ඤං, අනිකක් හෙවත් අන් ස්ත්‍රියක්; ලද්ධාන, ලැබ; මෙ, මාගේ; මානසං, මනොරථය; නෙව පූරෙති, නොපිරේමය (කෙසේද); පඞ්කජකානනං, (හිරුරැසින් පුබුදින) පියුම්වනය; චන්දං දිස්වාන, චන්ද්‍රාලොකය දැක; කදා බුජ්ඣති, කවදානම් ප්‍රබුද්ධ වේද? (එමෙනි).

117. සුද්ධා සාමා සුප්පසන්නා'යතක්ඛී
පීණසොණී දක්ඛිණා'වත්තනාභී,
සඞ්ඛිත්තංසා නාතිලොමා මිතඞ්ගී
ධඤ්ඤා කඤ්ඤා සාලිනිබද්ධවානං.

සාලිනිබද්ධවානං, හැල්බැඳුවූ ශාලිරාජකුමාරයාගේ (අගමෙහෙසිවූ); ධඤ්ඤා, පින්ලකුණු ඇති; කඤ්ඤා, (ඒ) ස්ත්‍රීතොමෝ; සුද්ධා, පරිශුද්ධය; සාමා, ශ්‍යාමවර්ණඇතිය; සුප්පසන්නා, අතිශයින් ප්‍රසන්නවූ; ආයතක්ඛී, දිගුනෙත් ඇතිය; පීණ, පිරුණාවූ; සොණී, නිතම්බප්‍රදෙශ හා; දක්ඛිණාවත්ත, දක්ෂිණාවෘතවූ; නාභී, නාභිමණ්ඩලයක් ඇතිය; සඞ්ඛිත්තංසා, සංක්ෂිප්තවූ අංශඇතිය; මිතඞ්ගී, හීන්වූ කටිප්‍රදෙශ ඇතිය; නාතිලොමා, විරලවූ රොමඇතිය.

118. යස්සා පාදා කොමලා පඞ්කජාභා
මජ්ඣමෙහාජාකාරරෙඛා ගභීරා,
වට්ටඞ්ගුල්‍යො තම්බතුඞ්ගා නඛා ච
ධඤ්ඤා කඤ්ඤා සාලිනිබද්ධවානං.

යස්සා, යම් ස්ත්‍රියක්හුගේ; කොමලා, මොලොක්වූ; පාදා, පාදයෝ; පඞ්කජාභා, පියුම්ආකාරවෙද්ද; ගභීරා, ගැඹුරුද; මච්ඡමෙහාජාකාර රෙඛා, මත්ස්‍යය් පද්මය යන මේආකාර රෙඛා ඇතිවෙද්ද; වට්ටඞ්ගුල්‍යා, වටවූ ඇඟිලිඇතිවෙද්ද; තම්බතුඞ්ගා නඛා ච, තඹවත් උස්වූ නිය ඇතිවෙද්ද; ධඤ්ඤා, පුණ්‍යවන්තවූ; කඤ්ඤා, (ඒ) කන්‍යාතොමෝ; සාලිනි බද්ධවානං, ශාලිබැඳුවූ කුමාරයාගේ අගමෙහෙසිය වේ.

119. සෙතා දන්තා හාසයන්තා සුවණ්ණී
පීණා බාහු තුඞ්ගනාසා සුභොරූ,
භූනං මජ්ඣෙ සාධු ජාතං තිසූලං
ධඤ්ඤා කඤ්ඤා සාලිනිබද්ධවානං.

ෂසනා, ශුභ්‍රවර්ණවූ; හාසයන්තා, මඳ සිනා ඇත්තාවූ; දන්තා, දන්ත යෝද; පීණා, පිරුණාවූ; බාහූ, බාහුයුගමයද; තුඞ්ගනාසා, උස්වූ නැහැයද; සුභොරූ, මනොඥවූ දෙවටොරද; භූනං මජ්ඣෙ, භ්‍රෑයුගම මධ්‍යයෙහි; සාධුජාතං, මොනවට හටගත්; තිසූලං, ත්‍රිශූලාකාරයද (යම් ස්ත්‍රියෙකුට වේද්ද); සුවාණී, (යම් ස්ත්‍රියක්) මනාවචන ඇත්තියක් වේද; කඤ්ඤා, ඒ කන්‍යාතොමෝ; සාලිනිබද්ධවානං, ශාලි බැඳුවූ ශාලිරාජකුමාරයන්ගේ; ධඤ්ඤා, පිණැති බිරින්දයි.

120. ඡත්තාකාරං යදි තු වරඞ්ගං නෙත්තා සාලා කමලදලාභා,
වත්තං පීණං කරචරණා වා මත්තා ලක්ඛි විලසති තස්මි'න්ති.

යදිතු, ඉදින් (යම්හෙයකින්); වරඞ්ගං, (ඒ ස්ත්‍රිගේ) උත්තමාඞ්ගය; ඡත්තාකාරං, නීලවර්ණ ඡත්‍රාකාරද; සාලා, විසාලවූ; නෙත්තා, නෙත්ස ගල; කමලදලාභා, පද්මපත්‍රාකාරද; පීණං, පිරුණාවූ; වත්තං, වක්ත්‍ර යන් පද්මාකාරද; කරචරණාවා, අත්පාත් පද්මපත්‍රාකාරද (එහෙයින්); තස්මිං, එහි හෙවත් ඒ ස්ත්‍රිගේශරීරයකෙරෙහි; ලක්ඛි, ශ්‍රීකාන්තාතොමෝ; මත්තා, මත්ව; විලසති, වාසයකෙරෙයි හෙවත් විරාජමානවෙයි.

121. දිබ්බාගදං ඉමං ධීර සබ්බරොග හරං පරං,
යාය අඤ්ජිත මත්තෙන අන්ධා හොන්ති අනන්ධකා.

ධීර, ධීරයන්වහන්ස; ඉමං, මේ (දිව්ඔසු කැඳ); සබ්බරොගහරං, සියලු ව්‍යාධි නසන්නාවූ; පරං, උතුම්වූ; දිබ්බාගදං, දිව්බෙහෙදෙක; යාය, යමකින්; අඤ්ජිතමත්තෙන, ඇස ඇඳි පමණකින්; අන්ධා, අන්ධයෝ; අනන්ධකා හොන්ති, ඇස්ඇත්තෝ වෙත්ද (එබඳුයි).

122. සීඝං උපසමං යන්ති කණ්ඩුකච්ඡුවණාදයො,
පීතමත්තෙන මූගා'පි මූගත්තං පජහන්ති ච,
බධිරා 'බධිරා හොන්ති හොන්ති ඛඤ්ජාදිකා සුඛී.

පීතමත්තෙන, මේ කැඳ පූ පමණින්; කණ්ඩුකච්ඡුවණාදයො, කණ්ඩු, කණ්ඩුතිය; කච්ඡු, විතච්ඡිකානම් කුෂ්ඨය; වණාදයො, ව්‍රණය යනාදී (රොගයෝ); සීඝං, වහා; උපසමං යන්ති, සංසිඳීමට යෙත්; මූගා අපි, ගොළුවෝද; මූගත්තං, ගොළුබව; පජහන්ති, දුරුකරත්; බධිරා, බිහිරෝ; අබධිරා හොන්ති, නොබිහිරි වෙත්; ඛඤ්ජාදිකා, කොරු ආදිහු; සුඛී හොන්ති, සුවපත් වෙත්.

123. වලිං වලීනං නාසෙති තථෙව පලිතං සිරෙ,
සබ්බරොග විනාසාය අලමෙතං ගදං භුවි.

වලීනං වලිං, ජරාවෙන් ශිථිලිවූවන්ගේ ඇඟ සම්රැලි; නාසෙති, නසයි; පලිතං සිරෙ, ඉස නර; තථෙව, එසේම නසයි; භුවි, (මේ) පෘථිවියෙහි; සබ්බරොගවිනාසාය, සියලු රොග නැසීම පිණිස; එතං ගදං, මේ දිව්ඔසු කැඳ; අලං, පමණි.

124. මහද්ධනො මහාභොගී සබ්බාලඞ්කාරභූසිතො,
සචෙ හොති සදා රොගී න සො සොභති සබ්බදා.

සචෙ, ඉදින්; මහද්ධනො, මහත් ධනඇත්තේ, මහාභොගී, මහත් උප භොග පරිභොග සම්පත් ඇත්තේ; සබ්බාලඞ්කාරභූසිතො, සියලුඅලඞ්කාරයෙන් සැරසුනේ; සදා, හැමකල්හි; රොගී හොති, රෝගඇත්තේ වේද; සො, හෙතෙම; සබ්බදා, සියලුකල්හි; න සොභති, නොහොබියි:

125. අරොගතාසමං ලොකෙ ධන ධඤ්ඤං න විජ්ජති,
අබ්‍යාධි ච නිරාතඞ්කො සො'ව සබ්බත්‍ථ සොභතී'ති.

ලොකෙ, ලෙව්හි; අරොගතාසමං, නිරොගිබව සමානවූ; ධන ධඤ්ඤං, ධනධාන්‍යයෙක්; නවිජ්ජති, නැත්තේය; අබ්‍යාධීච, (යමෙක් තෙමේ, රොගනැත්තේ වේද; නිරාතඞ්කො, පීඩාරහිත වේද; සො එව, හෙතෙමේම; සොභති ඉති, බබලයි.

126. දුඪගාමණී රඤ්ඤො තු රජ්ජෙ ජීතා ජනා අහු,
සාලිරාජකුමාරො'ති තස්සා'සි විස්සුතො සුතො.

දුට්ඨගාමණී රඤ්ඤො තු, දුටුගැමුණුරජහුගේ වනාහි; රජ්ජෙ, රජයෙහි; ජනා, ජනයෝ; ජීතා අහු, සැපතින් පිරුණෝවූහ; සාලිරාජකුමාරො ඉති, ශාලිරාජකුමාරයයි; විස්සුතො, ප්‍රසිඬවූ; සුතො, පුත්‍රයෙක්; තස්ස, ඒ රජහට; ආසි, ඇතිවිය.

127. අතී වධඤ්ඤො සො ආසි පුඤ්ඤකම්මරතො සදා,
අතී'ව චාරුරූපාය සතෙතා චණ්ඩාලියා අහු.

සො, හෙතෙමේ; අතීව ධඤ්ඤො, අතිශයින් වාසනාවනතාවූයේ; සදා, හැමකල්හි; පුඤ්ඤකම්මරතො, පින්කම්හි ඇලුනේ; ආසි, විය; අතීව චාරුරූපාය, ඉතාම රූපලාවන්‍ය ඇත්තාවූ; චණ්ඩාලියා, චණ්ඩාලියක්කෙරෙහි; සතෙතා, සක්තවූයේ හෙවත් ඇලුනේ; අහු, වීය.

128. අසොකමාලාදෙවිං තං සම්බන්ධං පුබ්බජාතියං,
රූපෙනා'ති පියායනෙතා සො රජ්ජං නෙ'ව කාමයි.

පුබ්බජාතියං, පූර්වජාතියෙහි; සම්බන්ධං, සම්බන්ධවූ; තං අසොකමාලාදෙවිං, ඒ අසොකමාලාදෙවිය; රූපෙන, රූපය කරණකොටගෙණ; අතිපියායනෙතා, අතිශයින් ප්‍රියකරන්නාවූ; සො, හෙතෙම; රජ්ජං, රජය, නෙව කාමයි, නොකැමැතිවිය.

129. දුට්ඨගාමණීභානාතු සද්ධාතිසො තද'ච්චයෙ,
රජ්ජං කාරෙසා'භිසිත්තො අට්ඨාරසසමාසමො'ති.

දුඩ්ගාමණීභාතා, දුටුගැමුණුරජහු මල්වූ; සද්ධාතිස්සොතු, සද්ධාතිස්සකුමරතෙමේ වනාහි;තදච්චයෙ, ඔහු ඇවෑමෙන්; අභිසිත්තො, අභිෂෙකකරණලද්දේ; අසමො, අසමවූයේ; අඨාරසසමා, අටළොස්හවුරුද්දක්; රජ්ජං කාරෙසි, රජය කරවූයේය.

130. ඉති සුජනජනානං සාසනෙ සොභදනං
මධුරචරිතමෙතං සුත්වා චිත්තෙ නිධාය,
චිණථ කුසලරාසිං ථාමසා සබ්බකාලං
වසථ සිවපුරස්මිං ගන්ත්වා රමෙම චිරමෙහා.

ඉති, මෙසේ; සාසනෙ, බුදුසස්නෙහි; සොභදනං, ශොභාදනය කරන්නාවූ; සුජනජනානං, සත්පුරුෂ ජනයන්ගේ; එතං මධුරචරිතං, මේ මිහිරි චරිත කථාව; සුත්වා, අසා; චිත්තෙ නිධාය, සිත තබාගෙණ; භො, භවත්නි; සබ්බකාලං, සියලුකල්හි; ථාමසා, ශක්තියෙන් (හෙවත් ශක්තිපමණින්) කුසලරාසිං, පුණ්‍යරාසිය; චිණථ, රැස්කරව්; (එසේකොට) ගන්ත්වා, (ස්වර්ගයට) ගොස්; රමෙම, මනරම්වූ; සිවපුරස්මිං, ක්ෂෙමනගරයෙහි; චිරං, බොහෝකල්; වසථ, වාසයකරව්.

## සාලිරාජකුමාර විස්තුව, 6.

---

131. සා'යං වරාකී කපණා අත්තාණා'සරණා සුනී,
පවෙධමානා අඨාසි අහො සංසාරදුක්ඛතා.

වරාකී, කාලකන්නිවූ; කපණා, කෘපණවූ, අසරණා, පිහිටක්නැත්තාවූ; සා අයං සුනී, ඒ මේ බැල්ලිතොමෝ; අත්තාණා, රක්ෂාස්ථාන නැත්තී; පවෙධමානා, වෙව්ලමින්; අඨාසි, සිටියාය; සංසාරදුක්ඛතා, සසරදුක්ඛව; අහො, ඛෙදයකි.

132. දිඩ්දිඩා ජනා එවං තාළෙන්ති කඨලාදිනා,
ඛරවාචාපතොදෙන නිත්තුදන්ති තථෙ'ව තෙ.

එවං, මෙසේ; දිඩ්දිඩා ජනා, දුමුදුටු ජනයෝ; කඨලාදිනා, කැටකැබිලිති ආදියෙන්; තාළෙන්ති, තලිත්, තෙ, ඔව්හු; තථෙව, එසේම; ඛරවාචාපතොදෙන, කෲරවචන නැමැති කැවිටින්; නිත්තුදන්ති, ඇන වෙහෙසත්.

133. යාපනං ගොචරං කිඤ්චි අලද්ධා දිවස'මපි ච,
පරියෙසන්ති පතිස්සති පාපානං එලම්'දිසං,

දිවසං අපිච, දවස මුලුල්ලෙහිද; පරියෙසන්ති, සොයා ඇවිදිනී; ඝාපනං, කුසයැපෙන්නාවූ; කිඤ්චිගොචරං, කිසි ගොදුරක්; අලද්ධා, නොලැබ; පතිසෙසති, (ඒ තැන) වැටී හොවියි; පාපානං පාප, යන්ගේ; ඵලං, විපාක; ඊදිසං, මෙබඳුයි.

134. යො කරොති නරො පාපං කොධලොභාදි දාරුණං,
සුනඛී'ව සදා'යං සො දුක්ඛභාගී භවිස්සති.

යො නරො, යම් මිනිසෙක් තෙම; කොධලොභාදී, ක්‍රොධලොභාදිවූ; දාරුණං, දරුණුවූ; පාපං, පව්; කරොති, කෙරේද; සො, හෙතෙම; අයං සුනඛී ඉව, මේ බැල්ලිමෙන්; සදා, හැමකල්හි; දුක්ඛභාගී භවිස්සති, දුකට හිමිවන්නේය.

135. යො කාමම්'දිසෙ සත්තෙ ජිඝච්ඡාපරිපීළිතෙ,
ඝාසං දත්වාන පීණෙති සො යාති සුගතිං ඉතො.

යො, යමෙක්තෙම; ඝාසං දත්වාන, (බඩසාදුකින් පෙළෙනවුන්ට) අහරදී; ජිඝච්ඡාපරිපීළිතෙ, ක්ෂුධාවෙන් පීඩිතවූ; ඊදිසෙ, මෙබඳුවූ; සත්තෙ, සත්වයන්; පීණෙති, පිණවාද; සො, හෙතෙම; කාමං, එකාන්තයෙන්; ඉතො, මෙයින්; සුගතිං, සුගතියට; යාති, පැමිණෙයි.

136. චින්තෙත්වාන තදා ථෙරො කරුණාපුණ්ණමානසො,
චමෙත්වාන අදා භුත්තං සුනඛියා දයාවෙතනො'ති.

තදා, එකල්හි; ථෙරො, ස්ථවිරතෙම; ඉති, මෙසේ; චින්තෙත්වාන, සිතා; කරුණාපුණ්ණමානසො, කරුණාවෙන් පිරුණු සිත් ඇත්තේ; භුත්තං, (තමන්වහන්සේ) අනුභවකළ (ආහාරය); චමෙත්වාන, වමාරා; දයාවෙතනො, දයාවෙතනා ඇත්තේ; සුනඛියා, බැල්ලිට; අදා, දුන්නේය.

137. ඉමිනා කතෙන පුඤ්ඤෙන අත්තානම'නපෙක්ඛිය,
හෙස්සං පච්චයලාභීනම'ග්ගො අව්‍යාධිකො සුඛී.

138. මානිතො පූජිතො හෙස්සං සබ්බසත්තෙහි සබ්බදා,
නිබ්බාණං ච සුඛං ඛෙමං පාපුණෙය්‍යම'නාගතෙ'ති.

අත්තානං, තමන් (ගේ ශරීරසුඛය); අනපෙක්ඛිය, අපෙක්ෂා නොකොට; ඉමිනා කතෙන, මේ කරණලද්දවූ; පුඤ්ඤෙන, පුණ්‍යය හෙතුකොට ගෙණ; පච්චයලාභීනං, ප්‍රත්‍යයලාභීන් අතරෙන්; අග්ගො හෙස්සං, අග්‍රවෙම්වයි; අව්‍යාධිකො, නිර්ව්‍යාධිවෙම්වයි; සුඛී, සුවපත්වෙම්වයි; සබ්බදා, හැමකල්හි; සබ්බසත්තෙහි, සියලූ

සතුන් විසින්; මානිතො, සත්කාරකරණලද්දේවෙම්වයි; පූජිතො හෙස්සං, පුදනලද්දේවෙම්වයි; අනාගතෙ, අනාගතයෙහි; ඛෙමං, නිර්භයවූ; නිබ්බාණසුඛංච, නිර්වාණ සැපයටද; පාපුණෙය්‍යං ඉති, පැමිණෙම්වයි; (ප්‍රාර්ථනාකෙළේය).

139. අප්පම්පිදානං මනසා සපඤ්ඤා,
කත්වා විසාලං ඵලමා'වහන්ති,
තථේ'ව තුම්හෙ'පි පරිත්තදානං
කරොථ චිත්තෙන විසාලභාවං.

සපඤ්ඤා, සප්‍රාඥයෝ; අප්පම්පිදානං, ස්වල්පවූ දානය පවා; මනසා, සිතින්; විසාලං කත්වා, මහත්කොට; විසාලං ඵලං, මහත්වූ විපාක; ආවහන්ති, පමුණුවාගණීත්; තුම්හෙ අපි, (භවත්හි) තෙපිද; තථෙව, එසේම; පරිත්තදානං, මඳවූ දානය නමුත්; චිත්තෙන, (සැදැහැ) සිතින්: විසාලභාවං කරොථ, මහත් ඵලඇති කරව්.

**චූලනාගස්ථවිර වස්තුව, 7.**

---

140. පුච්ඡාම'හං දෙවපුත්තං මෙස්සවණ්ණං යසස්සිනං,
කොනුත්වම'සි දෙවින්දො දෙවරාජා'සි නන්දනෙ.

අහං, මම; යසස්සිනං, යශස් ඇත්තාවූ; මෙස්සවණ්ණං, මෙස්සවර්ණ නම්වූ; දෙවපුත්තං; දිව්‍යපුත්‍රයා; පුච්ඡාමි, විචාරමි; ත්වං, නුඹ; කොනු අසි, කවරෙක් වෙහිද?; නන්දනෙ, නඳුන්වනයෙහි (ක්‍රීඩා කරණ); දෙවින්දො, දෙවියන්ට අධිපතිවූ; දෙවරාජා අසි, සක්දෙව් රජවෙහිද?.

141. දෙවිස්සරියසම්පන්නො දිබ්බාභරණභූසිතො,
දිබ්බෙහි නච්චගීතෙහි වාදිතෙහි පමොදසී.

දෙවිස්සරියසම්පන්නො, දිව්‍යඉසුරෙන් සමන්විතවූයේ; දිබ්බාභරණභූසිතො, දිව්‍යාබරණින් සැරසුනේ; දිබ්බෙහි, දිව්‍යමයවූ; නච්චගීතෙහි, නෘත්‍යයෙන් හා ගීතිකාවලින්ද; වාදිතෙහි, වාද්‍යයෙන්ද; පමොදසි, ප්‍රමුදිතවෙහිය.

142. පාණිස්සරා මුතිඞ්ගා ච මුරජා ඵකපොක්ඛරා,
වාදෙන්ති පුරතො තුය්හං නානාවාදිසු කොවිදා.

නානාවාදිසු, නානාප්‍රකාර වාද්‍යවිධියෙහි; කොවිදා, දක්ෂවූ (දෙව ගන්ධර්වයෝ); පාණිස්සරා, අත්තලද; මුතිඞ්ගා ච, මිනිගුබෙරද; මුරජා,

උඩැක්කිද; එකපොක්ඛරා, මහබෙර වීණාද (යන මේ තූර්‍යභාණ්ඩගෙණ); තුය්හං, ඔබගේ; පුරතො, ඉදිරියෙහි; වාදෙන්ති, වයත්.

143. කෙචි පග්ගය්හ තාළෙන්ති කංසතාලාදිකෙ ඝනෙ,
තථෙ'ව හට්ඨා තාළෙන්තා ගායං නච්චන්ති නාටකා.

කෙචි, සමහර දෙවතා කෙණෙක්; කංසතාලාදිකෙ ඝනෙ, කංසතාලං හා කුළුතාලං ආදිය; පග්ගය්හ, ගෙණ; තාළෙන්ති, ගසත්; තථා එව, එසේම; නාටකා, (සමහර) දිවනළුවෝ; හට්ඨා තාළෙන්තා, අත්තල ගසමින්; ගායං, ගායනාකරමින්; නච්චන්ති, නටති.

144. පග්ගය්හ සඞ්ඛවංසාදිනානාතුරියානි දෙවතා,
පුරතො වයන්ති තං සබ්බං තුවං තත්‍ථා'භිමොදසි.

දෙවතා, (සමහර) දෙවතාවෝ; සඞ්ඛවංසාදි, සක් වස්කුලල් ආදිවූ; නානාතුරියානි, නානාවිධ තූර්‍යයන්; පග්ගය්හ, ගෙණ; පුරතො, (තොප) ඉදිරියෙහි; තං සබ්බං, ඒ සියල්ල; වයන්ති, වාදනයකෙරෙත්; තුවං, නුඹ: තත්‍ථ, ඒ තූර්‍යයෙහි; අභිමොදසි, මොනවට සතුටුවෙහිය.

145. නච්චන්ති නාරියො තත්‍ථ දෙවකඤ්ඤා මනොරමා,
ලයානුයාතං ගායන්ති ගීතං කාචි මනොරමං.

තත්‍ථ, එහි; මනොරමා, සිත්කළුවූ; නාරියො, දිව්‍යස්ත්‍රීහු; නච්චන්ති, නෘත්‍ය කෙරෙත්; කාචි දෙවකඤ්ඤා, සමහර දිව්‍යකන්‍යාවෝතුමූ; මනොරමං, මනොරම්‍යවූ; ලයානුයාතං, එක්සියවිසිලයින් (තාලයෙන්) අනපෙනවූ; ගීතං, ගිතිකා; ගායන්ති, ගයත්.

146. කො වා ත්වං කත්‍ථ වාසී'ති කථං ජානෙමු තං මයං,
පුච්ඡො මෙ සංසයං සබ්බං තුය්හං ච භරියාය ච.

ත්වං, නුඹ; කො වා, කවරෙක් හෝ වෙහිද; කත්‍ථ, කොතැන්හි; වාසී ඉති, වාසයකරන්නෙක් වෙහිදැයි; මයං, අපි; කථං, කෙසේ නම්; ජානෙමු, දැනගණිමුද; තුය්හං ච, නුඹගේද; භරියාය ච, බිරින්දගේද; තං සබ්බං, (නාමගොත්‍ර හා වාසස්ථාන යන) ඒ සියළුම; සංසයං, සැකය; මෙ, මාවිසින්; පුච්ඡො, විචාරණ ලද්දේ; (කියව).

147. ඉමස්මිං පබ්බතෙ භන්තෙ ධූමරක්ඛසනාමකෙ,
මම පුඤ්ඤෙන නිබ්බත්තො පාසාදෙ රතනාමයො.

148. ඉච්ඡාදයකනෙකෙහි කප්පරුක්ඛෙහි'ලඞ්කතො,
පුරින්දදෙ'ව මොදමි නන්දනෙ සුරනන්දනෙ'ති.

භන්තෙ, ස්වාමිනි; ධූමරක්ඛසනාමකෙ, උදුම්බරගිරිනම්වූ; ඉමස්මිං පබ්බතෙ, මේ පව්වෙහි; මම, මාගේ; පුඤ්ඤෙන, පුණ්‍යයෙ

තුවෙන්; නිබ්බත්තො, උපන්නාවූ; ඉච්ඡාදයක, කැමැති කැමැති වස්තුප්‍රදානයකරන්නාවූ; නෙකෙහි, නන්වැදැරුම්වූ; කප්පරු ක්ඛෙහි, කප්තුරුවලින්; අලඞ්කතො, සැරසුනාවූ; රතනාමයො, රත්මුවාවූ; පාසාදෙ, දිව්‍යපහයෙක් (වෙයි; ඒ දිව්‍යප්‍රාසාදයෙහි); සුර නන්දනෙ, දෙවියන් සතුටුකරන්නාවූ; නන්දනෙ, නඳුනුයනෙහි; පුරින්දදෙ ඉව, සක්දෙව්රජහුමෙන්; මොදමි ඉති, සතුටුවෙමියි (කීයේය).

149. කෙන වතෙන සීලෙන බ්‍රහ්මචරියෙන තෙ අයං,
ලද්ධා දෙවසිරී දෙව තං මෙ අක්ඛාහි පුච්ඡිතො'ති.

දෙව, දිව්‍යරාජය; තෙ, තොපගේ; කෙන වතෙන, කවර ව්‍රතස මාදානයකින්; සීලෙන, (කවර) ශීලයකින්; බ්‍රහ්මචරියෙන, (කවර) බඹසරකින්; අයං දෙවසිරි, මේ දිව්‍යශ්‍රීතු; ලද්ධා ඉති, ලබ නලදද; මෙ, මාවිසින්; පුච්ඡිතො, විචාරණලද්දේ; තං, ඒ කුශ ලය; අක්ඛාහි, කියව.

150. අහං භන්තෙ අතීතස්මිං අහොසිං පරකම්මිකො,
පරකම්මෙන ජීවාමි අප්පභොගො අනාළිහියො.

භන්තෙ, ස්වාමීන්වහන්ස; අහං, මම; අතීතස්මිං, අතීතයෙහි (හෙවත්) මිට පළමු ජාතියෙහි; අනාළිහියො, සාල්නැළියක් පම ණවත් නැත්තාවූ; අප්පභොගො, භොගසම්පත් නැත්තාවූ; පරක ම්මිකො, අනුන් මෙහෙකරන්නෙක්; අහොසිං, වීමි; (ඒ මම එකල්හි) පරකම්මෙන, අනුන් බැළමෙහෙකිරීමෙන්; ජීවාමි, ජීවත් වෙමි.

151. කදාචි භරියා සද්ධිං පලාලං වාලයං අහං,
ලද්ධාන ධඤ්ඤ'මප්පං තං ඉණත්ථාය පයොජයිං.

කදාචි, කිසිකලෙක්හි; භරියාය සද්ධිං, බිරින්ද හා සමග; අහං, මම; පලාලං වාලයං, කලවිටිසලන්නෙමි; අප්පං, ස්වල්පවූ; ධඤ්ඤං, ධාන්‍යයක්; ලද්ධාන, ලැබගෙණ; තං, එය; ඉණත්ථාය, නයපිණිස; පයොජයිං, යෙදුයෙමි; (හෙවත්) නයට දුන්නෙමි.

152. තතො වඩ්ඪිං පයොජෙන්තො අහොසිං දසිදසවා,
ධනධඤ්ඤවා අථො ආසිං සඩ්ඪාධනවිභුසිතො.

තතො, එයින්; වඩ්ඪිං, වැඩීම; පයොජෙන්තො, යොදන්නේ (හෙවත්) පොලී උපදවන්නේ; දසිදසවා, දාසිදසුන් ඇත්තේ; ධන ධඤ්ඤවා, ධනධාන්‍යඇත්තෙක්; අහොසිං, වූයෙමි; අථො, යළිදු; සඩ්ඪාධනවිභූසිතො, ශ්‍රද්ධාධනයෙන් සැරසූනේ; ආසිං, වීමි.

153. අහං ච භරියා මය්හං උභො දානං අදම්හසෙ,
භික්ඛවො සීලසම්පන්නා ආනයිත්වා සකං ඝරං.

අහං ච, මමද; මය්හං, මාගේ; භරියා ච, බිරින්දද යන; උභො, අපිදෙදෙන; සීලසම්පන්නා, සිල්වත්වූ; භික්ඛවො, භික්ෂූන්; සකං ඝරං, ස්වකීය ගෘහයට; ආනයිත්වා, කැඳවා; දානං, දානයක්; අදම්හසෙ, දුන්නෙමු.

154. තප්පෙසිං අන්නපානෙහි වත්ථසෙනාසනෙහිච,
ගිලානානං අදාසා'හං භෙසජ්ජං ව්‍යාධි ඝාතකං,
නෙකපූජාවිධානෙහි බුද්ධපූජ'මකාරයිං.

අහං, මම; අන්නපානෙහි, ආහාරපානවර්ගවලින්ද; වත්ථසෙනාසනෙහිච, වස්ත්‍ර හා සෙනසුන්වලින්ද; තප්පෙසිං, (භික්ෂූන්) සන්තර්පිත කෙළෙමි (හෙවත්) උවටැන් කෙළෙමි; ගිලානානං, ගිලන් භික්ෂූන්ට; ව්‍යාධිඝාතකං, රොග නසන්නාවූ; භෙසජ්ජං, බෙහෙත්; අදාසිං, දුනිමි; නෙකපූජාවිධානෙහි, අනෙකපූජා විධිවලින්; බුද්ධපූජං, බුද්ධපූජාව; අකාරයිං, කරවූයෙමි.

155. ධම්මකථිකෙ සමානෙත්වා කත්වා සක්කාරම'බ්භුතං,
ධම්මදානං අදාසා'හං සබ්බදානෙසු උත්තමං.

අහං, මම; ධම්මකථිකෙ, ධර්මකථිකයන්වහන්සේලා; සමානෙත්වා, මනාකොට වැඩමවා; අබ්භුතං, අද්භූතවූ; සක්කාරං, සත්කාරවිධි; කත්වා, කොට; සබ්බදානෙසු, සියලූ දානයන් අතුරෙන්; උත්තමං, උතුම්වූ; ධම්මදානං, ධර්මදානය; අදාසිං, දුනිමි.

156. උභො මයං තදා තත්ථ සමග්ගා යතිනන්දන,
පඤ්චසීලානි ගොපිම්හ අවසිම්හ උපොසථං.

යතිනන්දන, බුද්ධපුත්‍රයානන්වහන්ස; මයං උභො, අපිදෙදෙන; තදා, එකල්හි; තත්ථ, එහි; සමග්ගා, සමගිවූමෝ; (නොහොත්) සමසිතින්; පඤ්චසීලානි, පන්සිල්; ගොපිම්හ; රක්‍ෂාකෙළෙමු; උපොසථං, පෙහෙවස්, අවසිම්හ, විසීමු

157. සුකතෙන තෙන කම්මෙන චවිත්වාන තතො මයං,
භුම්මදෙවෙසු ජාතම්හ ඉමස්මිං පබ්බතුත්තමෙ,
ඉදං මෙ පුබ්බ චරිතං ඉති ජානාහි ඛීපති.

සුකතෙන, මනාකොට කරණලද; තෙන කම්මෙන, ඒ කුශලකර්මය හෙතුකොටගෙණ; මයං, අපිදෙදෙන; තතො, ඒ අත්බැවින්; චවිත්වාන, සැව; ඉමස්මිං පබ්බතුත්තමෙ, මේ උතුම් පර්වතයෙහි;

භුම්මදෙවෙසු, භූමිස්ථදෙවියන් කෙරෙහි; ජාතා අම්හ, උපන්නෝ වෙමු; ධීපති, පණ්ඩිතොත්තමයන්වහන්ස; මෙ, මාගේ; ඉදං, මේ; පුබ්බචරිතං, පූර්වචරිතය; ඉති, මෙසේ; ජානාහි, දැනවදාළමැනවි.

158. ලොකො'යං යදි ජානාති ඉදං පුඤ්ඤඵලං ඉති,
කිච්චමඤ්ඤං විවජ්ජෙත්වා පුඤ්ඤංයෙ'ව කරොන්ති තෙ'ති.

අයං ලොකො, මේ ලෝවැසිතෙමේ; ඉති, මෙසේ; ඉදං පුඤ්ඤඵලං, මේ කුශලවිපාකය; යදි, ඉදින්; ජානාති, දනීනම්; තෙ, ඔහු තුමූ; අඤ්ඤං කිච්චං, අනිත් කටයුතු; විවජ්ජෙත්වා, හැරදමා; පුඤ්ඤං, පින්, කරොන්ති එව, කරන්නාහුමය.

159. කිත්තකං වත්තතෙ ආයු ඉමස්මිං වසතො තව,
අක්ඛාහි සොතුමි'ච්ඡාමි යදි ජානාහි මෙ තුව'න්ති.

ඉමස්මිං, මේ පර්වතයෙහි; වසතො, වාසයකරන්නාවූ; තව, නුඹගේ; ආයු, ආයුඃප්‍රමාණය; කිත්තකං, කෙපමණ; වත්තතෙ, පවතීද; තුවං, නුඹ; යදි, ඉදින්; ජානාහ්, (ආයුඃප්‍රමාණය) දන්නෙහි නම්; මෙ, මට, අක්ඛාහි, කියව, සොතුං, අසන්ට, ඉච්ඡාමි, කැමැත්තෙමි.

160. වඩ්ඪිත්වාන ධරා ධීර ගිලිත්වා පබ්බතං ඉදං,
යදා භූමිසමා හොති කූටංපි'ස්ස න දිස්සති.

ධීර, ධීරයානන්වහන්ස; ධරා, (මේ) මහාපෘථිවීතොමෝ; වඩ්ඪිත්වාන, වැඩී; ඉදං පබ්බතං, මේ පර්වතය; ගිලිත්වා, ගිල (හෙවත්) යටපත්කොට; යදා, යම්කලෙක, භූමිසමා හොති, බිම හා සමවේද; අස්ස, මේ පර්වතය සම්බන්ධවූ; කූටං අපි, මස්තකයවත්; නදිස්සති, නොදක්නාලැබේද-

161. සකටමග්ගො යදා හොති අස්මිං පබ්බතමුද්ධනි,
තෙලභාජනසම්පුණ්ණසකටං ගොණාවහන්ති හි,
පාජෙන්ති තං පතොදෙහි කුමාරා සත්තවස්සිකා.

යදා, යම්කලෙක්හි; අස්මිං පබ්බතමුද්ධනි, මේ පර්වත මස්තකයෙහි; සකටමග්ගො, ගැල්මග; හොති, වේද; ගොණා, ගෙරිහුතුමූ; තෙලභාජනසම්පුණ්ණ, තෙල්බඳුන් පිරූ; සකටං, ගැල; වහන්ති, උසුලද්ද; සත්තවස්සිකා, සත්හැවිරිදිවූ; කුමාරා, කුමරුවෝ; තං, ඒ ගැල; පතොදෙහි, කෙවිට්ටිවලින්; (නොහොත්) කෙවුටුවම්කොට; පාජෙන්ති, පැදගෙණ යෙද්ද-

162. තදා ඉතො චවිත්‍වාන තාවතිංසෙ මනොරමෙ,
චාදසයොජනුබ්බෙධෙ රතනෙහි සුසඞ්ඛතෙ.

163. දෙවිස්සරියසම්පන්නො දෙවනාහි පමොදිතො,
රමාමි පුඤ්ඤකම්මෙන පුබ්බෙන චරිතෙන'හ'න්ති.

තදා, එකල්හි; අහං, මම; ඉතො, මෙයින්; චවිත්‍වාන, චුතව; චාදස යොජනුබ්බෙධෙ, දොළොස්යොදුන් උසඇති; රතනෙහි, සත්රුවනින්; සුසඞ්ඛතෙ, මනාකොට සංස්කාරකරණලද (හෙවත්) මොනවට විසිතුරුවූ; මනොරමෙ, සිත්කලුවූ; තාවතිංසෙ, තව්තිසාදෙව් ලොව විමනෙක්හි; දෙවිස්සරියසම්පන්නො, දිව්‍යඑෛශ්වර්‍ය්‍යයෙන් සමෘඬව; දෙවනාහි, දෙවනාවන්විසින්; පමොදිතො, ප්‍රමොදිතව; පුබ්බෙන, පූර්වොපචිතවූ; චරිතෙන, සුචරිතවිශෙෂයක්වූ; පුඤ්ඤකම්මෙන, කුශලකර්මය කරණකොටගෙණ; රමාමි, (බොහෝකලක්) සිත්අලවා වාසය කරමි.

164. එවං දනං සඟසම්පත්තිදනං
දනං දිබ්බං චානුගාමිනිධානං,
දනං මන්තං සබ්බසත්තුපඝාතං
දනං තස්මා ථාමසා හො භජෙථා.

එවං, මෙසේ; දනං, දනයතෙම; සඟසම්පත්තිදනං, සඟසැපත් ගෙණදෙන්නේය; දනං, දනය; දිබ්බං, දිව්‍යමයවූ; අනුගාමි, තමන් කැටුව යන සුලුවූ; නිධානං, නිධානයක්ය; දනං, දනය; සබ්බසත්තුපඝාතං, සියලු සතුරුනැමැති විෂ නසන්නාවූ; මන්තං, (දිව්‍ය) මන්ත්‍රයක් හා සමානය; තස්මා, එහෙයින්; හො, පින්වත්නි (තෙපි); ථාමසා, ශක්ති පමණින්; දනං, දනය; භජෙථා, භජනය කරව්.

මෙඝවණ්ණ වස්තුව, 8.

---

165. හිංසා අප්පායුකත්තං ච බව්හාබාධත්තනම්පි ච,
වියොගදුක්ඛබාහුල්‍යං ජනෙතු'බ්බිග්ගවාසිත'න්ති.

හිංසා, සත්‍වහිංසා තොමෝ; අප්පායුකත්තං ච, අල්පායුෂ්කබවද; බව්හාබාධත්තනම්පි ච, බොහෝ රොගාතුරබවද; වියොගදුක්ඛබාහුල්‍යං, වියොගදුඃඛයාගේ බහුලභාවයද; උබ්බිග්ගවාසිතං, උබිගනව විසිමද (හෙවත්) භයින් තැතිගෙණ විසීමද; ජනෙති, උපදවයි.

166. සතසහස්සෙ ඉතො කප්පෙ බුද්ධො උප්පජ්ජි නායකො,
පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො.

ඉතො, මෙයින්; සතසහස්‍සෙ කපෙප, ලක්‍ෂයක් වන කල්පයෙහි; ලොකවිදූ, ලොකත්‍රය දන්නාවූ; ආහුතීනං, ආහුතිසඞ්ඛ්‍යාත දක්‍ෂිණා වන්; පටිග්‍ගහො, පිළිගන්නාවූ (දක්‍ෂිණාර්හවූ); නායකො, ලොක යාට අසහාය නායකවූ; පදුමුත්තරො, පියුමතුරානම්වූ; බුද්‍ධො, බුදු රජතෙම; උප්‍පජ්ජි, ලෝ පහළවූසේක.

167. සනරාමරලොකං සො ධම්මනාවාය පූරයං,
සංසාරණ්ණවතො නෙත්‍වා පාපෙති සිවමඤ්ජසං.

සො, ඒ බුදුරජතෙම; සනරාමර, දෙව්මිනිසුන් සහිතවූ; ලොකං, ලොකවාසී සත්‍වයා; ධම්මනාවාය, ධර්ම නැමැති නෞකාවෙහි; පූරයං, පුරවමින්; සංසාරණ්ණවතො, සංසාරාණ්ණවයෙන් (හෙවත්) සසර නැමැති මහසයුරෙන්; නෙත්‍වා, ගෙණගොස්; සිවමඤ්ජසං, නිවන් මගට; පාපෙති, පමුණුවන සේක.

168. තස්මිං කාලෙ තුවං තත්‍ථ ජාතො අඤ්ඤතරෙ කුලෙ,
පත්‍වාන විඤ්ඤුතං තත්‍ථ සුත්‍වා ධම්මං සුදෙසිතං.

තස්මිං කාලෙ, එකල; තුවං, නුඹ; තත්‍ථ, එහි; අඤ්ඤතරෙ කුලෙ, එක්තරා කුලගෙයක; ජාතො, උපන්නේ; තත්‍ථ, එහි; විඤ්ඤුතං, විඥබවට (නොහොත්) වැඩිවියට; පත්‍වාන, පැමිණ; සුදෙසිතං, මනාකොට දෙශනාකරණ ලද; ධම්මං, ධර්මය; සුත්‍වා, අසා.

169. ජාතසද්ධො පසන්නො සො රතනත්තයමාමකො,
පිණ්ඩචාරිකවත්තෙන චරන්තං පිණ්ඩපාතිකං,
අද්දක්ඛි දිස්‍වා පග්ගය්හ පත්තං තස්ස කරග්ගතො.

170. ගෙහං නෙත්‍වාන තං භික්ඛුං නිසින්නං තං සුඛාසනෙ,
පිණ්ඩපාතං උපනෙසි සසමංසරසෙන ච.

සො, ඒ නුඹ; ජාතසද්ධො හටගත් ශ්‍රද්ධා ඇත්තේ; පසන්නො, පහන්සිත් ඇත්තේ; රතනත්තයමාමකො, රත්නත්‍රය කෙරෙහි මම ත්‍වය ඇත්තේ; පිණ්ඩචාරිකවත්තෙන, පිඩුසිඟාවඩනා වතින්; චරන්තං, හැසිරෙන්නාවූ; පිණ්ඩපාතිකං, පිණ්ඩපාතික භික්‍ෂුකෙ ණෙකුන්; අද්දක්ඛි, දුටුයේය; දිස්‍වා, දැක; තස්ස, උන්වහන්සේගේ; කරග්ගතො, අතාගින්; පත්තං, පාත්‍රය; පග්ගය්හ, ගෙණ--තං භික්ඛුං, ඒ භික්‍ෂුව; ගෙහං, ගෙට; නෙත්‍වාන, පමුණුවා; සුඛාසනෙ, සැපඅසු නෙහි; නිසින්නං, වැඩහුන්නාවූ; තං, ඒ භික්‍ෂුව කරා; සසමංසර සෙන ච, ශශමාංස (හාමස්) සමග; පිණ්ඩපාතං, පිණ්ඩපාතඥනයක්; උපනෙසි, එලවීය.

171, පුනෙ'කදිවසං දිස්වා තථෙ'වෙ'කං යතිස්සරං,
සතසක්ඛරසම්පුණ්ණං මධුරං පූවඛජ්ජකං,
භොජයිත්වාන සන්තුට්ඨො එවං ත්වං පණිධිං අකා.

පුන, නැවත; එකදිවසං, එක්දවසක්; ත්වං, නුඹ; තථා එව, එපරිද් දෙන්ම; එකං යතිස්සරං, එක් යතීන්ද්‍රයන්වහන්සේ කෙණෙකුන්; දිස්වා, දැක; සතසක්ඛර සම්පුණ්ණං, ගිතෙල් හා උක්සකුරුවලින් සම්පූර්ණවූ; මධුරං, මිහිරිවූ; පූවඛජ්ජකං, පූපඛාද්‍යයක් (හෙවත්) කැවුම් අවුලුපතක්; භොජයිත්වාන, වළඳවා; සන්තුට්ඨො, සතුටු වූයේ; එවං, මෙසේ; පණිධිං, ප්‍රාර්ථනාවක්; අකා, කෙළේය.

172. එතෙහි පුඤ්ඤකම්මෙහි දෙවමානුසජං සුඛං,
ලභෙය්‍යා'හං ජනෙස'ග්ගො භොගවා යසවා සදා.

එතෙහි, මේ; පුඤ්ඤකම්මෙහි, කුශලකර්මයන් කරණකොටගෙණ; අහං, මම; දෙවමානුසජං, දිව්‍යමානුෂිකවූ; සුඛං, සැපය; ලභෙය්‍යං, ලබම්වා; සදා, හැමකල්හි; ජනෙසු, සියලු දෙනා අතුරෙන්; අග්ගො, අගතැන්පැමිණියේ; භොගවා, උපභොග පරිභොග සම්පත් ඇති වෙම්වා; යසවා, යසස් ඇතිවෙම්වා.

173. භවෙසු සංසරන්තො'හං යත්‍ථ ජායාමි මානුසෙ,
සසමංසං ච පූවං ච අක්ඛයං හොතු සබ්බදා.

භවෙසු, සංසාරයෙහි; සංසරන්තො, සැරිසරන්නාවූ; අහං, මම; යත්‍ථ, යම්කලෙක්හි; මානුසෙ, මිනිස්ලොව; ජායාමි, උපදිම්ද; සබ්බදා, ඒ හැමකල්හි; සසමංසං ච, හාමස්ද; පූවං ච, පූපවර්ගද; අක්ඛයං හොතු, ක්ෂයරහිතවේවා (හෙවත්) අඩුනොවේවා.

174, ඉදං තෙ චරිතං ආසි භවතො පුබ්බජාතියං,
ඨානො'පචිතපුඤ්ඤස්ස විපුලං ඵලමී'දිසං.

භවතො, (මේ) භවයෙන්; පුබ්බජාතියං, පූර්වජාතියෙහි; තෙ, නුඹගේ; ඉදං චරිතං, මේ චරිතය; ආසි, විය; ඨානෙ, සුදුසු ස්ථාන යෙහි; උපචිත, රැස්කරණලද; පුඤ්ඤස්ස, පුණ්‍යකර්මයාගේ; විපුලං, මහත්වූ; ඵලං, විපාකය; ඊදිසං, මෙබඳුයි.

175. දෙහි දානම්පි සද්ධාය මා පාපම'කරා ඛරං,
යථාබලම්පි භො සීලං පාලෙහි විමලං සදා'ති.

භො, පින්වත; දානම්පි, දානයද; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; දෙහි, දෙව; ඛරං, ක්‍රෑරවූ; පාපං අපි, පාපයද; මා අකරා, නොකරව; යථාබලං, ශක්තිපමණින්; විමලං, නිර්මලවූ; සීලං, ශීලයද; සදා, හැමකල්හි; පාලෙහි ඉති, රක්ෂාකරවයි වදාළසේක.

176. අසඞ්ඛකප්පාන'පි මත්ථකස්මිං
කතපුඤ්ඤකම්ම'මපි න නස්සතී'ති,
මනථ්වාන පුඤ්ඤස්ස විපාකමි'ච්ඡතා
ජහාථ දිවසං කුසලෙන ධීරා'ති.

ඉති, මෙසේ; අසඞ්ඛකප්පානං, අසඞ්ඛ්‍ය ගණන් කල්පයන්ගේ; මත්ථකස්මිං අපි, මත්තෙහිදු; කත, කරණලද; පුඤ්ඤකම්මං අපි, කුශලකර්මය පවා; න නස්සතීති, නොනැසේයයි; මන්වාන, දැන; පුඤ්ඤස්ස, පුණ්‍යකර්මයාගේ; විපාකං, විපාකය, ඉච්ඡතා, කැමැත් තාවූ; ධීරා, නුවනැතියෙනි (තෙපි); කුසලෙන, කුශලකර්මයෙහි යෙදීමෙන්; දිවසං ජහාථ, දවස් යවව්.

**ධම්මදින්නත්ථෙර වස්තුව, 9.**

---

177. යො වෙ'නත්ථා'වහං තණ්හං දූරෙ කත්වා නිරාසයො,
සද්ධං ච පුරතො කත්වා දෙය්‍යං දෙති ජිනො'රසෙ.

යො, යමෙක්තෙම; වෙ, ඒකාන්තයෙන්; අනත්ථාවහං, (නොයෙක්) අනර්ථලවන්නාවූ; තණ්හං, තෘෂ්ණාව; දූරෙ කත්වා, දුරීභූතකොට; නිරාසයො, ආසාරහිතවූයේ; සද්ධං ච, ශ්‍රද්ධාවද; පුරතො කත්වා, පෙරටුකොට; ජිනොරසෙ, සර්ඥපුත්‍රවූ සඞ්ඝරත්නයට; දෙය්‍යං, දෙයධර්මයක්; (හෙවත්) දානවස්තුවක්; දෙති, දෙයිද-

178. විපාකමහි ඵලං තස්ස න සක්කා උපමෙතවෙ,
ජායිත්වා අණුබීජමහා මහානිග්‍රොධපාදපො,
ඡාදෙත්වාන නභං යාති මහානීලමබුදෙ'පමො.

තස්ස, ඒ කුශලකර්මයාගේ; විපාකමහි, විපාකදානකාලයෙහිවූකලී; ඵලං, ඵලය; උපමෙතවෙ, උපමාකරන්ට; න සක්කා, නොහැක්කේය; අණුබීජමහා, (යම්සේ) ස්වල්පමාත්‍රවූ බිජුවටින්; මහානිග්‍රොධපාදපො, මහත්වූ න්‍යග්‍රොධ වෘක්ෂයක් තෙම; ජායිත්වා, හටගෙණ; මහානීලමබුදඋපමො, මහත් නීලමෙඝයක් උපමාකොට ඇත්තේ; නභං, ආකාශය; ඡාදෙත්වාන, වසා; යාති, නැගී සිටීද-

179. තථෙව අණුමත්ත'මපි බීජං කුසලසඤ්ඤිතං,
රොපෙති බුද්ධපුත්තස්ස සීලවන්තස්ස භූතලෙ.

තථාඑව, එපරිද්දෙන්ම; භූතලෙ, පොළෝතෙලෙහි (යමෙක්); අණුමත්තං අපි, ස්වල්පමාත්‍රවූද; කුසලසඤ්ඤිතං, කුසල් නැමැති;

බීජං, බිජුවටක්; සීලවන්තස්ස, සිල්වත්වූ; බුද්ධපුත්තස්ස, බුද්ධපුත්‍රයෙකුට (දන්දීම්වශයෙන්); රොපෙති, රොපනය කෙරෙයිද-

180. දෙවෙසු දිබ්බසම්පත්තිං තථා මානුසිකං සුඛං,
අන්තෙ නිබ්බාණසම්පත්තිං සො වින්දති අනූපමන්ති.

සො, ඒ ශ්‍රද්ධාවන්ත පුද්ගල තෙම; දෙවෙසු, දිව්‍යලොකයන්හි; දිබ්බසම්පත්තිං, දිව්සැපද; තථා, එසේම; මානුසිකං, මානුසිකවූ; සුඛං, සැපයද; අන්තෙ, කෙළවර; අනූපමං, උපමාවිෂයානික්‍රාන්තවූ; නිබ්බාණසම්පත්තිං; නිවන්සැපද; වින්දති, ලබයි.

181. කරොති හිත්වා'ලසියං ජනො යො
පුඤ්ඤානි අප්ප'මපි තථා බහු'මපි,
සො ජාතිජාතිසු අනාගතෙසු
තථා තථා වින්දති සබ්බසම්පදං.

යො ජනො, යම් ජනයෙක් තෙම; ආලසියං, අලසබව; හිත්වා, හැර; අප්පං අපි; ස්වල්පවූද; තථා, එසේම; බහුං අපි, බොහෝවූදූයි: පුඤ්ඤානි, පින්; කරොති, කෙරේද: සො, හෙතෙම; අනාගතෙසු, මතු අනාගතයෙහි; ජාතිජාතිසු, ජාතියක් ජාතියක් පාසා; තථා තථා, ඒ ඒ කුසල්වූ පරිද්දෙන්; සබ්බසම්පදං, සියලු සම්පත්; වින්දති, විඳී.

**රථිකපුත්‍ර වස්තුව, 10.**

## දුතිය යොධවග්ගො අට්ඨමො.

1. අහො ධම්මානුභාවො'යං සුගතස්ස මහෙසිනො,
අජාතිං ජාතිමන්තං සො කරොති ලොකපූජිතං.

මහෙසිනො, මහර්ෂිවූ; සුගතස්ස, සර්වඥයන්වහන්සේගේ; අයං, මේ; ධම්මානුභාවො, ධර්මානුභාවය තෙම; අහො, ආශ්චර්යයීමැයි (කුමක්හෙයින්දයත්); සො, ඒ ධර්මය තෙම; අජාතිං, ජාතිමත්නූවූ වහු (හීනජාතිකයෙකු); ජාතිමන්තං, ජාතිමත්වූ; ලොකපූජිතං, ලෝවැස්සන් විසින් පුදනලද්දෙකු; කරොති, කෙරෙයිද (එහෙයිනි).

2. නිද්ධනං ධනවන්තං ච අකුලීනං කුලග්ගතං,
දුම්මෙධං ච සුමෙධන්තං ධම්මො පාපෙති සබ්බදා.

ධම්මො, ඒ ධර්මය තෙම; නිද්ධනං, නිර්ධන සත්වයා; ධනවන්තං ච, ධනවතෙකුද (කෙරෙයී); අකුලීනං, නීචකුලිකයා (හෙවත්) කුල

යෙන් හීන නැනැත්තහු; කුලඞ්ගතං, උසස් කුල ඇතිබවටද; දුම්මෙධං, දුෂ්ප්‍රාඥයා (හෙවත්) අඥාන සත්වයා; සුමෙධසානං ච, සුප්‍රාඥභාවයටද; සබ්බදා, සෑම කල්හි; පාපෙති, පමුණුවයි.

3. සකණ්ටකා වතී ධම්මො අපායගමන'ඤ්ජසෙ,
සුසජ්ජිතො මහාමග්ගො සග්ගලොකස්ස ගාමිනො.

ධම්මො, ධර්ම්‍යතෙම; අපායගමනඅඤ්ජසෙ, අපායගාමිමාර්ගයෙහි; (බඳිනලද); සකණ්ටකා, කටුසහිතවූ; වතී, වැටක් වැනිවෙයි; සග්ගලොකස්ස, ස්වර්ගලොකයට; ගාමිනො, යනු කැමැත්තහුට; සුසජ්ජිතො, මොනවට සරසනලද; මහාමග්ගො, මහාමාර්ගයක් වැනි වෙයි.

4. ජරාරොගපහානෙ'සො සද්ධම්මො අමතා'ගදො,
තස්මා සො සෙවිතබ්බො'ව ජනකායෙන සාදරා.

එසො සද්ධම්මො, මේ සද්ධර්ම්‍ය තෙම; ජරාරොගපහානො, ජරා මරණාදි රොග නසන්නාවූ; අමතාගදො, අමා බෙහෙතක් වැනිය; තස්මා, එහෙයින්; සො, ඒ සද්ධර්ම්‍ය තෙම; ජනකායෙන, (සැපකැමැති) සත්වසමූහයා විසින්; සාදරා, සමාදරයෙන්; සෙවිතබ්බො එව, සෙවියයුත්තේමය.

5. සො'යං ධම්මිනි හො සුත්වා ලද්ධො මානුසිකං සිරිං,
කො තං ධම්මං න සෙවෙය්‍ය අත්ථකාමො ජනො හි කි'නාති.

හො, පින්වත්නි; සො අයං ධම්මිනි, ඒ මේ ගෘහසපි (ගැරණි) තෙම; ධම්මං, ධර්ම්‍ය; සුත්වා, අසා; මානුසිකං සිරිං, මානුසිකසම්පත්; ලද්ධො, ලැබිය: හි, එහෙයින්; අත්ථකාමො, තමහට වැඩකැමැත් නාවූ; කො ජනො, කවරනම් ජනයෙක් තෙම; තං, ඒ ධර්ම්‍ය; කිනාති නසෙවෙය්‍ය, කුමැයි සෙවනය නොකරන්නේද (සෙවනය කෙරේමැයි).

6. සුණන්තු සන්තො අමතං ජිනෙරිතං
භජන්තු පූජෙන්තු උපාසයන්තු තං,
ඨානෙ ච ගමනෙ සයනාසනෙ ච
සරන්තු තං හොති සදා පරායනං.

සන්තො, ශ්‍රද්ධාවත් සත්පුරුෂයෝ තුමූ; අමතං, කාණ්ණාමෘතවූ; ජිනරිතං, ජිනෙන්‍ද්‍රයන්වහන්සේවිසින් වදාරණලද්දාවූ (ධර්ම්‍ය); සුණන්තු, අසත්වා; තං, ඒ ධර්ම්‍ය; භජන්තු, භජනයකෙරෙත්වා; පූජෙන්තු, පුදත්වා; උපාසයන්තු, උපාසනයකෙරෙත්වා; ඨානෙ ච,

සිටීමෙහිද; ගමනෙ, යාමෙහිද; සයනාසනෙ ච, සයනාසනයෙහිද (හෙවත්) සැතපීමය හිඳීමය යන ඉරියව්වෙහිද; සරනතු, සමරණය කෙරෙත්වා; සදා, හැමකල්හි; තං, ඒ ධර්‍මය; පරායනං හොති, තමහට ප්‍රතිෂ්ඨාවේමැයි.

## සිලුහත වස්තුව, 1.

---

7. සුතං මේ'තං මහානාග ධම්මං ධම්මිස්සරී'රිතං,
සබ්බූපද්දවවිද්ධංසිං මධුරං රතිවඩ්ඪනං.

මහානාග, එම්බා මහානාගරාජය; ධම්මිස්සර, ධර්‍මේශ්වරවූ බුදුරජානන්වහන්සේ විසින්; ඊරිතං, (සියලු සත්වයන්ට වැඩපිණිස) වදාරණලද්දාවූ; සබ්බූපද්දවවිද්ධංසිං, සියලු උවදුරු නාසනසුලුවූ; මධුරං, (සියලු රසජාතීන්ට වඩා) මිහිරිවූ; රතිවඩ්ඪනං, ඇලුම් උපදවන්නාවූ; එතං, මේ; ධම්මං, (මාහැඟි) ධර්‍මයක්; මෙ, මාවිසින්; සුතං, අසන ලදී.

8. තස්ස මේ'නුස්සරන්තස්ස භයං නා'හොසි කිඤ්චනං,
තථාහි ධම්මො නාගින්ද වම්මො'ච වජිරූපමො'ති.

නාගින්ද, එම්බා නාගෙන්ද්‍රය; අනුස්සරන්තස්ස, ධර්‍මානුස්මරණය කරන්නාවූ (හෙවත්) ඒ ධර්‍මය සඳහන්කරන්නාවූ; තස්ස මෙ, ඒ මට; කිඤ්චනං භයං, කිසිභයක්; න අහොසි, නූවූයේය; තථාහි, ඒ එසේමය; ධම්මො, ධර්‍මය (වනාහි); වජිරූපමො, විදුරුමුවාවූ; වම්මො ඉව, (ආත්මරක්‍ෂණය පිණිස ශරීරයෙහි බහාගත්) සන්නාහයක් වැනිය.

9. අහ'මපිසොතු'මිච්ඡාමි ධම්මං සුගතදෙසිතං,
සුතං තෙ අවිනාසෙත්වා මය්හම්පි වද තං සඛෙ'ති.

සඛෙ, එම්බා යහලුව; සුගතදෙසිතං, සර්‍වඥදෙශිතවූ; ධම්මං, ධර්‍මය; සොතුං, අසන්ට; අහං අපි, මමද; ඉච්ඡාමි, කැමැත්තෙමි; තෙ, නුඹවිසින්; සුතං, අසනලද්ද; අවිනාසෙත්වා, නොනසා; තං, ඒ ධර්‍මය; මය්හං අපි, මටද; වද, කියව.

10. අධිමත්තානි පාපානි අවිසඞ්කා කරොන්ති* යෙ,
නිරයෙ තෙ මහාඝොරෙ උප්පජ්ජන්ති අසංසයං.

---

* "චරන්ති" සඞ්මෙවාපායන.

යෙ, (ප්‍රාප්තවූ) යම්කිසිකෙණෙක්; අවිසඞ්කා, සැකරහිතවූවාහු; අධිමත්තානි, අධිකමාත්‍රවූ; පාපානි, (ප්‍රාණාතිපාතාදී) පාපයන්; කරොන්ති, කෙරෙද්ද; තෙ, ඒ සත්වයෝ; මහාඝොරෙ, මහත් දරුණුවූ; නිරයෙ, නරකයෙහි; අසංසයං, නිසැකව (නොහොත්) එකාන්තයෙන්; උපපජ්ජන්ති, උපදිත්.

11. චතුක්කණ්ණො චතුද්වාරො විභත්තො භාගසො මිතො,
අයොපාකාරපරියන්තො අයසා පටිකුජ්ජිතො.

චතුක්කණ්ණො, (ඒ මහානරකය තෙම) කොන් සතරක් ඇත්තේය (හෙවත්) හතරැස්ය; චතුද්වාරො, දොර සතරක් ඇත්තේය; භාගසො, කොටස්වශයෙන්; විභත්තො, විභාගකරණ ලද්දේය; මිතො, ප්‍රමාණකරණලද්දේය; අයොපාකාරපරියන්තො, යපවරෙන් වටකරණ ලද්දේය; අයසා, යපියන්පතින්; පටිකුජ්ජිතො, වසනලද්දේය.

12. තස්ස අයොමයා භූමි ජලිතා තෙජසායුතා,
සමන්තා යොජනසතං ඵරිත්වා* තිට්ඨති සබ්බදා.

තස්ස, ඒ මහානරකයාගේ; අයොමයා, යමුවාවූ; භූමි, භූමිතොමෝ; තෙජසා, (වහ්නි) තෙජසින්; යුතා, යුක්තවූවා; ජලිතා, ජ්වලිතවෙයි; සබ්බදා, හැමකල්හි; සමන්තා, හාත්පස; යොජනසතං, යොදුන් සියයක්; ඵරිත්වා පැතිරගෙණ; තිට්ඨති, සිටී.

13. කතපාපො'පි යං දුක්ඛං ඝනජාලානිරන්තරො,
ජලමානඞ්ගපච්චඞ්ගො අනුභොති අවීචියං.

14. විස්සරං විරවන්තො'පි විධාවන්තො† ඉතො තතො,
තස්සෙ'කදෙසමත්ත'මපි කො සමත්ථො විභාවිතුං.

කතපාපො අපි, කරණලද පව් ඇත්තේද; අවීචියං, (මේ) අවීචි මහානරකයෙහි; ඝනජාලානිරන්තරො, බහලවූ ගිනිදලින් අතරක් නැත්තේ; ජලමානඞ්ගපච්චඞ්ගො, දිලියෙන අඟපසඟඇත්තේ; ඉතො තතො, ඔබමොබ; විධාවන්තො, දුවමින්; විස්සරං, බැගැපත්ව; විරවන්තො, හඬමින්; යං දුක්ඛං, යම් දුඃඛයක්; අනුභොති, අනුභවකෙරේද; තස්ස, ඒ දුඃඛයාගේ; එකදෙසමත්තං අපි, එකදෙශමාත්‍රයකුත්; විභාවිතුං, ප්‍රකාශකරන්ට; කො, කවරෙක් තෙම; සමත්ථො, පොහොසත්ද.

---

* "ඵුටා." † "ධාවන්තොව." සද්ධම්මොපායනයෙහි.

15. යස්ස අයොමයොනද්ධං අග්ගිජාලං බහලම්පි ච,
අන්තො අග්ගිජ්වාදිත්තාව මනන්තං අණ්ණවොදකං,*
චතුද්දිසානො පක්ඛන්තං ඛණෙන යදි සුස්සති.

යස්ස, යම් නරකයක්හුගේ; අන්තො, අභ්‍යන්තරය; අයොමයොනද්ධං, යමුවා පියනින් වසනලද්ද; බහලං, ඝනවූයේ; අග්ගිජාලං, ගිනිදල් ඇතිවේද; අග්ගිජාලාදිත්තං, ගිනිදූලින් ආදීප්තද (ඒ කණ කොට); අනන්තං අප්‍රමාණවූ; චතුද්දිසානො, සිව්දිගින්; පක්ඛන්තං, (වඩබාමුඛයෙන්) පැන ආවාවූ; අණ්ණවොදකං, අර්ණවජලය; ඛණෙන, ක්ෂණයකින්; යදි, ඉදින්; සුස්සති, ශුෂ්කවේද (වියළේද).

16. තස්සන්තො වසමානස්ස† සුඛුමාලසරීරිනො,
මිලියමානගත්තස්ස ආතුරස්ස විඵන්දනො.

17. ඛලන්තස්ස පතන්තස්ස මුච්ඡන්තස්ස මුහුං මුහුං,
අසහං ගහිතුං තස්ස‡ ආයාසෙන විකම්පතො.

18. විලපන්තස්ස කරුණං අනාථස්ස විචින්තතො,
අසය්හ මතුලං තිබ්බං කො දුක්ඛං වණ්ණයිස්සති.

තස්ස, ඒ නරකයාගේ; අන්තො, අභ්‍යන්තරයෙහි; වසමානස්ස, වාසයකරන්නාවූ; සුඛුමාලසරීරිනො, සිව්මැලි සිරුරුඇති; මිලියමානගත්තස්ස, හුණුවියන ගාත්‍රඇති; ආතුරස්ස, (දුකින්) ආතුරවූ; විඵන්දනො, විශෙෂයෙන් කම්පමානවූ;--ඛලන්තස්ස, ප්‍රස්ඛලනයකරන්නාවූ (හෙවත්) පැකිලෙන්නාවූ; මුහුං මුහුං, කෙණෙහි කෙණෙහි; මුච්ඡන්තස්ස, මුසපත් වන්නාවූ; අසහං නිහීයස්ථානයක්; ගහිතුං, ගන්ට; පතන්තස්ස, පතිතවන්නාවූ; ආයාසෙන, (දැඩිවූ) ආයාසයෙන්; විකම්පතො, විශෙෂයෙන් වෙව්ලන්නාවූ;--කරුණං, බැගෑපත්සේ; විලපන්තස්ස, වැලපෙන්නාවූ; අනාථස්ස, අසරණවූ (හෙවත්) පිළිසරණක් නැත්තාවූ; විචින්තතො, චින්තාපරවශවූ (පිහිට සොයන්නාවූ); තස්ස; ඔහුගේ; අතුලං, අසදෘශවූ; අසය්හං, නොඉවසියහැක්කාවූ; තිබ්බං, තීව්‍රවූ; දුක්ඛං, දුක; කො, කවරෙක් තෙම; වණ්ණයිස්සති, වර්ණනා කරන්නේද; නොකරන්නේමැයි.

---

* "යස්සායොමයි මොනද්ධං කපාලං බහලම්පි ච,
අන්තො අග්ගි ජවාදිත්තං අනන්තං අණ්ණවොදකං."
† "වත්තමානස්ස." ‡ "ආසාභඞ්ගාභිතුන්නස්ස."
සද්ධම්මොපායනයෙහි. I

19. සිම්බලිං'යොමයං ථූල* සොළසඞ්ගුලකණ්ටකං,
ජාලමාලාපරික්ඛිත්තං උඩ්ඩං යොජනමු'ග්ගතං.
චණ්ඩෙහි යමදූතෙහි තාඩියන්තො† පුනප්පුනං.

20. විද්ධො පතොදයට්ඨීහි සත්තියාදීහි චා'හතො.
ජලමානඞ්ගපච්චඞ්ගො‡ විරවන්තො ච විස්සරං,
භීතො රුදම්මුඛො දීනො ආරුහන්තො පුනප්පුනං.

චණ්ඩෙහි; චණ්ඩවූ; යමදූතෙහි, යමදූතයන්විසින්; පතොදය ට්ඨීහි, කෙවිටිවලින්; පුනප්පුනං, නැවත නැවත; තාඩියන්තො, තළනුලබන්නේ; විද්ධො, (එයින්ම) විදිනලද්දේ; සත්තියාදීහි ච, අඩයටි හුල් ආදියෙන්ද; ආහතො, පහරණලද්දේ; ජලමාන, දිලිසෙන්නාවූ; අඞ්ගපච්චඞ්ගො, අඟපසඟඇත්තේ; විස්සරං, බැගෑපත්ව; විරවන්තො, හඬින්නේ; භීතො, බියපත්වූයේ; රුදම්මුඛො, හඬන මුහුණු ඇත්තේ; දීනො, දීනවූයේ; ථූල, සථූල (මහත්) වූ; සොළසඞ්ගුලකණ්ටකං, සොළසඟුල් දිග කටුඇති; යොජනං, යොදුනක්; උඩ්ඩං, උඩට; උග්ගතං; උද්ගතවූ; ජාලමාලාපරික්ඛිත්තං, ගිනිදැල් සමූහයෙන් පිරිවැටූ; අයොමයං, යමුවාවූ; සිම්බලිං, කටුඉඹුලට; පුනප්පුනං, නැවත නැවත; ආරුහන්තො, නගින්නේ-

21. උබ්බත්තන්තාන තු මුඛං උදික්ඛන්තො'ව රක්ඛසෙ,
භයෙන විනිම්ලෙන්තො අඞ්ගමඞ්ගෙන ගුහයං.

මුඛං, මුහුන; උබ්බත්තන්තාන තු, උඩටනගා; රක්ඛසෙ, රකුසන්; උදික්ඛන්තො ඉව, දකින්නෙක් මෙන්; භයෙන, භීතියෙන්; විනිම්ලෙන්තො, ඇස්පියාගන්නේ; අඞ්ගෙන, අවයවයෙන්; අඞ්ගං, (තම) අවයවය; ගුහයං, වසන්නේ--

22. අලද්ධා ලියනඨානං වෙධමානො විචෙතනො,
අනුභොති හි යං දුක්ඛං තස්ස කා උපමා සියා.

ලියනඨානං, ගුප්තස්ථානයක් (හෙවත්) සැඟවීමට තැනක්; අලද්ධා, නොලැබ; වෙධමානො, වෙවුලන්නේ; විචෙතනො, විකලවූ සිත්ඇත්තේ (ඒ නෙරයිකපුද්ගල තෙම); යං දුක්ඛං, යම්දුකක්; අනුභොති; අනුභවකෙරේද; තස්ස, ඊට; කා උපමා හි, කවර නම් උපමාවක් තොමෝ; සියා, වන්නීද;

---

* "සිම්බලිං ආයසථූලං." † "දණ්ඩියන්තො."
‡ "විජ්ජලිතඞ්ගපච්චඞ්ගො"--යනු සද්ධම්මොපායනයෙහි.

23. ඒකන්තදුක්ඛා නිරයා යතො එවං සුදාරුණා,
න අක්ඛානෙන පත්තබ්බමිති තස්මා ජිනො'බ්‍රවි.

යතො, යම්හෙයකින්; සුදාරුණා, ඉතා දරුණුවූ; නිරයා, නරකයෝ තුමූ; එවං, මෙසේ (හෙවත්) උක්තප්‍රකාරයෙන්; ඒකන්ත දුක්ඛා, එකැතියෙන් දුක්ඇත්තාහුද; තස්මා, එහෙයින්; අක්ඛානෙන, (නැවත නැවත) ප්‍රකාශකිරීමෙන්; න පත්තබ්බං ඉති, (කෙළවරට) නොපැමිණී හැකියයි; ජිනො, (පස්මරුන්) දිනූ බුදුරජානන්වහන්සේ; අබ්‍රවී, (මෙසේ) වදාළසේක; (කෙසේදයත්?)

24. යථා හි අන්තරං දූරං අග්ගිනො චන්දනස්ස ච,
තථෙව අන්තරං දූරං නිරයග්ගි ඉධග්ගිනං.

යථා හි, යම්සේ වනාහි; අග්ගිනො, වහ්නිහුගේද; චන්දනස්ස ච, චන්දන කල්කයාගේද යන (දෙදෙනාගේ); අන්තරං, අතර (හෙවත්) ඔවුනොවුන්ගේ වෙනස; දූරං, ඉතා දුරවේද; තථාඑව, එපරිද්දෙන්ම; නිරයග්ගි, නරකාග්නිය; ඉධ අග්ගිනං, මෙලෙව්හිවූ වහ්නිය යනමොවුන් සම්බන්ධවූ; අන්තරං, අතර; දූරං, ඉතා දුරයි.

25. තිසත්තිසතවිද්ධස්ස යං දුක්ඛම'චින්තියං,
තං නෙරයිකදුක්ඛස්ස හිමවා සාසපන්තරං.

තිසත්තිසත, සැත් තුන්සියයකින්; විද්ධස්ස, හනිනලද්දහුට; අචින්තියං, නොසිතිය හැකිවූ; යං දුක්ඛං, යම් දුකෙක් වේද; තං, ඒ දුඃඛය; නෙරයිකදුක්ඛස්ස, නිරිසත්හුගේ දුකට (කෙපමණ දුරද); හිමවා, හිමවත්පර්වතය හා; සාසපන්තරං, (අසමානත්වයෙන්) අබැට දුරවූවාක් මෙනි.

26. අවීචි ගූථනිරයො කුක්කුලං කොටිසිම්බලි, *
අසිපත්තවනං චේ'ව තථා ඛාරොදිකා නදී.

27. අඞ්ගාරපබ්බතොවා'පි සංඝාතො රොරුවො'පිච, †
කාලහත්ථි මහායන්තො ලොහකුම්භාදිකා'පිච.

අවීචි, අවීචිමහානරකය; ගූථනිරයො, ගූථනරකය; කුක්කුලං, කුක්කුල (හුණුඅළු) නරකය; කොටිසිම්බලී, කොළහිඹුල්නරකය (හෙවත්) ශාල්මලීවනය; අසිපත්තවනං ච එව, අසිපත්‍රවනයද; තථා, එසේම; ඛාරොදිකානදී, ක්ෂාරොදිකානම් නදියද; අපිච, තවද; අඞ්ගාරපබ්බතො, අඞ්ගාර පර්වතය; සංඝාතො, සංඝාතනරකය;

* "කූටසිම්බලී." † "සංඝාතං රොරුව'මපිච."

රෞරුවෝ, රෞරවනරකය; කාලහඤ්ඤි, කාලසූත්‍රනරකය; මහා යන්‍තා, මහාරෞරවය; ලොහකුම්භාදීකාපිච, ලොහොකුම්භනරකය යන මේ ආදිහු වෙත්.

28. අම්තා දුස්සහා භීමා ඝොරා'තිභයදාරුණා*
මහාදුක්ඛා'නුභොතබ්බා නිරයෙ පාපකම්මිනා.

පාපකම්මිනා, පාපකම් ඇත්තහු විසින්; නිරයෙ, (උක්තප්‍රකාර) නරකයෙහි; අම්තා, අප්‍රමාණවූ; දුස්සහා, ඉවසිය නොහැකිවූ; භීමා, බිහිසුණුවූ; ඝොරා, ඝොරවූ; අතිභයදාරුණා, අතිශයභීතීන් දරුණුවූ; මහාදුක්ඛා, මහත්දුක්; අනුභොතබ්බා, අනුභවකටයුත්තාහුය.

29. එතෙසු එකමෙකස්ස විපාකො'පි අනප්පකො,
දුබ්බචො අථ නිසෙසසං නෙකවස්සසතෙසු'පි.

එතෙසු, මොවුන්හි; එකමෙකස්ස, එකෙක්හුගේ; විපාකො අපි, (දුඃඛ) විපාකයද; අනප්පකො, බොහෝයි; අථ, ඉක්බිති; නෙකවස්සසතෙසුපි, නොයෙක් වෂ්සියගණනෙක්හි (කියාත්); නිසෙසසං, නිරවශෙෂකොට; දුබ්බචො, (විපාකය කිය) නොහැකිවෙයි.

30- තං හි නෙරයිකං දුක්ඛං ඵුසිත්‍වා වෙදිතබ්බකං,
වදනෙතා'පි ච නිසෙසසං කථං තං දීපයිස්සති.

තං, ඒ යටකීප්‍රකාරඇති; නෙරයිකං දුක්ඛං, නිරය දුක; ඵුසිත්‍වා, සපශීකොට (අනුභවකොට); වෙදිතබ්බකං හි, දතයුතුවේමැයි; වදනෙතාඅපි ච, කියන්නේනමුදු; තං, ඒ නිරයදුක; කථං, කෙසේ; නිසෙසසං, නිරවශෙෂකොට; දීපයිස්සති, දක්වන්නේද;

31. එත්‍ථ අගගී'ති වුතෙන'ච කිනනු පාදෙ දහිස්සති,
අසද්දහනෙතා අක්කනෙතා දුක්ඛං පපෙපාති දාරුණං.

එත්‍ථ, මෙහි; අගගි ඉති, ගිනියයි; වුතෙන එව, කීකෙණෙහිම; පාදෙ, පාදයනෙම; කිනනු දහිස්සති, කුමැයි දවෙන්නේද (නොදවේමය); අසද්දහනෙතා, (මෙරමා බස්) නොඅදහමින්; අක්කනෙතා, (ගින්න) පෑගුයේ; දාරුණං, දරුණුවූ; දුක්ඛං, දුකට; පපෙපාති, පැමිණෙයි.

32. තස්මා ඉසීනං වචනං සද්දහනෙතා විචක්ඛණො,
පාපකම්මානි වජ්ජෙත්‍වා න තං පපෙපාති ආලයං.

---

* "ඝොරා භදය දාරුණා."

හසවා, එහෙයින්: ඉසීනං, (බුඩාදි) ඍෂින්වහන්සේලාගේ; වච නං, වචනය; සද්දහනෙතා, අදහන්නාවූ; විචක්ඛණෙ, විචක්‍ෂණ තෙම (හෙවත්) නුවනැත්තේ; පාපකම්මානි, (ප්‍රාණඝාතාදි) පාප කර්‍ම; වජ්ජෙත්වා, දුරුකොට; තං ආලයං, (පව්කිරීමෙහි) ඒ අභිලාෂයට (නොහොත් ඒ නරකාවාසයට); න පපෙපාති, නොපැමිණෙයි.

33. කණ්ටකෙන පවිඩස්ස සතබින්‍දුවිලියනං,
යාවතා අගහිදහො'පි පතිකාරොපි දුක්ඛමො.

කණ්ටකෙන, කටුවකින්; පවිඩස්ස, විදුනු තැනක් සම්බන්ධව; සතබින්‍දු, ගිතෙල් බින්‍දුහුගේ; විලියනං, හුණුවීම (හෙවත් උණුයි තෙල්බින්‍දු හෙලීමක් වේද එකල්හි); පතිකාරො අපි, ප්‍රතිකාරයවූද; අගහිදහො, වහනිදහය (ගින්නෙන්දැවීම); යාවතා, යම්තාක්; දුක්ඛමො අපි; ක්‍ෂම නොවේද (එසේකල්හි);

34. නෙකවස්සසහස්සෙසු නිරයෙ තිබ්බගගිනා,
එකජාලීකතානං කො දුක්ඛස්සනතං කථං වදෙ. *

නිරයෙ, නරකයෙහි; නෙකවස්සසහස්සෙසු, අනෙකවර්‍ෂසහස්‍ර යන්හි; තිබ්බගගිනා, තීක්‍ෂණවූ වහනියෙන්; එකජාලීකතානං, එකවහනිජවාලීකෘත (හෙවත්) හාත්පස ගිනිඇවිලගන්නාලද්ද වුන් සම්බන්ධවූ; දුක්ඛස්ස, (නිරය) දුඃඛයාගේ; අනතං, කෙළවර; කො, කවරෙක් තෙම; කථං, කෙසේනම්; වදෙ, කියන්නේද?.

35. එකගහිකතිනනභූතා'පි † කම්මෙන පරිරුන්ධිතා,
නිරයෙ'යෙව ජීවනති අහො කම්මං සුදාරුණං.

කම්මෙන, (පාප) කර්‍මයවිසින්; පරිරුන්ධිතා, හාත්පසින් අවුර ණලදුව; එකගහිකතිනන, එකගිනිගොඩෙහි වැටුනාවූ; භූතා අපි, සත්වයෝද; නිරයෙ එව, නරකයෙහිම; ජීවනති, ජීවත්වෙති; අහො, බෙදයකි; කම්මං, පාපකර්‍මයනම්; සුදාරුණං, ඉතා දරුණුයි.

36. අතිමන්‍දසුඛස්සත්ථං යං මුහුත්තෙන කිබ්බිසං,
කතං තස්සා'තුලං කාලං ඵලං යදිතු ඊදිසං.

මුහුත්තෙන, මොහොතක (ලබන); අතිමන්‍දසුඛස්සත්ථං, ඉතා මඳ සැපයක් සම්බන්ධ ප්‍රයොජනය උදෙසා; යං කිබ්බිසං, යම් පවක්;

* "දුක්ඛස්ස ධමනං වදෙ."  † "එකගගිකබන්ධභූතාපි."

කතං, කරණලද්දේද; අතුලං කාලං, අතුල්‍ය කලක් මුලුල්ලෙහි (විඳිනු ලබන); තස්ස ඵලං, ඒ සම්බන්ධ විපාකය; යදිතු, ඉදින් වනාහි; ඊදිසං, මෙබඳු නම්:

37. කො මානුසිකදුක්ඛෙන මහන්තෙනා'පි අට්ටිතො,
මුහුත්තමපි අනුම්මත්තො කරෙ පාපාදරං නරො.

මහන්තෙනඅපි, මහත්වූද; මානුසිකදුක්ඛෙන, මානුෂිකදුඃඛයෙන්; අට්ටිතො, පීඩිතවූ; අනුම්මත්තො, උමතුනොවූ; කො නරො, කවර නම් මනුෂ්‍යයෙක් තෙම; මුහුත්තං අපි, මොහොතක් පමණකුදු; පාපාදරං, පාපකර්මාභිලාෂය (පාපයෙහි ඇල්ම); කරෙ, කරන්නේද; (නොකරන්නේමය).

38. අහො මොහානුභාවො'යං යෙනා'යං පරිමොහිතො,
එවං දුක්ඛාවහං කම්මං කරොති සුඛමත්ථිකො.

යෙන, යම්හෙයකින්; පරිමොහිතො, මුළාවූ; අයං, මේලෙව්වැසි තෙම; සුඛමත්ථිකො, සැපකැමැත්තේ; එවං, මෙසේ; දුක්ඛාවහං, දුක් ඵලවත්නාවූ; කම්මං, පාපකර්මය; කරොති, කෙරෙයි; අයං, මේ; මොහානුභාවො, මොහයාගේ ආනුභාවය; අහො, ආශ්චර්‍ය්‍යයි.

39. භායිතබ්බං හි පාපානො එවං දුක්ඛඵලං යතො,
කුසලෙ ආදරො නිච්චං කත්තබ්බො දුක්ඛභීරුණා.

යතො, යමකින්; එවං, මෙසේ; දුක්ඛඵලං, දුක් විපාකය(වේද); පාපානො, (එබඳු) පාපක්‍රියාවෙන්; භායිතබ්බං හි, බියවිය යුතුමය; දුක්ඛභීරුණා, දුකට බනසුල්ලහු විසින්; නිච්චං, සතතයෙන්; කුසලෙ, කුසල්කිරීමෙහි; ආදරො, ආදරය තෙම; කත්තබ්බො, කටයුතුය.

40. පදිත්තඞ්ගාරකාසුං'ව පපාතං'ව භයානකං,
පස්සන්තො දුග්ගතිමග්ගං පාපං සම්පරිවජ්ජයෙ.

පදිත්ත, දිලියෙනලද; අඞ්ගාරකාසුං ඉව, අඟුරුවළක්මෙන්ද; භයානකං, බිහිසුනුවූ; පපාතං ඉව, ප්‍රපාතයක්මෙන්ද; දුග්ගතිමග්ගං, දුර්ගතිමාර්ගය; පස්සන්තො, දක්නා තැනැත්තේ; පාපං, පාපකර්මය; සම්පරිවජ්ජයෙ, දුරුකරන්නේය.

41. අමතෙ ච විසෙ චා'පි යථා හත්ථගතෙ නරො,
අනාදියිත්වා අමතං විසං භුඤ්ජෙය්‍ය දරුණං.

යථා, යම්සේ; අමතෙ ච, අමෘතරසයක්ද; විසෙ ච අපි, විෂයක්ද; හත්ථගතෙ, අතට පැමිණිකල්හි; නරො, මනුෂ්‍යතෙම; අමතං, අමෘතරසය; අනාදියිත්වා, නොමගෙණ; දරුණං, දරුණුවූ; විසං, විෂය; භුඤ්ජෙය්‍ය, අනුභවකරන්නේද.

42. එවං හි සම්පද'මිදං ලභිත්වා මානුසං භවං,
පුඤ්ඤකම්මං විවජ්ජෙත්වා පාපකම්මා'භිසෙවනං'ති.

මානුසං භවං, මනුෂ්‍යාත්මභාවය; ලභිත්වා, ලබා; පුඤ්ඤකම්මං, පින්කිරීම; විවජ්ජෙත්වා, දුරුකොට; පාපකම්මාභිසෙවනං, පව්කම් සෙවීමය (යනයමක්) වේද; ඉදං, ඒ මේ කාරණයද; එවං හි සම්පදං, එසේමැයි,

43. පමාද'මාපජ්ජ පුරෙ පනෙ'කෙ
මොහෙන පච්ඡා පණුදිත්ව මොහං,
චරන්ති ධම්මෙ සුගතප්පසත්‍ථෙ
තෙ වෙ ජනා හොන්ති ජිනප්පසත්‍ථා'ති.

එකෙ පන, ඇතැම්කෙණෙක් වනාහි; පුරෙ, පළමුවන වයසෙහි; මොහෙන, මුළාවෙන්; පමාදං, (කුසල්කිරීමෙහි) ප්‍රමාදයට; ආපජ්ජ, පැමිණ; පච්ඡා, පසුව; මොහං, මුළාව; පණුදිත්ව, (උත්තමයන්ගේ අවවාද ගිවිස) අතහැරදමා; සුගතප්පසත්‍ථෙ, සුගතයන්වහන්සේ විසින් පසස්නාලද; ධම්මෙ, ධර්මයෙහි; චරන්ති, හැසිරෙද්ද; තෙ ජනා, ඒ ජනයෝ තුමූ; වෙ, එකාන්තයෙන්; ජිනප්පසත්‍ථා හොන්ති, සර්වඥයන්වහන්සේ විසින් පසස්නාලද්දහු වෙත්.

### නෙසාද වණ්ණනාව, 2.

---

44. රාගයක්ඛිණියා විට්ඨා රාගෙනා'තිවිමොහිතා,
කාරණා'කාරණං කිඤ්චි න ජානන්ති හිතා'හිතං.

රාගයක්ඛිණියා, රාග නැමැති යක්ෂිණිය විසින්; ආවිට්ඨා, ආවිෂ්ට (ආවේශ)වූ; රාගෙන, රාගය කරණකොටගෙණ; අතිවිමොහිතා, අතිශයින් මුළාවූවාහු; හිතාහිතං, (තමහට) හිතවූද අහිතවූද; කිඤ්චි කාරණාකාරණං, කිසිම කාරණාකාරණයක් (හෙවත්) කටයුතු නොකටයුතු කිසිවක්; න ජානන්ති, නොදනිත්.

45. තස්මා මාතාපිතුන්න'ම්පි ඤාතිමිත්තහිතෙසිනං,
අජානෙත්වා'ව එකා'ව රාගවෙගෙන චම්මිතා.

තස්මා, එහෙයින්; (ඒ කුමාරිකා තොමෝ) මාතාපිතුන්නං අපි, මව්පියන්ටද; ඤාතිමිත්තහිතෙසිනං, ඤාතිමිත්‍රයන් හා හිතෛෂීන් ටද; අජානෙත්වා එව, නොහඟවාම; එකා එව, හුදකලාවූවාම; රාගවෙගෙන, රාගනැමැති සන්නාහයෙන්; චම්මිතා, සන්නාඬවූවා.

46. ජාලෙන්වා රාගපජ්ජොතං රත්තියං තිමිරෙ ඝනෙ,
බානුකණ්ටකපාසානබහුලෙ විසමඤ්ජසෙ.

රත්තියං, රාත්‍රියෙහි; ඝනෙ, ඝනවූ; තිමිරෙ, අන්ධකාරයෙහි; රාග පජ්ජොතං, රාගනැමැතිප්‍රදීපය; ජාලෙත්වා, දල්වාගෙණ; ඛානු කණ්ටක, කනුකටුය; පාසාන, ගල්ය (යන මේ); බහුලෙ, බහුල කොට ඇති; විසමඤ්ජසෙ, විෂමමාර්ගියෙහි:—

47, අජගරොරගසද්දූලඅච්ඡව්‍යාලකුලාකුලෙ,
උණ්ණාසකුනහුංකාරඅසිවොරුසිවාරුතෙ.

අජගර, පිඹුරුය; උරග, සර්පය; සද්දූල, දිවිය; අච්ඡ, වලස්ය; ව්‍යාලකුල, චණ්ඩමෘගය යනමේ සමූහයාගෙන්; ආකුලෙ, ගහණවූ; උණ්ණාසකුන, උලලිහිණිය; හුංකාර, බකමූහුණුය; අසිවොරු, සුනඛය; සිවා, කැණහිල්ය යන මොවුන්ගේ; රුතෙ, භයඞ්කාර නාදඇති:—

48. යක්ඛපෙතපිසාචාදිභයභෙරවසංකුලෙ,
ආමපක්කසුසානෙසු න ගණෙන්ති මහබ්භයං.

යක්ඛ, යක්ෂය; පෙත, ප්‍රෙතය; පිසාචාදි, පිසාචය යන මේආදීන් ගෙන්; භයභෙරවසංකුලෙ, භය හා භයජනක අරමුණුවලින් ගැව සුනාවූ; ආමපක්කසුසානෙසු, අමුසොහොන් (මිනීදමන සොහොන්) හි; මහබ්භයං, මහත්වූ භය; න ගණෙන්ති, නොසලකන්නී:—

49. කත්වාන දුතියං තණ්හං දළ්හමානසආවුධං,
ධාරෙන්ති ආරුහි මග්ගං ගහණං චනසංයුතං.

තණ්හං, (තමාගේ) කාමතෘෂ්ණාව; දුතියං කත්වාන, (දෙවෙනි) සහායකොට; දළ්හමානසආවුධං, දෘඪවූ සිත්නැමැති ආයුධයක්; ධාරෙන්ති, දරන්නී; චනසංයුතං, නොයෙක් උපද්‍රවයෙන් යුක්තවූ; ගහණං මග්ගං, වනමාර්ගයට; ආරුහි, නැංගේය (හෙවත්) පිළිපන් නේය.

50, කුම්භීලමකරාකිණ්ණං මහාවීචිසමාකුලං,
සමුද්දං'මපි තරන්ති සා අගා'පගතභෙරවා.

කුම්භීල, කිඹුල්ය; මකර, (දූනි) මොහොරය (යනමොවුන් ගෙන්); ආකිණ්ණං, ආකීර්ණ (ගැවසිගත්තා) වූ; මහාවීචි, මහත්වූ රළ පතරින්; සමාකුලං, ගැවසීගත්තාවූ; සමුද්දං අපි, (එබඳු) සමුද්‍රය පවා; තරන්ති, තරණයකරන්නීවූ; සා, ඒ කුමාරිකා තොමෝ; අප ගතභෙරවා, පහවගිය භයඇත්තී; අගා, ගියාය.

51. භාසාම'හන්ති යා කඤ්ඤා යදි භාසෙය්‍ය විඤ්ඤුනා,
න තං මනසි කාතබ්බං භයං තාසං තු කිත්තිමං.

යා කඤ්ඤා, යම් ස්ත්‍රියක් තොමෝ; අහං, මම; භාසාමි ඉති, බමියි; යදි, ඉදින්; භාසෙය්‍ය, කියන්නීනම්; විඤ්ඤුනා, නුවණැත්තහු විසින්; තං, ඒ බමි යන වචනය; මනසි, සිත්හි; න කාතබ්බං, නොකටයුතුයි (කුමක්හෙයින්දයත්?); තාසං භයං තු, ඔවුන්ගේ ත්‍රාසය වනාහි; කිත්තිමං, ක්‍රියානිෂ්පන්න මාත්‍රයක්ම වේද එහෙයිනි.

52. වීචිසතා'රෙ ඵෙණවිකිණ්ණෙ සලිලමගාධෙ චන්දසමවත්තා,
තුව'මභිරූපා නීලතරක්ඛි ජලපිහිතඞ්ගී කාසි තරන්තී, *

අරෙ, එම්බා සොඳුර; වීචිසතෙ, සියගණන් රළපතර ඇති; ඵෙණවිකිණ්ණෙ, පෙණබුබුළු සමූහයෙන් ගැවසීගත්තාවූ; සලිලමගාධෙ; සාගරයෙහි; තරන්ති, පිහිනන්නිවූ; අභිරූපා, විශිෂ්ටරූ ඇති; චන්දසමවත්තා, චන්ද්‍රයාටබඳු වක්ත්‍ර ඇති; නීලතරක්ඛි, අතිශයින් නිල්වූ ඇස්ඇති; ජලපිහිතඞ්ගී, ජලයෙන් වැසුනු ශරීරාවයව ඇති; තුවං, තී; කා අසි, කවරියක් වෙහිද?

53. උරගපති ත්වං ජීව චිරකාලං තව වනිතායො සාධු රමන්තු,
වචනපථං මෙ නාග සුණ සම්මා ජලධිතරන්තී චිත්තවසගා'හං.

උරගපති, එම්බා නාගෙන්ද්‍රය; ත්වං, නුඹ; චිරකාලං, බොහෝකාලයක්; ජීව, ජීවත්වෙහිවා; තව, නුඹගේ; වනිතායො, නාගකන්‍යාවෝ; සාධු, මනාකොට; රමන්තු, නුවන්සිත් අලවා වාසයකෙරෙත්වා; නාග, නාරජ්ජුරුවෙනි; මෙ, මාගේ; වචනපථං, වාග්මාර්ගය; සම්මා, මනාකොට; සුණ, අසනුමැන; ජලධිතරන්ති, සමුද්‍ර තරණයකරන්නාවූ (මුහුද පිහිනන්නීවූ); අහං, මම; චිත්තවසගා, සිතට වසඟවූවෙක් වෙමි.

54. කව යාසි වාම කරභොරු මහානිසායං
පාණාධිකො වසති යත්ථ ධවො ගතිමෙම,
බාලෙ කථං වද න භායසි එකිකා ත්වං
නණ්වත්ථි දළ්හතසිණාහි සහායිකා මෙ'ති.

වාම, සුන්දරවූ; කරභොරු, කරභය (සුලඟිලි මැනික්කට්ටු අතර අතසම්බන්ධ වාහ්‍යප්‍රදෙශය) මෙන් පිරුණු වටොර ඇත්තිය; මහානිසායං, (ඝනාන්ධකාරයෙන් යුත්) මහාරාත්‍රියෙහි; කව, කොතැන්හි; යාසි, යෙහිද; යත්ථ, යම්තැනෙක්හි; පාණාධිකො, මාගේ ජීවිතයටත්වඩා (සිනෙහැති); ධවො, ස්වාමිපුරුෂයෙක් තෙම;

* "ජලධිතරන්තී කාසි තුවං'ති."

වසනි, වාසයකෙරෙයිද; මෙ, මාගේ; ගති, ගමන (එනැත්තිය;) බාලෙ, එම්බල නුවනමද නැනැත්තිය; ඒකිකා, හුදකලාවූ; ත්‍වං, තී; කථං, කෙසේනම්; න හායසි, නොබන්නෙහිදැයි; වද, කියව; මෙ, මාගේ; දළිහනසිණා, දෘඪවූ කාමතෘෂණා සඞඛ්‍යාතවූ; සහායිකා, යෙහෙලියක්; නනු එති, (සමග) එන්නී නොවේද; (එහෙයින් නොබම්).

55. යො වෙ ජනො වත්තති සාධු ධම්මෙ
ධම්මානුපෙතං'ච කථං කථෙති,
ධම්මධජො ධම්මධරො ච හොති
දෙවා'පි තං ධම්ම ඨිතං අවෙන්ති.

යො ජනො, යම්ජනයෙක්තෙම; වෙ, ඒකාන්තයෙන්; සාධුධම්මෙ; සත්පුරුෂ ධර්මයෙහි; වත්තති, පවතීද; ධම්මානුපෙතං එව, ධර්මයෙන් යුක්තවූම; කථං, කථාවක්; කථෙති, කියයිද; ධම්මධජො, ධර්මය ධවජකොටඇත්තේද; ධම්මධරො ච හොති, ධර්මධරවේද; ධම්මඨිතං; ධර්මයෙහි සිටියාවූ; තං, ඔහු; දෙවාපි, දෙවියෝද; අවෙන්ති, රකිත්.

හෙ මා ව ස්‍යු ව, 3.

---

56. දුක්ඛෙ පරම්මුඛා හොන්ති සුඛෙ යෙ හොන්ති සම්මුඛා,
තෙ මිත්තපතිරූපා'ති ඤත්වා මෙත්තිං සමාචරෙ.

යෙ, යමෙක් තුමූ; දුක්ඛෙ, (තම මිතුරාගේ) දුකෙහි; පරම්මුඛා හොන්ති, පරාඞමුඛවෙත්ද; සුඛෙ, සැපයෙහි; සම්මුඛා හොන්ති, ගමුවෙද්ද; තෙ, ඔහුතුමූ; මිත්තපතිරූපා ඉති, මිත්‍රප්‍රතිරූපක අමිත්‍රයෝයයි; ඤත්වා, දැන; මෙත්තිං, (ඔවුන් කෙරෙහිද) මෛත්‍රිය; සමාචරෙ, කරන්නේය.

57. සමුප්පන්නෙසු දුක්ඛෙසු සඛිනං චිත්තතාපනං,
සමදුක්ඛී සදා හොති සඛා සො සඛිනං හිතො.

සඛිනං, යහලුවන්ට; දුක්ඛෙසු, දුක්; සමුප්පන්නෙසු, උපන්කල්හි; චිත්තතාපනං, (එය යම් මිතුරෙකුට) සිත්තැවුලිය වේද; සදා, හැමකල්හි; සමදුක්ඛී හොතී, (මිත්‍රයාට) සමාන දුක් ඇත්තේ වේද; සො සඛා, ඒ (සත්පුරුෂ) මිත්‍ර තෙම; සඛිනං, යහලුවන්ට; හිතො, හිත මිත්‍රයෙක් වෙයි.

58. අකත්තබ්බා නිසෙධෙති කත්තබ්බෙසු නියොජෙති,
ගුණං තස්ස පකිත්තෙති අගුණං තස්ස නිගුහති.

අකත්තබ්බා, නොකටයුතු (දුශ්චරිතාදියෙන්); නිසෙධෙති, වළක්වාද; කත්තබ්බෙසු, කටයුතු (සුචරිතාදියෙහි); නියොජෙති, (තම මිතුරා) යොදවාද; තස්ස, ඔහුගේ; ගුණං, ගුණය; පකිත්තෙති, (මෙර මාසමග) කියයිද; තස්ස, ඔහු සම්බන්ධවූ; අගුණං, අගුණ; නිගුහති, වසාද.

59. දදාති කාලෙ මිත්තස්ස භත්තපච්චාදිකං ධනං,
මනසා අසඨො හොති සඛා සො සඛිනං හිතො.

කාලෙ, සුදුසු කාලයෙහි; මිත්තස්ස, තම මිතුරාට; භත්තපච්චා දිකං, බත්පිළිආදියද; ධනං, (මුක්තාමාණික්‍යාදි) වස්තුවද; දදාති, දේද; මනසා, සිතිනුත්; අසඨො හොති, වංචාවක් නැතිවේද; සො සඛා, ඒ යහළුතෙම; සඛිනං, තමයහළුවන්ට; හිතො, හිතමිත්‍රවෙයි.

60. පාණාතිපාතථෙය්‍යාදිපාපාතො පටිසෙධති,
කුසලෙසු තං නියොජෙති සඛා සො සඛිනං හිතො.

පාණාතිපාතථෙය්‍යාදි, ප්‍රාණඝාතඅදත්තාදානාදිවූ; පාපාතො, පාපයන්ගෙන්; පටිසෙධති, වළක්වාද; තං, ඔහු; කුසලෙසු, කුශලක්‍රියාවන්හි; නියොජෙති, යොදවයිද; සො සඛා, ඒ යහළුතෙම; සඛිනං, යහළුවන්ට; හිතො, හිතමිත්‍රයෙක් වෙයි.

61. සාදරො හොති මිත්තස්ස මඤ්ජුභාණී සදා භවෙ,
අලිකං න භාසතෙ තස්ස එතං සම්මිත්තලක්ඛණං.

මිත්තස්ස, තම මිතුරාට; සාදරො හොති, ආදරසහිතවේද; සදා, හැමකල්හි; මඤ්ජුභාණී, මිහිරි තෙපුල් ඇත්තෙක්; භවෙ, වන්නේද; තස්ස, ඕහට; අලිකං, මුසාබස්; න භාසතෙ, නොකියාද; එතං, මේ සියල්ල; සම්මිත්තලක්ඛණං, සත්පුරුෂ මිත්‍රයන්ගේ ලක්ෂණයි.

62. යො මිත්තානං දිසො හොති ස හොති අත්තසත්තුකො,
පච්චඡෙ නින්දිතො හොති පෙච්ච සො නරකං භජෙ.

යො, යමෙක් තෙම; මිත්තානං, මිත්‍රයන්ට; දිසොහොති, සතුරුවේද; සො, ඒ පුද්ගලතෙම; අත්තසත්තුකොහොති, තමහටම සතුරුවෙයි; සො, හෙතෙම; පච්චඡෝ, මෙලෙව්හි; නින්දිතො හොති, (ලෝවැස්සන් විසින්) නින්දාකරණලද්දෙක්වෙයි; පෙච්ච, පරලොව්හි; නරකං, නරකය; භජෙ, භජනයකරන්නේය.

63. සුඛිනො හොති නිද්දුක්ඛො යො මිත්තානං න දූභති,
සබ්බසත්තපියො හොති ජනානං සො ජනුත්තමො.

යො, යම් පුද්ගලයෙක් තෙම; මිත්තානං, මිත්‍රයන්ට; න දූභති, ද්‍රොහ නොකෙරේද; සො, හෙතෙම; සුඛිනො හොති, සුවපත්වෙයි; නිද්දුක්ඛො, නිදුක්වෙයි; සො, ඒ මිත්‍රතෙම; සබ්බසත්තපියො, සියලු සත්වයන්ට ප්‍රියවූයේ; ජනානං, මනුෂ්‍යජනයන් අතුරෙන්; ජනුත්තමොහොති, ජනොත්තමයෙක් වෙයි.

64. භජෙ සදා උත්තමමජ්ඣිමාධමෙ
තදා තදා තෙහි සියා පයොජනං,
අමිත්තවන්තො හි කදාචි හොති
දුක්ඛෙන එකො'ව සවෙධතෙ සදා'ති.

උත්තම මජ්ඣිම අධමෙ, උත්තම මධ්‍යම අධමයන්; සදා, හැම කල්හි; භජෙ, භජනයකරන්නේය; (කුමක්හෙයින්දයත්)? තදා තදා, ඒ ඒ කාලයෙහි (හෙවත් අවුවැඩිතරම් කටයුත්තක් පැමිණි කල්හි); තෙහි, ඔවුන්ගෙන්; පයොජනං, ප්‍රයොජනය; සියා, වන්නේද (එහෙයිනි); කදාචි, කවරකලක නුමුත්; අමිත්තවන්තො හොති, (යමෙක්) මිත්‍රයන් නැත්තෙක් වේද; සො, හෙතෙම; සදා, හැමකල්හි; එකො එව, හුදකලාවූයේම; දුක්ඛෙන,දුකින්; වෙධතෙ, කම්පමානවෙයි.

## කානසිගාල වත්ථුව—4.

65. යථා සලෙලන හරිණො විද්ධො වෙදෙසි වෙදනා,
තථා'ස්සා නෙත්තසලෙලන විද්ධො සො මුච්ඡිතො තදා.

සලෙලන, උලින් හෝ ඊ පහරින්; විද්ධො, විදිනලද; හරිණො, මෘග තෙම; වෙදනා, දුඃඛවෙදනාවන්; යථා, යම්සේ; වෙදෙසි, වින්දේද; තථා, එපරිද්දෙන්ම; අස්සා, ඇගේ; නෙත්තසලෙලන, නෙත්‍රනැමැති ශරප්‍රහාරයෙන්; විද්ධො, විදිනලද; සො, ඒ අමාත්‍ය තෙම; තදා, එකල්හි; මුච්ඡිතො, (කාමතෘෂ්ණාවෙන්) මුසපත් වූයේ වෙයි.

66. අසසුබින්දුපපබන්ධෙහි කලිතානනෙත්තො රුදමමුඛො,
ජනං සො පුච්ඡි කා චෙ'සා කස්ස ධීතා මනොරමා'ති.

අසසුබින්දුප්පබන්ධෙහි, බාෂ්පධාරා සමූහයෙන්; කලිතානනෙත්තො, තෙත්වූ නෙත්ඇති; රුදමමුඛො, හැඬූනු මුව ඇති; සො, හෙ තෙම;

මනොරමා, සිත්කළුවූ; එසා, මෝතොමෝ; කාව, කවරක්ද; කසස, කවරෙකුගේ; ඕතා ඉති, දුවනියක්දයි; ජනං, ජනයා; පුච්ඡ, විචාළේය.

67\. නන්දිවාණිජකො නාම එත්ථ අත්ථි මහද්ධනො,
තස්සෙ'සා භරියා කුන්දදසනා නීලලොචනා'ති.

එත්ථ, මේ නගරයෙහි; මහද්ධනො, මහත් ධනසම්පත් ඇත්තාවූ; නන්දිවාණිජකො නාම, නන්දී නම් වෙළෙන්දෙක්; අත්ථි, ඇත්තේය; කුන්දදසනා, කොඳකැකුලුවන් දසන් (දත්) ඇති; නීලලොචනා, නිල්වන් ඇස් ඇති; එසා, මෝ තොමෝ; තස්ස, ඒ නන්දිවාණිජක යාගේ; භරියා, බිරින්ද වෙයි.

68\. යථා යස්සෙ'කනෙත්තෙන වදනං නෙව සොභති,
නෙ'ව සොභති මත්තක්ඛි විනෙ'කා කාමුකං තථා.

යස්ස, යම්කිසිවෙකුගේ; වදනං, මුහුන; එකනෙත්තෙන, එක ඇසකින්; යථා, යම්සේ; නෙවසොභති, නොහොබනේද; තථා එව, එපරිද්දෙන්ම; එකා, හුදකලාවූ; මත්තක්ඛි, මත්තාක්ෂිතොමෝ; කාමුකං විනා, කාමී පුරුෂයෙකු හැර; නසොභති එව, නොහොබීමය.

69\. යථා එකෙන දන්තෙන න සොභති ගජානනං,
නෙ'ව සොභති මත්තක්ඛි විනා එකා'ව කාමුකං,

යථා, යම්සේ; එකෙන දන්තෙන, එක්දතකින්; ගජානනං, ඇතු මුහුන; න සොභති, නොහොබීද (එපරිද්දෙන්); එකා, හුදකලාවූ; මත්තක්ඛි, මත්තාක්ෂිතොමෝ; කාමුකං විනා, කාමිපුරුෂයෙකු හැර; න සොභති එව, නොහොබීමය.

70\. හෙමලතා සචෙ ගන්ත්වා සීතං චන්දනපාදපං,
ආසිලිස්සති සොභන්ති උභො නෙ'තෙ විසුං විසුං.

සචෙ, ඉදින්; හෙමලතා, සවණිලතාවක් තොමෝ; ගන්ත්වා, ගොස්; සීතං, සිහිල්වූ; චන්දනපාදපං, සඳුන්රුකක්; ආසිලිස්සති, වැළඳ ගන්නීනම්; උභො, දෙදෙනම; සොභන්ති, හොබිත්; එතෙ, මොව්හු දෙදෙන; විසුං විසුං, වෙන්වෙන්ව; න (සොභන්ති), එසේ නොහො බිත්.

71\. කායො'යං කුණපෙ ජාතො කුණපො කුණපෙ රතො,
ඉන්දජාලකරූපො'ව බාලාන'මභිපත්ථිතො.

අයං කායො, මේ ශරීරය තෙම; කුණපෙ, (දෙතිස්) කුණුකොට සෙහි; ජාතො, උපන්නේය; කුණපො, ඒ කුණපකොට්ඨාසයතෙම;

කුණපෙ, කුණපයෙහිම; රතො, ඇලුණේය; බාලානං, අඥනයන් විසින්; අභිපත්ථිතො, ප්‍රාර්ථනාකරණලද්දේ; ඉන්දජාලකරූපො ඉව; ඉන්ද්‍රජාලිකයා (ඇස්බැඳුම්කරන්නා) විසින් දක්වනලද රූපයක් මෙනි.

72. අමෙජ්ඣපොත්ථකො වා'යං චින්තිතො බාලනන්දිතො,
ද්වත්තිංසවිධකොට්ඨාසො කෙසලොමාදිකො අයං.

බාලනන්දිතො, නුවන මදවුන් විසින් පතන ලද; අයං. මේ ශරීරයතෙම; අමෙජ්ඣපොත්ථකො ච; අපවිත්‍ර දෙයින් කරණලද පුස්ත රූපයක් (බූනික්කෙක්) මෙන්ද; චින්තිතො ,(නුවනැත්තවුන් විසින්) සලකනලද්දේය; කෙසලොමාදිකො, කෙහෙලොම් ආදි කොට ඇති; අයං, මේ සිරුර; ද්වත්තිංසවිධකොට්ඨාසො, දෙතිස් කුණු කොටසකි.

73. අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං,
එකද්වාරෙන පවිසිත්වා නවද්වාරෙහි සන්දති.

අන්නං, ආහාරයද; පානං, පියයුතු දෑද; ඛාදනීයං, කෑයුතු දෑද යන; මහාරහං, මහාර්හවූ; භොජනං ච, බොජුන්; එකද්වාරෙන, එක දොරකින්; පවිසිත්වා, පිවිස; නවද්වාරෙහි; නවදොරකින්; සන්දති, වැගිරෙයි.

74. අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං,
භුඤ්ජති සපරිවාරෙහි නික්ඛාමෙන්තො නිලීයති.

අන්නං, ආහාරයද; පානං, පානවර්ගද; ඛාදනීයං, ඛාද්‍යද යන; මහාරහං, මහාර්හවූ; භොජනං ච, බොජුන්; සපරිවාරෙහි, පිරිවර සමග; භුඤ්ජති, අනුභවකෙරෙයි; නික්ඛාමෙන්තො, (නැවත එය) බැහැරකරමින්; නිලීයති, සැඟවෙයි.

75. අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං,
භුඤ්ජති අභිනන්දන්තො නික්ඛාමෙන්තො ජිගුච්ඡති.

අන්නං, ආහාරයද, පානං, පානවර්ගද; ඛාදනීයං, කෑයුතු දෑද යන; මහාරහං, මහාර්හවූ; භොජනංච, බොජුන්; අභිනන්දන්තො, සතුටුවෙමින්; භුඤ්ජති, අනුභවකෙරේද; නික්ඛාමෙන්තො, (එය පිටතට) නික්මවන්නේ; ජිගුච්ඡති, පිළිකුල් කෙරෙයි.

76. අන්නං පානං ඛාදනීයං භොජනං ච මහාරහං,
එකරත්තිපරිවාසා සබ්බං භවති පූතිකං.

අන්නං, අහරද; පානං, පියයුතු දෑද; ඛාදනීයං, ඛාද්‍යද යන; මහාරහං, මහාර්ඝවූ; සබ්බං, සියල්ල; භොජනං, භොජනය; එකරත්තිපරිවාසා, එකරැයක් ඉක්මයාමෙන්; පූතිකං භවති, කුණුවෙයි.

77. දුග්ගන්ධො අසුචි කායො කුණපො උක්කරූපමො,
නින්දිතො චක්ඛුභූතෙහි කායො බාලාභිනන්දිතො:

දුග්ගන්ධො, දුගඳ වහනයකරන්නාවූ; අසුචි, අපවිත්‍රවූ; කුණපො, කුණපයක්වූ; උක්කාර උපමො, වර්චස් භූමියක් උපමාකොට ඇති; කායො, මේ ශරීරය තෙම; බාලාභිනන්දිතො, අඥනයන් විසින් පතනලද්දේ; චක්ඛුභූතෙහි, නුවනැත්තවුන් විසින්; නින්දිතො, ගරහන ලද්දේය.

78. අද්දචම්මපටිච්ඡන්නො නවද්වාරො මහාවණො,
සමන්තතො පග්ඝරතී අසුචී පූතිගන්ධියො.

අද්ද, ආර්ද්‍රවූ (තෙත්වූ); චම්ම, සමකින්; පටිච්ඡන්නො, ප්‍රතිච්ඡන්නවූ (වැසුනාවූ); නවද්වාරො, (චක්ෂුඃ ශ්‍රොත්‍රාදි) නවදොරක් ඇති; මහාවණො, මහත් ව්‍රණයක් වැනිවූ (මේ ශරීරය තෙම); පූතිගන්ධියො, කුණුගඳඇත්තේ; සමන්තතො, හාත්පසින්; අසුචිපග්ඝරති, අශුචි වගුරුවයි.

79. සචෙ ඉමස්ස කායස්ස අන්තො බාහිරතො සියා,
දණ්ඩං නූන ගහෙත්වාන කාකෙ සොනෙ ච වාරයෙ.

සචෙ, ඉදින්; ඉමස්ස කායස්ස, මේ ශරීරයාගේ; අන්තො, අභ්‍යන්තරය; බාහිරතො, පිටතින්; සියා, වන්නේද (එසේ ඇතිකල්හි); නූන, එකාන්තයෙන්; දණ්ඩං, දඬුකඩක්; ගහෙත්වාන, (අතින්) ගෙණ; කාකෙ, කවුඩන්ද; සොනෙ ච, සුණඛයන්ද; වාරයෙ, වළක්වන්නේය (වළක්වන්ට වන්නේය).

80. ආගන්තුකෙන කායො'යං අලඞ්කාරෙන මණ්ඩිතො,
රාගන්ධකතචක්ඛූනං සුභරූපං ව දිස්සති.

ආගන්තුකෙන, ආගන්තුකවූ; අලඞ්කාරෙන, (වස්ත්‍රාභරණාදි) අලඞ්කාරයෙන්; මණ්ඩිතො, සරසනලද; අයං කායො, මේ ශරීරය තෙම; රාගන්ධකතචක්ඛූනං, රාගයෙන් අන්ධකරණලද ඇස්ඇත්තවුන්ට; සුභරූපං ඉව, යහපත් රූපයක් මෙන්; දිස්සති, පෙණෙයි.

81. යථාපි සෙලා විපුලා නභං ආහච්ච පබ්බතා,
සමන්තා අනුපරියෙය්‍යුං නිප්පොථෙන්තා චතුද්දිසා.

විපුලා, මහත්වූ; සෙලා පබ්බතා, ශෛලපර්වතයෝ; යථාපි, යම්සේ වනාහි; නභං, අහස, ආහච්ච, හැපී; නිප්පොථෙන්තො, (සැව යන්) සුණුවිසුණුකරමින්; චතුද්දිසා, (පූර්වපශ්චිමාදි) සිව්දිගින්; සමන්තා, හාත්පස; අනුපරියෙය්‍යුං, පෙරළීඑන්නාහුද.

82. එවං ජරා ච මච්චු ච අධිවත්තන්ති පාණිනො,
ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ.

83. න කිඤ්චි පරිවජ්ජෙති සබ්බමෙ'වා'භිමද්දති,
න තත්‍ථ හත්‍ථීනං භූමි න රථානං න පත්තියා,
න චා'පි මන්තයුද්ධෙන සක්කා ජෙතුං ධනෙන වා.

එවං, මෙපරිද්දෙන්ම; ජරා ච, ජරාවද; මච්චු ච, මෘත්‍යුසංඛ්‍යාත මරණයද; ඛත්තියෙ, ක්ෂත්‍රිය කුලිකයන්ද; බ්‍රාහ්මණෙ; බමුණන්ද; වෙස්සෙ, වෛශ්‍යයන්ද; සුද්දෙ, ශූද්‍රයන්ද; චණ්ඩාලපුක්කුසෙ, සැඬොලන් හා බඹුරන්ද (යන); පාණිනො, සියලු සතුන්; අධිවත්තන්ති, මැඩපවත්වත්; කිඤ්චි, කිසිවෙක්; න පරිවජ්ජෙති, අත්නොහරී; සබ්බං එව, සියල්ලම; අභිමද්දති, වෙසෙසින් මඩී; තත්‍ථ, ඒ සංග්‍රාමභූමියෙහිලා; හත්‍ථීනං, හස්තිසෙනාවටද; න භූමි, බිමක් (පිහිටන්ට තැනක්) නොවෙයි; රථානං, රියසෙනගටද; න, නැත; පත්තියා, පාබලසෙනගටද; න, නැත; අපි, යලිදු; මන්තයුද්ධෙන වා, මන්ත්‍රයුද්ධයෙන් හෝ; ධනෙන වා, ධනයුද්ධයෙන් හෝ; ජෙතුං, (ඒ ජරාමරණාදීන්) දිනන්ට; න සක්කා, නොහැකිවෙයි.

84. අජ්ජස්වෙවා පරස්වෙ'ති මරණං නෙ'ව ඤායති,
එවමා'සන්නමච්චුම්හි වත්තමානෙ මම'න්තිකෙ.

අජ්ජ වා, අද හෝ; ස්වෙ වා, සෙට හෝ; පරස්වෙවා ඉති, අනිද්දා හෝ වේදැයි; මරණං, මරණය තෙම; න ඤායති එව, නොදන්නා ලැබේමය; එවං, මෙසේ; මමන්තිකෙ, මා සමීපයෙහි; ආසන්න මච්චුම්හි, ආසන්න මෘත්‍යු රාජයා; වත්තමානෙ, පවත්නා කල්හි:—

85. කො නු හාසො කිමා'නන්දො කා රතී කා ධනෙසනා,
යො තං පඤ්ඤාය චින්තෙන්ති භත්තම්පි'ස්ස න රුච්චතී'ති.

කො හාසො නු, කවරනම් හාස්‍යයෙක්ද; කිං ආනන්දො, කිනම් සතුටෙක්ද; කා රති, කිනම් රතිකෙළියක්ද; කා ධනඑසනා, කවර වස්තු සැපයීමෙක්ද; යො, යමෙක් තෙම; තං, ඒ කාරණය; පඤ්ඤාය, නුවණින්; චින්තෙන්ති, සිතයිද; අස්ස, ඔහට; භත්තං අපි, ආහාරයද; නරුච්චති, රුචිනොවෙයි.

86. යො වෙ පරස්ස භණ්ඩස්මිං අපරජ්ඣති නරො ඉධ,
ගරහා ච භවෙ තස්ස දණ්ඩදනාදිකං'මපි ච.

ඉධ, මේ ලොකයෙහි; යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; වෙ, එකාන්තයෙන්; පරස්ස, මෙරමාගේ; භණ්ඩස්මිං, භාණ්ඩයෙක්හි; අපරජ්ඣති, අපරාධ කෙරේද; තස්ස, ඔහට; ගරහා ච, (ලොවැස්සාගෙන්) නින්දාවද; දණ්ඩදනාදිකං අපි ච, දඬුවම් ආදියද; භවෙ, වන්නේය.

87. ආදිත්තෙ යොජනුබ්බෙධෙ සොළසඞ්ගුලකණ්ටකෙ,
සදා සො වින්දතෙ'සය්හං දුක්ඛං සිම්බලිකානනෙ'ති.

සො, හෙතෙම; සොළසඞ්ගුලකණ්ටකෙ, සොළසඟුල් දිග කටු ඇති; යොජනුබ්බෙධෙ, යොදුන්ගණන් උස ඇති; ආදිත්තෙ, (ආදීප්ත) ගිනිගෙණ දිලියෙන්නාවූ; සිම්බලිකානනෙ, කටුඉඹුල් වෙනෙහි; අසය්හං, නොඉවසිය හැකිවූ; දුක්ඛං, දුක්; සදා, හැම කල්හි; වින්දතෙ, විඳී.

88. මරීචිතොය'මානෙත්වා පූරෙත්වා ඝටචාටිසු,
පරිභුඤ්ජති සො කාමං සඞ්ගමො තෙන මෙ තදා.

සො, හෙතෙම; කාමං, එකාන්තයෙන්; මරීචිතොයං, මිරිඟුදිය; ආනෙත්වා, ගෙණවුත්; ඝටචාටිසු, කළසැළිවල; පූරෙත්වා, පුරවා; පරිභුඤ්ජති, පරිභොගකෙරේද; තදා, එකල්හි; තෙන, ඔහු සමග; මෙ, මාගේ; සඞ්ගමො, සඞ්ගමය වන්නේය.

89. සරදබ්භං වට්ටිකං කත්වා වණ්ණුතෙලෙන තෙමිය,
සො දීපං කුරුතෙ ගෙහෙ සඞ්ගමො තෙන මෙ තදා.

සරදබ්භං, හෙලවලා; වට්ටිකං, පහන්වැටියක්; කත්වා, කොට; වණ්ණුතෙලෙන, වැලිතෙලින්; තෙමිය, තෙමා; සො, හෙතෙමේ; ගෙහෙ, ගෘහයෙහි; දීපං, ප්‍රදීයක්; කුරුතෙ, කෙරේද; තදා, එකල්හි; තෙන, ඔහු සමග; මෙ, මාගේ; සඞ්ගමො, සඞ්ගමය වන්නේය.

90. නිග්‍රොධොදුම්බරස්සත්ථ පුප්ඵද්දමවිභූසිතො,
ආයාති මම ගෙහං සො සඞ්ගමො තෙන මෙ තදා.

නිග්‍රොධ, නුගය; උදුම්බර, දිඹුල්ය; අස්සත්ථ, ඇසතුය යන මේ වෘක්ෂයන් සම්බන්ධිවූ; පුප්ඵද්දම, මල්දමින්; විභූසිතො, අලඞ්කෘතවූ; සො, හෙතෙමේ; මම, මාගේ; ගෙහං, ගෘහයට; ආයාති, පැමිණේද; තදා, එකල්හි; තෙන, ඔහු සමග; මෙ, මාගේ; සඞ්ගමො, එක්තුවීම වන්නේය.

91. යද වණ්ණෙ පබොධෙති මහාරාජීවකානනං,
තද තස්ස මයා වා'පි තෙන වා මම සඞ්ගමො.

වණ්ණෙ, වණ්ණතෙම; යද, යම්කලෙක්හි; මහාරාජීවකානනං, මහත්වූ පද්මවනය; පබොධෙති, ප්‍රබොධකෙරේද; තද, එකල්හි; මාය, මා සමග; තස්ස වා, ඔහුගේ හෝ; තෙන, ඔහු සමග; මම වා, මාගේ හෝ; සඞ්ගමො, සඞ්ගමය වන්නේය.

92. යද සුරියො පබොධෙති මහන්තං කෙරවං වනං,
තද තස්ස මයා වා'පි තෙන වා මම සඞ්ගමො.

යද, යම්කලෙක්හි; සුරියො, සූර්‍ය්‍ය තෙම; මහන්තං, මහත්වූ; කෙරවං වනං, කෙරව වනය; පබොධෙති, පුබුදුවාද; තද, එකල්හි; මයා, මා සමග; තස්ස වා, ඔහුගේ හෝ; තෙන, ඔහු සමග; මම වා, මාගේ හෝ; සඞ්ගමො, සඞ්ගමය වෙ.

93. නාව'ඤ්ඤො පති මෙ අත්ථි යාව ජීවති මෙ පති,
කද කප්පලතා හොති වායසානං නිවෙසනං.

යාව, යම්තාක්කල්; මෙ, මාගේ; පති, ස්වාමිපුරුෂ තෙම; ජීවති, ජීවත්වෙයිද; (තාව, ඒතාක්ම); මෙ, මට; අඤ්ඤො, අන්‍යවූ; පති, ස්වාමියෙක්; නාව, නැත්තේය; කප්පලතා, කප්ලිය තොමෝ! කද, කවරකලෙක්හි; වායසානං, කවුඩන්ගේ; නිවෙසනං, වාසස්ථාන යක්; හොති, වේද (නොවේමැයි).

94. වධායො'පක්කමෙ සත්තො අදුබ්භිං ගුණභාජනං,
විනාසං යාති සො සත්තො සිවාම්බෙවා'ව වාණිජං.

සත්තො, යම් සත්වයෙක් තෙම; අදුබ්භිං, අද්‍රොහිවූ; ගුණභාජනං, කාරුණාදි ගුණයට භාජනවූවෙකු; වධාය, නැසීමට; උපක්කමෙ, උපක්‍රම යොදන්නේද; සො සත්තො, ඒ සත්වතෙම; වාණිජං, වෙළඳ නැසීමට උපක්‍රම කළාවූ; සිවඅම්බෙවා ඉව, සිවනම් ඇමති සාමෙන්; විනාසං, වනසට; යාති, පැමිණේ.

95. තථාගතං වීතරණං චතුමාරරණං ජයං,
සරණං කො න ගවෙෂයා කරුණාභාවිතාසයං.

වීතරණං, අපගතවූ (රාගාදි) පාපධර්ම ඇති; චතුමාරරණං, (දෙවපුත්‍රමාරාදී) චතුර්විධමාරයුද්ධය; ජයං, පරදවා ජයගත්තාවූ; කරුණා, කරුණාඥනයෙන්; භාවිත, වඩනලද; ආසයං, අභිප්‍රාය ඇති; තථාගතං, තථාගතයන්වහන්සේ; කො, කවරෙක් තෙම; සර ණං, ප්‍රතිෂ්ඨාකොට; න ගවෙෂයා, නොයන්නේද? (යන්නේමය).

96. ස්වාක්ඛාතං තෙන සද්ධම්මං සංසාරභයභඤ්ජකං,
කරුණාගුණජං තස්ස සරණං කො න ගච්ඡති.

තෙන, ඒ තථාගතයන්වහන්සේ විසින්; ස්වාක්ඛාතං, මනාකොට දෙශිතවූ; සංසාරභයභඤ්ජකං, සංසාර භීතිය හරණාවූ; කරුණා, කරුණාඥනසඞ්ඛ්‍යාතවූ; ගුණජං, ගුණයෙහි ජාතවූ; තස්ස, උන්වහන්සේගේ; සද්ධම්මං, ශ්‍රීසද්ධර්මය; කො, කවරෙක්; සරණං, පිහිට කොට; න ගච්ඡති, නොයේද.

97. පරිපීතාමතරසං සද්ධම්මොදයභාජනං,
සඞ්ඝං පුඤ්ඤාකරං කො හි සරණං න ගමිස්සති.

පරිපීතාමතරසං, පානයකළ අමාරසඇති; සද්ධම්මඋදය, සදහම් උදුවීමට; භාජනං, බඳුනක්වූ; පුඤ්ඤාකරං, පුණ්‍යධර්මයන්ට උත්පත්තිස්ථානවූ; සඞ්ඝං, අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝරත්නය; කො හි, කවරෙක් වනාහි; සරණං, පිහිටකොට; න ගමිස්සති, නොයන්නේද.

98. එවං විධං යෙ බළූ කාමරාගං
විපත්තිමූලං පජහිත්වා ධීරා,
කරොන්ති පුඤ්ඤානි සුභද්‍රයානි
තෙ වෙ පහාසෙන්ති ජනා තිලොකං.

ධීරා, පණ්ඩිතවූ; යෙ, යමෙක් තුමූ; බළූ, එකාන්තයෙන්; විපත්ති මූලං, විපතට මුල්වූ; එවං විධං, මෙබඳුවූ; කාමරාගං, කාමයෙහි ඇල්ම; පජහිත්වා, දුරුකොට; සුභද්‍රයානි, සැපඵලවන්නාවූ; පුඤ්ඤානි, (දානාදී) පුණ්‍යකර්මයන්; කරොන්ති, කෙරෙද්ද; වෙ, එකාන්තයෙන්; තෙ ජනා, ඒ ජනයෝ තුමූ; තිලොකං, ත්‍රිවිධලොකය; පහාසෙන්ති, බබුළුවත්.

**නන්දිමාණවකවත්ථුව, 5.**

---

99. නෙ'සො උපාසකො තිස්ස පිතා භාතා ච මාතුලො,
න ඤාති සුහදො හොති දිට්ඨසම්භත්තකො තව.

තිස්ස, එම්බා තිස්සස්ථවිරයෙනි; එසො උපාසකො, මේ උපාසක තෙම; තව, නුඹගේ; න පිතා; පියෙක්ද නොවෙයි; න භාතා ච, බෑයෙකුත් නොවෙයි; මාතුලො, මයිලෙක්ද නොවෙයි; න ඤාති, අන්‍යවූ බන්ධුකෙණෙකුත් නොවෙයි; සුහදො, සුහෘදයෙක්ද; න හොති, නොවෙයි; දිට්ඨසම්භත්තකො, දෘෂ්ටමිත්‍ර දෘෂ්මිත්‍රයෙක්ද; න හොති, නොවෙයි.

100. කිඤ්චි තස්ස කතං නත්ථි උපකාරං තයා පුරෙ,
සීලවන්තො'ති ඤත්වාන තුය්හං දස්සති භොජනං.

පුරෙ, මීට පෙර; තයා, තාවිසින්; තස්ස, ඕහට; කතං, කරණලද; කිඤ්චි උපකාරං, කිසි උපකාරයකුත්; නත්ථි, නැත්තේය; සීලවන්තො ඉති, සීලවන්තයෙකැයි; ඤත්වාන, දැන; තුය්හං, තට; භොජනං, ආහාරයක්; දස්සති, දුන්නේය.

101. මහත්තරං ආනිසංසං තස්ස ත්වං යදි ඉච්ඡසි,
සරාගො තං න භුඤ්ජාහි මීයමානො'පි භොජනං.

ත්වං, නුඹ; තස්ස, ඕහට; මහත්තරං, අතිශයින් මහත්වූ; ආනිසංසං, ආනිසංසයක්; යදි, ඉදින්; ඉච්ඡසි, කැමැත්තෙහිනම්; මීයමානො අපි, මියන්නේනමුත්; සරාගො, සරාගීව; තං භොජනං, ඒ භොජනය; න භුඤ්ජාහි, අනුභව නොකරව.

102. ඔවදිත්වාන සො අත්තානං කත්වා දුක්ඛක්ඛයං තදා,
භත්තකිච්ච'මකා ධීරො බුද්ධසාසනසොභකො'සි.

බුද්ධසාසනසොභකො, බුදුසසුන හොබවන්නාවූ; ධීරො, ධීරවූ; සො, ඒ තිස්සස්ථවිරතෙම; අත්තානං, තමහට; ඔවදිත්වාන, (මෙසේ) අවවාදකොට; තදා, එකල්හි; දුක්ඛක්ඛයං, දුඃඛක්ෂය; කත්වා, කොට (රහහත්ව); භත්තකිච්චං, බත්කිස; අකා, කෙළේය.

103. එවං'මපි සන්තො භවභොගසම්පදං
ලභන්ති දානෙන පරිත්තකෙන,
තුම්හෙ'පි දානෙ අථ සීලසඤ්ඤමෙ
අත්තානං නිවෙසෙථ පයාථ නිබ්බුතිං'ති.

සන්තො, සත්පුරුෂයෝ තුමූ; එවං, මෙසේ; පරිත්තකෙන අපි, ස්වල්පවූද; දානෙන, දානය හෙතුකොටගෙණ; භවභොගසම්පදං, භවසම්පත හා භොගසම්පත; ලභන්ති, ලබත්; අථ, එබැවින්; තුම්හෙ අපි, තෙපිදු; දානෙ, දන්දීමෙහිද; සීලසඤ්ඤමෙ, සීලසංයමයෙහිද; අත්තානං, චිත්තය; නිවෙසෙථ, නිවිෂ්ටකරව; නිබ්බුතිං, නිර්වාණයට; පයාථ, පැමිණෙව්.

නකුලවස්තුව, 6.

---

104. සංසාරෙ සංසරන්තස්ස මෙ වෙ තහඑ භවාභවෙ,
අලද්ධාන'න්නපානස්ස කාලනියමො න විජ්ජති.

අන්නපානස්ස අලද්ධාන, බත් පැන් නොලැබ; භවාභවෙ, භව යෙන් භවයෙහි; තහඑ සංසාරෙ, ඒ සංසාරයෙහි; සංසරන්තස්ස, සැරිසරන්නාවූ (සැරිසැරුවාවූ); මෙ, මාගේ; කාලනියමො, කාලනියමයක්; වෙ, එකාන්තයෙන්; න විජ්ජති, විද්‍යමාන නොවේ.

105. නිරයම්හි (?) ජාතො ජිඝච්ඡා පරිපීළිතො,
පුරෙ අලද්ධො ඝාසනං තිතික්ඛං මහතිං ඛුදං.

පුරෙ, පූර්වයෙහි; නිරයම්හි, නියඹිග්භවයෙහි; ජාතො, උපන්නේ; ජිඝච්ඡා, බඩසයින්; පරිපීළිතො, පෙළුණේ; ඝාසනං, අහරක්; අලද්ධො, නොලද්දෙම්; මහතිං, මහත්වූ; ඛුදං, ක්ෂුධාව; තිතික්ඛං, ඉවසන්නෙක් විමි.

106. බහූනි වස්සූපගානි පච්චමානො අවීචියං,
ඝාසනඑං අලද්ධො'සමි සිත්ථමත්තමපි භොජනං.

අවීචියං, අවීචිමහනරකයෙහි; බහූනි, බොහෝවූ; වස්සූපගානි, අවුරුදුගණන්; පච්චමානො, පැසෙන්නේ; ඝාසනඑං, අහර්පිණ්ඩ; සිත්ථමත්තං අපි, බත්හුලක්පමණවූද; භොජනං, බොජුනක්; අලද්ධො අස්මි, නොලද්දේ වෙමි.

107. අට්ඨිචම්මාවසෙසානං ඛයභන්තානං බුද්ධනලා,
පිපාසිතානං පෙතානං ලබ්භතෙ කිනනු භොජනං.

බුද්ධනලා, ක්ෂුධාගනියෙන් (බඩගින්නෙන්); ඛයභන්තානං, දැවෙන්නාවූ; අට්ඨිචම්මාවසෙසානං, අස්ථිචර්මාවශෙෂවූ (හෙවත්) ඇට සම් පමණක් ඉතිරිවූ; පිපාසිතානං, පැන්බොනු රිසිවූ; පෙතානං, ප්‍රෙතාත්මයෙහි උපනුන්ට; භොජනං, බොජුනක්; කිනනු ලබ්භතෙ, කුමැයි ලැබේද (නොලැබේමැයි).

108. බුද්ධන්තර'මපි යෙ පෙතා අලද්ධන්නා පිපාසිතා,
ජීවන්ති හි අහො තෙසං දුක්ඛා කා උපමා සියා.

අලද්ධන්නා, නොලබනලද අහර ඇති; පිපාසිතා, පිපාසිතවූ (හෙවත්) පැන්බොනු රිසිවූ; යෙ, යම්බඳුවූ; පෙතා, ප්‍රෙතයෝතුමූ; බුද්ධන්තරං අපි, බුද්ධාන්තරයකුදු; හි, යම්හෙයකින්; ජීවන්ති, ජීවත්වෙද්ද; තෙසං, ඔවුන්ගේ; දුක්ඛ, දුඃඛානුභවයෙහි; කා උපමා, කිනම් උපමාවක් නොමෝ; සියා, වන්නීද; අහො, බේදයකි.

109. විපඤ්ඩිතං නිටඩුභිතං විජානානං ච යං මලං,
යො ලභිස්සති පෙතො සො මහාපුඤ්ඤො'ති වුච්චති.

යො පෙතො යම් ප්‍රෙතයෙක් තෙම; විවජ්ජිතං, (සංකාරකූටාදී යෙහි) දමනලද; නිට්ඨුභිතං, කෙල සෙම්සොට්වූද; විජාතානං, විජාත් (වැදූ) සත්‍රීන්ගේ; යං ච මලං, යම් ගැබ්මලආදියකුත්; ලභිස්සති, ලබන්නේනම්; සො, හෙතෙම; මහාපුඤ්ඤො ඉති, මහ පිණැත්තෙ කැයි; වුච්චති, කියනුලැබේ.

110. අදත්වා න පුරෙ කිඤ්චිදානං යාචකජනතුනං,
උදික්ඛමානෙ භුත්තස්ස ලබ්භතෙ කිතනු භොජනං.

පුරෙ, පූර්වජාතියෙහි; යාචකජනතුනං, යාචකජනයන්ට; කිඤ්චිදානං, කිසියම් දානයක්; අදත්වාන, නොදී; උදික්ඛමානෙ, ඔවුන් බලාසිටියදී; භුත්තස්ස, අනුභවකළහුට; භොජනං, බොජුනක්; කිතනු ලබ්භතෙ, කිම ලැබේද? (නොලැබේමය).

111. ඉදන'ජ්ජ මයා ලද්ධං පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං,
භොජන'මපි ච මෙ අත්ථි ධම්මෙනු'ප්පාදිතං ඉදං.

ඉදානි, දැන්; අජ්ජ, අද; මයා, මාවිසින්; අනුත්තරං, නිරුත්තරවූ; පුඤ්ඤක්ඛෙත්තං, (කුශලබීජරොපනය පිණිස) පින්කෙතක්; ලද්ධං, ලබනලදී; ධම්මෙන, දැහැමින්; උප්පාදිතං, උපයනලද; ඉදං, මේ; භොජනං අපිච, අහරක්ද; මෙ, මට; අත්ථි, ඇත්තේය.

112. සුඛෙත්තෙ අජ්ජ රොපෙමි බීජම'ප්ප'මපි සාධුකං,
තං මෙ භවති දීඝං හිතාය ච සුඛාය චා'ති.

සුඛෙත්තෙ, ඒ යහපත් පින්කෙතෙහි; අජ්ජ, අද; අප්පං අපි, ස්වල්පවූද; බිජං, බීජයක්; සාධුකං, මනාකොට; රොපෙමි, රොපනයකෙරෙමි; තං, එය; මෙ, මට; දීඝං, දීර්ඝකාලයක් මුලුල්ලෙහි; හිතාය ච, හිතපිණිසද; සුඛාය ච, සුවපිණිසද; භවති, වෙයි.

113. අහො සප්පුරිසා ධීරා බුද්ධපුත්තා ගුණාකරා,
පරත්‍ථ පටිපජ්ජන්ති කතඤ්ඤූ කතවෙදිනො'ති.

ගුණාකරා, (සීලසංයමාදි) ගුණයන්ට උත්පත්තිස්ථානවූ; සප්පුරිසා, සත්පුරුෂවූ; ධීරා, පණ්ඩිතවූ; කතඤ්ඤූ, කෘතඥවූ; කතවෙදිනො, කෙළෙහිගුණ දන්නාවූ; බුද්ධපුත්තා, බුද්ධපුත්‍රයෝ තුමූ; පරත්‍ථ, පරාර්ථයෙහි (හෙවත්) මෙරමාහට වැඩසිදුකිරීමෙහි; පටිපජ්ජන්ති, පිළිපදිත්; අහො, ආශ්චර්යයියි.

114. සද්ධො විසුද්ධො සුවිදානවාහණං,
ආරුය්හ එවං තිදිවං පයාති,
ධාරෙය්‍ය වෙ සීලමයාතපත්තං
නිබ්බාණරජ්ජෙ ස පතිට්ඨහෙය්‍යා'ති.

එවං, මෙසේ; විසුඩො, වෙසෙසින් පිරිසිදුවූ; සඞො, ශ්‍රඞාවත් පුද් ගල තෙම; සුචි, (තුන්සිත පිරිසිදු හෙයින්) පවිත්‍රවූ; දනවාහණං, දනනැමැති වාහණයට; ආරුය්හ, නැගී; තිදිවං, දිව්‍යලොකයට; පයාති, පැමිණෙයි; සො, හෙතෙම; වෙ, ඉදින්; සීලමයාතපත්තං, සීලරක්‍ෂණසංඛ්‍යාත ධවලාතපත්‍රයක් (ශ්වෙතක්); ධාරෙය්‍ය, දරන් නේනම්; නිබ්බාණරජ්ජෙ, නිවන් නැමති රජයෙහි; පතිට්ඨහෙය්‍ය, පිහිටන්නේය.

අ ඞ්ඞා මා ත්‍ය ව ඝා ව, 7.

---

115. නා'ත්තනො'ති ඝරං හොති විඝාසාදෙ'ව පීළිතො,
අප්පත්තපානො සො හොති යො නරො අකතඤ්ඤුකො.

යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; අකතඤ්ඤුකො, අකෘතඥ යෙක් වේද (හෙවත්) කෙලෙහිගුණ නොදන්නේ වේද (ඕහට); අත්තනො ඉති, තමාගේයයි; ඝරං, ගෙයක්දෙරක්; න හොති, නොවෙයි; සො, හෙතෙම; විඝාසාදෙ ඉව, භුක්තාවශෙෂය අනුභව කරන්නෙක්මෙන්; පීළිතො, බඩසයින් පෙළුනේ; අප්පත්තපානො, බත්පැන් නොලබන්නෙක්ද; හොති, වෙයි.

116. මාතාපිතුන්නා'මපි ඝරං සචෙ සො උපසප්පති,
ධී'ති තං පටිසෙධෙන්ති යො නරො අකතඤ්ඤුකො.

යො, යම්බඳුවූ; නරො, මනුෂ්‍යයෙක් තෙම; අකතඤ්ඤුකො, අකෘතඥවේද; සො, හෙතෙම; සචෙ, ඉදින්; මාතාපිතුන්නං අපි, මව්පියන්ගේද; ඝරං, ගෘහයට; උපසප්පති, එළඹේද; ධී ඉති, ධික් යයි නින්දාකොට; තං, ඔහු; පටිසෙධෙන්ති; වළක්වත්.

117. ථෙනාදින'පරාධානි ලොකවජ්ජානි නෙකධා,
තස්සෙ'ව රුහතෙ දොසං යො නරො අකතඤ්ඤුකො.

යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; අකතඤ්ඤුකො, අකෘතඥ වේද; ථෙනාදිනි, හොරකම් ආදීවූ; නෙකධා, අනෙකප්‍රකාරවූ; ලොකවජ්ජානි, ලොක වද්‍යවූ; අපරාධානි, අපරාධයෝ; තස්ස එව, ඒ අකෘතඥයාටම; දොසං, දොස්කොට; රුහතෙ, නගිත්.

118. රජචොරාරිදහනසීහව්‍යාලාදිජං භයං,
තස්සෙ'ව සබ්බදා හොති යො නරො අකතඤ්ඤුකො.

යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; අකතඤ්ඤුකො, අකෘතඥ වේද; රාජ, රජදරුවෝය; චොර, සොරුය; අරි, සතුරෝය; දහන, වහ්නිය; සීහ, සිංහය; ව්‍යාලාදිජං, චණ්ඩමෘගය යන මේආදීන් ගෙන් වන්නාවූ; භයං, භය; සබ්බදා, හැමකල්හි; තස්ස එව, ඕහටම; හොති, වෙයි.

119. හත්‍ථපාදාදිජෙජ්ජං ච කණ්ණනාසාදික'මපි ච,
නෙකවධානි පප්පොති යො නරො අකතඤ්ඤුකො.

යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; අකතඤ්ඤුකො, අකෘතඥ වේද (හෙතෙම); හත්‍ථපාදාදී, අත්පා ආදීන්ගේ; ඡෙජ්ජං ච, ඡේද්‍යයටද; කණ්ණනාසාදිකං අපිච, කන්නාසාසිඳීම් ආදියටද්‍ය‍යි; නෙකවධානි, නොයෙක් වධබන්‍ධනයන්ට; පප්පොති, පැමිණෙයි.

120. කායසුඛං චිත්තසුඛං අඤ්ඤං වා තාදිසං සුඛං,
න හොති සුපිනෙනා'පි යො නරො අකතඤ්ඤුකො.

යො නරො, යම් මිනිසෙක් තෙම; අකතඤ්ඤුකො, කෙලෙහිගුණ නොදන්නේවේද (ඕහට); කායසුඛං, කායික සැපයද; චිත්ත සුඛං, චෛතසික සැපයද; අඤ්ඤං, මෙයින් අන්‍යවූ; තාදිසං, එබඳුවූ; සුඛං වා, යම්කිසි සැපයක් හෝ; සුපිනෙන අපි, ස්වප්නයෙහුදු; න හොති, නොවෙයි.

121. අවණ්ණො ච අකිත්ති ච අයසො ච 'ස්ස විතඤ්ඤති,
පාපො'ති පාකටො හොති යො නරො අකතඤ්ඤුකො.

යො නරො, යම් මිනිසෙක් තෙම; අකතඤ්ඤුකො, කෙලෙහිගුණ නොදන්නේ වේද; අස්ස, ඔහු සම්බන්‍ධවූ; අවණ්ණො ච, අගුණද; අකිත්ති ච, අපකීර්තියද; අයසො ච, අයසද; විතඤ්ඤති, (ඒ ඒ තැන්හි) පැතිරෙයි; පාපො ඉති, පාපිෂ්ඨයෙකැයි කියාද; පාකටො හොති, (ලෙව්හි) ප්‍රකටවෙයි.

122. චණ්ඩාලො'ව පිසාචො'ව කාකො'ව සුනඛො විය,
සබ්බේ තං අවමඤ්ඤන්ති යො නරො අකතඤ්ඤුකො.

යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; අකතඤ්ඤුකො, අකෘතඥ වේද (හෙතෙම); චණ්ඩාලො ඉව, සැඩොලෙකුමෙනැයිද; පිසාචො ඉව, පාංශුපිසාචයෙකු මෙනැයිද; කාකො ඉව, (කුණුසාරාකන)

කව්ඩෙකු මෙනැයිද; සුනඛො විය, (ඉසපණුහුනු) සුනඛයෙකුමෙ' නැයිද (පිළිකුල්කොට); සබ්බෙ, සර්ව්ලොකවාසීහු; තං, ඔහුට; අවම ඤ්ඤන්ති, අවඥකෙරෙත්.

123. අවීචියං ච යං දුක්ඛං යං දුක්ඛං තිරියඝගතෙ,
පෙතලොකෙසු යං දුක්ඛං තථෙ'වා'සුරකායිකෙ,
සො භාගී සබ්බදුක්ඛස්ස යො නරො අකතඤ්ඤුකො.

යො නරො, යම් මිනිසෙක් තෙම; අකතඤ්ඤුකො, කෘතඥනො වේද; සො, හෙතෙම; අවීචියං, අවීචිමහනරකයෙහි; යං ච දුක්ඛං, යම් දුඃඛයකුත් වේද; තිරියඝගතෙ, තිර්‍ය්‍යක් යොනියෙහි; යං දුක්ඛං, යම් දුකකුත් වේද; පෙතලොකෙසු, ප්‍රෙතනිකායන්හි; යං දුක්ඛං, යම්දුකක් වේද; තථා එව්, එසේම; අසුරකායිකෙ, අසුරනිකායෙහි; යං දුක්ඛං, යම්දුකකුත් වේද; සබ්බදුක්ඛස්ස, ඒ සියලූ දුකට; භාගී, හිමියෙක් වෙයි.

124. කරොථ මා මිත්තදුහිං කදාචි
කතඤ්ඤුමා හොථ කතං සරථ,
සග්ගාවහං හො කුසලං කරොථ
අනින්දිතා හොථ අනාගතෙසු.

හො, පින්වත්නි (එහෙයින් තෙපි); කදාචි, කිසිකලෙකත්; මිත්ත දුහිං, මිත්‍රද්‍රොහ කර්මය; මා කරොථ, නොකරව්; අකතඤ්ඤු, කෙලෙහිගුණ නොදන්නෝ; මා හොථ, නොවව්; කතං, කෙලෙහි ගුණ; සරථ, සිහිකරව්; සග්ගාවහං, ස්වර්ගසැපඑලවන්නාවූ; කුසලං, (දනාදි) කුසල්; කරොථ, කරව්; අනාගතෙසු, ආයති භවයෙහි; අනින්දිතා හොථ, අනින්දිතයෝ (පසස්ලද්දෝ) වව්.

## වානර වත්ථුව, 8.

---

125. නා'කම්හ කුසලං බහූ හොති පුබ්බෙ
ඉදානි තස්මා අභිදුග්ගතම්හ
න කුච්ඡිපූරං මධුරන්නපානං
ලභාම පුබ්බෙසු අදින්නභාවා.

හොති, පින්වතිය; පුබ්බෙ, පූර්වජාතියෙහි; බහූ, එකාන්තයෙන්; කුසලං, (දනාදී) කුශලක්‍රියාවක්; න අකම්හ, අපි නොකළේවමු; තස්මා, එහෙයින්; ඉදානි, දැන්; අභිදුග්ගතා අම්හ, ඉතා දුගියෝ වමු;

පුබ්බෙසු, පූර්වකාලයන්හිදී; අදින්නභාවා, (දන්) නුදුන්බැවින්; කුච්ඡිපූරං. කුසපුරා; මධුරන්නපානං, මධුරවූ ආහාරපානවර්ගී; නලභාම, නොලබමු.

126. ඝරෙසු අත්ථීසු අදත්වා භත්තං
මච්ඡෙරභූතස්ස නරස්ස'දානි,
න කුච්ඡිපූරං මධුරන්නපාන
ලාභො නභාතො පඨවීව දූරෙ.

අත්ථීසු, අර්ථීන් (යාචකයන්); ඝරෙසු, (ගෙදොර) සිටිකල්හි; භත්තං, බත්පැන්; අදත්වා, නොදී; මච්ඡෙරභූතස්ස, මසුරුකමින් අනුභවකළාවූ; නරස්ස, මිනිසෙකුට; ඉදානි, දැන්; කුච්ඡිපූරං, කුස පුරා; න මධුරන්නපානලාභො, මිහිරිවූ අහරපැන් නොලැබීම; නභාතො, අහසින්; පඨවී ඉව, පෘථිවිය මෙන්; දූරෙ, ඉතා දුරෙහිය.

127. ඉතො චිතො සිබ්බිතථූලකන්තං
සායූකමණ්ඩං ච කිලිට්ඨමෙකං,
නිවාසනං ආසි අහො අතීතෙ
අදින්නවත්ථස්ස කුතො නු වත්ථං.

ඉතො චිතො, ඔබිනොබින් (දිගින් සරසින්); සිබ්බිත, සිබ්බනය කරණලද (මසනලද); ථූලකන්තං, දළ හූ ඇති; සායූකමණ්ඩං, හිනිකුණු මඩුලු ඇති; කිලිට්ඨං, කිලුටුවූ; එකං නිවාසනං ච, එකම වස්ත්‍රයක්; ආසි, වූයේය; අතීතෙ, අතීතකාලයෙහි; අදින්නවත්ථස්ස, නුදුන් වස්ත්‍ර ඇත්තහුට; වත්ථං, වස්ත්‍රයක්; කුතො නු, කොයින් ලැබේද; අහො, ඛෙදයකි.

128. හත්ථීගවාස්සාමහිසාදිනානා
කුලාකුලානමහ කුලානමජ්ඣෙ,
දීනා අනාථා කපණා වරාකා
තමා'සි පුබ්බෙ කතපාපකත්තා.

කුලානි, උච්චාකුලයෝ (පෙරපින්කළහෙයින් උසස් කුලවල උපන්නාහු); හත්ථී, හස්තිය; ගො, ගෙරිය; අස්ස, අශ්වයෝය; මහිස ආදි, මහිසය යනාදීවූ; නානාකුලා, අනෙකසම්පත් ඇත්තාහු වෙත්; කුලානං, ඒ උච්චාකුලීනයන්ගේ; මජ්ඣෙ, මධ්‍යයෙහි; දීනා, දීනවූ; අනාථා, අනාථවූ; කපණා අමහ, කෘපණයෝවමු; වරාකා, නිඃශ්‍රීකයෝවමු; තං, එය; පුබ්බෙ, පෙර; කතපාපකත්තා, කළපව්අැතිබැවින්; ආසි, විය.

129. සයන්ති නානාසයනෙ අලඞ්කතෙ
මාලාදිනානාසුභගන්ධවාසිතෙ,
සක්කච්ච පුඤ්ඤූපචිතා මහාජනා
අපුඤ්ඤතා සෙම ඡමාය අම්හෙ.

සක්කච්ච, සකස්කොට (තුන්සිත පහදවා); පුඤ්ඤූපචිතා, දන් පින්රැස්කළාවූ; මහාජනා, මහාජනයෝ තුමූ; මාලාදී, මල්මාලා දීවූ; නානාසුභගන්ධවාසිතෙ, නොයෙක් සුවඳදූයින් සුවඳවත්ක ළාවූ; අලඞ්කතෙ, අලඞ්කෘතවූ; නානාසයනෙ, නොයෙක් සයන යෙහි; සයන්ති, (සැපසේ) හොවිත්; අම්හෙ, අපිවනාහි; අපුඤ්ඤ තාය, පින්රැස්නොකළ බැවින්; ඡමාය, භූමියෙහි; සෙම, සයනය කරමු.

130. අකත්වා පුඤ්ඤානි මය‘මපි‘දන්
කරොම කිං ආයතිජාතිහෙතුං,
ලූඛ‘මපි අප්ප‘න්ති අචින්තයිත්වා
නිධෙම සඞ්ඝෙ බලූ දෙය්‍යධම්ම‘න්ති.

මයං අපි, අපිදු; ඉදානි, දැන්; පුඤ්ඤානි, පින්; අකත්වා, නොකොට; ආයතිජාතිහෙතුං, ආයතිභවයට හෙතුවූ: කිං, කුමක්; කරෙම, කරමුද; ලූඛං අපි, රූක්ෂවූද දානවස්තුව; අප්පං ඉති, ස්වල්පයයි; අචි න්තයිත්වා, නොසිතා; සඞ්ඝෙ, සඞ්ඝරත්නය විෂයෙහි; බලූ, එකා න්තයෙන්; දෙය්‍යධම්මං, දෙයධර්මයක්; නිධෙම ඉති, නිධානගත කරම්හයි (කීහ).

131. ඉතො චුතා නො උභයෙ ජයම්පතී
ජයම්පතිත්තං අවිනාසයන්තා,
එකත්ථ ජායෙමු පියා මනාපා
හෙස්සාම රූපෙන පසත්ථරූපා.

නො උභයෙ ජයම්පතී, අපි දෙමහල්ලෝ; ඉතො, මෙයින්; චුතා, චුතවූවාහු; ජයම්පතිත්තං, ජයම්පතීභාවය (අඹුසැමිබව); අවිනාස යන්තා, නොනසන්නාහු; එකත්ථ, එක්තැනෙක්හි; ජායෙමු, උප දිමු; රූපෙන, රුවින්; පසත්ථරූපා, පසස්නාලද ස්වභාව ඇත් තෝව; පියා, (ඔවුනොවුන්ට) ප්‍රියව; මනාපා හෙස්සාම, මන වඩන්නෝ වන්නෙමු.

132. දිඝායුකා වණ්ණවන්තා යසස්සී
හෙස්සාම භොගී ච විසුද්ධසද්ධා,
මෙත්තෙය්‍යනාථං චතුපච්චයෙහි
තප්පෙත්වා කස්සාම භවස්ස අන්ත‘න්ති.

දීඝායුකා, දීර්ඝායුෂකවූ; වණ්ණවන්තා, (දශදිග් පැතිර පවත්නා) ශරීරවර්ණවත්වූ; යසස්සී, යසපිරිවර අත්තාවූ; භොගී, උපභොග පරිභොග සම්පත් ඇත්තාවූ; විසුද්ධසද්ධා ච, වෙසෙසින් පිරිසිදු සැදැ හැත්තෝද; හෙස්සාම, වන්නෙමු; මෙත්තෙය්‍යනාථං, මෛත්‍රෙය බුදුන්; චතුපච්චයෙහි, සිවුරු ඈ සිව්පසින්; තප්පෙත්වා, සතප්වා; භවස්ස, සංසාරාර්ණවයාගේ; අන්තං, කෙළවර; කස්සාම ඉති, කරන් නෙමුයි කිහ.

133. පුච්ඡා'මහං ජම්පතිකෙ ජලන්තෙ
අකත්ථ කිං පුඤ්ඤම'තීතකාලෙ,
තං මෙ වියාචික්ඛථ ඤාතුකාමො
දානාදිනං කස්ස අයං විපාකො'ති.

ජලන්තෙ, ජවලමාන (දිලිසෙන්නා)වූ; ජම්පතිකෙ, දෙමහල්ලන්; අහං, මම; පුච්ඡාමි, විචාරමි; අතීතකාලෙ, ඉතුත්කල්හිදී; කිං පුඤ්ඤං, (දානාදීන් අතුරෙන්) කවරනම් පිණක්; අකත්ථ, (නෙපි) කළිහුද; තං, ඒ කුශලක්‍රියාව; මෙ. මට; වියාචික්ඛථ, ප්‍රකාශකොට කියව්; දානාදීනං, දානාදි කුශලක්‍රියා අතුරෙන්; අයං, මේ; කස්ස විපාකො ඉති, කවර කුසලයක්හුගේ විපාකයෙක්දැයි; ඤාතුකාමො, දැනගණු කැමැත්තෙමි.

134. අහුම්හ පුබ්බෙ කපණා වරාකා
අදම්හ සඞ්ඝස්ස කදන්නමත්තං,
සද්ධාය තං දානවරං භදන්තෙ
අකාසි නො'දානි මහාවිභූතිං.

භදන්තෙ, ස්වාමිනි; පුබ්බෙ, පූර්වයෙහි; කපණා, කෘපණවූ; වරාකා අහුම්හ, නිශ්‍රීකයෝ වූම්හ; සඞ්ඝස්ස, සඞ්ඝරත්නයට; සද්ධාය, බල වත් ශ්‍රද්ධාවෙන්; කදන්නමත්තං, ස්වල්පවූ කුත්සිතාහාරයක්; අදම්හ, දුනිමු; තං දානවරං, ඒ උත්තම දානයතෙම; ඉදානි, දැන්; නො, අපට; මහාවිභූතිං, මහත් භවභොග සම්පත්; අකාසි, කෙළේය.

135. තදා පරිත්තං ච අදම්හ දානං
තථා'පි තං හොති කදන්නමත්තං,
සද්ධාය ඨානෙ සුපතිට්ඨිතත්තා
තස්සෙ'දිසං ආසි ඵලං භදන්තෙ'ති.

භදන්තෙ, ස්වාමීන්වහන්ස; තදා, එකල්හි; පරිත්තං ච, ස්වල්ප වූම; දානං, දානයක්; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; අදම්හ, දුනිමු: තථා; එසේ; තං, ඒ දානය; කදන්නමත්තං හොති අපි, (එකල) ස්වල්ප

කුතසිතාහාරයක් වෙයි නුමුත්; ඨානෙ, අනාශ්‍රවසඞ්ඛ්‍යාත පුණ්‍ය ක්ෂෙත්‍රයෙහි; සුපතිට්ඨිතත්තා, මනාකොට පිහිටි බැවින්; තස්ස, ඒ දානයාගේ; ඵලං, විපාක ඵලය; ඊදිසං ආසි, මෙබඳුවිය.

136. පුච්ඡාමි තුම්හෙ වසතං ඉධේ'වං
වදෙථ කිත්තාවතකොන්නු ආයු,
සුඛෙ ඨිතානං පියමෙ'ව අත්තා
චිරං වසිස්සන්තු අපාපකම්මා.

තුම්හෙ, තොප; පුච්ඡාමි, විචාරමි; ඉධ, මෙහි; එවං, මෙසේ; වසතං, වාසයකරන්නාවූ තොපගේ; ආයු, ආයුඃකාලය තෙම; කිත්තාවතකොන්නු, කොපමණෙක්ද; වදෙථ, (එය) කියව්; සුඛෙ, සැපයෙහි; ඨිතානං, සිටියවුන්ට; අත්තා, ආත්මය (තමා); පියං එව; ප්‍රියවේමය (එහෙයින්); අපාපකම්මා, පාපකම් නැත්තෝ (කුශල ක්‍රියාඇත්තෝ); චිරං, බොහෝකලක්; වසිස්සන්තු, (සැපසේ) වාසය කෙරෙත්වා.

137. භියෙ‍්‍යා සුඛං එත්ථ'නුභූයමානා
අනන්තරායෙ'ත්ථ වසාම යාව,
මෙත්තෙය්‍යනාථස්ස ජිනස්ස පත්ති
ඉතො චුතා කෙතුමතිං ගමාම.

එත්ථ, මෙහි; භීයෙ‍්‍යා, බොහෝසෙයින්; සුඛං, භවභොගසම්පත් සුව; අනුභූයමානා, අනුභවකරන්නාවූ අපි; අනන්තරායා, අනන්තරාය විරහිතව; මෙත්තෙය්‍යනාථස්ස, මෛත්‍රෙය සම්‍යක්සම්බුඬවූ; ජිනස්ස, සර්වඥයන්වහන්සේගේ; පත්ති, ප්‍රාප්ති තොමෝ (හෙවත්) ලෝපහලවීම; යාව; යම්තාක්ද (ඒතාක්); එත්ථ, මෙහි; වසාම, වාසය කරම්හ; ඉතො, (එකල්හි) මෙයින්; චුතා, චුතව; කෙතුමතිං, කෙතුමතීනම් රාජධානියට; ගමාම, (උත්පත්තිවශයෙන්) පැමිණෙමු.

138. අඩ්ඪෙ කුලෙ පූජිතලොකසම්මතෙ
ජාතා තතො තස්ස ජිනස්ස ධම්මං,
සුත්වාන දත්වාන සසාවකස්ස
අනූපමං උත්තමදානම'ග්ගං.

පූජිත, ලොවැස්සන් විසින් පුදනලද්දාවූ; ලොකසම්මතෙ, (උච්ච යයි) ලොකසම්මතවූ; අඩ්ඪෙ, ධනයෙන් ආඪ්‍යවූ; කුලෙ, බමුණුමහ සල් කුලයෙක්හි; ජාතා, (එසේ) උපන්නාවූ (අපි); තතො, ඉක්බිති; තස්ස ජිනස්ස, ඒ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේගේ; ධම්මං, ධර්මය; සුත්වාන, අසා; සසාවකස්ස, ශ්‍රාවකසඞ්ඝයා සහිත බුදුන්ට; අනූපමං, උපමා රහිතවූ; අග්ගං, අග්‍රවූ; උත්තමදානං, උතුම්දනක්; දත්වාන, දී.

139\. පබ්බජ්ජ සබ්බඤ්ඤු සුපාකටා නො
පූරෙත්ව සීලං පටිපත්තිසාරං,
තදා කරිස්සාම ජිනස්ස සාසනෙ
භවස්ස අන්තං මුනිනො සකාසෙ'ති.

සබ්බඤ්ඤු, සැමතන්හි; සුපාකටා, සුප්‍රකටවූ; නො, අපි; තදා, එකල්හි; ජිනස්ස, බුදුන්ගේ; සාසනෙ, සස්නෙහි; පබ්බජ්ජ, පැවිදිව; පටිපත්තිසාරං, ප්‍රතිපත්තියෙන් සාරවූ; සීලං, සිව්පිරිසිදු සිල්; පූරෙත්වා, පුරා; මුනිනො, මුනීන්ද්‍රයන්වහන්සේගේ; සකාසෙ, සමීපයෙහිදී; භවස්ස, භවයාගේ; අන්තං, කෙළවර; කරිස්සාම, කරන්නෙමු.

140\. ආරුය්හ දානමයනාවම'නූනපඤ්ඤා,
සද්ධාලඞ්කාරසහිතං ගුණභණ්ඩපුණ්ණං,
සංසාරපාපදුරිතාකරසාගරස්ස
පාරං පයන්ති සුජනා න චිරෙන එවං.

එවං, මෙසේ; අනූනපඤ්ඤා, බොහෝ ප්‍රඥා ඇත්තාවූ; සුජනා, සත්පුරුෂ ජනයෝ තුමූ; සද්ධාලඞ්කාරසහිතං, ශ්‍රද්ධා නැමැති රුවල සහිතවූ; ගුණභණ්ඩපුණ්ණං, ගුණනැමැති බඩු පිරූ; දානමයනාවං, දාන නැමැති නැවට; ආරුය්හ, නැගී; සංසාරපාපදුරිතආකරසාගරස්ස, පාපනැමැති උපද්‍රවයන්ට උත්පත්තිස්ථානවූ සංසාරසාගරයාගේ; පාරං, පරතෙරට; නචිරෙන, නොබෝකලකින්ම; පයන්ති, පැමිණෙති.

ජ ය ම ප ත් ති කා ව ස් තු ව, 9.

---

141\. සුලද්ධා වත'යං ජාති සුප්පභාස'ජ්ජවාසරං,
යං අද්දසාසිම'ජ්ජා භො තස්ස මෙ සුගතොරසං.

භො, පින්වත්නි; අ, ආශ්චර්‍ය්‍යයි; යං, යම්හෙයකින්; අජ්ජ, අද දින; සුගතොරසං, බුද්ධපුත්‍රයෙක්; අද්දසාසිං, දුටුයෙම්ද (ඒ හෙයින්); තස්ස මෙ, (බොහෝකලක් දුක්වින්දවූ) ඒමට; අජ්ජවාසරං, අද මේ දවස; සුප්පභාසං, අතිශයින් ප්‍රභා සහිත විය; වත, ඒකාන්තයෙන්; අයං ජාති, මේ උත්පත්තිතොමෝ; සුලද්ධා, මනාකොට ලබන ලද්දීය.

142. යම්'හං අද්දසං භික්ඛුං පටිපත්තිපරායනං,
ආහුණෙය්‍යං පාහුණෙය්‍යං තස්ස'ජ්ජ මම මඞ්ගලං.

අහං, මම; අජ්ජ, අද; පටිපත්තිපරායනං, ප්‍රතිපත්තිය පිහිට කොට ඇති; ආහුණෙය්‍යං, (වෙතට පැමිණ පිදියයුතු හෙයින්) ආහුණෙය්‍යවූ; පාහුණෙය්‍යං, (පණ්ණාකාරපෙසණාදියෙන් පිදියයුතු හෙයින්) පාහුණෙය්‍යවූ; යං භික්ඛුං, යම් බුද්ධපුත්‍රයෙක්; අද්දසං, දුටුයෙම්ද (එහෙයින්); තස්ස මම, ඒ මට; මඞ්ගලං, මඞ්ගලයක් (යහපතක්) වෙයි.

143. යස්ස දින්නං යස්ස යිට්ඨං යඤ්ඤක්ඛෙත්තම්හි රොපිතං,
අකාලිකඵලං හොති සො'ජ්ජ දිට්ඨො මයා මුනි.

යස්ස, යම් සඞ්ඝරත්නයකට; දින්නං, දෙනලද්දවූ; යස්ස, යම් සඞ්ඝරත්නයකට; යිට්ඨං, පුදනලද්දවූ; යඤ්ඤක්ඛෙත්තම්හි, යම් සඞ්ඝරත්නසඞ්ඛ්‍යාත පුණ්‍යක්ෂෙත්‍රයෙක්හි; රොපිතං, රොපනයකරණලද්දවූ (දනනැමැති බිජුවට); අකාලිකඵලං හොති, කල්නොයවා ලබන විපාකඵල ඇතිවේද; සො මුනි, ඒ මුනිතෙම; අජ්ජ, අද; මයා, මා විසින්; දිට්ඨො, දක්නා ලදී.

144. අදින්නත්තා පුරෙ දානං සමණබ්‍රාහ්මණයාචකෙ,
දෙවභූතස්ස මය්හ'ම්පි න ලබ්භති තථාවිධං.

පුරෙ, පූර්වකාලයෙහි; සමණබ්‍රාහ්මණයාචකෙ, මහණබමුණු යදියන්ට; දානං, දානයක්; අදින්නත්තා, නුදුන් බැවින්; දෙවභූතස්ස අපි, දිව්‍යාත්මයෙහි උපන්නාවූද; මය්හං, මට; තථාවිධං, එබඳුවූ ආහාරයක්; න ලබ්භති, නොලැබෙයි.

145. අජ්ජ යෙන මමං දින්නං ආලොපං චරිමං'ප'හං,
තස්සෙ'ව'දාසිං සො භුඤ්ජි මමා'නුග්ගහබුද්ධියා.

යෙන, යම් ආයුෂ්මත්වහන්සේ කෙණෙකුන් විසින්; අජ්ජ, අද; මමං, මට; චරිමං, චරිමවූ; ආලොපං, එකම බත්පිඩ; දින්නං, දෙන ලද්ද; අහං අපි, මමද; තස්ස එව, උන්වහන්සේටම; අදාසිං, (එය) දුනිමි; සො, ඒ ආයුෂ්මත්වහන්සේ; මම; මට; අනුග්ගහබුද්ධියා, අනුග්‍රහබුද්ධියෙන් (මාකෙරෙහි කරුණාවෙන්); භුඤ්ජි, (එය) වැළඳූසේක.

146. අජ්ජෙ'ව දානං දත්වාන දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ,
ඵලං ලද්ධොස්මි අජ්ජෙ'ව අහො මෙත්තමහන්තතා.

දක්ඛිණෙය්‍යෙ, දක්ෂිණාර්හවූ; අනුත්තරෙ, නිරුත්තරවූ (සඞ්ඝ

රතනයට); අජ්ජ එව, අදම; දනං, දනයක්; දත්වාන, දී; ඵලං, විපාක ඵලය; අජ්ජ එව, අදම; ලඩොසම්, ලැබූයේ වෙමි; මෙත්ත මහන්තතා, මෛත්‍රී මහත්වය; අහො, ආශ්චර්‍ය්‍යයි.

147. අකාලිකො'ති යං ආහු සුගතො සුගතොරසං,
තදත්ථො අජ්ජ මෙ ඤාතො ඵලං සච්ඡිකතො පුන.

සුගතොරසං, බුද්ධපුත්‍රවූ සඞ්ඝරතන ගුණසම්බන්ධවූ; යං, යම්ධර්‍මයක්; අකාලිකො ඉති, අකාලිකයයි (කල්නොයවා දෙන විපාකඵල ඇත්තේයයි); සුගතො, බුදුරජතෙම; ආහු, වදලසේක්ද; තදත්ථො, ඒ අර්ථය (ඒ කාරණය) තෙම; අජ්ජ, අද; මෙ, මාවිසින්; ඤාතො, දන්නාලදී; පුන, නැවත; ඵලං, ප්‍රතිඵලය; සච්ඡිකතො, (ප්‍රතිලාභ වශයෙන්) ප්‍රත්‍යක්ෂ කෙළෙමි.

148. සබ්‍යඤ්ජනං සොපකරණං සුධන්නං සාදුම'ක්ඛයං,
අට්ඨවාටි පාතුභූතං අහො දනඵලං අහො'ති.

සබ්‍යඤ්ජනං, ව්‍යඤ්ජන සහිතවූ (රසමසවුලෙන් යුක්තවූ); සොපකරණං, උපකරණ සහිතවූ; සාදුං, මධුරවූ (යහපත්වූ); අක්ඛයං, පරික්ෂීණ නොවන්නාවූ; සුධන්නං, සුධාභොජන (පිරූ); අට්ඨවාටි, මහසැලි අටක්; පාතුභූතං, පහළවිය; දනඵලං, දන යාගේ විපාකඵල වනාහි; අහො අහො, අතිශයින් ආශ්චර්‍ය්‍යමැයි.

149. යො සීලවන්තමහියං සුචි පුඤ්ඤභූත
සද්ධාලවාළවලයෙ සුචි දනබීජං,
රොපෙති සො ජනිතකප්පමහාදුමින්දො
සග්ගාපවග්ගවිපුලං දදතෙ ඵලමෙහා.

හො, පින්වත්නි; යො, යම්ශ්‍රද්ධාවන්තයෙක් තෙම; සීලවන්තමහියං, සිල්වත් සඞ්ඝනැමැති පෘථිවියෙහි; සුචිපුඤ්ඤභූත, පිවිතුරු පින්වූ; සද්ධාඅලවාලවලයෙ, ශ්‍රද්ධා නැමැති තොතැනිමඩුල්ලෙහි; සුචි, පවිත්‍රවූ; දනබීජං, දනනැමැති බිජුවටක්; රොපෙති, රොපනය කෙරෙයිද; සො ජනිතකප්පමහාදුමින්දො, ඒ දනබීජයෙන් උපන් මහාකල්පවෘක්ෂය තෙම; සග්ගාපවග්ග, ස්වර්ගාපවර්ගසම්පත්තින්; විපුලං, මහත්වූ; ඵලං, විපාක ඵල; දදතෙ, දෙයි.

දෙ ම පු ත්ත ව ත්‍ථු ව, 10.

---

සීලුත්තනවග්ගො නවමො.

1. සෙතමඞ්ගො සෙතවණ්ණො සෙතාභරණභූසිතො,
සෙතඞ්ගරාගලිත්තඞ්ගො සෙතමාලාවිභූසිතො.

සෙතමඞ්ගො, ශ්වෙතවර්ණ ශරීරඇත්තාවූ; සෙතවණ්ණො, ශ්වෙත වර්ණ වස්ත්‍රඇත්තාවූ; සෙතාභරණභූසිතො, ශ්වෙතාභරණ පැළැන් දවූ; සෙතඞ්ගරාගලිත්තඞ්ගො, ශ්වෙතවර්ණ සුගන්ධාඞ්ගරාගයෙන් ආලෙපකරණලද අවයව ඇත්තාවූ; සෙතමාලා විභූසිතො, ශ්වෙත වර්ණ මල්මාලාවෙන් අලඞ්කෘතවූ; (ඒ දිව්‍යපුත්‍ර තෙම).

2. සෙතාලඞ්කාරසඤ්ඤුත්තං සෙතසින්ධවයොජිතං,
සෙතාසනසුපඤ්ඤත්තං සෙතමා'රුය්හ සන්දනං.

සෙතාලඞ්කාරසඤ්ඤුත්තං, ශුභ්‍රවර්ණ අලඞ්කාරයෙන් යුක්තවූ; සෙතසින්ධවයොජිතං, සුදු අසුන් යොදන ලද්දාවූ; සෙතාසන සුපඤ්ඤත්තං, මනාකොට පණවන ලද (ස්ඵටික මාණික්‍යමය) ශ්වෙතවර්ණ ආසන ඇති; සෙතං, ශුභ්‍රවර්ණවූ; සන්දනං, රථයකට; ආරුය්හ, නැගී:—

3. ඔභාසයං දිසා සබ්බා අගච්ඡති මහායසො,
අථා'පි තං මහාසෙනා පරිවාරෙන්ති ඊදිසා.

මහායසො, මහත් යශස් ඇත්තේ; සබ්බාදිසා, සියලුදිගුන්; ඔභාසයං, (වස්ත්‍රාභරණයෙන් හා ශරීරාලෝක කරණකොටගෙණ) බබුලුවමින්; අගච්ඡති, එයි; අථඅපි, තවද; ඊදිසා, මෙබඳුවූ; මහාසෙනා, මහාසෙනා තුමූ; තං, ඔහු; පරිවාරෙන්ති, පිරිවරත්.

4. සෙතාලඞ්කාරවසනා සෙතගන්ධානුලෙපිනො,
පග්ගය්හ පණ්ඩරච්ඡත්තෙන පතාකායො ධජෙ තථා.

සෙතාලඞ්කාරවසනා, ශුභ්‍රවර්ණ අලඞ්කාර වස්ත්‍රඇත්තාවූ; සෙතගන්ධානුලෙපිනො, සුදු සුවඳ ආලෙපකළාවූ දෙවියෝ; පණ්ඩරච්ඡත්තෙන, ධවලාතපත්‍රයන්ද; තථා, එසේම; ධජෙ, (සුදුවූ) ධ්වජයන්ද; පතාකායො, (සුදුවූ) පතාකාවන්ද; පග්ගය්හ, ගෙණ:—

5. දෙවතා පරිවාරෙන්ති සමන්තා චතුයොජනෙ,
කීළන්ති අථ සෙලෙන්තා උල්ලඞ්ඝන්තා සමන්තතො.

සමන්තා, හාත්පස; චතුයොජනෙ, සිව්යොදනෙක්හි; දෙවතා, දෙවතාවෝ; පරිවාරෙන්ති, ඔහු පිරිවරත්; අථ, නැවත; සෙලෙන්තා, (දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ) දිවසළු ඉසවට නටවමින්; සමන්තතො, හාත්පස; උල්ලඞ්ඝන්තා, උල්ලඞ්ඝනයකරන්නාහු; කීළන්ති, ක්‍රීඩා කෙරෙති.

6. සේතචාමරමුග්ගය්හ සේතාභරණභූසිතා,
වීජෙන්ති සුරකඤ්ඤායො දෙවපුත්තං මහිද්ධිකං.

සෙතාභරණභූසිතා, ශ්වේතාභරණයෙන් විභූෂිතවූ; සුරකඤ්ඤායො, දහස්ගණන් දිව්‍යස්ත්‍රීහු; සෙතචාමරං, සුදුසෙමෙර; උග්ගය්හ, ගෙණ; මහිද්ධිකං, මහත් සෘද්ධිඇත්තාවූ; දෙවපුත්තං, දිව්‍ය පුත්‍රයාට; වීජෙන්ති, පවන් හෙලත්-

7. පඤ්චඞ්ගිකානි තුරියානි පග්ගය්හ සුරසුන්දරී,
වජ්ජෙන්ති මධුරං තත්ථ මොදෙන්ති තං මනොරමා.

මනොරමා, සිත්කලූවූ; සුරසුන්දරී, දහස්ගණන් දිව්‍යකන්‍යාවෝ; පඤ්චඞ්ගිකානිතුරියානි, පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යභාණ්ඩයන්; පග්ගය්හ, ගෙණ; තත්ථ, එහි; මධුරං, මිහිරිකොට; වජ්ජෙන්ති, වයමින්; තං, ඔහු; මොදෙන්ති, සතුටුකෙරෙත්.

8. සත්තසරානුගං ගීතිං තාරාදිලයසංයුතං,
වාදෙන්ති තන්ති යො තත්ථ ගායන්ති සුරසුන්දරී.

තත්ථ, එහි; සුරසුන්දරී, ඇතැම් දිව්‍යස්ත්‍රීහු; සත්තසරානුගං, සප්තස්වරානුගතකොට; තාරාදිලයසංයුතං, තාරාදි එක්සියවිසි ලයකින් යුක්තකොට; ගීතිං ගායන්ති, ගී ගයත්; තන්තියො වාදෙන්ති, වෙණ වයත්.

9. තම්බබිම්බාධරා චාරු පයොධරභරා සුභා,
විසාලායතනීලක්ඛා සබ්බාවයවමණ්ඩිතා.

තම්බබිම්බාධරා, කෙම්පල වැනි සුරක්ත අධර ඇති; චාරු, මනොඥවූ; පයොධරභරා, පියයුරු බරින්; සුභා, සුභවූ; විසාලආයතනීලක්ඛා, දිගුපුලුල් නිල්වන් ඇස් ඇති; සබ්බාවයවමණ්ඩිතා, සියලු අවයව සම්පත්තීන් සොභමානවූ; (ඇතැම් දිව්‍යස්ත්‍රීහු).

10. නච්චන්ති පුරතො තස්ස භෙරිමණ්ඩලමජ්ඣගා,
හාවභාවරසූපෙතා මනුඤ්ඤා නයනුස්සවා.

හාවභාවරසූපෙතා, හාවභාවලීලාරසයෙන් යුක්තවූ; මනුඤ්ඤා, මනොඥවූ; නයනුස්සවා, නෙත්‍රොත්සවවූ (දර්ශනීයවූ); භෙරිමණ්ඩලමජ්ඣගා, බෙරමඬුලු මැදට පැමිණියාවූ; තස්ස, ඒ දිව්‍යපුත්‍රයාගේ; පුරතො, ඉදිරියෙහි; නච්චන්ති, නෘත්‍ය කෙරෙති.

11. න මෙ එතාදිසො ධීර දිට්ඨපුබ්බො කුදාචනං,
පුට්ඨො ආචික්ඛ මෙ එසො කිං පුඤ්ඤමකරා පුරෙ'ති.

සීර, ධෘතිමත් සවාමීන්වහන්ස; එතාදීසො, මෙබන්දෙක්; මෙ, මාවිසින්; කුදවනං, කිසිකලෙකත්; න දිට්ඨපුබ්බො; නොදිටු විරූය; මෙ, මාවිසින්; පුට්ඨො, විචාරණලද ඔබ; එසො, මේතෙම; පුරෙ, පෙර; කිං පුඤ්ඤං, කවරනම් පිණක්; අකරා ඉති, කෙලේදැයි; ආචික්ඛ, වදාළමැනව.

12. ලඞ්කාදීපම්හි හො එසො ගාමෙ කම්මාරනාමකෙ,
එකො ගොපාලකො ආසි රක්ඛනෙතා ගොගණං හි සො.

හො, පින්වත් උපාසකය; එසො, මේ දිව්‍යපුත්‍රතෙම; ලඞ්කාදීපම්හි, ලක්දිව; කම්මාරනාමකෙ ගාමෙ, කඹුරුගමුවෙහි; එකො ගොපාලකො ආසි, එක් ගොපලුදරුවෙක් වූයේය, සො හි, හෙතෙම වනාහි; ගොගණං, ගෙරිමුළ, රක්ඛනෙතා, රක්නේ.—

13. දිස්වා සුපුප්ඵිතං එකං වලල්ලිගුම්බං මනොරමං,
සො තං තමුපසංකම්ම මාලමොචිනි පුප්ඵිතං.

සුපුප්ඵිතං, සුපුෂ්පිතවූ; මනොරමං, සිත්කළුවූ; එකං වලල්ලිගුම්බං, එක් වැල්ගාලක්; දිස්වා, දැක; සො, ඒ ගොපළුතෙම; තං, ඒ වැල් ගාල ලඟට; උපසංකම්මං, එළඹ; පුප්ඵිතං, පිපියාවූ; තං මාලං, ඒ මල්; ඔචිනි, නෙලාගෙණ:—

14. පිළන්ධිත්වාන තං ගය්හ සීසෙ ච කණ්ණජන්තුසු,
පූජයිත්වාන තං සබ්බං ගච්ඡං වම්මිකමුද්ධනි.

සීසෙ ච, හිසෙහිද; කණ්ණජන්තුසු, දෙකණ දෙව්රද; පිළන්ධිත්වාන, පැළඳ; ගච්ඡං, යන්නේ; තං, ඒමල; ගය්හ, (නැවත සිරුරෙන්, ගෙණ, වම්මිකමුද්ධනි, තුඹසක් මුදුනෙහි; තං සබ්බං, ඒ සියල්ලම, පූජයිත්වාන, (බුදුන්ට පූජාවේවයි සිතා පූජාකොට:—

15. වන්දිත්වාන අපක්කනෙතා දට්ඨො ආසිවිසෙන සො,
චවිත්වා දෙවලොකම්හි ජාතො එත්ථ මනොරමෙ

වන්දිත්වාන, දෙහොත් මුදුන්දී වැඳ; අපක්කනෙතා, එයින් බැහැර ගියේ; ආසිවිසෙන, අශීර්විෂයෙකු විසින්; දට්ඨො, දෂ්ට කරණ ලද්දේ; සො, හෙතෙම; (ඒ විෂ කරණකොටගෙණ); චවිත්වා, එයින් සැව: මනොරමෙ, සිත්කළුවූ; එත්ථ, මෙහි; දෙවලොකම්හි, දෙව්ලොව; ජාතො, උපන්නේය

16. දිබ්බකාමෙහි මොදෙනෙතා දෙවිස්සරියමණ්ඩිතො,
මහිද්ධිකො ච සො ආසි පුප්ඵපූජායිදං ඵලං'ති.

ෂසො, හෙතෙම; දිබ්බකාමෙහි, දිව්‍යමයවූ පචකාමසම්පත්තියෙන්; මොදෙනෙනා, සතුටුවන්නේ; දෙවිස්සරියමණ්ඩිතො, දිව්‍යඉසුරෙන් ප්‍රතිමණ්ඩිතවූයේ; මහිඞ්ඪිකො ච, මහත් සෘද්ධි ඇත්තෙක්ද; අසි, විය; පුප්ඵපූජාය, මල්පූජාවෙහි; ඉදං ඵලං ඉති, මේ විපාකඵලයයි වදාලසේක.

17. රතනවණ්ණො රතනවණ්ණො රතනාභරණභූසිතො,
රතනඩ්ගරාගලිත්තඩ්ගො රතනමාලාවිභූසිතො.

රතනවණ්ණො, (බඳුවදමල්දමක්මෙන්) රත්නවණ්ණ ගාත්‍ර ඇත්තාවූ; රතනවණ්ණො, රත්නවස්ත්‍ර පැළඳින්නාවූ; රතනාභරණභූසිතො, රතුඅබරණින් සැරසුනාවූ; රතනඩ්ගරාග, රත්සුවඳකලලින්; ලිත්තඩ්ගො, ආලෙපකරණ ලද ශරීර ඇති; රතනමාලාවිභූසිතො, රත්මල්දමින් අලඩ්කෘතවූ; (ඒ දිව්‍යපුත්‍ර තෙම්)

18. රතනාලඩ්කාරසංයුත්තං රතනසිඩ්ඛවයොජිතං,
රතනාසනසුපඤ්ඤත්තං රතනමාරුය්හ සන්දනං.

රතනාලඩ්කාරසංයුත්තං, (ලොහිතඩ්කමාණික්‍යමය) රක්තවණ්ණ අලඩ්කාරයෙන් යුක්තවූ; රතනසිඩ්ඛවයොජිතං, රතු අසුන්යොදනලද්දාවූ; රතනාසනසුපඤ්ඤත්තං, මොනවට පණවනලද (පදමරාගමාණික්‍යමය) රක්තවණ්ණ ආසන ඇති; රතනං සන්දනං, (ලොහිතඩ්ක මාණික්‍යමයවූ) රත්වන් රියකට; ආරුය්හ, නැඟී:—

19. ඔභාසයං දිසා සබ්බා ආගච්ඡති මහායසො,
අථා'පි තං මහාසෙනා පරිවාරෙන්ති ඊදිසා.

මහායසො, මහත් යශස් ඇත්තාවූ (හෙතෙම); සබ්බා දිසා, සියලු දිගුන්; ඔභාසයං. බබුලුවමින්; ආගච්ඡති, ආගමනය කෙරෙයි; අථ අපි, තවද; තං, ඒ දිව්‍යපුත්‍රයා; ඊදිසා, මෙබඳුවූ; මහාසෙනා, මහ දිවසෙන්තුමූ; පරිවාරෙන්ති, පිරිවරත්

20. රතනාලඩ්කාරවසනා රතනගන්ධානුලෙපිනො,
පග්ගය්හ ලොහිතච්ඡත්තෙන පතාකායො ධජෙ තථා,
දෙවතා පරිවාරෙන්ති සමන්තා චතුයොජනෙ.

රතනාලඩ්කාරවසනා, රක්තවණ්ණඅලඩ්කාරවස්ත්‍රඇත්තාවූ; රතනගන්ධානුලෙපිනො, රත්සුවඳ සුණු ආලෙපකළාවූ; දෙවතා. දෙවතාවෝ; ලොහිතච්ඡත්තෙන, රක්තවණ්ණ ඡත්‍රද; පතාකායො, (රතු) පතාකාවන්ද; තථා, එසේම (රතුවූ); ධජෙ, ධජයන්ද; පග්ගය්හ, ගෙණ සමන්තා, හාත්පස; චතුයොජනෙ, සිව්යොදුනක් පමණ තැන්හි; පරිවාරෙන්ති, ඔහු පිරිවරත්.

21\. කිළන්ති අථ සෙලෙන්තා උල්ලඞ්ඝන්තා සමන්තතො,
රතනචාමරමුග්ගයහ රතනාභරණභූසිතා,
වීජෙන්ති සුරකඤ්ඤායො දෙවපුත්තං මහිඩ්ඪිකං.

අථ, සළිදු (දහස්ගණන් දෙවියෝ); සෙලෙන්තා, දිවසළු ඉසවට සලමින්; සමන්තතො, හාත්පස; උල්ලඞ්ඝන්තා, උල්ලඞ්ඝනයකර මින් (උඩපැනපැන); කීළන්ති, කෙළිති; සුරකඤ්ඤායො, දහස් ගණන් දෙවඟනෝ; රතනාභරණභූසිතා, රතුවන් අබරණින් සැර සුනාහු; රතනචාමරං, රතු සෙමෙර; උග්ගයහ, ඔසවාගෙණ; මහි ඩ්ඪිකං, මහත් සෘඩිඇත්තාවූ; දෙවපුත්තං, දිව්‍යපුත්‍රයාට; වීජෙන්ති, පවන් හලත්.

22\. පඤ්චඞ්ගිකානි තුරියානි පග්ගයහ සුරසුන්දරී,
වජ්ජෙන්ති මධුරං තත්‍ථ මොදෙන්තී තං මනොරමා.

මනොරමා, මනොහරවූ; සුරසුන්දරී, ඇතැම් දිව්‍යස්ත්‍රීහු; පඤ්චඞ්ගි කානි තුරියානි, පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යභාණ්ඩයන්; පග්ගයහ, රැගෙණ; තත්‍ථ, ඒ දිව්‍යපුත්‍රයා ඉදිරියෙහි; මධුරං, මිහිරිකොට; වජ්ජෙන්තී, වයමින්; තං, ඔහු; මොදෙන්ති, සතුටුකෙරෙති.

23\. සත්තසරානුගං ගීතිං තාරාදිලයසංයුතං,
වාදෙන්ති තන්තියො තත්‍ථ ගායන්ති සුරසුන්දරී.

තත්‍ථ, එහි; සුරසුන්දරී, සමහර දිව්‍යස්ත්‍රීහු; සත්තසරානුගං, සප්ත ස්වරය අනුගතකොට; තාරාදිලයසංයුතං, තාරාදි එක්විසිලයින් යුක්තකොට; ගීතිං ගායන්ති, ගී ගයත්; තන්තියො වාදෙන්ති, වෙණ වයත්.

24\. තම්බබිම්බාධරා චාරු පයොධරභරා සුභා,
විසාලායතනීලක්ඛා සබ්බාවයවමණ්ඩිතා.

25\. නච්චන්ති පුරතො තස්ස හෙරිමණ්ඩලමජ්ඣගා,
භාවභාවරසූපෙතා මනුඤ්ඤා නයනූස්සවා.

තම්බබිම්බාධරා, තඹවන් බිඹුපල වැනි තොල්ඇති; චාරු, මනො ඥවූ; පයොධරභරා, පියයුරුබරින්, සුභා, ශොභනවූ; විසාල, පුළුල්වූ; ආයත, දික්වූ; නීලක්ඛා, නිල්වන් ඇස් ඇති; සබ්බාවයව මණ්ඩිතා, සියලු අවයවයන්ගෙන් හෙබියාවූ; හෙරිමණ්ඩලමජ්ඣගා, බෙරමඬුලුමැදට පැමිණියාවූ; භාවභාවරසූපෙතා, භාවභාවලීලා රසයෙන් යුක්තවූ; මනුඤ්ඤා, මනොඥවූ; නයනූස්සවා, නෙත්‍රොත් සවවූ (දිව්‍යස්ත්‍රීහු); තස්ස, ඔහුගේ; පුරතො, ඉදිරියෙහි; නච්චන්ති, නටති.

26. න මෙ එතාදිසො ධීර දිට්ඨපුබ්බො කුදාචනං,
පුට්ඨො ආචික්ඛ මෙ එසො කිං පුඤ්ඤ'මකරා පුරෙ'ති.

ධීර, ධීරයන්වහන්ස; එතාදිසො, මෙබන්දෙක්; කුදාචනං, කිසි කලෙකත්; මෙ, මාවිසින්; න දිට්ඨපුබ්බො, නොදිටුවිරූය; මෙ, මාවිසින්; පුට්ඨො, විචාරණලද ඔබ; එසො, මේතෙම; පුරෙ, පූර්වකාලයෙහි; කිං පුඤ්ඤං, කවරනම් පිණක්; අකරා ඉති, කෙළේදැයි; ආචික්ඛ, වදාළ මැනව.

27. ලඞ්කාදීපම්හි හො එසො ගාමෙ අඤ්ඤතරෙ පුරෙ,
ගොපාලදාරකො ආසි රක්ඛන්තො ගොගණං හි සො.

හො, පින්වත් උපාසකය; එසො, මේතෙම; පුරෙ, පූර්වකාලයෙහි; ලඞ්කාදීපම්හි, ලක්දිව; අඤ්ඤතරෙ ගාමෙ, එක්තරාගමක; ගොපාලදාරකො, ගොපළුදරුවෙක්; ආසි, විය; සො හි, හෙතෙම වනාහි; ගොගණං, ගෙරිමුල; රක්ඛන්තො, රක්නේ:—

28. නෙත්වාන ගොගණං තත්‍ථ ජජ්ජරවහමහානදිං,
කීළන්තො වාලුකා තත්‍ථ දාරකෙහි සහා තහිං.

තත්‍ථ, එහි; ගොගණං, ගොසමූහයා; ජජ්ජරවහමහානදිං, දූදුරුහොයනම් මහානදියට; නෙත්වාන, ගෙණගොස්; තත්‍ථ, එහි; දාරකෙහි සහ, සෙසු ගොපළුදරුවන් සමග; තහිං, එහි; වාලුකා කීළන්තො, වැලිකෙළින්නේ:—

29. කත්වාන වාලුකා ථූපං රත්තමාලාහි පූජිය,
ආසිඤ්චිත්වා ජලං තත්‍ථ කත්වානා'තපසංවරං.

වාලුකාථූපං, වැලිකොනක්; කත්වාන, කොට; රත්තමාලාහි, රත්මලින්; පූජිය, පුදා; තත්‍ථ, එහි, ජලං, දිය; ආසිඤ්චිත්වා, ඉස; ආතපසංවරං, (මල් නොවියලෙනසේ) ආතපසංවරණය (කොලමඩුවක්); කත්වාන, කොට:—

30. තදහෙ රත්තිභාගස්මිං වාතාබාධෙන සො මතො,
ඉමස්මිං දෙවලොකස්මිං උපපජ්ජිත්වා මනොරමෙ.

තදහෙ, එදවස්; රත්තිභාගස්මිං, රාත්‍රිකාලයෙහි; වාතාබාධෙන, වාතාබාධයක් කරණකොටගෙණ; සො, හෙතෙම; මතො, මළේ; මනොරමෙ, සිත්කලුවූ; ඉමස්මිං, මේ; දෙවලොකස්මිං, දිව්‍යලොකයෙහි; උපපජ්ජිත්වා, ඉපිද:—

31. දිබ්බකාමෙහි මොදෙන්තො දෙවිස්සරියමණ්ඩිතො,
මහිද්ධිකො ච ද්‍යො ආසි පුප්ඵපූජායිදං ඵලං'ති.

දිබ්බකාමෙහි, දිව්‍යමයවූපඤ්චකාමසම්පත්තියෙන්; මොදන්තො, සතුටුවන්නේ; දෙවිස්සරියමණ්ඩිතො, දිවඉසුරෙන් ප්‍රතිමණ්ඩිතවූයේ; සො, හෙතෙම; මහිද්ධිකො ච, මහත් සෘද්ධිඇත්තෙක්ද; අසි, වූයේය; පුප්ඵපූජාය, මල්පූජාවෙහි; ඉදං ඵලං ඉති, මේ විපාක ඵලයයි වදාළසේක.

32. සොණ්ණවණ්ණො සොණ්ණවත්ථො සොණ්ණාභරණභූසිතො,
සොණ්ණවණ්ණඞ්ගරාගඞ්ගො සොණ්ණමාලාවිභූසිතො.

සොණ්ණවණ්ණො, රන්වන් පැහැ ඇති; සොණ්ණවත්ථො, සුවර්ණවර්ණවස්ත්‍රඇත්තාවූ; සොණ්ණාභරණ, රන්වන් අබරණින්, භූසිතො, සැරසුනාවූ; සොණ්ණවණ්ණ, රන්වන්වූ; අඞ්ගරාගඞ්ගො, අඞ්ග රාග සහිත ශරීර ඇති; සොණ්ණමාලා, රන්වන් මල්දමින්; විභූසිතො, විශෙෂයෙන් අලඞ්කෘතවූ; (ඒ දිව්‍යපුත්‍රතෙම).

33. සොණ්ණාලඞ්කාරසංයුත්තං සොණ්ණසිඛවයොජිතං,
සොණ්ණාසනසුපඤ්ඤත්තං සොණ්ණමා'රූය්හ සන්දනං.

සොණ්ණාලඞ්කාර, සුවර්ණමය අලඞ්කාරයෙන්; සංයුත්තං, යුක්තවූ; සොණ්ණසිඛවයොජිතං, රන්වන් අසුන් යොදනලද; සොණ්ණාසනසුපඤ්ඤත්තං, මොනවට පණවන ලද රන්මුවා අසුන් ඇති; සොණ්ණං සන්දනං, රන්මුවා රියකට; ආරූය්හ, නැගී:—

34. ඔභාසයං දිසා සබ්බා ආගච්ඡති මහායසො,
අථො'පි නං මහාසෙනා පරිවාරෙන්ති ඊදිසා.

මහායසො, මහත් යශස් ඇත්තේ; සබ්බා දිසා, සියලු දිගුන්; ඔභාසයං, බබුලුවමින්, ආගච්ඡති, එයි; අථ අපි, තවද; ඊදිසා, වක්ෂ්‍යමාණාකාරවූ මහාසෙනා, මහත්වූ දිව්‍යසෙනා තුමූ; නං, ඔහු; පරිවාරෙන්ති, පිරිවරත්.

35. සොණ්ණාලඞ්කාරවසනා සොණ්ණගන්ධානුලෙපිනො,
පග්ගය්හ කඤ්චනච්ඡත්ත පතාකායො ධජෙ තථා,
දෙවතා පරිවාරෙන්ති සමන්තා චතුයොජනෙ.

සොණ්ණාලඞ්කාරවසනා, රන්වන් අලඞ්කාර හා වස්ත්‍ර ඇත්තාවූ; සොණ්ණගන්ධානුලෙපිනො, රන්වන් සුවඳසුණු අලෙප[illegible]වූ; දෙවතා, දෙවතාවෝ; කඤ්චනච්ඡත්ත, සුවර්ණවර්ණ ඡ[illegible]; පතාකායො, රන්මුවා පතාකාවන්ද; තථා, එසේම සුවර්ණමය [illegible]; ධජෙ, ධජයන්ද; පග්ගය්හ, ගෙණ, සමන්තා, හාත්පස්හි; චතුයොජනෙ, සිව්යොදුන් පමණ තැන්හි, පරිවාරෙන්ති, ඔහු පිරිවරා යෙති.

36. කීළන්ති අථ සෙලෙන්තා උල්ලඞ්ඝන්තා සමන්තතො,
සොණ්ණචාමරමුග්ගය්හ සොණ්ණාභරණභූසිතා,
විජෙන්ති සුරකඤ්ඤායො දෙවපුත්තං මහිද්ධිකං.

අථ, යළිදු; සෙලෙන්තා, (දසවට) දිවසළු සලමින්; සමන්තතො, හාත්පසින්; උල්ලඞ්ඝන්තා, උල්ලඞ්ඝනයකරමින්, කීළන්ති, ක්‍රීඩා කරත්; සොණ්ණාභරණභූසිතා, රන් අබරණින් සැරසුනාවූ; සුරකඤ්ඤායො, දිව්‍යසත්හු; සොණ්ණචාමරං, රන්සෙමෙර; උග්ගය්හ, ගෙණ; මහිද්ධිකං, මහත් සෘඬි ඇති; දෙවපුත්තං, දිව්‍යපුත්‍රයාට; විජෙන්ති, පවන් හලත්.

37. පඤ්චඞ්ගිකානි තුරියානි පග්ගය්හ සුරසුන්දරී,
වජ්ජන්ති මධුරං තත්ථ මොදමානා මනොරමා.

මනොරමා, සිත්කළුවූ; සුරසුන්දරී, දෙවඟනෝ; පඤ්චඞ්ගිකානි තුරියානි, පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යභාණ්ඩ; පග්ගය්හ, ගෙණ; තත්ථ, ඒ දිව්‍යපුත්‍රයා ඉදිරියෙහි; මොදමානා, සතුටුවෙමින්; මධුරං, මිහිරි කොට, වජ්ජන්ති, වයත්.

38. සත්තස්සරානුගං ගීතිං තාරාදිලයසංයුතං,
වාදෙන්ති තන්තියො තත්ථ ගායන්ති සුරසුන්දරී.

සුරසුන්දරී, දහස්ගණන් දෙවඟනෝ; සත්තස්සරඅනුගං, සප්තස්වර යට අනුව; තාරාදිලයසංයුතං, තාරාදි එක්වසිලයෙන් යුක්ත කොට; ගීතිං ගායන්ති, ගී ගයත්; තත්ථ, ඒ දිව්‍යපුත්‍රයා ඉදිරියෙහි; තන්තියො වාදෙන්ති, වෙණ වයත්.

39. තම්බබිම්බාධරා චාරූ පයොධරභරා සුභා,
විසාලායතනීලක්ඛා සබ්බාවයවමණ්ඩිතා.

40. නච්චන්ති පුරතො තස්ස භෙරිමණ්ඩලමජ්ඣගා,
භාවභාවරසූපෙතා මනුඤ්ඤා නයනුස්සවා.

තම්බබිම්බාධරා, තඹවන් බිඹුපල වැනි අධර ඇති; චාරූ, මනොඥවූ; සුභා, ශොභනවූ; පයොධරභරා, පයොධරභාර ඇති; විසාලායතනීලක්ඛා, දිගු පුළුල් නිල්වන් ඇස් ඇති; සබ්බාවයවමණ්ඩිතා, සියලු අවයවයෙන් හෙබියාවූ; භාවභාවරසූපෙතා, භාවභාවලීලාරසයෙන් යුක්තවූ; මනුඤ්ඤා, මනොඥවූ; නයනුස්සවා, නෙත්‍රොත්සවවූ; භෙරිමණ්ඩලමජ්ඣගා, බෙරමඬුලුමැදට පැමිණියාවූ (දිව්‍යසත්හු); තස්ස, ඔහුගේ; පුරතො, ඉදිරියෙහි; නච්චන්ති, නටති.

41. න මෙ එතාදිසො ධීර දිට්ඨපුබ්බො කුදාචනං,
පුට්ඨො ආචික්ඛ මෙ එසො කිං පුඤ්ඤමකරා පුරෙනි.

ධීර, පණ්ඩිතයන්වහන්ස; එතාදිසො, මෙබන්දෙක්; මෙ, මාවිසින්; කුදාචනං, කිසිකලෙකත්; න දිට්ඨපුබ්බො, නොදිටුවිරුය; මෙ, මාවිසින්; පුට්ඨො, විචාරණලද ඔබ; එසො, මේතෙම; පුරෙ, පෙර; කිං පුඤ්ඤං, කවරපිණක්; අකරා ඉනි; කෙලේද්‍දයි; මෙ, මට; ආචික්ඛ, වදාළමැනව.

42. ලඞ්කාදීපම්හි හො එසො ගඞ්ගාසනෙන්‍ද මනොරමෙ,
ගාමෙ තිණ්ඩුකනාමම්හි ආසි ගොපාලදාරකො.

හො, පින්වත්නි; එසො, මේතෙම; ලඞ්කාදීපම්හි, ලක්දිව; මනොරමෙ, සිත්කලුවූ; ගඞ්ගාසනෙන්‍ද, මහවැලිගඟ සමීපයෙහි; තිණ්ඩුකනාමම්හි ගාමෙ, තිඹිරිගමුවෙහි; ගොපාලදාරකො, ගොපල්ලූ දරුවෙක්; ආසි, වූයේය.

43. සො'යං ඛිරෙකදා හාවො ගඞ්ගාසනෙන්‍ද සුචාරයං,
දිස්වා කොසාතකිගුම්බං වණ්ණවන්තං සුපුප්ඵිතං.

සො අයං ඛිර, ඒ මේතෙම වනාහි; එකදා, එක්දවසක්; ගඞ්ගාසනෙන්‍ද, ගඟසමීපයෙහි; ගාවො, ගෙරින්; සුචාරයන්, තණකවන්නේ; වණ්ණවන්තං, වණ්වත්වූ; සුපුප්ඵිතං, මනාකොට පිපියාවූ; කොසාතකිගුම්බං, වැටකොලුවැල් ගාලක්; දිස්වා, දැක:—

44. තතො චිණ්ණිත්වා පුප්ඵානි කත්වා වාලුකථූපිකං,
පුප්ඵපූජං කරිත්වාන ඔසිඤ්චිත්වා ජලං තදා.

තතො, එයින්; පුප්ඵානි, මල්; චිණ්ණිත්වා, නෙලාගෙණ; වාලුකථූපිකං, වැලිකොතක්; කත්වා, කොට; තදා, එකල්හි; පුප්ඵපූජං, මල්පූජාවක්; කරිත්වාන, කොට; ජලං, දිය; ඔසිඤ්චිත්වා, ඉස:—

45. සාඛාහි මණ්ඩපං කත්වා වන්දිත්වා සුගතං ගතො,
කාලං කත්වාන සො එත්ථ ජාතො දෙවපුරෙ වරෙ.

සාඛාහි, අතුවලින්; මණ්ඩපං, මණ්ඩපයක් (කොලසෙවිල්ලක්); කත්වා; කොට; සුගතං, බුදුන්; වන්දිත්වා, (සිත්පහදවා) වැඳ; ගතො, ගියේ; සො, හෙතෙම; කාලං කත්වාන, කලුරියකොට; එත්ථ, මෙහි; වරෙ, උතුම්වූ; දෙවපුරෙ, දිව්‍යපුරයෙහි; ජාතො, උපන්නේය.

46. දිබ්බකාමෙහි මොදන්තො දෙවිස්සරියමණ්ඩිතො,
මහිද්ධිකො ච සො ආසි පුප්ඵපූජායි'දං ඵල'න්ති.

සො, හෙතෙම; දිබ්බකාමෙහි, දිවපස්කම්සැපතින්; මොදන්තො, සතුටුවෙන්නේ; දෙවිස්සරියමණ්ඩිතො, දිවඉසුරෙන් ප්‍රතිමණ්ඩිතවූයේ; මහිද්ධිකොච, මහත්සෘද්ධිඇත්තෙක්ද; ආසි, විය; පුප්ඵපූජාය, පුෂ්පපූජාවෙහි; ඉදං ඵලං ඉති, මේ ඵලයයි වදාළසේක.

47. මණිවණ්ණො මණිවත්ථො මණ්‍යාභරණභූසිතො,
මණිවණ්ණඞ්ගරාගඞ්ගො මණිමාලාවිභූසිතො.

මණිවණ්ණො, ඉඳුනිල්මිණිවන් සිරුරුඇති; මණිවත්ථො, මිණිමුවා වස්ත්‍ර ඇත්තාවූ; මණ්‍යාභරණභූසිතො, ඉඳුනිල් මිණිබරණින් සැරසුනාවූ; මණිවණ්ණඞ්ගරාගඞ්ගො, ඉඳුනිල් මිණිවන් සුවඳසුණු ආලෙපකළ සිරුරුඇති; මණිමාලාවිභූසිතො, ඉඳුනිල්මිණිමල් දමෙන් සැරසුනාවූ; (හෙතෙම.)

48. රතනාලඞ්කාරසංයුත්තං රතනසින්ධවයොජිතං,
රතනාසනසුපඤ්ඤත්තං රතන'මාරුය්හ සන්දනං.

රතනාලඞ්කාරසංයුත්තං, රත්නාලඞ්කාරයෙන් යුක්තවූ; රතනසින්ධවයොජිතං, රත්නසෙන්ධවයන් යොදනලද; රතනාසන සුපඤ්ඤත්තං, මනාකොට පණවනලද රත්නමය ආසනඇති; රතනං සන්දනං, රත්මුවාරියකට; ආරුය්හ, පැණනැගී.

49. ඔභාසයං දිසා සබ්බා ආගච්ඡති මහායසො,
අථා'පි තං මහාසෙනා පරිවාරෙන්ති ඊදිසා.

50. රතනාලඞ්කාරවසනා රතනගන්ධානුලෙපිනො,
පග්ගය්හ රතනච්ඡත්තෙ පතාකායො ධජෙ තථා.

51. දෙවතා පරිවාරෙන්ති සමන්තා චතුයොජනෙ,
කීළන්ති අප්ඵොසෙලෙන්තා උල්ලඞ්ඝන්තා සමන්තතො.

52. මණිචාමරමුග්ගය්හ රතනාභරණභූසිතා,
වීජෙන්ති සුරකඤ්ඤායො දෙවපුත්තං මහිද්ධිකං.

53. පඤ්චඞ්ගිකානි තුරියානි පග්ගය්හ සුරසුන්දරී,
වජ්ජෙන්ති මධුරං තත්ථ මොදෙන්ති තං මනොරමං.

54. සත්තසරානුගං ගීතිං තාරාදිලයසංයුතං,
වාදෙන්ති තන්තියො තත්ථ ගායන්ති සුරසුන්දරී.

55. තම්බබිම්බාධරා චාරු පයොධරභරා සුභා,
විසාලායතනීලක්ඛා සබ්බාවයවමණ්ඩිතා.

56. නච්චන්ති පුරතො තස්ස භෙරිමණ්ඩලමජ්ඣගා,
හාවභාවරසූපෙතා මනුඤ්ඤා නයනුස්සවා.

57. න මෙ එතාදිසො ධීර දිට්ඨපුබ්බො කුදාචනං,
පුට්ඨො ආචික්ඛ මෙ එසො කිං පුඤ්ඤම'කරා පුරෙ'ති.

34 පටන් 41 වෙනි ගාථාව දක්වා බැලියයුතුයි.

58. එසො සීහලදීපස්මිං ලඞ්කාපබ්බතසන්තිකෙ,
මහාතිස්සව්හගාමස්මිං ජාතො ගොපාලදාරකො.

එසො, මෙතෙම; සීහලදීපස්මිං, හෙළදිව්හි; ලඞ්කාපබ්බතසන්තිකෙ, ලග්ගලසමීපයෙහි; මහාතිස්සව්හගාමස්මිං, මහාතිස්සනම්ගම; ගොපාලදාරකො, ගොපලුදරුවෙක්ව; ජාතො, උපන්නේය.

59. එකදා සො කුමාරෙහි සද්ධිං ගාවො චරාපයං,
තස්මිං පබ්බතපාදස්මිං ගිරිකණ්ණිකවන'ද්දස.

සො, හෙතෙම; එකදා, එක්දවසක්; කුමාරෙහි සද්ධිං, ගොපලු දරුවන් සමඟ; ගාවො, ගෙරින්; චරාපයං, තණකවන්නේ; තස්මිං, ඒ; පබ්බතපාදස්මිං, ලග්ගලනම් පර්වතපාදයෙහි; ගිරිකණ්ණිකවනං, ගිරිතිල්වනයක්; අද්දස, දුටුයේය.

60. දිස්වා සුපුප්ඵිතං කුසුමං ඡින්දිත්වාන බහුං තදා,
කන්දරං උපසංකම්ම සීතලං සිකතාතලං.

තදා, එකල්හි; සුපුප්ඵිතං, මොනවට පිපියාවූ; බහුං, බොහෝවූ; කුසුමං, මල්; දිස්වා, දැක; ඡින්දිත්වාන, කඩාගෙණ; සීතලං, සිහිල්වූ; සිකතාතලං, වැලිතලාඇති; කන්දරං, කඳුරැලියකට; උපසංකම්ම, එළඹ:-

61. කත්වාන වාලුකාථූපං පූජෙත්වා කුසුමං තහිං,
ආකිරිත්වාන තොයෙන කත්වා'තපනිවාරණං.

තහිං, එහි; වාලුකාථූපං, වැලිකොතක්; කත්වාන, කොට; කුසුමං, මල්; පූජෙත්වා, පුදා; තොයෙන, දියෙන්; ආකිරිත්වාන, ඉස; ආතපනිවාරණං, ආතපාවරණයක්; (කොළසෙවිල්ලක්) කත්වා, කොට:

62. වන්දිත්වාන අපක්කාමි චුතො සො තාය ජාතියා,
ඉමස්මිං දෙවලොකස්මිං ජායිත්වාන මනොරමෙ.

වන්දිත්වාන, (තුන්සිත පහදවා) වැඳ; අපක්කාමි, බැහැර ගියේය; සො, හෙතෙම; තාය ජනියා, ඒ අත් බැවින්; චුතො, සැව; මනොරමෙ, සිත්කළුවූ; ඉමස්මිං, මේ; දෙවලොකස්මිං, දෙව්ලොව; ජායිත්වාන, ඉපිද:-

63. දිබ්බකාමෙහි මොදන්තො දෙවිස්සරියමණ්ඩිතො,
මහිද්ධිකො ච සො ආසි පුප්ඵපූජායි'දං ඵල'න්ති.

දිබ්බකාමෙහි, දිව පස්කම් සැපතින්; මොදන්තො, සතුටුවන්නාවූ; දෙවිස්සරිය මණ්ඩිතො, දිව ඉසුරෙන් ප්‍රතිමණ්ඩිතවූ; සො; හෙතෙම, මහිද්ධිකොච, මහත් සෘද්ධි ඇත්තෙක්ද; ආසි, වූයේය; පුප්ඵපූජාය; මල් පූජාවෙහි; ඉදං ඵලං ඉති, මේ ඵලයයි වදාළේය.

64. සත්තරතනෙහි සම්භූතවත්ථාභරණභූසිතො,
සත්තරතනුජ්ජලං දිබ්බං අඞ්ගිකං විය සොභති.

සත්තරතනෙහි, සත්රුවනින්; සම්භූත, නිර්මිතවූ; වත්ථාභරණ භූසිතො, වස්ත්‍රාභරණයෙන් සැරසුනේ; සත්තරතනුජ්ජලං, සත් රුවනින් දිලිසෙන; දිබ්බං, දිව්‍යමයවූ; අඞ්ගිකංවිය, ඇඟැවක්මෙන්; සොභති, හොබියි.

65. සත්තරතනාලඞ්කාරං දිබ්බසිඞ්ඛවයොජිතං,
ආරුය්හ දෙවරාජා'ව සත්තරතනමාසනං.

සත්තරතනලඞ්කාරං, සත්රුවන් අලඞ්කාර ඇති; දිබ්බසිඞ්ඛව යොජිතං, දිව්‍ය සෛන්ධවයන් යොදනලද; සත්තරතනං ආසනං, සත්රුවන් අස්නකට; දෙවරාජ ඉව, දෙව් රජමෙන්; ආරුය්හ, නැඟී.

66. ඔභාසයං දිසා සබ්බා ආගච්ඡති මහායසො,
අථා'පිතං මහාසෙනා පරිවාරෙන්ති ඊදිසා.

67. සත්තරතනාලඞ්කාරා සත්තරතනෙහි භූසිතා,
සත්තරතනධජච්ඡත්තපතාකායො තථෙව ච.

මෙම වස්තුවෙහි 3. 4 වෙනි ගාථා දෙක බලනු.

68. සත්තරතනවිතානානි ධාරෙති මත්ථකූ'පරි,
දෙවතා පරිවාරෙන්ති සමන්තා චතුයොජනෙ.

මත්ථකූපරි, ඔහුගේ හිස මත්තෙහි; සත්තරතනවිතානානී, සත් රුවන් වියන්; ධාරෙති, දරයි; දෙවතා, දෙවතාවෝ; සමන්තා, හාත්පසින්; චතුයොජනෙ, සිව් යොදුන් පමණ තැන්; පරිවාරෙන්ති, පිරිවරත්.

69. කීළන්ති අච්ඡෙසෙළෙන්තා උල්ලඞ්ඝන්තා සමන්තතො,
රතනචාමරමුග්ගය්හ රතනාභරණභූසිතා.

70. වීජෙන්ති සුරකඤ්ඤායො දෙවපුත්තං මහිද්ධිකං,
පඤ්චඞ්ගිකානි තුරියානි පග්ගය්හ සුරසුන්දරී.

71. වජ්ජෙන්ති මධුරං තත්ථ මොදෙන්ති තං මනොරමා,
සත්තසරානුගං ගීතිං තාරාදිලය සංයුතං.

72. වාදෙන්ති තන්තියො තත්ථ ගායන්ති සුරසුන්දරී,
තම්බබිම්බාධරා චාරුපයොධරභරා සුභා,
විසාලායතනිලක්ඛා සබ්බාභරණමණ්ඩිතා.

73. නච්චන්ති පුරතො තස්ස භෙරිමණ්ඩලමජ්ඣගා,
භාවභාවරසූපෙතා මනුඤ්ඤා නයනුස්සවා.

74. න මෙ එතාදිසො ධීර දිට්ඨපුබ්බො කුදාචනං,
පුට්ඨො ආචික්ඛ මෙ එසො කිං පුඤ්ඤම'කරා පුරෙ'ති.

මේ වස්තුවෙහි 36. පටන් 41 වෙනි ගාථාව දක්වා බැලියයුතුයි.

75. සො'යං සීහලදීපස්මිං පුරිමත්තභවෙ ඉතො,
චිත්තලපබ්බතාසන්නෙ කප්පකන්දරගාමකෙ.

76. සද්ධාසීලගුණොපෙතො ආසි අඤ්ඤතරො නරො,
එකං ආසනසාලං සො සඞ්ඝං උද්දිස්ස කාරයි.

සො අයං, ඒ මේ දිව්‍යපුත්‍රතෙම; ඉතො, මෙයින්; පුරිමත්ත භවෙ, පූර්වජාතියෙහි; සීහලදීපස්මිං, සිංහලද්වීපයෙහි; චිත්තලපබ්බ තාසන්නෙ, සිතුල්පව්වට නුදුරුවූ; කප්පකන්දරගාමකෙ, කප්පඳුරු නම් ගමෙහි;-සද්ධාසීලගුණොපෙතො, ශ්‍රද්ධාශීල ගුණයෙන් යුක්තවූ; අඤ්ඤතරො නරො, එක්තරා මිනිසෙක්; ආසි, වූයේය; සො, ඒ මනුෂ්‍යතෙම; සඞ්ඝං උද්දිස්ස, සඞ්ඝයා උදෙසා; එකං ආසනසාලං, එක් ආසන ශාලාවක්; කාරයි, කරවීය.

77. තෙන'ස්ස පුඤ්ඤකම්මෙන උච්චතො සට්ඨියොජනො,
තිංසයොජනවිත්ථිණ්ණො නෙකභූමිසමාකුලො.

78. නෙකබ්යූහසමාකිණ්ණො දුදික්ඛො චක්ඛුමොසනො,
සබ්බසොවණ්ණයො ආසි පාසාදො මනනන්දනො,
තත්ථ සො රමතෙ නිච්චං සාලාය කරණෙ ඵලං.

තෙන පුඤ්ඤකම්මෙන, ඒ පින්කම කරණකොටගෙණ; අස්ස, ඕහට; උච්චතො, උසින්; සට්ඨියොජනො, සැටයොදුන් ඇත්තාවූ; තිංස යොජන විත්ථිණ්ණො, තිස්යොදුන් පුළුල ඇත්තාවූ; නෙක භූමිසමාකුලො, නොයෙක් මහලින් ගැවසීගත්තාවූ; නෙකබ්‍යූහස මාකිණ්ණො, නොයෙක් විතිවිද නොගිය වීථින්ගෙන් ආකුලවූ; දුදික්ඛො, දුෂ්කර දර්ශන ඇත්තාවූ; චක්ඛුමොසනො, (බලන්න වුන්ගේ) ඇස්මුළාකරන්නාවූ; සබ්බ සොවණ්ණයො, සියල්ල රන් රන්මුවාවූ; මනනන්දනො, සිත් සතුටුකරන්නාවූ; පාසාදො, දිව්‍ය ප්‍රාසාදයක්; ආසි, වීය; සො, ඒ දිව්‍යරාජතෙම; තත්ථ, ඒ දිව්‍ය ප්‍රාසාදයෙහි; නිච්චං, සනතයෙන්; රමතෙ, සිත් අලවා වෙසෙයි; සාලායකරණෙ, ශාලාකිරීමෙහි; ඵලං, මේ විපාකයි.

79. අපර'මපි'ස්ස කුසලං සුණොහි සුතිසොභනං,
දිස්වා'නෙකං මහාසාලං කුරුමානෙ මහාජනෙ,
එකං ගොපාණසි ඵලකං වලලිමුට්ඨිං ච සො අදා.

අස්ස, ඔහුගේ; අපරම්පි, අනිකුදු; සුතිසොභනං, කර්ණාමෘතවූ; කුසලං, පින්කමක්; සුණොහි, අසව; සො, හෙතෙම; එකං මහා සාලං, එක් මහාශාලාවක්; කුරුමානෙ, කරන්නාවූ; මහාජනෙ, මහා ජනයන්; දිස්වාන, දැක; එකං ගොපාණසි ඵලකං, එක් ගොනැස් පුවරුවක්ද; වලලිමුට්ඨිං ච, වැල්මිටියක්ද; අදා, දුන්නේය.

80. තෙන'ස්ස පුඤ්ඤකම්මෙන පාසාදං පරිවාරිය,
අනෙකානි විමානානි රමනීයානි වනානි ච.

81. පාසාදං සොභයන්තා තෙ නිබ්බත්තිං සු මනොරමා,
තත්ථ සො මොදතෙ නිච්චං වලලිදනාදිනො ඵලං.

අස්ස, ඔහුගේ; තෙන පුඤ්ඤකම්මෙන, ඒ කුශල කර්මයෙන්; පාසාදං, දිව්‍යප්‍රාසාදය; පරිවාරිය, පිරිවරා; මනොරමා, සිත්කලුවූ; අනෙකානි විමානානි, නොයෙක් දිව්‍යවිමානයෝද; රමනීයානි, රමනීයවූ; වනානි ච, දිව්‍ය උද්‍යානයෝද යන; තෙ, ඔහුතුමූ; පාසාදං, දිව්‍යප්‍රාසාදය; සොභයන්තා, හොබවන්නාහු; නිබ්බත්තිංසු, උපන්නාහුය; තත්ථ, ඒ දිව්‍ය ප්‍රාසාදයෙහි; සො, හෙතෙම; නිච්චං, නිරන්තරයෙන්; මොදතෙ, සතුටුවෙයි; වලලිදනාදිනො, වලලිදනාදීන්ගේ; ඵලං, විපාකයි.

82. අථා'පි කුසලං තස්ස සොභබ්බං මනනන්දනං,
දිස්වාන සො පොක්ඛරණිං ඛණමානෙ මහාජනෙ,
කතිපයපිට්ඨකෙනෙ'ත්ථ මත්තිකුද්ධරණං අකා.

අථාපි, නැවතද; තස්ස, ඔහුගේ; මනනන්‍දනං, සිත් සතුටු කරන්නාවූ; කුසලං, කුශලයක්; සොතබ්බං, ඇසියයුතුයි; සො, හෙතෙම; පොක්ඛරණිං, පොකුණක්; ඛණමානෙ, සාරන්නාවූ; මහාජනෙ, මහාජනයන්; දිස්වාන, දැක; එත්‍ථ, මෙහිදී; කතිපය පිටකෙන, කුඩා කීපයකින්; මත්‍තිකා උද්ධරණං, මැටි ගොඩලීම, අකා, කෙළේය.

83. තෙන'ස්ස පුඤ්ඤකම්මෙන සුගන්‍ධා සීතලා සුභා,
ආකාසතො සමුට්ඨාය තස්ස චිත්තානුකූලකං,
අම්බුධාරා සරීරස්මිං පතන්‍තෙන තං පමොදති.

අස්ස, ඔහුගේ; තෙන පුඤ්ඤකම්මෙන, ඒ කුශලකර්මය කරණකොටගෙණ; සුගන්‍ධා, සුගන්ධවූ; සීතලා, සිහිල්වූ; සුභා, ශුභපත්වූ; අම්බුධාරා, ජලධාරාවෝ; ආකාසතො, අහසින්; සමුට්ඨාය, නැඟී; තස්ස, ඔහුගේ; චිත්තානුකූලකං, සිතට අනුකූලවූ පරිද්දෙන්; සරීරස්මිං, සිරුරෙහි; පතන්‍තෙන, පතිතවෙත්; තං, එයින්; පමොදති; (හෙතෙම) සතුටුවෙයි.

84. දෙවච්ඡරා පරිවුතො උය්‍යානභවනාදිසු,
සදා කීළති සන්‍තුට්ඨො මත්‍තිකුද්ධරණෙ ඵලං.

දෙවච්ඡරා පරිවුතො, දිව්‍යාප්සරාවන් විසින් පිරිවරණලද්දේ; උය්‍යානභවනාදිසු, උද්‍යාන භවනාදීන්හිද; සදා, හැමකල්හි; සන්‍තුට්ඨො, සතුටුව; කීළති, ක්‍රීඩා කෙරෙයි; මත්‍තිකුද්ධරණෙ, (එදවස්) මැටි ගොඩලීමෙහි; ඵලං, විපාකයයි.

85 සුණොහි අපරං තස්ස පුඤ්ඤකම්මං මනොරමං,
දිස්වානෙ'කං පුඤ්ඤවන්‍තං කරොන්‍තං බොධිවෙදිකං,
චතුපඤ්චපංසුපිණ්ඩෙ සො'පනෙසි තදන්‍තිකං.

තස්ස, ඔහුගේ; මනොරමං, සිත්කලුවූ; අපරං, අන්‍යවූ; පුඤ්ඤකම්මං, පින්කමක්; සුණොහි, අසව; බොධිවෙදිකං, බොධිවෙදිකාවක්; (හෙවත් බොධීන්වහන්සේ සමීපයෙහි කරණලද හතරැස් පිළක්) කරොන්‍තං, කරන්නාවූ; එකං පුඤ්ඤවන්‍තං, එක් පින්වතෙකු; දිස්වාන, දැක; සො, හෙතෙම; තදන්‍තිකං, ඔහු වෙතට; චතුපඤ්චපංසු පිණ්ඩෙ, පස්පිඩු හතරක් පහක්; උපනෙසි, එළවූයේය.

86. තෙන'ස්ස පුඤ්ඤකම්මෙන දෙවසෙනා අනූපමා,
පරිවාරෙන්ති පග්ගය්හ ඡත්තචාමරකෙතවො.

87. එලකාවුධාදයො චා'පි අට්ඨමඞ්ගල ආදයො,
තෙසං මජ්ඣගතො භාති චන්දො'ව නභමජ්ඣගො.

අස්ස, ඔහුගේ; තෙන පුඤ්ඤකම්මෙන, ඒ කුශලානුභාවයෙන්; අනූපමං, උපමාරහිතවූ දෙවසෙනා, (සිංදහස් ගණන්) දිව්සෙනඟ; ඡත්ත, ඡත්‍රද; චාමර, සෙමරද; කෙතවො, කොඩිද; එලකාවුධාදයො ච අපි, එලකායුධාදීන්ද; අට්ඨ මඞ්ගලාදයො, අට්ඨමඞ්ගලාදීන්ද; පග්ගය්හ, ගෙණ; පරිවාරෙන්ති, පිරිවරා සිටිත්; තෙසං, ඔවුන්ගේ; මජ්ඣගතො, මධ්‍යයට ගියේ; නභමජ්ඣගො, අහස් මැදට පැමිණියාවූ; චන්දො ඉව, සඳමෙන්; භාති, බබලයි.

88. අථා'පි'ස්ස පුඤ්ඤකම්මං සොතබ්බං මුදමා'වහං,
දිස්වානෙ'සො සෙතුකාරෙ තස්සත්ථං එලකං අදා.

අථ අපි, තවද; මුදං ආවහං, ප්‍රීති එලවන්නාවූ; අස්ස, ඔහුගේ; පුඤ්ඤකම්මං, පුණ්‍යකර්මයක්; සොතබ්බං, ඇසිය යුතුයි; එසො, මේ තෙම; සෙතුකාරෙ, හෙයක් කරන්නාවුන්; දිස්වාන, දැක; තස්සත්ථං, ඒ හෙයට නිසිවූ; එලකං, පුවරුවක්; අදා, දුන්නේය.

89. තෙන'ස්ස පුඤ්ඤකම්මෙන අස්මිං දෙවපුරෙ වරෙ,
සීන්ධවස්සසහස්සෙන වාහිතං තිංසයොජනං.

90. සබ්බාලඞ්කාරසම්පන්නං රථං නිබ්බත්ති තෙන සො,
මහායසො මහාතෙජො කරොති දෙවචාරිකං.

අස්ස, ඔහුගේ; තෙන පුඤ්ඤකම්මෙන, ඒ කුශලකර්මය හෙතු කොට ගෙණ; වරෙ, උතුම්වූ; අස්මිං දෙවපුරෙ, මේ දෙව් පුරයෙහි; සබ්බාලඞ්කාරසම්පන්නං, සියලු අලඞ්කාරයෙන් යුක්තවූ; සින්ධවස්ස සහස්සෙන, දහසක් පමණ සෛන්ධවයන් විසින්; වාහිතං, උසුලන ලද; තිංසයොජනං, තිස්යොදුන් පමණවූ; රථං, (දිව්‍ය) රථයක්; නිබ්බත්ති, පහළවිය; සො, හෙතෙම; තෙන, ඒ දිව්‍ය රථය කරණ කොටගෙණ (එහවත් ඒ දිව්‍යරථයට පැන නැගී;) මහායසො, මහත් යශස් ඇත්තේ; මහා තෙජො, මහත් තෙජස් ඇත්තේ; දෙවචාරිකං, දිව්‍යචාරිකාව; කරොති; කෙරෙයි.

91. සුණොහි අපරං තස්ස පුඤ්ඤකම්මං * පුරෙ කතං,
සද්ධම්මසවණත්ථාය සාලං පාතං පුරෙ අයං.

---

* "පුරකතංති" ඇතැම්,

92. ඝොසෙසි ඝොසං සො තෙන පුඤ්ඤකම්මෙන අත්තනා,
පරිවාරෙන්ති තං එත්ථ දෙවසෙනා අනූපමා.

තස්ස, ඔහුගේ; පුරෙකතං, පෙර කරණලද; අපරං, අනිකුදු; පුඤ්ඤකම්මං, පින්කමක්; සුණොහි, අසව; සො අයං, ඒ මේ තෙම; පුරෙ, පළමුජාතියෙහි; සායං, සවස්වේලෙහිද; පාතං, උදෑසන්හිද; සද්ධම්ම සවණත්ථාය, සදහම් ඇසීම පිණිස; ඝොසං ඝොසෙසි, කාල ඝොෂාකළේය; අත්තනා, තමා විසින් (කරණලද); තෙන පුඤ්ඤ කම්මෙන, ඒ පුණ්‍ය කර්මයාගේ හෙතුවෙන්; එත්ථ, මේ දිව්‍ය ලොක යෙහි, අනූපමා, අනූපමවූ; දෙවසෙනා, දිව්සෙනග; තං, ඔහු; පරිවාරෙන්ති, පිරිවරත්.

93. මඤ්ජුවාණිච සො ආසි ඵලං තං ධම්මඝොසනෙ,
අපර'මපි'ස්ස කුසලං සුණොහි සුතිසොභනං
සුගොපිතං පංචසීලං එසො ගොපෙසි'තො පුරෙ.

සො, හෙතෙම; මඤ්ජුවාණිච, මිහිරිබස්ඇත්තේද; ආසි, විය; ධම්මඝොසනෙ, ධර්මඝොෂාවෙහි (ධර්මශ්‍රවණයපිණිස කාලඝොෂණයෙහි;) තං, ඒ; ඵලං, විපාකයි; අස්ස, ඔහුගේ; අපරං අපි, අන්‍යවූද; සුතිසොභනං, කර්ණරසායනවූ; කුසලං, කුශලයක්; සුණොහි, ශ්‍රවණයකර; එසො, මේතෙම; ඉතොපුරෙ, මෙයින් පූර්වයෙහි, පංච සීලං, පංචසීලය; සුගොපිතං, මොනවට ගොපිතකොට; ගොපෙසි, රැක්කේය.

94. තෙන'ස්ස පුඤ්ඤකම්මෙන අච්ඡරායො මනොරමා,
පරිවාරෙන්ති තං නිච්චං පංචසීලස්සි'දං ඵලං.

අස්ස, ඔහුගේ; තෙන පුඤ්ඤකම්මෙන, ඒ කුශලකර්මය හෙතුකොට ගෙණ; මනොරමා, සිත්කලුවූ; අච්ඡරායො, දිව්‍යාප්සරාවෝ; තං, ඔහු; නිච්චං, නිබඳ; පරිවාරෙන්ති, පිරිවරාසිටිත්; පංචසීලස්ස, (සුරක්ෂිත) පංචශීලයාගේ; ඉදං, මේ; ඵලං, විපාකයි.

95. අපර'මපි'ස්ස කුසලං සුණොහි මම සන්තිකා,
සද්ධම්මං සුණමානො'යං සන්තුට්ඨො පීතිවෙගසා.

අස්ස, ඔහුගේ; අපරම්පි, අනිකුදු; කුසලං, කුශලයක්; මම සන්තිකා, මාගේසමීපයෙන්; සුණොහි, අසව; අයං, මේතෙම; සද්ධම්මං, සද්ධර්මය; සුණමානො, ශ්‍රවණයකරන්නේ; පීතිවෙගසා, ධර්මාලම්බනප්‍රීතිවෙගයෙන්, සන්තුට්ඨො, සතුටුවූයේ:-

96. පූජෙසි උත්තරාසඞ්ගං සද්ධම්මස්ස යසස්සිනො,
තෙන'ස්ස පුඤ්ඤකම්මෙන කප්පරුක්ඛා'පි ජායරුං.

යසස්සිනො, යශස් ඇත්තාවූ; සද්ධම්මස්ස, සද්ධර්මයට; හෙවත් ධර්මකථිකයාට; උත්තරා සඞ්ඝං, උත්තර ශ්‍රාවකයා; පූජෙසි, පිදූයේය; තෙන පුඤ්ඤකම්මෙන; ඒ කුශල කර්මයෙන්; අස්ස, ඔහුට; කප්පරුක්ඛාපි, (නොයෙක් සිය ගණින්) කප්රුක්ද; ජායරුං, (දිව්‍යපහය සිසාරා) පහළවූහ.

97. යං යං යො අකාරි පුඤ්ඤං පුඤ්ඤං තස්ස ඵලං ඉධ,
සම්පජ්ජතී'ති ඤත්වාන කුසලෙ චිත්තං නිවෙසයෙ'ති.

යො, යමෙක් තෙම; යං යං පුඤ්ඤං, යම් යම් කුසලයක්; අකරි, කෙළේද; තස්ස, ඔහට; පුඤ්ඤං ඵලං, (ඒ ඒ) කුශල විපාකය; ඉධ, මේ දිව්‍ය ලොකයෙහි; සම්පජ්ජති ඉති, පැමිණේයයි; ඉති, මෙසේ; ඤත්වාන, දැන; කුසලෙ, කුසල් කිරීමෙහි; චිත්තං, සිත; නිවෙසයෙ, පිහිටුවන්නේය.

98. අනූපමො අසදිසො මහතියා සිරියා ජලං,
ආපූරයං දිසා තාහි කො'යං එති මහායසො'ති.

අනුපමො, උපමා රහිතවූ; අසදිසො, අසදෘශවූ; මහතියා සිරියා, මහත් දිව්‍යශ්‍රී සොභාවෙන්; ජලං, දිලිසෙන්නාවූ; මහායසො, මහත් යසස් ඇත්තාවූ; කො අයං, මේ කවරෙක්; තාහි, ඒ ශ්‍රී සම්පත්තීයෙන්; දිසා ආපූරයං, දසදික් පුරවමින්; එති, එයිද.

99. යො සොළස අසඞ්ඛෙය්‍යං පූරෙත්වා සබ්බපාරමී,
ධම්මං දෙසෙති දෙවානං ස මෙත්තෙය්‍යො ජිනඞ්කුරො..

යො, යමෙක් තෙම; සොළස අසඞ්ඛෙය්‍යං, සොළසාසඞ්ඛ්‍යයක්; සබ්බ පාරමී, (දානශීලාදී) සියලු පාරමී ධර්මයන්; පූරෙත්වා, පූරණය කොට; දෙවානං, දෙවියන්ට; ධම්මං, ධර්මය; දෙසෙති, දෙශනා කෙරේද; සො ජිනඞ්කුරො, ඒ බුද්ධාඞ්කුර තෙම; මෙත්තෙය්‍යො, මෛත්‍රෙය නම් දිව්‍යරාජවන්නේය.

100. පුඤ්ඤං කත්වාන යෙ සත්තා ජායාම තුසිතෙ පුරෙ,
පත්ථෙන්ති කාරණා යස්ස ස මෙත්තෙය්‍යො ජිනඞ්කුරො.

යෙ සත්තා, යම් සත්වයෝ තුමූ; පුඤ්ඤං කත්වාන, පින්කොට; තුසිතෙ පුරෙ, තුෂිත පුරයෙහි; ජායාම, උපදින්නෙමුයි; යස්ස කාරණා, යමෙක් හෙතුකොටගෙණ; පත්ථෙන්ති; ප්‍රාර්ථනා කෙරෙද්ද; සො ජිනඞ්කුරො, ඒ බුද්ධාඞ්කුර තෙම; මෙත්තෙය්‍යො, මෛත්‍රෙය නම් දිව්‍යරාජවන්නේය.

101. යො කෙතුමතියං ජාතො බුද්ධො හුත්වා අනුත්තරො,
ලොකං දුක්ඛා පමොචෙති ස මෙත්තෙය්‍යො ජිනඞ්කුරො.

යො, යමෙක් තෙම; කෙතුමතියං, කෙතුමතීනම් රාජධානියෙහි; ජාතො, උපන්නේ; අනුත්තරො, නිරුත්තරවූ; බුද්ධො හුත්වා, බුදුවී; ලොකං, ලොකයා; දුක්ඛා, සංසාර දුකින්; පමොචෙති, මුදවාද (නිවන් පමුණුවාද); සො ජිනඞ්කුරො, ඒ බුද්ධාඞ්කුර තෙම; මෙත්තෙය්‍යො, මෛත්‍රෙය නම් දිව්‍යරාජ වන්නේය.

102. බහූ අනාගතෙ යස්ස සාසනෙ කලිසාසනෙ,
කරෙන්ති ජාතියා අන්තං ස මෙත්තෙය්‍යො ජිනඞ්කුරො.

අනාගතෙ, අනාගත කාලයෙහි; කලිසාසනෙ, පව් නසන්න වූ; යස්ස සාසනෙ, යම් බුදුකෙනෙකුගේ ශාසනයෙහි; බහු, බොහෝ දෙන; ජාතියා, ඉපදීමේ; අන්තං, කෙළවර; කරෙන්ති, කෙරෙද්ද; සො ජිනඞ්කුරො; ඒ බුද්ධාඞ්කුර තෙම; මෙත්තෙය්‍යො, මෛත්‍රෙය නම් දිව්‍යරාජ වන්නේයයි විදාළේය.

103. එවං හි නානා ගුණභූසණා ජනා
ගුණානුභාවෙන උපෙන්ති සග්ගං,
පූරෙථ තස්මා ගුණමේ'ව කෙවලං
ගුණං හි සබ්බත්ථ පසත්ථ මෙවා 'ති.

එවං හි, මෙසේ වනාහි; නානා ගුණභූසණා, (දානශීලාදී) නොයෙක් ගුණයන් අබරණ කොට ඇත්තාවූ; ජනා, ජනයෝ; ගුණානු භාවෙන, (දානශීලාදී) ගුණානුභාවයෙන්; සග්ගං, දිව්‍ය ලොකයට; උපෙන්ති, පැමිණෙත්; තස්මා, එහෙයින්, කෙවලං, හුදෙක්; ගුණං එව, ගුණයම; පූරෙථ, පුරව්; සබ්බත්ථ, හැම තන්හි; ගුණං හි, ගුණයම; පසත්ථං එව ඉති, ප්‍රශස්තමැයි.

## චූලගල්ල වස්තුව—1—

104. සො වෙ දෙව අයං ලොකෙ සබ්බො ඉස්සරනිම්මිතො,
ලොකස්මිං යං සුඛං දුක්ඛං සබ්බමි'ස්සරසන්තකං.

දෙව, දෙවයන්වහන්ස; ලොකෙ, ලොකයෙහි; යො අයං සබ්බො, යම් මේ සියල්ලක්වේද; (ඒ සියල්ල) වෙ; එකාන්තයෙන්; ඉස්සර නිම්මිතො, ඊශ්වර නිර්මිතය; ලොකස්මිං, ලොකයෙහි; යං සුඛං දුක්ඛං, යම් සැපක් දුකක් වේද; සබ්බං, (ඒ) සියල්ල; ඉස්සරසන්තකං, ඉසුරුසතුය.

105. තස්සෙ'කො තාපසො එත්ථ සුසානස්මිං වසිස්සති,
භස්මඞ්ගරාගලිත්තඞ්ගො රුළ්හකච්ඡො රජස්සිරො.

තස්ස, ඔහුගේ; එකො තාපසො, එක් තවුසෙක් තෙම; එත්ථ, මෙහි; සුසානස්මිං, සොහොන්හි; වසිස්සති, වෙසෙයි; භස්මඞ්ගරාග

ලිත්තඞ්ගො, හළුමුවා අඞ්ගරාගයෙන් අලෙව්කළ සිරුර ඇති; රූළ්හකච්ඡො, වැඩුනු කිසිලි ලොම් ඇති; රජස්සිරො, දූලි වැකුණු හිස ඇති:–

106. ජටාධරො ජල්ලධරො පාණිප්පත්තෙන භික්ඛති,
නත්ථ'ඤ්ඤ ගුණතො තෙන සමො අඤ්ඤො ජගත්තයෙ,
පුඤ්ඤකාමෙන තස්සෙ'ව දාතබ්බං තං සුභොජනං.

ජටාධරො, හිස් වෙළුම් දරන්නාවූ; ජල්ලධරො, දූලිකඩපිලි දරන්නාවූ (හෙතෙම); පාණිපත්තෙන, අත්නල පායෙන්; භික්ඛති, සිඟයි; ජගත්තයෙ, තුන්ලෙව්හි; අඤ්ඤ ගුණතො, රහත් ගුණයෙන්; තෙන සමො, ඔහු හා සමවූ; අඤ්ඤො. අනිකෙක් තෙම; නත්ථි, නැත; පුඤ්ඤකාමෙන, පින් කැමැත්තහු විසින්; තස්සෙව, ඔහුටම; තං සුභොජනං, ඒ මනා බොදුන; දාතබ්බං, දියයුතුයි.

107. න දක්ඛිණාරහො සො'යං අගුණො හිරිවජ්ජිතො,
ඉත්ථිධුත්තො සුරාධුත්තො ථෙනො පාණාතිපාතිකො.

සොඅයං, ඒ මේ තෙම; අගුණො, නිර්ගුණයෙකි; හිරිවජ්ජිතො, විළිතොරවූවෙකි; ඉත්ථිධුත්තො, ස්ත්‍රී ධූර්තයෙකි; සුරාධුත්තො, සුරා ධූර්තයෙකි; ථෙනො, සොරෙකි; පාණාතිපාතිකො, ප්‍රාණඝාත කරන්නෙකි; (එහෙයින්) නදක්ඛිණාරහො, දක්ෂිණාර්හ නොවේ.

108. පිවිත්වා ඉත්ථියා සද්ධිං සුරං එසො යථි'ච්ඡිතං,
මච්ඡෙ උද්ධරතෙ'දානි බළිසෙන අසඤ්ඤතො.

අසඤ්ඤතො, සංයමයක් නැත්තාවූ; එසො, මේ තෙම; ඉත්ථියා සද්ධිං, මාගමක් සමග; යථා ඉච්ඡිතං, අභිමත පරිදි; සුරං පිවිත්වා, රාපී; ඉදානි, දැන්; බළිසෙන, බිලියෙන්; මච්ඡෙ, මසුන්; උද්ධරති, උදුරයි හෙවත් ගොඩලයි.

109. නත්ථ'ස්සා'චාරමත්තම්පි කුතො සීලං සමාධි කො,
එතාදිසානං යං දින්නං කිං නු තස්ස මහප්ඵලං.

අස්ස, ඔහුගේ; ආචාරමත්තංඅපි, මනාහැසිරීම්පමණකුදු; නත්ථි, නැත; සීලං, සීලයක්; කුතො, කොයින්ද; කො සමාධි, කිනම් සමාධියක්ද; එතාදිසානං, මෙබඳුවූවන්ට; යං, යමක්; දින්නං, දෙනලදද; තස්ස, ඒදානයාගේ; මහප්ඵලං, මහානිසංසය; කිංනු, කවරේද?.

110. දෙති යො 'පචිකානම්පි තිණපණ්ණම්පි චෙතසා,
තෙන තාදිසකං හොති ඵලං තස්ස භවන්තරෙ.

යො, යමෙක්තෙම; උපචිකානංඅපි, වේයන්වපචා; තිණපණ්ණං අපි, තණපතකුදු; චෙතසා, (පිරිසිදු) සිතින්; දෙති, දෙයිද; තෙන, ඒකරණකොටගෙණ; තස්ස, ඕහට; භවන්තරෙ, භවාන්තරයෙහි; තාදිසකං, එබඳුවූ; ඵලං හොති, විපාකවේ.

111. නිත්තිං කත්වා දින්නදානං තිරච්ඡානසතස්සයං,
මනුස්සෙ'කස්ස තං සබ්බං දිනෙනන සමකං සියා.

තිරච්ඡානසතස්ස, තිරිසනුන් සියයකට; නිත්තිං කත්වා, තෘප්තිය කොට; යං දින්නදානං, යම්දෙනලද දානයක්වේද; තං සබ්බං, ඒ සියල්ල; එකස්සමනුස්ස, එක්මිනිසෙකුට; දිනෙනන, දෙනලද්දහා; සමකං සියා, සමවන්නේය.

112. යථා සාරතරෙ ඛෙත්තෙ බීජම'ප්පමපි රොපිතං,
ඵලං දෙති මහාහුත්වා කස්සකස්ස අනප්පකං.

සාරතරෙ, අතිශයින්සාරවත්වූ; ඛෙත්තෙ, කෙතෙහි; රොපිතං, රොපනයකරණලද; අප්පං අපි බීජං, සවල්පවූද බිජුවට; කස්සකස්ස, ගොවියාට, මහාහුත්වා, මහත්ව; අනප්පකං, බොහෝවූ; ඵලං, ඵලය, යථාදෙති, යම්සේ දෙන්නේද.

113. තථා උත්තමඛෙත්තෙසු දානං යො දෙති සද්ධයා,
දෙවලොකමනුස්සෙ'පි නිබ්බාණ ඵලදං හි තං.

තථා, එපරිද්දෙන්; යො, යමෙක්තෙම; උත්තමඛෙත්තෙසු, උතුම්ක්ෂෙත්‍රයන්හි (උතුම් ගුණවතුන්ට); සද්ධයා, සැදැහැයෙන්; දානංදෙති, දානයක් දෙන්නේද; තං හි, ඒ දානය වනාහි; දෙව ලොක මනුස්සෙඅපි, දිව්‍යමනුෂ්‍යලොක සමපත්ද (දෙයි); නිබ්බාණ ඵලදං, නිවන්සැපද දෙන්නේය.

114. යො අසාරතරෙ ඛෙත්තෙ බීජං රොපෙති'නප්පකං,
න විපුලං ඵලං හොති, කිම් කිච්'පි දස්සති.

යො, යමෙක්තෙම; අසාරතරෙ, අතිශයින්නිසරුවූ; ඛෙත්තෙ, කෙතෙහි; අනප්පකං, බොහෝවූ; බීජං, බිජු; රොපෙති, රොපනය කෙරේද; විපුලං ඵලං, මහත්ඵලය; නහොති, නොවේ (නොදෙයි); කිම්කිම්පි, මදමදවද; දස්සති, දෙයි.

115. තථෙ'ව ගුණහීනෙසු දුස්සීලෙසු පතිට්ඨිතං,
විපුලං න ඵලං දෙති කිංචි කිංචි ඵලං සියා.

තථාඑව, එසේම; ගුණහීනෙසු, හීනගුණඇත්තාවූ; දුස්සීලෙසු, නිස්සීලයන්කෙරෙහි; පතිට්ඨිතං, පිහිටුවනලද්ද; විපුලං ඵලං, මහත් ඵලයක්; න දෙති, නොදෙයි; කිඤ්චි කිඤ්චි ඵලං සියා, මදමදවිපාක වන්නේය.

116. ඒතස්සා'හං ඉමං දත්වා කිඤ්චිමත්තං ඵලං ලභෙ,
අප්පෙව නාම තස්මා'හං ඒතස්සෙ'ව දදාමි'දං.

අහං, මම; ඒතස්ස, මොහට; ඉමං, මෙය; දත්වා, දී; කිඤ්චිමත්තං, ස්වල්පමාත්‍රවූ; ඵලං, ඵලයක්; ලභෙ, ලබම් නම්; අප්පෙව නාම, ඉතාමැනවි; තස්මා, එහෙයින්; අහං, මම; ඒතස්සෙව, මොහටම; ඉදං, මේ (ආහාරය); දදාමි, දෙමි.

117. සා'පි අප්පතරා ලජ්ජා මනුස්සෙ'ත්ථ ගුණං නනු,
හොති තාදිසකො කාලො තෙන දානෙන මෙ අපි.

අප්පතරා, අල්පතරවූ; සාපිලජ්ජා, ඒ හිරීතොමෝද; මනුස්සෙත්ථ, මිනිස්වැඩිහි; ගුණං නනු, ගුණයක්නොවේද; තෙන දානෙන, ඒ දීමෙන්; මෙ, මට; තාදිසකො කාලො අපි, එබඳුකාලයකුදු; හොති, වෙයි-

118. අචෙඡරචිත්තා ජනතා සුණාථ නිහීනජච්චස්ස'පි දින්නදානං,
ඒවං ඵලං හොති කථන්නු තුම්හෙ ඛෙත්තෙස්ව'නංගෙසු
(පමාදසීලා.

ජනතා, ජනසමූහයෙනි; අචෙඡරමත්තං, ආශ්චර්‍ය්‍යමාත්‍රයක්; සුණාථ, ශ්‍රවණය කරව්; නිහීනජච්චස්ස අපි, ගුණහීනජාතිකයාට පවා; දින්නදානං, දෙනලද දානය; එවං, මෙසේ, ඵලං හොති, ඵලඇති වෙයි: තුම්හෙ, තෙපි; අනංගෙසු, අනඞ්ගවූ; ඛෙත්තෙසු එව, ක්ෂෙත්‍ර යන්හිම; කථන්නු, කෙසේ නම්; පමාදසීලා, ප්‍රමාදවන්නහුද.

## පණ්ඩරඞ්ගපරිබ්‍රාජකවස්තුව-2.

—+—

119. සහායකා මය'න්ති'කෙ පටිඤ්ඤාතා නරා ඉධ,
පාණාතිපාතකම්මෙ තෙ නියොජෙන්ති සහායකං,

ඉධ, ඉහලොව්හි; එකෙනරා, ඇතැම්මිනිස්සු; මයං, අපි; සහායකා ඉති, යහළුවෝ වෙමුයි; පටිඤ්ඤාතා, ප්‍රතිඥාතවෙත්; තෙ, ඔව්හු සහායකං, යහළුවා, පාණාතිපාතකම්මෙ, පණිවකම්හි, නියොජෙන්ති, යොදවත්.

120. පරස්සහරණෙ චෙ'කෙ සන්ධිච්ඡෙදාදිදාරුණෙ,
නියොජෙන්ති සකං මිත්තං තෙ මිත්තපතිරූපකා.

එකෙ, ඇතැම්කෙනෙක්; සන්ධිච්ඡෙදාදි දාරුණෙ, උමං බිඳීම් ආදි වශයෙන් දරුණුවූ; පරස්ස හරණෙච, අන්සතුද්‍රව්‍ය ගැනීමෙහිද. සකං මිත්තං, සියමිතුරු; නියොජෙන්ති, යොදවත්; තෙ, ඔහුතුමූ; මිත්ත පතිරූපකා, මිත්‍රප්‍රතිරූපකයෝ වෙත්.

121. ඉත්ථිධුත්තො සුරාධුත්තො අක්ඛධුත්තො සහායකො,
සහායං තත්ථ යොජෙති සො මිත්තපතිරූපකො.

ඉත්ථිධුත්තො, මාගමුන්කෙරෙහි ඇලුනාවූ; සුරාධුත්තො, රා පී මෙහි ඇලුනාවූ; අක්ඛධුත්තො, දූකෙළියෙහි ඇලුනාවූ; සහායකො, යහලුතෙම; සහායං, යහලුවා; තත්ථ, එහි; යොජෙති, යොදයි; සො, හෙතෙම; මිත්තපතිරූපකො, මිත්‍රප්‍රතිරූපකයෙක් වෙයි-

122. භාසන්තා අලිකං ලොකෙ වණ්ණෙන්තා තුච්ඡවණ්ණනං,
මිත්තං මිච්ඡාසු යොජෙන්ති තෙ මිත්තපතිරූපකා.

ලොකෙ, ලෙව්හි; අලිකං, මුසා; භාසන්තා, බණන්නාහු; තුච්ඡ වණ්ණනං, හිස් වණිනා; වණ්ණෙන්තා, කරනන්නාහු; මිත්තං, මිත්‍රයා; මිච්ඡාසු, මිථ්‍යාවන්හි; යොජෙන්ති, යොදද්ද; තෙ, ඔහුතුමූ; මිත්තපතිරූපකා, මිත්‍රප්‍රතිරූපකයෝ වෙත්.

123. නච්චන්තා අථ ගායන්තා වාදෙන්තා කෙළිසීලකා.
තත්ථ යොජෙන්ති මිත්තං යෙ තෙ මිත්තපතිරූපකා.

යෙ, යමෙක්; නච්චන්තා, නටන්නාහුද; අථ, යලි; ගායන්තා, ගායනාකරන්නාහුද; වාදෙන්තා, වාදනයකරන්නාහුදැයි; කෙළිසීලකා, ක්‍රීඩාස්වභාවඇත්තාහු; මිත්තං, මිත්‍රයා; තත්ථ, එහි; යොජෙන්ති, යොදද්ද; තෙ, ඔහුතුමූ; මිත්තපතිරූපකා, මිත්‍රප්‍රතිරූපකයෝ වෙත්.

124. අයං ඉණායිකො මය්හං රුඩො 'යං කාසි ඊදිසං,
සො මෙ හිතාවහො ආසී පච්චත්ථෙ ච පරත්ථ ච.

මය්හං, මාගේ; අයං ඉණායිකො, මේ ණය ගැතිතෙම; රුඩො, කිපියේ; ඊදිසං, මෙබන්දක්; යං, යම්හෙයකින්; අකාසි, කෙළේද. (එහෙයින්); සො, හෙතෙම; මෙ, මට; පච්චත්ථෙ ච; ඉහලෙව්හිද; පරත්ථ ච, පර ලෙව්හිද; හිතාවහො ආසී, හිතසැප එළවන්නෙක් විය.

125. අජ්ජතග්ගෙ අයං මය්හං ඤාතකො ච සහායකො,
කාතබ්බො සො මයා නිච්චං උපකාරො යථාබලං.

අජ්ජතග්ගෙ, අදපටන්; අයං, මේතෙම; මය්හං, මාගේ; ඤාතකො ච, නෑයෙක්ද වෙයි; සහායකො, යහලුවෙක්ද වෙයි; මයා, මා විසින්; යථාබලං, ශක්ත්‍යනුපරිද්දෙන්; නිච්චං, අනවරතයෙන්; සො උපකාරො, ඒ උපකාරයතෙම; කාතබ්බො, කටයුතුයි.

126. සද්ධා ලද්ධං දක්ඛිණෙය්‍යෙසු දත්වා
භූතලෙ භාති සො සාමිනී සාමිකො ච,
සාධවො සාධූනං සාධු දත්වාන තම්හා
නිබ්බුතිං යාථ භො සොගතෙ සුප්පසන්නා.

භො සාධවො, පින්වත් සත්පුරුෂයෙනි; සො සාමිකො ච, ඒ සැමි තෙමේද; සාමිනී, බිරින්දෑතොමෝද; සද්ධා; සැදැහැයෙන්; ලද්ධං, (දැහැමින්) ලැබූ ධන; දක්ඛිණෙය්‍යෙසු, දක්ෂිණාභියන්විෂයෙහි; දත්වා, දී; භූතලෙ, පෘථිවීතලයෙහි; භාති, බබලයිද; තම්හා, එහෙයින්; සොගතෙ, බුදුසස්නෙහි; සුප්පසන්නා, මනාසේ පැහැදුනාවූ තෙපි; සාධූනං, සත්පුරුෂයන්ට; සාධු, යහපත්සේ; දත්වාන, දන්දී; නිබ්බුතිං, නිවනට; යාථ, යව්.

## දුක්ඛිත මහාතිස්ස වස්තුව-3-

127. ආගච්ඡන්තා ඉමෙ භද්දෙ බුද්ධසෙට්ඨස්ස සාවකා,
සීලවා වත්තසම්පන්නා සබ්බසත්තහිතෙ රතා.

භද්දෙ, සොඳුර; ආගච්ඡන්තා, එන්නාවූ; ඉමෙ, මුන්වහන්සේලා; බුද්ධසෙට්ඨස්ස, සර්වඥශ්‍රෙෂ්ඨයන්වහන්සේගේ; සාවකා, ශ්‍රාවකයෝය; සීලවා, සිල් ඇත්තාහ; වත්තසම්පන්නා, වත්සම්පූර්ණයෝය; සබ්බසත්තහිතෙ, සියලු සත්වයන්ට හිතකිරීමෙහි; රතා, ඇලුනාහ.

128. පාලෙන්ති ජීවිතං 'වෙ'තෙ සම්මාසම්බුද්ධසාසනං,
එතෙ සන්නද්ධයොධා'ව කෙලෙසාරිසීසපාතනෙ.

එතෙ, උන්වහන්සේලා; සම්මාසම්බුද්ධසාසනං, සම්‍යක්සම්බුද්ධ ශාසනය; ජීවිතං ඉව, (තමතමන්ගේ) ජීවිතය මෙන්; පාලෙන්ති, රකිත්; එතෙ, උන්වහන්සේලා; කෙලෙසාරිසීසපාතනෙ, කෙලෙස් නමැති සතුරුහිස් සිඳීමෙහි; සන්නද්ධ, සැරසුනාවූ; යොධා ඉව, යොධයන් මෙනි.

129. යත්ථ දින්නං යත්ථ පිණ්ඩං අනන්තඵලදං සියා,
යස්ස දස්සනමා'ගම්ම චක්ඛු හොති නිරාමයං,
යම්භාවිතස්ස චිත්තස්ස කොචි සොකො න විජ්ජති.

යත්ථ, යම් තැනෙක්හි; දින්නං, දෙනලද්දේ; යත්ථ, යම්තැනෙක්හි; පිණ්ඩං, පුදනලද්දේ; අනන්තඵලදං සියා, අනන්ත්පල දෙන්නේවේද; යස්ස, යම් සගුරුවනක්හුගේ; දස්සනං, දැකීමට; ආගම්ම, පැමිණ; චක්ඛු, ඇස; නිරාමයං හොති, නිරෝගිවේද; යං, යම් සඞ්ඝානුස්මෘතියකින්; භාවිතස්ස, වැඩුනාවූ; චිත්තස්ස, සිතට; කොචි සොකො, කිසි සොකයක් තෙම; න විජ්ජති, විද්‍යමාන නොවන්නේද?.

130. හොතෙ'තං සබ්බරතනං තතියං ලොකපූජිතං,
එහි තං පයිරුපාසාම සක්කරොම යථාබලං.

හොති, පින්වතිය; එතං සබ්බරතනං, මේ සබ්බරත්නය; ලොකපූජිතං, ලෝවැස්සාවිසින් පුදනලද්දවූ; තතියං, තුන්වැනිවූ රත්නයකි; එහි, එව; තං, ඒ තුන්වැනි සඟුරුවන; පයිරුපාසාම, පයිරුපාසන කරමු; යථාබලං, ශක්තිවූ පරිද්දෙන්; සක්කරොම, (ඊට) සත්කාර කරමූ.

131. දෙම දානානි හො'දානි යස්ස දින්නං මහප්ඵලං,
තං භවිස්සති නො දානං අත්ථාය ච හිතාය ච.

හො, පින්වත; යස්ස, යම්තැනෙක්හි; දින්නං, දෙනලද්ද; මහප්ඵලං, මහත්ඵලවේද; (එතැන්හි) ඉදානි, දැන්; දානානි, දන්; දෙම, දෙමු; තං දානං, ඒ දීම; නො, අපට; අත්ථාය ච, වැඩපිණිසද, හිතාය ච, හිතපිණිසද; භවිස්සති, වන්නේය.

132. විමානං තෙ මහා එතං සබ්බං තං රතනාමයං,
සයනාසනසම්පන්නං මාලදාමාදිභූසිතං.

තෙ, තාගේ; එතං විමානං, මේ විමන; මහා, මහත්ය; තං සබ්බං, ඒ සියල්ල; රතනාමයං, රුවන් මුවාය; සයනාසනසම්පන්නං, සයනාසනයෙන් සමන්විතය; මාලදාමාදිභූසිතං, මල්දම්ආදියෙන් අලංකෘතය.

133. පඤ්චඞ්ගිකානි තුරියානි පග්ගණ්හිත්වාන දෙවතා,
වාදෙන්ති මධුරං ගීතං ගායන්ති හදයඞ්ගමං.

දෙවතා, දෙවියෝ; පඤ්චඞ්ගිකානි තුරියානි, (ආතතාදී) පඤ්චාඞ්ගිකතූර්යයන්; පග්ගණ්හිත්වාන, ගෙණ; වාදෙන්ති, වාද්‍යකරත්; හදයඞ්ගමං, හෘදයඞ්ගමවූ; මධුරං ගීතං, මිහිරි ගී, ගායන්ති, ගයත්.

134. නච්චන්ති චතුරා එත්ථ දෙවකඤ්ඤා මනොරමා,
භාවභාවවිලාසෙහි රමාපෙන්ති තවං සදා.

එත්ථ, මේ විමනෙහි; මනොරමා, සිත්කලුවූ; චතුරා, දක්ෂවූ; දෙවකඤ්ඤා, දෙව්ගනෝ; නච්චන්ති, නටත්; භාවභාවවිලාසෙහි, ශෘඞ්ගාරචෙෂ්ටානුරාගවිලාසයන්ගෙන්; සදා, හැමකල්හි; තවං, තා; රමාපෙන්ති, රමනය කරවත්.

135. ඛුත්තවජ්ජාතපතාකායො ගහෙත්වා රතනාමයා,
පරිවාරෙන්ති තං නිච්චං දෙවසෙනා මනොරමා.

මනොරමා, මනහරවූ; දෙවසෙනා, දිව්‍යසෙනාවෝ; රතනාමයා, රුවන්මුවා; ඛුත්තවජ්ජතපතාකායො, කොත්සත්කෙහෙලින්; ගහෙත්වා, ගෙණ; තං, තා; නිච්චං, සතතයෙන්; පරිවාරෙන්ති, පිරිවරත්.

136. සබ්බාලඞ්කාරසම්පන්නො වණ්ණවන්තො මහායසො,
විරොචෙති දිසා සබ්බා සුරියො'ව නභමු'ග්ගතො.

නභං, අහසට; උග්ගතො, නැංගාවූ; සුරියො ඉව, හිරු මෙන්; සබ්බාලඞ්කාරසම්පන්නො, සියලු අලඞ්කාරයෙන් සමන්විතවූයේ; වණ්ණවන්තො, වණීවත්වූයේ; මහායසො, මහත් යශස් ඇත්තේ; සබ්බාදිසා, සියලු දිගුන්; විරොචෙති, බබුලුවයි.

137. කෙන තෙ පුඤ්ඤකම්මෙන සීලෙන ච වතෙන ච,
උප්පජ්ජන්ති ඉමෙ භොගා තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

තෙ, තාගේ; කෙන, කිනම්; පුඤ්ඤකම්මෙන, පින්කමකින්; සීලෙන ච, සීලයකින්; වතෙන ච, ව්‍රතයකින්; ඉමෙ භොගා, මේ භොග සම්පත්; උප්පජ්ජන්ති, උපදිද්ද; පුච්ඡිතො, විචාරණලද්දාවූ නුඹ; මෙ, මට; තං, ඒ කරුණ; අක්ඛාහි, කියව.

138. අහං භන්තෙ අතීතස්මිං විහාරෙ නාගසව්හයෙ,
අහොසිං සමණුද්දෙසො සද්ධාසීලගුණාකරො.

භන්තෙ, ස්වාමිනි; අහං, මම; අතීතස්මිං, ඉකුත් කාලයෙහි; නාගසව්හයෙ, නාගනාම්වූ; විහාරෙ, වෙහෙරෙහි; සද්ධාසීලගුණාකරො, ශ්‍රද්ධාශීල ගුණයන්ට උත්පත්තිස්ථානයක්වූ; සමණුද්දෙසො අහොසිං, හෙරණෙක් වීමි.

139. සෙනාසනපරික්ඛාරං නස්සමානමු'දික්ඛිය,
තෙන මූලෙන භික්ඛූනං මහාදානම'දාස'හං.

අහං, මම; නස්සමානං, නැසෙන්නාවූ; සෙනාසනපරික්ඛාරං, සෙනසුන් පිරිකර; උදික්ඛිය, බලා; තෙන මූලෙන, ඒ මිළයෙන්; භික්ඛූනං, භික්ෂූන්ට; මහාදානං අදාසිං, මහදනක් දුනිමි.

140. බන්ධිත්වාන විතානානි පඤ්ඤපෙත්වාන ආසනෙ,
පූජෙත්වා'නෙකපුප්ඵානි උජ්ජාලෙත්වා පදීපියං.

විතානානි, වියන්; බන්ධිත්වාන, බැඳ; ආසනෙ, අසුන්; පඤ්ඤපෙත්වාන, පණවා; අනෙකපුප්ඵානි, නොයෙක් මල්; පූජෙත්වා, පුදා; පදීපියං, පහන්; උජ්ජාලෙත්වා, උසස්කොට දල්වා.

141. මධුසක්ඛරගුළොපෙතඛජ්ජභොජ්ජෙහි සංයුතං,
නානාවිධාහි යාගූහි භික්ඛුසඞ්ඝමු' පට්ඨහිං.

මධුසක්ඛරගුළොපෙතඛජ්ජභොජ්ජෙහි, මී සකුරු උක්සකුරු යන මෙයින් යුක්තවූ කැයුතු බුදිය යුතු දෙයින්; සංයුතං, යුක්ත කොට; නානාවිධාහි, නන්වැදෑරුම්වූ; යාගූහි, හුළුකැඳින්; භික්ඛුසඞ්ඝං, බික්සඟනට; උපට්ඨහිං, උවටැන් කෙළෙමි.

142. සමච්ඡමංසවිකතිං උපෙතං ගොරසෙන ච,
මධුරන්නෙන තප්පෙසිං භික්ඛවො යාවදත්ථකං.

සමච්ඡමංසවිකතිං, මත්ස්‍යමාංස විකෘති සහිතකොට; ගොරසෙන ච උපෙතං, පස්ගෝරසයෙන්ද යුක්ත කොට; මධුරන්නෙන, මිහිරි අහරින්; භික්ඛවො, භික්ෂූන්; යාවදත්ථකං, ප්‍රයොජන ඇතිතාක්; තප්පෙසිං, වැළඳවිමි.

143. උපඩ්ඪහන්තො භික්ඛූනම්’ව මෙ’වං තදා අහං,
බහූනි වස්සපූගානි ඛෙපෙත්වාන තතො චුතො.

අහං, මම; තදා, එකල; එවංඑවං එපරිද්දෙන්ම; භික්ඛූනං, භික්ෂූන්ට; උපඩ්ඪහන්තො, උවටැන් කරන්නෙමි; බහූනි වස්සපූගානි, බොහෝ අවුරුදු ගණන්; ඛෙපෙත්වාන, ගෙවා; තතො, ඒ මිනිසත් බැවින්; චුතො, චුතවූයෙමි:—

144. එත්ථා’හං රුචිරෙ දෙවවිමානෙ රතනාමයෙ,
ජාතොසිං තෙන කම්මෙන දෙවො හුත්වා මහිද්ධිකො.

අහං, මම; තෙන කම්මෙන, ඒ කම්මයෙන්; එත්ථ, මෙහි; රතනාමයෙ, රුවන්මුවාවූ; රුචිරෙ, සිත්කළුවූ; දෙවවිමානෙ, දෙව්විමනෙහි; මහිද්ධිකො, මහත් සෘද්ධි ඇත්තාවූ; දෙවො හුත්වා, දෙවියෙක්වී; ජාතොසිං, උපන්මි.

115. පරසන්තකෙන දින්නස්ස දානස්ස ඵල’මීදිසං,
කීදිසන්නු ඵලං හොති සකසන්තකතො අහො.

පරසන්තකෙන, අනුන් අයත් දෙයින්; දින්නස්ස, දුන්නාවූ; දානස්ස, දානයාගේ; ඵලං, අනුසස්; ඊදිසං, මෙබඳුයි; සකසන්තකතො, තමාසතු දෙයින් (දුන්නාහට); කීදිසංනු ඵලං හොති, කෙබඳුනම් ඵලයක්වේද්ද; අහො, ආශ්චර්‍ය්‍යයි.

146. නත්ථි දානසමො භන්තෙ ලොකෙ සබ්බත්ථදායකො,
දෙති සො භවසම්පත්තිං තථා ලොකුත්තරං සුඛං.

භන්තෙ, ස්වාමීනි; ලොකෙ, ලොකයෙහි; දානසමො, දානය හා සමවූ; සබ්බත්ථදායකො, සකලාර්ථ ප්‍රදානය කරන්නෙක්; නත්ථි, නැත; සො, ඒ දානය; භවසම්පත්තිං, (දිව්‍යමනුෂ්‍ය) භව සැපත්; දෙති, දෙයි; තථා, එසේම; ලොකුත්තරං සුඛං, ලොවුතුරා සැපයද (දෙයි).

147. පුච්ඡාමි තං දෙවපුත්ත පීතියා වසගො අහං,
තවි’මං අනුභොන්තස්ස දිබ්බසම්පත්තිම’බ්භුතං
කාලො කීවතකො හොති යදි ජානාසි මෙ වදෙ’ති.

දෙවපුත්ත, දිව්‍යපුත්‍රය; පීතියා; ප්‍රීතියට; වසගො, වසඟවූ; අහං, මම; තං, තා; පුච්ඡාමි, විචාරමි; අබ්භුතං, පුදුමවූ; ඉමං දිබ්බ සම්පත්තිං, මේ දිව ඉසුරු; අනුභොන්තස්ස, බුදින්නාවූ; තව, නුඹට; කාලො, කාලය තෙම; කීවතකො හොති, කොපමණක්වේද; යදි, ඉදින්, ජානාසි, දන්නෙහි නම්; මෙ, මට; වද, කියව.

148. යථා'කාසො අනන්තො'සො යස්ස අන්තං නදිස්සති,
එවං මෙ පුඤ්ඤකම්මස්ස අන්තං නො දිස්සතෙ මයා.

එසො ආකාසො, මේ අහස තෙම; යථා අනන්තො, යම්සේ කොණක් නැත්තේද; යස්ස, යම් අවකාශයක්හුගේ; අන්තං, කෙළවරක්; නදිස්සති, නො පෙණේද; එවං, එසේ; මෙ, මාගේ; පුඤ්ඤකම්මස්ස, පුණ්‍යකර්ම ඵලයාගේ; අන්තං, කොණක්; මයා, මාවිසින්; නො දිස්සතෙ, නොදක්නා ලැබේ.

149. ලොකනාථං ඨපෙත්වාන කොනු අඤ්ඤො ජගත්තයෙ,
ඤත්වාං මෙ චරිමං කොටිං තං හොති ජිනගොචරං.

මෙ, මාගේ; චරිමං කොටිං, අවසාන කොණ; ඤත්වාං, දැනගන්ට; ලොකනාථං, ලොක ස්වාමීන් වහන්සේ; ඨපෙත්වාන, හැර; ජගත්තයෙ, ජගත්ත්‍රයෙහි; අඤ්ඤො කොනු, අන්කවරෙක් වේද; තං, ඒ දැනගැන්ම; ජිනගොචරං හොති, සර්වඥ ගොචර වෙයි.

150. ධම්මෙන ලද්ධං පරසන්තකං වා සමාදපෙත්වාන පර'මපි (තෙන,
දදෙය්‍ය දානං පචුරානුභාවං තථෙ'ව ලද්ධං සකසන්තකං වා.

තෙන, උක්තප්‍රකාර අනුසස් ඇති හෙයින්; පරම්පි සමාදපෙත්වාන, මෙරමාත් සමාදන් කරවා; ධම්මෙන, දැහැමින්; ලද්ධං, ලැබුවාවූ; පරසන්තකං වා, අනුන් අයත් දෙය හෝ; තථෙව ලද්ධං, එසේම දැහැමින් ලද්දාවූ; සකසන්තකං වා, තමන් සතු දේ හෝ; පචුරානුභාවං, බොහෝ අනුසස් ඇත්තාවූ; දානං, දානවස්තුකොට; දදෙය්‍ය, දෙන්නේය.

තිස්සසාමණෙර වස්තුව.—4—

---

151. ඉමං දානවිධිං හොල දසපාරම්ධම්මතො,
පඨමං කත්වාන සම්භඩං මුනිනා ලොකසාමිනා.

හොල, ගෝල (උපාසක)ය; ලොකසාමිනා, ලොකස්වාමිවූ; මුනිනා, මුනීන්ද්‍රයන් විසින්; ඉමං දානවිධිං, මේ දානවිධිය; දසපාරම්ධම්මතො, දසපාරමිධර්මයෙන්; පඨමං කත්වාන, පළමුවෙනි කොට; සම්භඩං, පුරණලදී.

152. දායකා ඡසු දෙවෙසු උපපජ්ජනති මහායසා,
අනෙකසතමුබෙබධෙ පාසාදෙ රතනාමයෙ.

දායකා. දන් දෙන ජනයෝ; ඡසු දෙවෙසු, ෂඩ්විධ දිව්‍යලොක යන්හි; අනෙකසතමුබෙබධෙ, නොයෙක් සියගණන් (යොදුන්) උස්වූ; රතනාමයෙ, රුවන්මුවාවූ; පාසාදෙ, පහයෙහි; මහායසා, මහත් යශස් ඇත්තෝව; උපපජ්ජනති, උපදිත්.

153. නෙකදෙවචඡරාකිණ්ණෙ උය්‍යානපතිමණ්ඩිතෙ,
දායකා ගොළ සගෙගසු තාවතිංසෙ මනොරමෙ,
සකකතත'මපි ච කාරෙනති අබුඩෙන අවාචියං.

ගොළ, ගෝළය; දායකා, දායකයෝ; සගෙගසු, සවගී අතුරෙන්; නෙකදෙවචඡරාකිණ්ණෙ, නොයෙක් දෙවගණන්ගෙන් ගැවසුනාවූ; උය්‍යානපතිමණ්ඩිතෙ, උයනින් හෙබියාවූ; මනොරමෙ, සිත්කලුවූ; තාවතිංසෙ, තව්තිසාවෙහි; අබුඩෙන, බුදුනොවූවෙකු විසින්; අවාචියං, කියනොහැකිවූ; සකකතතං අපිච, ශක්‍ර බවද; කාරෙනති, කරවත්.

154 ලභනති දානපතිනො චකකවතතිසිරි'මපි ච,
සතතරතනසමපනනං චතුදීපසස ඉසසරං.

දානපතිනො, දානපතීහු තුමූ; චතුදීපසස, සිව්දිවයිනට; ඉසසරං, අධිපතිවූ; සතතරතනසමපනනං, සපතවිධරතනයෙන් යුකතවූ; චකකවතතිසිරිමපිච, සක්විති සැපතද; ලභනති, ලබත්.

155. පදෙසරජ්ජං විපුලං ගොළ කුබබනති දායකා,
ධම්මාසොකනරින්දො'ව තෙජවනතා මහායසා.

ගොළ, ගෝළය; දායකා, දායකයෝ; තෙජවනතා, තෙද ඇත් තාහු; මහායසා, මහත් යශස් ඇත්තාහු; ධම්මාසොකනරින්දො ඉව, දම්සෝ නිරිඳුමෙන්; විපුලං, මහත්වූ; පදෙසරජ්ජං, පෙදෙස් රජද; කුබබනති, කරත්.

156. ඛතතියාදිමහාසාලා හුත්වා ජායනති දායකා,
හත්ථසසදාසිදාසෙහි අනනතවිභවෙහි ච.

දායකා, දායකයෝ; හත්ථසසදාසිදාසෙහි, ඇත් අස් දාසි දසුන් හා; අනනතවිභවෙහි ච, අනත් සැපයෙන්ද යුකතවූ; ඛතතියාදි මහාසාලා හුත්වා, කැත්ඔහසල් ඈ කුලීනයෝ වී; ජායනති, උපදිත්.

157. පචෙචකමුනිභාවං ච සාවකතතං ච දායකා,
නිරාමිසං ලභනෙත'තෙ අගගං ලොකුතතරං සුඛං.

එතෙ දායකා, ඒ දායකයෝ තුමූ; පච්චෙකමුනිභාවං ච, පසේ බුදු බවද; සාවකත්තං ච, සව්බැව්ද; නිරාමිසං, ආමිස රහිතවූ; අග්ගං, ශ්‍රෙෂ්ඨවූ; ලොකුත්තරං සුඛං, ලොවුතුරා සැපද; ලභන්ති, ලබත්.

158. නෙත්තරතනාදිදානෙහි බුද්ධො බුද්ධත්තමා'ගතො,
තස්මා දානවරං එතං දාතබ්බං'ව සදා'දරා.

බුද්ධො, සර්වඥතෙම; නෙත්තරතනාදිදානෙහි, ඇස් ලේ ආදිය දීමෙන්; බුද්ධත්තං, බුදුබවට; ආගතො, පැමිණිසේක; තස්මා, එහෙයින්; එතං දානවරං, මේ ශ්‍රෙෂ්ඨ දානය; සදා, හැමකල්හි; ආදරා, ආදරයෙන්; දාතබ්බං එව, දියයුත්තේමය.

159. ජානන්තෙන සදා ගොළ දානස්ස ඵලමු'ත්තමං,
දාතබ්බම'ප්පකං වා'පි බහුං වා'පි සුභාසුභං.

ගොළ,ගොළය; දානස්ස, දානයාගේ; උත්තමං ඵලං, උතුම් ඵලය; ජානන්තෙන, දන්නහුවිසින්; සදා, හැමකල්හි; අප්පකං ච අපි, මඳවූද; බහුං ච අපි, බොහෝවූද; සුභාසුභං, යහපත් හෝ අයහපත්දෑ; දාතබ්බං, දියයුතුයි.

160. චිත්තමත්තෙන පසන්නෙ'පි ඵලං හොති අනූපමං,
තස්මා දදෙය්‍ය සබ්බත්ථ සදා සද්ධාය විඤ්ඤුනා.

චිත්තමත්තෙන, සිතපමණකින්; පසන්නෙ අපි, පැහැදුනුකල්හිද; අනූපමං, උපමාරහිතවූ; ඵලං හොති, අනුසස් වෙයි; තස්මා, එහෙයින්; විඤ්ඤුනා, නුවනැති මනුෂ්‍යතෙම; සබ්බත්ථ, හැමතන්හි; සදා, හැම කල්හි; සද්ධාය, සැදැහැයෙන්; දදෙය්‍ය, (දන්)දෙන්නේය.

161. තව දානමයා ඝොසා පත්ථරිත්වා සදෙවකෙ,
දෙවජිව්හග්ගරඞ්ගම්හි නිච්චං නච්චන්ති මණ්ඩිතා.

තව, තාගේ; දානමයා, දානයෙන් නිර්මිතවූ; ඝොසා, යශොඝොෂයෝ; සදෙවකෙ, දෙවියන් සහිත ලොකයෙහි; පත්ථරිත්වා, පැතිරී; දෙවජිව්හග්ගරඞ්ගම්හි, දෙවියන්ගේ ජිව්හාග්‍රනැමැති නෘත්‍යමණ්ඩලයෙහි; මණ්ඩිතා, සැරසුනාහු; නිච්චං, සතතයෙන්; නච්චන්ති, නටත්.

162. දත්වා දානවරං ගොළ සීලවන්තෙ බහුස්සුතෙ,
අනිජ්ජිතො දෙවලොකමා'ගච්ඡ මම සන්තිකං.

ගොළ, ගොළය; සීලවන්තෙ, සිල්වත්වූ; බහුස්සුතෙ, බහුශ්‍රැතජනයාට; දානවරං, ශ්‍රෙෂ්ඨදානය; දත්වා, දී; අනිජ්ජිතො, පසස්නාලද්දේ; දෙවලොකං, දෙව්ලොවට; මම සන්තිකං, මාගේ සමීපයට; ආගච්ඡ, එව.

163. එවං දත්වං සග්ගසොපානම'ග්ගං
දිබ්බං යානං භූසිතං චාරුමග්ගං,
තස්මා භොන්තො දෙථ දනානි නිච්චං
ගන්ත්වා සග්ගං භුඤ්ජථසාරම'ග්ගං.

එවං, මෙසේ ;දනං, දීම; සග්ගසොපානං, දෙව්ලොවට නැගෙණි හිණෙක; අග්ගං, අග්‍රවූ; දිබ්බං යානං, දිව්‍යයානයකි; භූසිතං, අලංකෘතවූ; චාරුමග්ගං, මනොඥමාර්‍ගයකි; භොන්තො, පින්වත්නි; තස්මා, එහෙයින්; නිච්චං, සතතයෙන්; දනානි, දන්; දෙථ, දෙව්; සග්ගං ගන්ත්වා, දෙව්ලොවගොස්; අග්ගං සාරං, අග්‍රවූසැප; භුඤ්ජථ, බුදිව්.

## ගොල උපාසක වස්තුව. –5–

164. සද්ධාය දත්වා පූටභත්තම'කා
නිවත්ථවත්ථං මලිනං ච ථූලං,
භික්ඛුස්ස එකස්ස අනාසවස්ස
දිබ්බම්බරෙ සා තදහෙව ලද්ධා.

එකා, එක්මාගමක් තොමෝ; අනාසවස්ස, ආශ්‍රවරහිතවූ; එකස්ස භික්ඛුස්ස, එක්මහණක්හට; පූටභත්තං, බත්මුලක්ද; ථූලං, දලවූ; මලිනං, කිලුටුවූ; නිවත්ථවත්ථං ච, හැඳිවතද; සද්ධාය, සැදැහැයෙන්; දත්වා, දනය කොට; සා, ඕතොමෝ; තදහෙව, එදවසෙහිම; දිබ්බම්බරෙ, දිවසළු; ලද්ධා, ලැබුවා.

165. දිබ්බානි වත්ථානි පුනා'පි එසා
දත්වාන දනං මුනිසාවකානං,
තස්සා'නුභාවෙන තතො චවිත්වා
නිබ්බත්ති සග්ගෙ පරමප්පණීතෙ.

එසා, මෝතොමෝ; පුනඅපි, යළිත්; මුනිසාවකානං, සර්‍වඥශ්‍රාවකයන්ට; දිබ්බානි වත්ථානි, දිව්‍යවස්ත්‍රයන්; දනං දත්වාන, දන්දී; තස්සානුභාවෙන, ඒදිවසළුදනයාගේ තෙදින්; තතො, ඒමිනිසත්බැවින්; චවිත්වා, චුතව; පරමප්පණීතෙ, අතිශයින් ප්‍රණීතවූ; සග්ගෙ, සවර්ගයෙහි; නිබ්බත්ති, ජනිතවූවා.

166. තත්ථේ'ව තස්සා'සි මහාවිමානං
උබ්බෙද්ධතො ද්වාදසයොජනෙසු,
තස්සා'නුරූපෙන විසාලවන්තං
දුස්සච්ඡායං නෙකවිරාගවන්තං.

තත්ථෙව, ඒදෙව්ලෙව්හිම; තස්සා, ඈට; උබ්බෙධතො, උසින්; වාදසයොජනෙසු, දෙළොස්යොදුන්හි; තස්සානුරූපෙන, ඊට සුදුසු පරිද්දෙන්; විසාලවත්තං, විසල්වූ; නෙකවිරාගවණ්ණං, නානාවණී වත්වූ; දුස්සවහයං, දුස්සනම්වූ; මහාවිමානං ආසි, මහවිමනක් විය.

167. ථම්භාදිගොපානසි ආදිකෙසු
භූමීසු භිත්තිච්ඡදනෙසු තෙසු,
අනෙන සමන්තා ඡදනස්ස තස්ස
නානාවිරාගම්බරලඞ්කතානි.

ථම්භාදිගොපානසිආදිකෙසු, වැම්ආදීන්හි හා ගොණැස්ආදීන්හිද; භූමීසු, භූමින්හිද; තෙසු භිත්තිච්ඡදනෙසු, ඒ බිත්පියැස්හිද; තස්ස ඡදනස්ස, ඒ පියසිහුගේ; අනෙන, කෙළවර; සමන්තා, හාත්පසද; නානාවිරාගම්බරලඞ්කතානි, නත්පැහැපත්වතින් අලඞ්කාරයහ.

168. තත්ථෙ'ව වත්ථෙහි විභත්තගබ්භා
ගබ්භාන'මන්තො සයනාසනානි,
පාවාරපච්චත්ථරණත්ථතා තෙ
භාසන්ති නිච්චං රමණීයරූපා.

තත්ථෙව, එසේම; වත්ථෙහි, වස්ත්‍රාන්ගෙන්; විභත්තගබ්භා, බෙද නලදගැප්ඇත්තාහ; ගබ්භානං, (ඒ) ගැබියන්ගේ; අන්තො, ඇතුලත; පාවාරපච්චත්ථරණත්ථතා, පලස්පසතුරුණුඅතුළාවූ; සයනාසනානි, සෙනසුන්වෙත්; රමණීයරූපා, සිත්කළුවූ; තෙ, ඔහුතුමු; නිච්චං, අනවරතයෙන්; භාසන්ති, බබලත්.

169. නානාවිරාගද්ධජපන්තිකෙහි
මුත්තාමණිලම්බිතකණ්ණිකෙහි,
වාතෙරිතාකිඞ්කිණිරාවකෙහි
අමන්දනන්ද'වහමා'සි නිච්චං.

නානාවිරාගද්ධජපන්තිකෙහි, නොයෙක්වර්ණවත් ධ්වජපඞ්ක්තිඇති; මුත්තාමණිලම්බිතකණ්ණිකෙහි, මුතුමැණික්එල්වනලද කණිණිකා ඇති; වාතෙරිතාකිඞ්කිණිරාවකෙහි, වාතයෙන්කම්පිතවූ මන්දකිංකිණිකධ්වනීන්ගෙන්; නිච්චං, සතතයෙන්; අමන්දනන්දවහං ආසී, බොහෝසතුටු එළවන්නක් විය.

170. සා දෙවකඤ්ඤා කනකාවභාසා
පයොධරාභාරභරාභිරාමා,
බිම්බාධරාකචනවල්ලිලීලා
මුඛම්බුජා නෙත්තමධුබ්බතෙහි.

සා දෙවකඤ්ඤා, ඒදිව්‍යාප්සරාතොමෝ; කනකාවභාසා, ස්වර්ණවර්ණ වූවා; පයොධරාභාරභරාභිරාමා, පියයුරුබරින්හා මුත්හරයෙන්සිත් කළුය; බිම්බාධරා, බිඹුපලවන්දෙතොල්ඇත්තිය; කමනවලලිලීලා, රන්ලියක්බඳුලීලාඇත්තිය; නෙත්තාම්බුබ්බනෙහි, නෙත්නැමැති බම රුන්ගෙන්උපලක්ෂිතවූ; මුඛම්බුජා, මුවපියුමක්ඇත්තිය;

171. විචිත්තවණ්ණාදි විභූසිතඞ්ගී
සුගන්ධකඤ්ඤා පතිසෙවිතඞ්ගී,
භාසන්තමාලායුතලත්තමඞ්ගී
ඛහාස සා දෙවකඤ්ඤා සමඞ්ගී.

විචිත්තවණ්ණාදිවිභූසිතඞ්ගී, විසිතුරුවර්ණාදියෙන් අලඞ්කෘතශරීර යක්ඇත්තිය; සුගන්ධකඤ්ඤා පතිසෙවිතඞ්ගී, සුගන්ධවත්ස්ත්‍රීන්විසින් සෙවුනාලදඅවයවඇත්තිය; භාසන්තමාලායුතලත්තමඞ්ගී, භ්‍රාජිත මාලාවෙන්යුත්ශීර්ෂයක්ඇත්තිය; දෙවකඤ්ඤාසමඞ්ගී, දිව්‍යකන්‍යාවන් ගෙන්යුක්තවූ; සා, ඕතොමෝ; ඛහාස, බැබලීන.

172. අනන්තසම්පත්තිසමඞ්ගිභූතෙ විසාලපාසාදවරෙ සුරම්මෙ,
නච්චෙහි ගීතෙහි ච මොදමානා විහාසි එවං සුචිරං දිවස්මිං.

අනන්තසම්පත්තිසමඞ්ගිභූතෙ, අනන්සැපතින්සමන්විතවූ; සුරම්මෙ, අතිශයරම්‍යවූ; විසාලපාසාදවරෙ, විසල් වර පහයෙහි; නච්චෙහි, නෘත්‍යයන්ගෙන්ද; ගීතෙහි ච, ගීතිකාවන්ගෙන්ද; මොදමානා, සතුටු වන්නී; එවං, මෙසේ; දිවස්මිං, දෙව්ලොවෙහි; සුචිරං, ඉතා බෝකලක්; විහාසි, විසුවා.

173. ඤත්වාන දෙහම'චිරං ඛණභඞ්ගුර'න්ති
සම්පත්ති නාම මනුජස්ස ච නස්සතී'ති,
සග්ගාපවග්ගවිභවං මධුර'න්ති එවං
දානාදිනෙකකුසලෙසු යතෙය්‍ය ධීරො'ති.

ධීරො, ප්‍රාඥතෙම; දෙහං, සිරුර; අචිරං, නොබෝකලක් පවත් නේය; ඛණභඞ්ගුරං, ක්ෂණයකින්බිඳෙනසුලුය; මනුජස්ස,මිනිසාගේ; සම්පත්ති ච නාම, සැපතද; නස්සතීති, නැසෙන්නේයයිද; සග්ගාප වග්ගවිභවං, ස්වර්ගමොක්ෂසැප; මධුරං ඉති, මිහිරියයිද; එවං, මෙසේ; ඤත්වාන, දැන; දානාදිනෙකකුසලෙසු, දානාදිනානාඅනෙක් කුශලයන්හි; යතෙය්‍ය ඉති, යත්න කරන්නේය.

**ඛන්මුලඳුන් ස්ත්‍රියගේ කථාවස්තුව—6—**

174. සාධු සාධු තයා දින්නදානං ඨානෙ පතිට්ඨිතං,
තස්මා තං අනුමෝදම් සාධු සාධු උපාසකා'ති.

උපාසක, උවසුව; සාධු සාධු, මැනව මැනවි; තයා, තා විසින්; දින්නදානං, දෙනලද දානය; ඨානෙ, සුදුසු තැන; පතිට්ඨිතං, පිහිටි යේය; තස්මා, ඒ හේතුවින්; තං, ඒ දානමය පින; අනුමෝදම්, සතුටින් පිළිගණිම්; සාධු සාධු, යහපත යහපති.

175. සාධු සාධු තයා දින්නදානං ඨානෙ පතිට්ඨිතං,
තස්මා තං අනුමෝදම් සාධු සාධු උපාසකා'ති.

176. සාධු සාධු තයා දින්නදානං ඨානෙ පතිට්ඨිතං,
තස්මා තං අනුමෝදම් සාධු සාධු උපාසකා'ති.

177. සාධු සාධු තයා දින්නදානං ඨානෙ පතිට්ඨිතං,
තස්මා තං අනුමෝදම් සාධු සාධු උපාසකා'ති.

178. ලොකො වදති පුංසානං සුඛං දුක්ඛං භවාභවං,
භරියායත්තනානි තං ඤත්වා කලත්තං සඞ්ගහෙ බුධො.

පුංසානං, පුරුෂයන්ගේ; සුඛං දුක්ඛං, සැපදුක් දෙකද; භවාභවං, අභිවෘඩි අනභිවෘඩි දෙකද; භරියායත්තනානි, බිරින්ද සම්බන්ධ යයි; ලොකො, ලෙව්වැසිතෙම; වදති, කියයි; [එහෙයින්] බුධො, නුවනැතිතෙම; තං, ඒ කරුණ, ඤත්වා, දැන; කලත්තං සඞ්ගහෙ, කලත්‍රසඞ්ග්‍රහ කරන්නේය.

179. යා කඤ්ඤා දෙවකඤ්ඤා'ව හොති සබ්බඞ්ගසොභනා,
තස්සා වෙ දුග්ගුණා හොන්ති තෙහි රූපං පිපියති.

යා කඤ්ඤා, යම් කන්‍යාවක්තොමෝ; දෙවකඤ්ඤා ඉව, දෙවඟනක් මෙන්; සබ්බඞ්ගසොභනා හොති, සියලඟ හොබනී වේද; වෙ, ඉදින්; තස්සා, ඇගේ; දුග්ගුණා හොන්ති, නපුරු ගුණයෝත් වෙද්ද; තෙහි, දුර්ගුණයන් විසින්; (තස්සා, ඇගේ;) රූපං, රූපය තෙම; පිපියති, වසනුලැබේ.

180. උත්තරොට්ඨෙ කපොලෙ ච ඌරුජඞ්ඝාසු බාහුසු,
සා වෙ පතිං විනාසෙති යස්සා හොන්ති තනූරුහා.

යස්සා, යම් මාගමක්හුගේ; උත්තරොට්ඨෙ, උඩුතොලෙහිද; කපොලෙච, කොපුල් තෙලෙහිද; ඌරුජඞ්ඝාසු, කලවා කෙණ්ඩයන්හිද; බාහාසු, බාහුන්හිද; තනූරුහා හොන්ති, ලොමයෝ වෙත්ද; සා, ඕතොමෝ; වෙ, එකාන්තයෙන්; පතිං, සැමියා; විනාසෙති, නසයි;

181. සලාලා මහතී කණ්හාධරු'ත්තලච්ඡී ඛරා,
බල්ලාමා ච කලාරා ච යා සා දුක්ඛස්ස භාගිනී.

යා, යම් ස්ත්‍රියක්තොමෝ; සලාලා, කෙලවැගිරීම් සහිත වේද; මහතී, මහත්වූවා; කණ්ණභාධරා, කලුතොල් ඇත්තීද; ආකුලවිජා, ව්‍යාකූල දත් ඇත්තීද; බරා, පරුෂ වේද; බලලාටා ච, හිසකෙස්නැති හිස ඇත්තීද; කලාරා ච, රිටසේ උස්ද; සා, ඕතොමෝ; දුකඛස්ස භාගිනි, දුකට හිමි වන්නිය.

182. අට්ඨිචම්මා'වසෙසා යා සිරාවිතතදෙහිනි,
බණ්ඩා කුණී කලංකා ච දළිද්ද සා වරාකිකා.

යා, යම් ස්ත්‍රියක්තොමෝ; අට්ඨිචම්මාවසෙසා, ඇට සම් ශෙෂ වූවා, සිරාවිතතදෙහිනි, නිල්නහර ඉල්පිසිටි ශරිරයක් ඇත්තීද; බණ්ඩා, කොරවූවාද; කුණී, වක්වූ අත් පා ඇඟිලි ඇත්තීද; කලංකා ච, [සහජාත] කැළැල් ඇත්තීද; සා, ඕතොමෝ; දළිද්ද, දිළිදුවූ; වරාකිකා, දුර්භාග්‍යඇත්තියක් වෙයි.

183. කාණා කෙකරා අන්ධා විසමකඛි මධුපිඞගලා,
නිකඛනතබුබ්බුලාකාරනෙතතා සා විධවා භවෙ.

[යම් ස්ත්‍රියක්තොමෝ] කාණා, එකඇසක් කණවූවාද; කෙකරා, විෂමව දක්නා ඇස්ඇත්තීද; මධුපිඞගලා, මීමෙන් පිඟුවන් ඇස් ඇත්තීද; නිකඛනතබුබ්බුලාකාරනෙතතා, පිටතට නික්මුනු බුබුලු අයුරු ඇස් ඇත්තීද; සා, ඕතොමෝ; විධවා භවෙ, වැන්දඹු වන්නිය.

184. පිනාකිනී වංකනාසා කුඞි සපෙපාදරා වණී,
කාකජජරභාසී ච විභාසා ච අලකඛිකා.

පිනාකිනී, දුන්නවැනිවූවා; වංකනාසා, වක්වූ නැහැයක් ඇත්තීද; කුඞි, කුෂටඇත්තීද; සපෙපාදරා, (අහරින් සුහිත) සර්පයෙකුගේ මෙන් බඩක් ඇත්තීද; වණී, ව්‍රණඇත්තීද; කාකජජරභාසී ච, කවුඩෙකුමෙන් දුදුරුවචන ඇත්තීද; විභාසා ච, විකාරවචන ඇත්තීද; (ඕතොමෝ) අලකඛිකා, කාලකන්නි වන්නිය.

185, ඛරස්සරා ච යා හොති පිසුනා මිතතදුභිකා,
කලහප්පියා කොධමනා සා හරියා මච්චුසාදිසා.

යා, යම් ස්ත්‍රියක්තොමෝ; ඛරස්සරා ච හොති, බිදුනාවූ ස්වර ඇත්තී වේද; පිසුනා, පෙහෙදුන්කිය ඇත්තීද; මිතතදුභිකා, මිත්‍රද්‍රොහිද; කලහප්පියා, ඩබරට කැමැත්ද; කොධමනා, කිපෙන සිත් ඇත්තිද; සා හරියා, ඒ බිරින්ද; මච්චුසාදිසා, මරු සදෘශ වන්නීය.

186. බහුභාණී මහාහාසා සෙරිවාරී මහඝසසා,
අභිරිකා අනොටතපපා සා නාසයති සාමිකං.

බහුභාණී, බෙහෙවින් බණන්නීද; මහාභාසා, මහත්කොට සිනාසෙන්නීද; සෙරිචාරී, සිත්සේ හැසිරෙන්නීද; මහග්ඝසා, බොහොම අහර බුදිනා සුලුද; අහිරීකා, විළිනැත්තීද; අනොත්තප්පා, බිය නැත්තීද; සා, ඕතොමෝ; සාමිකං, සැමියා; නාසයති, නසයි.

187. චොරී ච කඨිනා යා තු සුරාපායී මුසාරතා,
උත්තාලා කෙළිසීලා ච සා කඤ්ඤා විධවා සියා.

යා තු, යම් සත්‍රියක් වනාහි; චොරී ච, සොරකම් කරන්නීද; කඨිනා, දැඩිද; සුරාපායී, සුරා බොන්නීද; මුසාරතා, මුසාවා බිණීමෙහි ඇළුනීද; උත්තාලා, හිස්මන් ඇත්තීද; කෙළිසීලා ච, කෙළියටීද; සා කඤ්ඤා, ඒ කන්‍යාතොමෝ; විධවා සියා, සැමිනැත්තියක් වන්නීය.

188. රමන්ති ගජ්ජමානාය සද්ධියො ච හසන්තියා,
ගණ්ඩෙ කූපානි ජායන්ති සා'රිනි පතිනො සදා.

ගජ්ජමානාය, යන්නියගේ; සද්ධියො, [දතිස්ගොප්] සඬිහු; රමන්ති, නාදකෙරත්ද; හසන්තියා, සිනාසෙන්නියගේ; ගණ්ඩෙ, කොපුලෙහි; කූපානි, කූපයෝ; [නිම්නස්ථාන] ජායන්ති, හටගණිත්ද; සා, ඕතොමෝ; සදා, හැමකල්හි; පතිනො, සැමියාට; අරිනී, සැතිරී වන්නීය.

189. යා චෙ ලක්ඛණහීනා'පි අස්සාවා ගුණවා වධූ,
පුබ්බුට්ඨායී ච යා හොති තථා පච්ඡා නිපාතිනී.
පතිට්ඨාපෙති විත්තෙසු යා භවෙ සාධු සා ධවං,

යා වධූ, යම් සත්‍රියක්තොමෝ; චෙ, ඉදින්; ලක්ඛණහීනා අපි, සත්‍රී ලක්ෂණයෙන් හීනවූවානමුත්; අස්සවා, කීකරුද; ගුණවා, ගුණවත්ද; යාච, යම්සත්‍රියකුත්; පුබ්බුට්ඨායී හොති, [සියල්ලටම] පෙරනැගී සිටින සුලුවේද; තථා, එසේම; පච්ඡා, පසුව; නිපාතිනී භවෙ, හොවින්නි වේද; සා, ඒ සත්‍රීතොමෝ; ධවං, සැමියා; විත්තෙසු; වස්තූන්හි; සාධු, මොනවට; පතිට්ඨාපෙති, පිහිටුවයි.

190. න භින්දති සදා කාමං යා කඤ්ඤා පතිනො මනං,
සුඛදුක්ඛෙ සමා හොති සා පාණෙන සමා මතා.

යා කඤ්ඤා, යම් කන්‍යාවක්; සදා, හැමකල්හි; පතිනො, සැමියාගේ; මනං, සිත; කාමං, ඒකාන්තයෙන්; නභින්දති, නොබිඳීද; සුඛදුක්ඛෙ, සැපදුකෙහි; සමා හොති, සම වේද; සා, ඕතොමෝ; පාණෙන සමා, ප්‍රාණය හා සමවන්නියයි; මතා, දන්නාලද්දීය.

191. භොජනෙ සයනෙ ගමනෙ භයෙ ව්‍යාධිඋප්පද්දවෙ,
සමචිත්තා සදා හොති සා හොති පතිපූජිකා.

භොජනෙ, බුදීමෙහිද; සයනෙ, හොවීමෙහිද; ගමනෙ, යාමෙහිද; භයෙ, බියෙහිද; ව්‍යාධිඋපද්දවෙ, රොගොපද්‍රවයෙහිද; සදා, සියලු කල; සමචිත්තා හොති, සමසිත් ඇත්තී වේද; සා, ඕතොමෝ; පති පූජිකා හොති, සැමියා පුදන්නී වෙයි.

192. උණ්හොදකාදිදනෙසු පාදසම්බාහනාදිසු,
පතිං යා නා'වමඤ්ඤති සා හොති පතිපූජිකා.

යා, යම් ස්ත්‍රියක්තොමෝ; උණ්හොදකාදිදනෙසු, උණුදිය දීම්ආදීන්හිද; පාදසම්බාහනාදිසු, පා මැඩීම් ආදින්හිද; පතිං, සැමියා; න අවමඤ්ඤති, පහත්කොට නොසිතයිද; සා, ඈ; පතිපූජිකා හොති, පතිපූජිකා නම් වෙයි.

193. ගන්ධපුප්ඵාදිනා යාතු පණිපාතෙති සාමිකං,
න චු'ච්චාසනිකා හොති සා හොති පතිපූජිකා.

යාතු, යම් ස්ත්‍රියක් වනාහි; ගන්ධපුප්ඵාදිනා, ගඳමල් ආදියෙන්; සාමිකං, සැමියා; පණිපාතෙති, පුද වදියිද; නව උච්චාසනිකා හොති, උස් අසුන්හි නොහිඳින්නී වේද; සා, ඈතොමෝ; පතිපූජිකා හොති, පතිපූජිකානම් වෙයි.

194. මාතාපිතුසු භාතාදීසස්සුසසුරාදිඤාතකෙ,
සාදරෙන උපට්ඨාති සා හොති කුලනන්දිනී.

මාතාපිතුසු, මව්පියන් කෙරෙහිද; භාතාදි, සොහොවුරු ආදීන් කෙරෙහි හා; සස්සුසසුරාදිඤාතකෙ, නැදිමයිල් ආදි නෑයන්කෙරෙහිද; සාදරෙන, ආදර සහිතව; උපට්ඨාති, උවටැන් කරන්නීද; සා, ඕතොමෝ; කුලනන්දිනී හොති, කුලනන්දිනී වෙයි.

195. දාසකම්මකරෙ කම්මෙ යා ධම්මෙන නියොජති,
නික්ඛිත්තදණ්ඩඵරුසා සා හොති ජනරඤ්ජනී.

යා, යම් ස්ත්‍රියක්; දාසකම්මකරෙ, දස්කම්කරුවන්; කම්මෙ, (ඒඒ) කම්මයෙහි; ධම්මෙන, දැහැමින්; නියොජති, යොදවාද; නික්ඛිත්ත දණ්ඩඵරුසා, බහාතබනලද දඬුවම් රළුබස් ඇත්තීද; සා, ඕතොමෝ; ජනරඤ්ජනී හොති, ජනරඤ්ජනී(ජනයා සතුටුකරන්නී)නම් වෙයි.

196. යා දානාභිරතා හොති තීසු වත්ථූසු මාමිකා,
සීලාචාරගුණූපෙතා භරියා ධම්මචාරිණී.

යා, යම් ස්ත්‍රියක්; දානාභිරතා හොති, දීමෙහි ඇලුනී වේද; තීසු වත්ථූසු, වස්තුත්‍රයෙහි; මාමිකා, මමත්වය ඇත්තීද; සීලාචාරගුණූපෙතා, ශීලාචාර ගුණයෙන් යුක්තද; භරියා, [ඒ] බිරින්ද; ධම්මචාරිණී, ධම්මචාරිණී නම් වෙයි.

197. පුත්තං සපතිරූපෙන ජනෙති නා'තිවාරිනී,
ධීතරං සකරූපෙන යා ජනෙති ස'උත්තමා.

යා, යම් ස්ත්‍රියක්; න අතිවාරිනි, [සැමියා] නොඉක්මවා හැසිරෙන්නී; සපතිරූපෙන, සියහිමිරුවින්; පුත්තං, පුත්‍රයා; ජනෙති, වදයිද; සකරූපෙන, සියරුවින්; ධීතරං, දියනිය; ජනෙති, ප්‍රසවය කරද; සා, ඕතොමෝ; උත්තමා, උතුම් වන්නිය.

198. භූමිං අකම්පයං යාති යාති කඤ්ඤා සනිං සනිං,
දිසා යා නා'වලොකෙති න පක්ඛලති භූමියං,
සා'පි කඤ්ඤා වරාරොහා වරිතබ්බා වරෙති'ධා'ති.

යාකඤ්ඤා, යම් කන්‍යාවක්තොමෝ; භූමිං, පෘථිවිය; අකම්පයං, කම්පානොකරමින් (නොඅවුස්සමින්); යාති, යාද; සනිං සනිං, සෙමින් සෙමින්; යාති, යාද; දිසා, දිගුත්; න අවලොකෙති, නොබලාද (ඔබමොබ නොබලාද); භූමියං, පොළවෙහි; න පක්ඛලති, නොපැකිලේද; සාපි කඤ්ඤා, ඒ කන්‍යාතොමෝද; වරාරොහා, වරාරොහා නම් වන්නිය; ඉධ, මේ ලොකයෙහි; වරෙන, බිරින්දක් පතන පුරුෂයා විසින්; වරිතබ්බා, කැමැතිවිය යුත්තීය.

199. සංසාරදුග්ගවිපිනෙ භයදෙ අසාරෙ
රොපෙත්වා දානසුරපාදපම'ච්චු'ළාරං,
තස්සා'නු භාවජනිතං සුඛමෙ'සමානා
අනෙත'නුභොනති සුජනා අමතපඵල'න්ති.

ඉති, මෙසේ; සුජනා, සත්පුරුෂයෝ; භයදෙ, [අවාබියආදි] බිය දෙන්නාවූ; අසාරෙ, සාරයක් නැත්තාවූ; සංසාරදුග්ගවිපිනෙ, සසර නැමැති මහාදුර්ගවනයෙහි; අච්චුළාරං, ඉතා මහත්වූ; දානසුරපාදපං, දානසඞ්ඛ්‍යාත කල්පවෘක්ෂය; රොපෙත්වා, රොපනය කොට; තස්ස, ඒ දානකල්පවෘක්ෂයාගේ; ආනුභාවජනිතං, ආනුභාවයෙන් හටගත්තාවූ; සුඛං, සැප; එසමානා, කැමැතිවෙන්නාහු (බුදිත්නාහු); අනෙත, පශ්චිම භවයෙහි; අමතපඵලං, අමාපල; අනුභොනති, බුදිත්.

**දෙවෙනි අඹුසැමිදෙදෙනාගේ කථාවස්තුව—7—**

—+—

200. පුච්ඡාමි තං දෙවපුත්ත විතක්කො උදපාදි මෙ,
පස්සන්ති සකලං දෙවා යදි ජානාසි සංස මෙ

දෙවපුත්ත, දිව්‍යපුත්‍රය; මෙ, මට; විතක්කො' විතර්කයක්තෙම; උදපාදි, පහළවූයේය; තං, එය; පුච්ඡාමි, තා විචාරමි; දෙවා, දෙවියෝ; සකලං, සියල්ල; පස්සන්ති, දකිත්; යදි, ඉදින්; ජානාසි, (එය) දන්නෙහි නම්; මෙ, මට; සංස, කියව.

201. උපද්දුතා ඡාතකෙන ලඞ්කායං ජනතා බහු,
එසන්තා සරණං ගඤ්ඡුං සක්කා තෙ යත්ථ ජීවිතුං.

ලඞ්කායං, ලක්දිවෙහි; බහුජනතා, බොහෝජනසමූහයෝ; ඡාතකෙන, බඩසයින්; උපද්දුතා, උපද්‍රැතයහ; තෙ, ඔව්හු; සරණං, පිහිටක්; එසන්තා, සොයන්නාහු; යත්ථ, යම්තැනක; ජීවිතුං, ජීවත් වන්ට; සක්කා, හැක්කාහුද; ගඤ්ඡුං, (එහි) ගියාහුය.

202. අහමෙ'කො තයා දෙව රක්ඛිතො පරිපාලිතො,
අනුභොමි යථාකාමං සබ්බදා දිබ්බභොජනං.

දෙව, දෙවය; අහං, මම; එකො, හුදකලාවූයේ; තයා, තාවිසින්; රක්ඛිතො, රක්නාලද්දේ වෙමි; පරිපාලිතො, හාත්පසින් පාලනය කරණ ලද්දේ වෙමි; සබ්බදා, හැමකල්හි; දිබ්බභොජනං, දිව බොජුන; යථාකාමං, සිත්සේ; අනුභොමි, බුදිමි.

203. කෙන මෙ පුඤ්ඤකම්මෙන සීලෙන ච වතෙන ච,
උපපජ්ජන්ති මමෙ'තානි තං මෙ අක්ඛාහි පුච්ඡිතො 'ති,

මෙ, මාගේ; කෙන පුඤ්ඤකම්මෙන, කිනම් පින්කමකින්; සීලෙන ච, ශීලයකින්; වතෙන ච, ව්‍රතයකින්; මම, මට; එතානි, මේ සැප; උපපජ්ජන්ති, උපදින්ද; පුච්ඡිතො, විචාරණලද්දාවූ නුඹ; මෙ, මට; තං, ඒ කාරණය; අක්ඛාහි, කියව.

204. කටච්ඡුමත්තං භික්ඛ'මපි යො බුද්ධස්ස නරො දදෙ,
විපාකං කො නු සක්කොති වත්තුං හිත්වා මුනිස්සරං.

යො නරො, යම් මිනිසෙක්තෙම; බුද්ධස්ස, සර්වඥයන්වහන්සේට; කටච්ඡුමත්තං, සැන්දක් පමණ; භික්ඛං අපි, භික්ෂාව හුදු; දදෙ, දෙන්නේද; විපාකං, [එහි] විපාකය; වත්තුං, කියන්ට; මුනිස්සරං හිත්වා, මුනීශ්වරයානන්වහන්සේ හැර; කො නු, කවරෙක් තෙම වනාහි; සක්කොති, හැක්කේද.

205. තථා පච්චෙකබුද්ධස්ස සාවකස්ස ච සාමිනො,
යො නරො දෙති දානානි තම්පි බුද්ධා'ව භාසරෙ.

තථා, එසේම; යො නරො, යම් මිනිසෙක්තෙම; පච්චෙකබුද්ධස්ස, පසේබුදුවරයන් වහන්සේ නමකටද; සාමිනො, ස්වාමිවූ ලොවුතුරු සර්වඥයන්වහන්සේගේ; සාවකස්ස ච, ශ්‍රාවක නමකටද; දානානි දෙති, දන් දේද; තං අපි, ඒදානමය පිණත්; බුද්ධා එව, බුදුවරයෝම; භාසරෙ, වදාරත්.

206. යො වෙ ධම්මං උපට්ඨාති සඞ්ඝං වා'පි ජිනොරසං,
විපාකං තස්ස කො වත්තුං සමත්ථො හොති තං විනා.

සො, යමෙක්තෙම; ධම්මං,ධර්මයද; ජිනොරසං, ජිනතනුජවූ; සඞ්ඝං ච අපි, සඞ්ඝරුවනද; උපට්ඨාති, උවටැන්කෙරේද; තස්ස, ඒඋපස්ථානයාගේ; විපාකං, අනුසස්; වත්තුං, කියන්ට; නං විනා, ඒ බුදුන්හැර; කො, කවරෙක්; සමත්ථො හොති, සමර්ථ වේද?.

207. අහං භන්තෙ න සක්කොමි අතීතෙ ජිනියො බහු,
අප්පසක්කාදිභාවත්තා පස්සිතුං මන්දපුඤ්ඤතා.

භන්තෙ, ස්වාමීනි; අහං, මම; අප්පසක්කාදිභාවත්තා, අල්ප ශාක්‍යාදීබැවින්ද; මන්දපුඤ්ඤතා, මඳපින් ඇතිබැවින්ද; අතීතෙ, ඉකුත්කාලයෙහි; බහුජිනියො, බොහෝ ජිනීන්; පස්සිතුං, දක්නට; න සක්කොමි, නොහැක්කෙමි.

208. ආචික්ඛන්තො අහං'දානි චරිතං පුබ්බජාතියං,
සුණොථ භන්තෙ සුමනා දානම'ප්පතරං තව.

භන්තෙ, ස්වාමීනි; අහං, මම; ඉදානි, දැන්; තව, ඔබවහන්සේගේ; පුබ්බජාතියං, පූර්වජාතියෙහි; චරිතං, පැවැත්ම; අප්පතරං දානං, ඉතා ස්වල්පදානයක්; ආචික්ඛන්තො; දන්වමි; සුමනා, සතුටුසිත්ඇතිව; සුණොථ, (ඒ) ශ්‍රවණයකරණු මැනවි.

209. තව භුඤ්ජිතුමා'නීතං පුබ්බෙ සාදුරසොදනං,
නිසින්නො භොජනත්ථාය දිස්වා සොණිං සමාගතං.

පුබ්බෙ, පෙර; තව, ඔබවහන්සේට; ආනීතං, එළවනලද; සාදුරසොදනං, මිහිරිරසඅහරක්; භුඤ්ජිතුං, බුදින්ට; නිසින්නො, හුන්නේ; භොජනත්ථාය,(ඒඅහර)අනුභවයපිණිස; සමාගතං, ආවාවූ; සොණිං,සුනඛියක්; දිස්වා, දැක:-

210. තස්සා ත්වං කුපිතො රුට්ඨො දට්ඨො'ට්ඨො භීමලොචනො,
පඨමෙන හත්ථපිණ්ඩෙන පහරී තං පලාපිතුං.

ත්වං, නුඹවහන්සේ; තස්සා, ඒ සුනඛියට; කුපිතො, කිපියේ; රුට්ඨො, වෛරකෙළේ; දට්ඨොට්ඨො, ඩැහැගත් තොල්ඇත්තේ; භීමලොචනො, බියඑලවන ඇස්ඇත්තේ; පඨමෙන හත්ථපිණ්ඩෙන, පළමුබත්පිඩෙන්; තං, ඒ බැල්ලිය; පලාපිතුං, පලවන්ට; පහරි,ගැසුවේය.

211. සා තුට්ඨා පිණ්ඩලාභං ච පරිභුඤ්ජි ජිඝච්ඡිතා,
අථ ත්වං දුතියෙ පිණ්ඩෙ රසඤ්ඤුතො විච්ඡිනායි.

ජිඝච්ඡිතා, බඩසයින් පිඩිතවූ; සා, ඕතොමෝ; තුට්ඨා, තුටුවූවා; පිණ්ඩලාභං ච, ලැබූ බත්පිඩ; පරිභුඤ්ජි, අනුභවකළා; අථ, ඉක්බිති; ත්වං, නුඹවහන්සේ; දුතියෙ පිණ්ඩෙ, දෙවෙනි පිඩෙහි; රසඤ්ඤුතො, රසය දත්තේ, විච්ඡිනායි, වෙනස්ව සිතුයේය.

212. සාදුරසං මයා දින්නං සාධු සාධූ'ති භාසිය,
පසාදෙසි සකං චිත්තං එත්තකං තෙ පුරාකතං.

මයා, මාවිසින්; සාදුරසං, මිහිරිරසයක්තෙම; දින්නං, දෙනලද්දේය;. සාධු සාධුඉති, මැනව මැනවැයි; භාසිය, කියා; සකං චිත්තං, ස්වකීයසිත; පසාදෙසි, පැහැදවූයෙහිය ; තෙ, නුඹවහන්සේවිසින්; පුරාකතං, පෙරකරණලද්ද; එත්තකං, මෙපමණය;

213 සො තුවං තෙන පුඤ්ඤෙන චවිත්වා තාය ජාතියා,
ඉධ ජාතො'සි තං සබ්බං ලාභී'සි යතිනන්දන.

යතිනන්දන, තාපසවින්වහන්ස; සො ත්වං, ඒ නුඹවහන්සේ; තාය ජාතියා, ඒ ජාතියෙන්; චවිත්වා, චුතව; තෙන පුඤ්ඤකම්මෙන, ඒ පින්කමෙන්; ඉධ, මෙහි; ජාතො අසි, උපන්නෙහිය; තං සබ්බං, ඒ සියල්ල; ලාභී අසි, ලබනසුලු වෙහිය.

214. දානබ්බං සබ්බදා දානං රුඤ්ඤෙන'පි ජනෙන'ධ,
ඵලං තාදිසකං දෙති දායකානං අනූපම'න්ති.

ඉධ, මේලොකයෙහි; රුඤ්ඤෙන ජනෙන අපි, කිපියාවූද ජනයාවිසින්; සබ්බදා, හැමකල්හි; දානං දානබ්බං, දන්දියයුතුයි; දායකානං, දායකයන්ට; අනූපමං, උපමා රහිතවූ; තාදිසකං, එබඳුවූ; ඵලං දෙති, ඵලය දෙයි.

215. දානෙන සත්තා තිදිවං පයන්ති
දානේන නිබ්බාණපුරං පයන්ති,
දානං හි සබ්බත්ථ පරායන'න්ති
දානේ'ව චිත්තං රමයන්තු සන්තො.

සත්තා, සත්වයෝ; දානෙන, දීමෙන්; තිදිවං, දෙව්ලොවට; පයන්ති, පැමිණෙත්; දානෙන, ත්‍යාගයෙන්; නිබ්බාණපුරං, නිවන් පුරයට; පයන්ති, ප්‍රයානය කරත්; දානං හි, දානය වනාහි; සබ්බත්ථ, හැමතැන; පරායනංඉති; පිහිටයි (එහෙයින්); සන්තො, සත්පුරුෂයෝ, දානෙ එව, දීමෙහිම; චිත්තං, සිත; රමයන්තු, අලවත්වා.

සඞ්ඝදත්ත ස්ථවිරයන්ගේ කථාවස්තුව. 8.

——o:*:o——

216. ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමා'වහාති,
එසා'නිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී'ති.

ධම්මො, ධර්මයතෙම; ධම්මචාරිං, ධර්මචාරී පුද්ගලයා; හවෙ; එකාන්තයෙන්; රක්ඛති, රකී; සුචිණ්ණො, මනාසේ පුරුදුකරණලද්දාවූ; ධම්මො, ධර්මතෙම; සුඛං ආවහාති, සැපඑලවයි; සුචිණ්ණධම්මෙ, යහපත්සේ පුරුදුකරණලද ධර්මයෙහි; එසො ආනිසංසො, මේ ආනිසංසයයි; ධම්මචාරී, ධර්මයෙහි හැසිරෙණ පුද්ගලතෙම; දුග්ගතිං, දුගතියට; න ගච්ඡති; නොයයි.

217. යථා ඉමං තථා එතං යථා එතං තථා ඉදං,
දුග්ගන්ධො අසුචි ලොකො යථාභූතං න පස්සති.

ඉමං, මේ මල්දම; යථා, යම්සේ(දුගඳ)ද; එතං, මේ සිරුරත්; තථා එසේම(දුගඳ)ය; එතං, මේ සිරුර; යථා, යම්සේද; ඉදං, මේ මල්දමත්; තථා, එසේය; දුග්ගන්ධො, දුගඳවූ; අසුචි, අපවිත්‍රවූ; ලොකො, ලොකිය ජනතෙම; යථාභූතං, තත්වූපරිද්දෙන්; නපස්සති, නොදකී.

218. අට්ටියාමි සරීරස්මිං අස්මිං කිමිකුලාලයෙ,
කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරුච.

කිමිකුලාලයෙ, පණුකුලයන්ට ගෘහයක්වූ; අස්මිං සරීරස්මිං, මේ සිරුරකෙරෙහි; අට්ටියාමි, පිළිකුල් කරමි; කෙසා, කෙශයෝය; ලොමා, රොමයෝය; නඛා, නියය; දන්තා, දන්තයෝය; තචො, සමය; මංසං, මාංසය; නහාරු ච, නහරය:-

219. අට්ඨි ච අට්ඨිමිඤ්ජා ච වක්කම්පි හදයං'පිච,
යකනං කිලොමකං චා'පි පිහකං පප්ඵාසමෙ'වච.

අට්ඨි ච, ඇටද; අට්ඨිමිඤ්ජා ච, ඇටමිදුලුද; වක්කං අපි, වකුගඩුවද; හදයං අපි ච, හෘදයද; යකනං, අක්මාවද; කිලොමකං ච, අපි, දලබුවද; පිහකං, බඩදිවද; පප්ඵාසමෙවච, පපුවද:-

220. අන්ත'මන්තගුණං චා'ථ උදරියං ච කරීසකං,
පිත්තං සෙම්හං ච පුබ්බො ච රුධිරං ච සෙදො තථා.

අන්තං, බඩවැලද; අන්තගුණං ච, අතුණුබහනද; අථ, වැලි; උදරියං ච, උදරපටලයද; කරීසකං, මලද; පිත්තං, පිතද; සෙම්හං, සෙමද; පුබ්බො ච, පූයාද; රුධිරං ච, ලේද; තථා, එසේම; සෙදො, ඩහය:-

221. මෙද,ස්සු වසා ඛෙළං ච තථා සිඞ්ඝාණිකා'පි ච,
ලසිකා මුත්තං මත්ථලුඞ්ග'මිති කුණපා ද්විසොළස.

මෙද, මෙදතෙලය; අස්සු, කඳුලුය, වසා, චුරුණුතෙලය; ඛෙළං ච, කෙළද; තථා, එසේම; සිඞ්ඝාණිකා අපිච, සොටුද; ලසිකා, සඳමිදුලුය;

මුත්තං, මුත්‍රය; මත්ථලුඞ්ගං ඉති, හිස්මොලය යන; විසොළස, දෙසොළසක් (32); කුණපා, කුණපයෝවෙත්.

222. නතෙථ'ත්‍ථ කුණපෙ අඤ්ඤං මජ්ජිමුත්තාදිකං ධනං,
සුගන්‍ධතා තහිං නත්‍ථි සබ්බං'ව කුණපං ඉදං.

එත්‍ථ කුණපෙ; මේ කුණපයෙහි; අඤ්ඤං, සෙසු; මජ්ජිමුත්තාදිකං, මිණ්මුතු ආදීවූ; ධනං, ධනයක්; නත්‍ථි, නැත; තහිං, ඒ සිරුරෙහි; සුගන්‍ධතා, සුවඳ බවක්; නත්‍ථි, නැත; ඉදං සබ්බං, මේ සියල්ල; කුණපං එව, කුණපයක්මය.

223. අත්‍තා හො කුණපෙ ජාතො කුණපං කුණපෙ රතං,
තසිණ්හාය ච මොහස්ස ආනුභාව'මහො අහො.

හො, පින්වත්නි; අත්‍තා, තෙමේ; කුණපෙ, කුණපයෙහි; ජාතො, උපන්නේය; කුණපං, කුණපය; කුණපෙ, කුණපයෙහි; රතං, ඇළුනේය; තසිණ්හාය ච, තෘෂ්ණාවගේද; මොහස්ස, මොහයාගේද; ආනුභාවං, ආනුභාවය; අහො අහො, අහෝ ආශ්චය්‍ය්‍යිසි.

224. වායසා ච සුවානා ච සිගාලා මක්ඛිකා තථා,
සුගන්‍ධං තෙ'ව ඉච්ඡන්ති ඉච්ඡන්ති කුණපං'ව තෙ.

වායසා, කවුඩෝද: සුවානා ච, සුනඛයෝද; සිගාලා, හිවල්ලූද; තථා, එසේම; මක්ඛිකා, නිලමැස්සෝද; සුගන්‍ධං, සුවඳ; න එව ඉච්ඡන්ති; නොකැමැතිම වෙත්; තෙ, ඔව්හු; කුණපං එව, කුණපයම; ඉච්ඡන්ති, පතත්.

225. පච්චෙකං'ව පටිකකූලං චත්තිංස කුණපං ඉදං,
රමණීයන්ති මඤ්ඤන්ති බාලා මොහෙන පාරුතා.

ඉදං චත්තිංස කුණපං, මේ දෙතිස් කුණපය; පච්චෙකං එව, වෙන් වශයෙන්ම; පටිකකූලං, පිළිකුලයි; මොහෙන, මුළාව විසින්; පාරුතා, වසනලද්දවූ. බාලා, අඥනයෝ; රමණීයං ඉති, (ඒ) මනොඥයි; මඤ්ඤන්ති, හඟිත්.

226. ධීරා සම්පන්නමෙධාවී තං සභාවං විචින්තිය,
නො'පලිම්පන්ති අත්තානං නිබ්බාණාභිමුඛා සදා.

සම්පන්නමෙධාවී, සම්පූණ්ණප්‍රඥ ඇත්තාවූ; ධීරා, ධෘතිසම්පන්නාවූ, නිබ්බාණාභිමුඛා, නිවණට අභිමුඛවූවෝ; සදා, හැමකල්හි; තං සභාවං, ඒකුණප ස්වභාව; විචින්තිය, විශෙෂයෙන් සිතා; අත්තානං, සිත; න උපලිම්පන්ති, නොඇලවත්.

227. නහාත්වා සීලරහදෙ සීලගන්ධවිලෙපිනො,
සද්ධාපුප්ඵං පිළන්ධිත්වා යන්ති සන්තිපුරං ඉතො.

සීලරහදෙ, සිල් නැමැති ගැඹුරු ජලාසයෙහි; නහාත්වා, ස්නානය කර; සීලගන්ධවිලෙපිනො, සිල්ගඳ අලෙව්කළාහු; සද්ධාපුප්ඵං, සැදැ නැමැති මල්; පිළන්ධිත්වා, පැළඳ; ඉතො, මෙලොවින්; සන්තිපුරං, නිවන්පුරයට; යන්ති, යෙත්.

228 ඔකාසං වෙ ලභිස්සාමි අහං භො තව සන්තිකා,
අජ්ජෙ'ව පබ්බජිස්සාමි පබ්බජ්ජා මම රුච්චති.

භො, පින්වත; තව, තුඹවහන්සේගේ; සන්තිකා, සමීපයෙන්; අහං, මම; ඔකාසං, අවසරයක්; වෙ ලභිස්සාමි, ඉදින් ලබන්නෙම්ද; අජ්ජ එව, අදම; පබ්බජිස්සාමි, පැවිදිවන්නෙමි; පබ්බජ්ජා, ප්‍රව්‍රජ්‍යා තොමෝ; මම, මට; රුච්චති, රිසියි.

229. දෙහෙ ධනෙ ඤාතිමිත්තෙ සුහජ්ජෙ
විහාය රාගං නවයොබ්බනෙ'ව,
පඤ්ඤාය සංඛාරගතං විදිත්වා
පප්පොන්ති නිබ්බාණපුරං සපඤ්ඤා'ති.

සපඤ්ඤා, ප්‍රඥා සහිතයෝ; නවයොබ්බනෙ එව, අභිනව යෞවන කාලයෙහිම; දෙහෙ, ශරීරයෙහිද; ධනෙ, වස්තුවෙහිද; ඤාතිමිත්තෙ, නෑමිතුරන් කෙරෙහිද; සුහජ්ජෙ, සුහෘදයන් කෙරෙහිද; රාගං, ඇලීම; විහාය, හැර; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; සංඛාරගතං, සංස්කාර ධර්මයන්; විදිත්වා, දැන; නිබ්බාණපුරං, නිවන්පුරයට; පප්පොන්ති, පැමිණෙන්.

### එක්තරා කුමාරිකාවකගේ කථාවස්තුව-9-

——o:*:o——

230. සාසනෙ කුලපුත්තානං පතිට්ඨා නත්ථි යං විනා,
ආනිසංසපරිච්ඡෙදං තස්ස සීලස්ස කො වදෙ.

සාසනෙ, සස්නෙහි; කුලපුත්තානං, කුලපුත්‍රයන්ට; යං විනා, යම් ශීලයක් හැර; පතිට්ඨා නත්ථි, පිහිටක් නැත්තේද [එහෙයින්]; තස්ස සීලස්ස, ඒ ශීලයාගේ; ආනිසංසපරිච්ඡෙදං, අනුසස් පමණ; කො, කවරෙක්තෙම; වදෙ, කියන්නේද.

231. න ගඞ්ගා යමුනා චා'පි සරභූ වා සරස්සතී,
නින්නගාවා'චිරවතී මහී චා'පි මහානදී.

232. සක්කුණන්ති විසොධෙතුං තම්මලං ඉධ පාණිනං,
විසොධයන්ති සත්තානං යං වෙ සීලජලං මලං.

ගඞ්ගා, ගඞ්ගා නම් ගඟද; යමුනා ච, යමුනා නම් ගඟද; අපි, වැලි; සරභූ ච, සරභූ නම් ගඟද; සරස්සති, සරස්වති ගඟද; නින්නගා ච අචිරවතී, අචිරවතී ගඟද; මහී ච අපි, මහීනම් ගඟද යන; මහානදී, මහා ගංගාවෝ; ඉධ, මේ ලෝකයෙහි; පාණිනං, ප්‍රාණීන්ගේ; තං මලං, ඒ කෙලෙස් නැමැති මල; විසෝධෙතුං, ශුද්ධ කරන්ට; න සක්කුණන්ති, නොහැකිවෙත්; සත්තානං, සත්වයන්ගේ; යං මලං, යම් [කෙලෙස්]මලයක්; සීලජලං, සිල්නැමැති ජලයතෙම; වෙ, එකාන්තයෙන්; විසොධයති, ශුද්ධකරයිද; [ඒ මලයයි]

233. න තං සජලදා වාතා න චා'පි හරිචන්දනං,
නෙ'ව හාරා න මණයො න චන්දකිරණඞ්කුරා.

234. සමයන්තී'ධ සත්තානං පරිළාහං සුරක්ඛිතං,
යං සමෙති ඉදං අරියං සීලං අච්චන්තසීතලං.

සුරක්ඛිතං, මනාකොට රක්‍ෂාකරණලද; අරියං, උතුම්වූ; අච්චන්තසීතලං, අත්‍යන්තයෙන් සිහිල්වූ; ඉදං සීලං, මේ සීලයතෙමේ; ඉධ, මේ ලෝකයෙහි; සත්තානං, සත්වයන්ගේ; යං පරිළාහං, යම් හාත්පස දැවිල්ලක්; සමෙති, සංසිඳුවාද; තං, ඒ දැහය; සජලදා වාතා, මෙඝසහිත වාතයෝද; න සමයන්ති, නොසංසිඳුවත්; හරිචන්දනං, රත්චන් සඳුනද; න ච, නොම සංසිඳුවයි; හාරා අපි, මුත්හරයෝද; නෙව සමයන්ති, නොම සංසිඳුවත්; මණයො, මිණිරුවන්හුද; න සමයන්ති, නොසංසිඳුවත්; චන්දකිරණඞ්කුරා, සඳරැස්හුද; න සමයන්ති, නොසංසිඳුවත්.

235. සීලගන්ධසමො ගන්ධො කුතො නාම භවිස්සති,
යො සමං අනුවාතෙ ච පටිවාතෙ ච වායති,

සො, යම් සීලසුගන්ධයක්, සමං, සමව; අනුවාතෙ ච, යටසුළඟවද; පටිවාතෙ ච, උඩුසුළඟවද; වායති, හමාද; සීලගන්ධසමො ගන්ධො, ඒසිල්සුවඳ හා සමවූ සුවඳක්; කුතො නාම භවිස්සති, කොහි නම් වේද;

236. සග්ගාරොහණසොපානං අඤ්ඤං සීලසමං කුතො,
ද්වාරං වා පන නිබ්බාණනගරස්ස පවෙසනෙ.

සග්ගාරොහණ, දෙව්ලොවට නැඟීමට; සොපානං, හිණක්වූ; සීලසමං, ශීලය හාසමවූ; අඤ්ඤං, අනික් හිණෙක්; කුතො, කොයින්ද; නිබ්බාණනගරස්ස, නිවන්නැමැති පුරයට; පවෙසනෙ, ප්‍රවිෂ්ටවීමෙහි; සීලසමං අඤ්ඤං ද්වාරං වා පන කුතො, ශීලය සමවූ අනික් දොරක් හෝ කොයින්ද?

237. සොභන්තෙ'වං න රාජානො මුත්තාමණිවිභූසිතා,
යථා සොභන්ති යතිනො සීලභූසණභූසිතා.

සීලභූසණභූසිතා, සිල්නැමැතිඅබරණින් අලඞ්කෘතවූ; යතිනො, තපස්වීහු; යථා සොභන්ති, යම්සේ හොබිද්ද; එවං, එසේ; මුත්තාමණිවිභූසිතා, මුතුමිණියෙන් අලඞ්කෘතවූ, රාජානො, රජදරුවෝ; න සොභන්ති, නොහොබිත්.

238. අත්තානුවාදාදිභයං සුද්ධසීලස්ස භික්ඛුනො,
අන්ධකාරං විය රවිං හදයං නා'වගාහති.

අන්ධකාරං, අන්ධකාරයතෙම; රවිං විය, හිරුකිරණ බැසනොගන්නාක්මෙන්; සුද්ධසීලස්ස, පිරිසිදුසිල්ඇත්තාවූ; භික්ඛුනො, මහණහුගේ; හදයං, සිතට; අත්තානුවාදාදිභයං; තමන්ම තමාට නින්දාකිරීමෙන් උපදනා බිය; න අවගාහති, බැසනොගණී.

239 සීලසම්පත්තියා භික්ඛු සොභමානො තපොවනෙ,
පභාසම්පත්තියා චන්දො ගගනෙ විය සොභති.

ගගනෙ, අහසෙහි; පභාසම්පත්තියා, ප්‍රභාසම්පත්තියෙන්; සොභමානො, හොබනාවූ; චන්දො විය, සඳමෙන්; තපොවනෙ, තපස්වෙනෙහි; සීලසම්පත්තියා, ශීලසම්පත්තියෙන්; භික්ඛු, මහණතෙම; සොභති, හොබනේ වෙයි.

240. කායගන්ධො'පි පාමොජ්ජං සීලවන්තස්ස භික්ඛුනො,
කරොති අපි දෙවානං සීලගන්ධෙ කථා'ව කා.

සීලවන්තස්ස භික්ඛුනො, සිල්වත් මහණහුගේ; කායගන්ධො අපි, ශරීර ගන්ධයද; දෙවානං, දෙවියන්ට; පාමොජ්ජං, ප්‍රමොද්‍යය; කරොති, කරයි; අපි, වැලි; සීලගන්ධෙ, සිල් සුවඳෙහි; කා එව කථා, කවරනම් කථාවක්ද?

241. සබ්බෙසං ගන්ධජාතානං සම්පත්තිං අභිභුය්‍යති,
ආවිසනී දසදිසා සීලගන්ධො පවායති.

සීලගන්ධො, ශීලගන්ධයතෙම; සබ්බෙසං, සියලු; ගන්ධජාතානං, ගන්ධවර්ගයන්ගේ; සම්පත්තිං, සම්පත්තිය; අභිභුය්‍යති, මැඩපවතියි; දසදිසා, දසදිසාවට; ආවිසති, පැමිණෙයි; පවායති, ප්‍රකෘතියෙන් හමයි.

242. අප්පකා'පි කතා කාරා සීලවන්තෙ මහප්ඵලා,
හොන්ති'ති සීලවා හොති පූජාසක්කාරභාජනො.

සීලවන්තෙ, සිල්වත්හු කෙරෙහි; කතා, කරණලද; අප්පකා අපි, සවල්පවූද; කාරා, උපකාරයෝ; මහප්ඵලා හොන්ති, මහත්ඵලවෙත්;

ඉති, මෙසේ; සීලවා, සිල්වත්තෙම; පූජාසක්කාරභාජනො හොති, පූජාසත්කාරයට බඳුනක් වෙයි.

243. සීලවන්තං න බාධෙන්ති ආසවා දිට්ඨධම්මිකා,
සම්පරායිකදුක්ඛානං මූලං ඛණෙති සීලවා.

දිට්ඨධම්මිකා, ඉහාත්මභාවයෙහි ඇතිවන්නාවූ; ආසවා, ආශ්‍රවයෝ; සීලවන්තං, සිල්වතා; න බාධෙන්ති, නොපෙළත්; සීලවා, සිල්වත්තෙම; සම්පරායිකදුක්ඛානං, පරලොව ඇතිවන දුක්ඛයන්ගේ; මූලං, මූල (හෙතුව); ඛණති, සාරා ලයි.

244. යා මනුස්සෙසු සම්පත්ති යා තිදෙවෙසු සම්පදා,
න සා සම්පන්නසීලස්ස ඉච්ඡිතා හොති දුල්ලභා.

මනුස්සෙසු, මිනිසුන් විෂයෙහි; යා සම්පත්ති, යම් සම්පත්තියක් වේද; තිදෙවෙසු; දෙවියන් විෂයෙහිද; යා සම්පදා, යම් සම්පත්තිය කුත් වේද; සම්පන්නසීලස්ස, සම්පූර්ණ සිල් ඇත්තාහට; ඉච්ඡිතා, අභිමතවූ; සා, ඒ සම්පත් තෙමේ; දුල්ලභා න හොති, දුලබ නොවේ.

245. අච්චන්තසන්තා පන යා අයං නිබ්බාණසම්පදා,
සම්පන්නසීලස්ස මනො තමෙ'ව අනුධාවති.

අච්චන්තසන්තා, අතිශය ශාන්තවූ; යා අයං නිබ්බාණසම්පදා පන, යම් මේ නිර්වාණ සම්පත්තියක් වේද; සම්පන්නසීලස්ස, සම්පූර්ණ සිල්ඇත්තාහුගේ; මනො, සිත; තං එව, ඒ නිවන්සැපතම කරා; අනුධාවති, අනුධාවන කෙරේ.

246. තිධාපපභින්නා මදවාරණා'පි දිස්වාන සීලං පණිපාතයන්ති,
පාලෙථ හොන්තා සකජීවිතං'ව සීලං තිලොකෙහි නමස්සනීයං.

තිධාපපභින්නා, තුන්තැනකින් බිඳුනාවූ (ත්‍රිමදගලිතවූ); මදවාරණාපි, මත්තහස්තිහු පවා; සීලං, සීලවන්තයා; දිස්වාන, දැක; පණිපාතයන්ති, නමදිත්; හොන්තා, පින්වත්නි; තිලොකෙහි, තුන්ලෝවාසීන් විසින්; නමස්සනීයං, නමස්කාර කටයුතුවූ; සීලං, සිලය; සකජීවිතං ඉව, ස්වකීය ජීවිතයමෙන්; පාලෙථ, රකිව්.

තිස්සමහානාගස්ථවිර වස්තුව—10—

———:———

**චූලගල්ලවග්ගො දසමො.**

——+——

1. පුච්ඡාමි ථෙරං කතකිච්චං පහීනභවබන්ධනං,
කිම'ත්ථං පස්සමානො ත්වං තස්සා'කාසි අනුග්ගහං.

කතකිච්චං, (සිව්මගින්) කරණලද කටයුතු ඇති; පහීනභවබන්ධනං, නසනලද සසරබැඳුම් ඇති; ථෙරං, සථවිරයන්; පුච්ඡාමි, විචාරමි; ත්වං, නුඹවහන්සේ; කිමත්ථං, කුමන අර්ථයක්; පස්සමානො, දක්නේ; තස්සා, ඇට; අනුග්ගහං අකාසි, අනුග්‍රහ කෙළෙහිද ?.

2. කිමා'යතිං ඵලං එසා යාගුදානෙන වින්දති,
තමෙම ධීර වියාචික්ඛ සොතුම්'ච්ඡාමි තං ඵලං.

එසා, මේ තොමෝ; යාගුදානෙන, හුලුකැන් දීමෙන්; ආයතිං, මත්තෙහි; කිං ඵලං, කුමන ඵලයක්; වින්දති, විඳින්නිද; ධීර, ධීරයන් වහන්ස; තං, එය; මෙ, මට; වියාචික්ඛ, දක්වනු මැනවි; තං ඵලං, ඒ ඵලය; සොතුං, අසන්ට; ඉච්ඡාමි, කැමැත්තෙමි

3. යා සා අදාසි මෙ අජ්ජ පරිත්තං යාගුමත්තකං,
තෙන සා පුඤ්ඤකම්මෙන දෙවලොකෙ රමිස්සති.

යා සා, යම් ඒ මැහැල්ලියක් තොමෝ; මෙ, මට; අජ්ජ, අද; පරිත්තං, ස්වල්පවූ; යාගුමත්තකං, හුලුකැන් මාත්‍රයක්; අදාසි, දුන්නාද; සා, ඕ තොමෝ; තෙන පුඤ්ඤකම්මෙන, ඒ පින්කමෙන්; දෙවලොකෙ, දිව්‍යලොකයෙහි; රමිස්සති, අභිරමනය කරන්නේය.

4. තත්ථ නච්චෙහි ගීතෙහි දිබ්බෙහි වාදිතෙහි ච,
පමොදති මහාභොගා මහාසුඛ සමඞ්ගිනී.

තත්ථ, එහි; මහාභොගා, මහත් භොගසම්පත් ඇත්තී; මහාසුඛසමඞ්ගිනී, මහත් සැපයෙන් යුක්තවූවා; දිබ්බෙහි, දිව්‍යමයවූ; නච්චෙහි, නෘත්‍යයන්ගෙන්ද; ගීතෙහි, ගීතිකාවන්ගෙන්ද; වාදිතෙහි ච, වාද්‍යයන්ගෙන්ද; පමොදති, සතුටු වෙයි.

5. යා මනුස්සෙසු සම්පත්ති යා ච දෙවෙසු සම්පදා,
එතෙන පුඤ්ඤකම්මෙන ලච්ඡතෙ සා අනාගතෙ.

සා, ඕතොමෝ; එතෙන පුඤ්ඤකම්මෙන, ඒ පින්කමෙන්; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; යා සම්පත්ති, යම් සැපයක් ඇද්ද; දෙවෙසු, දිව්‍යලොකයන්හි; යාච සම්පදා, යම් සැපතකුත් ඇද්ද (ඒ සියල්ල); අනාගතෙ, මතු කාලයෙහි; ලච්ඡතෙ, ලබන්නේය.

6. එතෙනෙ'ව නියාමෙන සංසරන්තී භවාභවෙ,
සම්පුණ්ණසඞ්කප්පානී සම්පත්තිම'නුභොස්සති.

එතෙනෙව නියාමෙන, මේ නියමයෙන්ම; භවාභවෙ, ජාතියෙන් ජාතියෙහි; සංසරන්තී, හැසිරෙන්නී; සම්පුණ්ණසඞ්කප්පානි, පිරුණු කප් සැටක්; සම්පත්තිං, සැපත; අනුභොස්සති, බුදින්නීය.

7. අසාරසාරාදිකමෙන භූමිසු
නිවුත්තබීජෙ කමතො මහප්ඵලං,
එවම්පි දානස්ස ච ඛෙත්තසම්පදා
ලභන්ති දානා භවභොග සම්පදං

භූමිසු, භූමීන්හි; අසාරසාරාදිකමෙන, නිසරුසරු ආදී ක්‍රමයෙන්; නිවුත්තබීජෙ, වපුරණලද බිජුවටෙහි; මහප්ඵලං, (අල්ප ඵලහා) මහත්ඵල; කමතො, ක්‍රමයෙන්; ලභන්ති, ලබත්; එවං අපි, එසේම; දානස්ස ච, දානය සම්බන්ධවූද; ඛෙත්තසම්පදා, ක්ෂෙත්‍ර සම්පත්ති ක්‍රමයෙන්; දානා, දන්දීම හෙතුකොටගෙණ; භවභොග සම්පදං, භව භොග සම්පත්තිය; ලභන්ති, [දායකයෝ] ලබත්.

## මැහැල්ලියගේ කථාවස්තුව—1—

---

8. භවෙසු සබ්බෙසු සදා අසෙසතො
අසාරකං පුඤ්ඤඵලං අසස්සතං,
තරඞ්ගදෙලානිලවිජ්ජුචංචලං
පිහෙය්‍ය කො තම්පි නරො විචක්ඛණො.

සබ්බෙසු භවෙසු, සියලු භවයන්හි; පුඤ්ඤඵලං, පුණ්‍යඵලයතෙම; සදා, හැමකල්හි; අසෙසතො, නිරවශෙෂයෙන්; අසාරකං, සාරයක් නැත්තේය; අසස්සතං, අශාශ්වතයි; තරඞ්ගදෙලානිලවිජ්ජුචචලං, රළ හෝවිල් පවන් විදුලිමෙන් චංචලවූ; තං අපි, ඒ පින්පල (භව සම්පත්)ද; විචක්ඛණො, නුවණැත්තාවූ; කො නරො, කවර මිනිසෙක් තෙම; පිහෙය්‍ය, පතන්නේද?

9. භවග්ගපත්තා'පි පජා අරූපිනො
ආයුක්ඛයෙනෙත සමුපෙන්ති දුග්ගතිං,
සයම්පභා බ්‍රහ්මගණා මහිද්ධිකා
ඛජ්ජොතභූතා විචරන්ති එකදා.

භවග්ගපත්තා, භවාග්‍රයට පැමිණියාවූ; අරූපිනො පජා අපි, අරූපි බ්‍රහ්මයෝද. ආයුක්ඛයෙනත, ආයුඃක්ෂයාවසානයෙහි; දුග්ගතිං, දුගතියට; සමුපෙන්ති, පැමිණෙන්; සයංපභා, ස්වයම්ප්‍රභා ඇති; මහිද්ධිකා, මහත් සෘද්ධි ඇත්තාවූ; බ්‍රහ්මගණා, බ්‍රහ්ම සමූහයෝද; එකදා, ඇතම් කලෙක; ඛජ්ජොතභූතා, කණමැදිරියෝව; විචරන්ති, හැසිරෙත්.

10. දෙවිඤ්ඤභූතා තිදිවෙ මහායසා
උපෙන්ති චණ්ඩාලගතිං ජිගුච්ඡිතං,
අලඞ්කතා දෙවගණා සුඛෙධිතා
භවන්ති පෙතෙසු පුනො බුභුක්ඛිතා.

තිදිවෙ, දෙව්ලොවෙහි; මහායසා, මහත් යශස් ඇත්තාවූ; දෙවින්ද පූතා, දෙවෙන්ද්‍රවූවෝද; ජිගුච්ඡිතං, ගර්හිතවූ; චණ්ඩාලගතිං, සැඬොල් ගතියට; උපෙනති, පැමිණෙත්; අලඞ්කතා, අලඞ්කෘතවූ; සුඛෙධිතා, සැපයෙන් සමෘද්ධවූ; දෙවගණා, දිව්‍යසමූහයෝද; පුනො, වැලි; පෙතෙසු, ප්‍රෙතනිකායන්හි; බුභුක්ඛිතා, බඩසයින් පෙලුනාහු; භවන්ති, වෙත්.

11. සුඵුල්ලිතෙ නන්දනකානනෙ රතා
චරන්ති භූයො අසිපත්තකානනෙ,
විමානසෙට්ඨෙසු චිරං පමොදිතා
භවන්ති පච්ඡා නිරයෙ ජලන්තරෙ.

සුඵුල්ලිතෙ, සුතපුල්ලවූ; නන්දනකානනෙ, නඳුන් උයනෙහි; රතා, ඇලුනාහු; භූයො, නැවත; අසිපත්තකානනෙ, අසිපත්වෙනෙහි; චරන්ති, හැසිරෙත්; විමානසෙට්ඨෙසු, උතුම් විමන්හි; චිරං, බෝකලක්; පමොදිතා, සතුටුවූවාහු; පච්ඡා, පසුව; නිරයෙ, නරකයෙහි; ජලන්තරෙ, දිලිසෙන ගිනි අතරෙහි; භවන්ති, වෙත්.

12 භුත්වා සුධන්න'මපි පුරෙ සුරාලයෙ
ගිලන්ති සම්පජ්ජලිතං අයොගුලං,
පීත්වා සුචිං සීතසුගන්ධපානියං
පිවන්ති තෙ ලොහජලං සුභිංසනං.

තෙ, ඔව්හු; පුරෙ, පෙර; සුරාලයෙ, දෙව්ලොවෙහි; සුධන්නං, දිව බොජුන; භුත්වා, වළඳ; අපි, වැලිදු; සම්පජ්ජලිතං, සම්ප්‍රජ්වලිතවූ; අයොගුලං, ලොහොගුලි; ගිලන්ති, ගලිත්; සුචිං, පිරිසිදුවූ; සීත සුගන්ධපානියං, සිහිල්සුවඳපැන්; පීත්වා, පානයකොට; සුභිංසනං, අතිශයින් බිහිසුනුවූ; ලොහජලං, ලොහොදිය; පිවන්ති, පානය කරත්.

13 සුඛං සයිත්වා සයනෙ අලඞ්කතෙ
සයන්ති දිත්තෙ අයභූතලෙ පජා,
නිසෙවිතා අච්ඡරදෙහජං සුඛං
පුනො'පගුහන්ති ච කොට්සිම්බලිං.

පජා, ප්‍රජාවෝ; අලඞ්කතෙ, අලඞ්කෘතවූ; සයනෙ, ශය්‍යායෙහි; සුඛං, සැපසේ; සයිත්වා, සයනයකොට; දිත්තෙ, ගින්නෙන්දිලිසුනාවූ; අයභූතලෙ, යපොළොවෙහි; සයන්ති, හොවිත්; අච්ඡරදෙහජං, අප්සරාදෙහයපශීයෙන් උපන්නාවූ; සුඛං, සැපය; නිසෙවිතා, සෙවුනාහු; පුන, නැවත; කොට්සිම්බලිං ච, කොළඉඹුල්වනයද; උප ගුහන්ති, වැළඳගණිත්.

14 ආකාසගඞ්ගොදකසෙවිතා පුරෙ
පතන්ති තෙ වෙතරණිං මහානදිං,
දිබ්බං සුභං පොක්ඛරණිං නිසෙවිතා
තෙ ලොහකුම්භිම්හි පතන්ති එකදා.

පුරෙ, පූර්වයෙහි; ආකාසගඞ්ගොදකසෙවිතා, අහස්ගඟදියසෙවුනාවූ; තෙ, ඔව්හු; වෙතරණිං මහානදිං, වෙතරණිනම් මහනඟට; පතන්ති, වැටෙත්. සුභං, සැපසේ; දිබ්බං පොක්ඛරණිං, දිව්‍ය පුෂ්කරණීන්; නිසෙවිතා, සෙවූනාවූ; තෙ, ඔව්හු; එකදා, ඇතම් කලෙක; ලොහකුම්භිම්හි, ලොහොකුඹුනිරයෙහි; පතන්ති, වැටෙත්.

15 පුරෙ චරිත්වා හරිමෙරුමත්ථකෙ
චරන්ති අඞ්ගාරනගස්සමත්ථකෙ,
සුභං නිසින්නා සිලපණ්ඩුකම්බලෙ
සූලෙසු අච්ඡන්ති චිරං පදීපිතා·

පුරෙ, පූර්වයෙහි; හරිමෙරුමත්ථකෙ, රන්මෙරමුදුනෙහි; චරිත්වා, හැසිර; අඞ්ගාරනගස්ස, ගිනිඅඟුරුපර්වතයාගේ; මත්ථකෙ, මුදුනෙහි; චරන්ති, හැසිරෙත්; සිලපණ්ඩුකම්බලෙ, පාණ්ඩුකම්බලශෛලාසනයෙහි; චිරං, බෝකලක්; සුභං, සුවසේ; නිසින්නා, හුන්නාහු; පදීපිතා, ප්‍රදීප්තව; සූලෙසු අච්ඡන්ති, උලහිඳිත්.

16 පුරෙ ඨිතා හෙමරථෙ සුරාලයෙ
වහන්ති ආදිත්තරථෙ යමාලයෙ,
ගජුත්තමෙරාවණඛන්ධවාහිතා
වහන්ති ඛන්ධෙන පරම්පි එකදා.

පුරෙ, පෙර; සුරාලයෙ, දෙව්ලොවෙහි; හෙමරථෙ, රන්මුවාරියෙහි; ඨිතා, සිටියාහු; එකදා, සමහරකලක; යමාලයෙ, නිරයෙහි; ආදිත්තරථෙ, ගිනිගෙණදිලිසෙන රිය; වහන්ති, උසුලත්; ගජුත්තමෙරාවණඛන්ධවාහිතා, හස්තිශ්‍රෙෂ්ඨඓරාවණයාගේ කඳින් උසුලනලද්දාහු; ඛන්ධෙන, සියකඳින්; පරං අපි, සෙස්සාද; වහන්ති, උසුලත්.

17 නරාධිපා කෙවලචක්කවත්තිනො
භවන්ති දාසා පුන පුඤ්ඤසඞ්ඛයෙ,
ධනෙන මන්ධාතු සමා'පි එකදා
කපාලහත්ථා විචරන්ති නිධනා.

නරාධිපා, නරශ්‍රෙෂ්ඨවූ; කෙවලචක්කවත්තිනො, හුදකලා සක්විත්තෝ පවා; පුඤ්ඤසඞ්ඛයෙ, පින් ගෙවුනුකල්හි; පුන, නැවත; දාසා භවන්ති, දස්හු වෙත්; ධනෙන, වස්තුවෙන්; මන්ධාතුසමා අපි, මන්ධාතුරජසමවූවෝද; එකදා, ඇතැම්කලක; නිධනා, වස්තු නැත්තාහු; කපාලහත්ථා, කබල්ගත්අත්ඇත්තෝව; විචරන්ති, හැසිරෙත්.

18 බහුස්සුතා වජිරසමානබුද්ධිනො
භවන්ති එළා කුජලා කුබුද්ධිනො,
විචිත්තවාක්‍යා කපිකා භවන්ති තෙ
මූගා පුනො භඤ්ජවිකාරචොදකා.

බහුස්සුතා, බොහෝ ඇසූපිරූතැන්ඇත්තාවූ; වජිරසමානබුද්ධිනො, විදුරුසමාන නුවනැත්තාහු; පුනො, යලි; කුබුද්ධිනො, නුවන නැත්තාවූ; කුජලා, කුත්සිතජඩවූ; එළා භවන්ති, කෙලතොල්ලෝ වෙත්; විචිත්තවාක්‍යා, විසිතුරු වාක්‍යඇති; කපිකා, කථාවෙහි දක්ෂවූ; තෙ, ඔව්හු; පුනො, නැවත; භඤ්ජවිකාරචොදකා, අන්විකාරයෙන් අඟවන්නාවූ; මූගා භවන්ති, ගොළුවෝ වෙත්.

19 එතෙසු නිබ්බින්නමනො භවෙසු
නිරත්ථකං සබ්බභව'න්ති ඤත්වා,
භවෙසු ඡන්දං පජහිත්ව ධීරො
නිබ්බාණමෙ'වා'භිමුඛො භවෙය්‍ය.

එතෙසු භවෙසු, මේ (කාමරූපාරූප) භවයන්හි; නිබ්බින්නමනො, කලකිරුණු සිත්ඇත්තාවූ; ධීරො, ප්‍රාඥතෙම; සබ්බභවං, සියලු භවය; නිරත්ථකං ඉති ඤත්වා, අර්ථරහිතයයි දැන; භවෙසු, භවයන්හි; ඡන්දං, ආලය; පජහිත්ව, දුරලා; නිබ්බාණං එව, නිවණම; අභිමුඛො, පතන්නෙක්; භවෙය්‍ය, වන්නේය.

20 සාරාසාරවිවෙකභාවරහිතා පක්ඛී'පි කිඤ්චාවිදූ
සුත්වා වග්ගුලියො රවං'ව යතිනො පාළිං හි සජ්ඣායතො,
වින්දන්තා මහතිං සිරිං ඨිතිහරං කාමග්ගියං තප්ඵලා
සම්පත්තා ජිනසෙවිතං සිවපදං තුම්හාදිසා කා කථා.

සාරාසාරවිවෙකභාවරහිතා, සරුනිසරු වෙන්කිරීමෙහි ශක්ති නැත්තාවූ; කිඤ්චාවිදූ, කිසිවක් නොදන්නාවූ; වග්ගුලියො පක්ඛීඅපි, වවුල්පක්ෂීහු පවා; පාළිං හි, දෙශනාපෙළපමණක්ම; සජ්ඣායතො, හදාරන්නාවූ; යතිනො, යතිහුගේ; රවං එව, ශබ්දයම; සුත්වා, අසා; කාමග්ගියං, දෙව්ලෝසැපතින් අගතැන්පත්වූ; ඨිතිහරං, ඨිතිහරණාවූ; මහතිං සිරිං, මහත්සම්පත්තිය; වින්දන්තා, විඳිනාහු; ජිනසෙවිතං, බුදුන්විසින් සෙවුනාලද්දවූ; සිවපදං, නිවන්පදයට; සම්පත්තා, පැමිණියාහුය; තුම්හාදිසා, තොප බඳුවූවෝ; කාකථා,(එසේ සැපතට පැමිණෙන්ය යනු) කියනුම කවරේද?

**පන්සියයක් භික්ෂූන්ගේ කථාවස්තුව —2—**

——o:*:o——

* 1 සමත්තා'නන්තරයෙන යත්ථා'යං රසවාහිනී,
තත්ථ සිජ්ඣන්තු සඞ්කප්පා ජනානං සාධුසම්මතා.

අයං රසවාහිනී, මේ රසවාහිනිය; අනන්තරයෙන, උවදුරු නොමැතිව; යථා සමත්තා, යම්සේ සමාප්තාවීද; තථා, එසේ; ජනානං, සත්වයන්ගේ; සාධුසම්මතා, යහපතැයි සම්මතවූ; සඞ්කප්පා, කල්පයෝ; සිජ්ඣන්තු, සිදුවෙත්වා.

2 ධම්මාමතරසං ලොකෙ වහන්තී රසවාහිනී,
පඤ්චවස්සසහස්සානි පවත්තන්තු අනින්දිතා.

රසවාහිනී, රසවාහිනීතොමෝ; ලොකෙ, ලෙව්හි; ධම්මාමතරසං, දහම් අමාරසය; වහන්ති, වහනයකරමින්; අනින්දිතා, පසස්නා ලදුව; පඤ්චවස්සසහස්සානි, පන්දහසක්හවුරුදු; පවත්තන්තු, පවතීවා.

3 චත්තිංසභාණවාරෙහි නිට්ඨිතා රසවාහිනී,
කරොතු සබ්බසත්තානං ඉච්ඡිතං සබ්බදා සුභං.

චත්තිංසභාණවාරෙහි, දෙතිස්බණවරකින්; නිට්ඨිතා, නිමකරණලද්දවූ; රසවාහිනී, රසවාහිනීතොමෝ; සබ්බදා, හැමකලැ; සබ්බසත්තානං, හැමසතුන්ගේ; සුභං, සොභනවූ; ඉච්ඡිතං, අභිමතය; කරොතු, කෙරේවා.

4. කාලිඞ්ගව්හමහාථෙරො යස්සො'පජ්ඣායතං ගතො,
මඞ්ගලව්හො මහාථෙරො ඛණ්ඩසීමාපතී යතී,
යස්ස ආචරියො ආසි සබ්බසත්ථවිසාරදො.

කාලිඞ්ගව්හමහාථෙරො, කලිඟුනම් මහතෙරතෙම; යස්ස, යම් මහණක්හට; උපජ්ඣායතං, උපාධ්‍යායබවට; ගතො, පැමිණියේද; සබ්බසත්ථවිසාරදො, සියලු ශාස්ත්‍රයෙහි විසාරදවූ; ඛණ්ඩසීමාපතී, ඛණ්ඩසීමානම් වෙහෙරහිමිවූ; මඞ්ගලව්හො මහාථෙරො යති, මඞ්ගලනම් මහතෙර යතිඳුතෙම; යස්ස, යම් මහණක්හට; ආචරියො ආසි, ඇදුරුවීද.

5 අරඤ්ඤායතනානන්ද මහාථෙරො මහාගණී,
ගරුත්තමා'ගතො යස්ස සත්ථසාගරපාරගූ.

සත්ථසාගරපාරගූ, සත්සයුරුපරතෙරගියාවූ; මහාගණී, මහගණහිමිවූ; අරඤ්ඤායතනානන්දමහාථෙරො, අරන්වෙහෙරවැසි අනඳ මහතෙරතෙම; යස්ස, යම් අතවැසියක්හුගේ; ගරුත්තං ආගතො, ගුරුබවට පැමිණියේද.

---

* දන්නකුටුම්බිකවස්තුවෙහි ගාථාර්ථවිවරණය, ගෝලඋපාසකවස්තුවෙන් දතයුතු

6 යො විප්පගාමවංසෙකකෙතුභූතො තිසීහලෙ,
යො'කා සීහලභාසාය සීහලං සද්දලක්ඛණං.

යො, යමෙක්තෙම; තිසීහලෙ,[රුහුණු මායා පිහිටි] ත්‍රිසිංහලයෙහි; විප්පගාමවංස, බමුණුගම් කුලයට; එකකෙතුභූතො, අවිතිය කෙතුමෙන් වූයේද; යො, යමෙක්තෙම; සීහලභාසාය, හෙළුබසින්; සීහලං සද්දලක්ඛණං, සිහලසද්දලකුණක් (සිදත්සඟරාව); අකා, කෙළේද.

7 යො ච සමන්තකූටස්ස වණ්ණනං වණ්ණයී සුභං,
තෙන වෙදෙහථෙරෙන කතා'යං රසවාහිනී.

යො ච, යමෙක්තෙමේත්; සමන්තකූටස්ස, සමන්කුළුහුගේ; සුභං වණ්ණනං, සොභන වණ්නාවක් (සමන්තකූටවණ්නාව); වණ්ණයී, කෙළේද; තෙන වෙදෙහථෙරෙන, ඒ වෙදෙහතෙර(නම් මා) විසින්; අයං රසවාහිනී, මේ රසවාහිනීතොමෝ; කතා, කරණලද්දීය;

8 යං පුඤ්ඤං පසුතං හොති ථොමෙන්තෙන ජිනං මයා,
තෙන පුඤ්ඤෙන ලොකො'යං සුඛී හොතු අවෙරිකො.

ජිනං, (මස්මරුන්දිනුයෙන් ජින නම්වූ) බුදුන්ට; ථොමෙන්තෙන, ස්තුතිකරන්නාවූ; මයා, මාවිසින්; යං පුඤ්ඤං, යම් පිණක්; පසුතං, රැස්කරණලදද; තෙන පුඤ්ඤෙන, ඒ පිණෙන්; අයං ලොකො, ඉහලෙව්වැසිතෙම; අවෙරිකො, වෛරනැතිවූයේ; සුඛී හොතු, සැප ඇත්තේවේවා.

9 පාලෙන්තු දෙවතා ලොකං සම්මා දෙවො පවස්සතු,
පාලයන්තු මහිපාලා ධම්මෙන සකලං පජං.

දෙවතා, දෙවියෝ; ලොකං, ලොකය; පාලෙන්තු, රකිත්වා; දෙවො, මෙඝයතෙම; සම්මා, මොනවට, පවස්සතු, වසීවා; මහිපාලා, මිහිපල්හු; ධම්මෙන,(දසරජ)දහැමින්; සකලං පජං, හැම සත්වයා; පාලයන්තු, පාලනය කරත්වා.

10 පචවස්සසහස්සානි දිප්පන්තු ජිනසාසනං,
වත්ථුත්තයස්ස මෙ නිච්චං ජයන්තු ජයමඞ්ගලං.

ජිනසාසනං, බුදුසසුන්; පචවස්සසහස්සානි, පන්දහසක් හවුරුදු; දිප්පන්තු, දිලේවා; වත්ථුත්තයස්ස,රතනත්‍රයට; ජයො අත්‍ථු, ජය වේවා; මෙ, මට; නිච්චං, නිතර; ජයමඞ්ගලං, ජයමඟුල් වේවා.

—:+:—

නිමි

# ලක්දිව කථාවස්තූන්ගේ
# පටුන.

පිට.


2. මිගපොතක වස්තුව.
4. ධම්මසුත උපාසිකා වස්තුව.
6. කුඩ්ඩරජ්ජවාසිථෙර වස්තු:
8. ආරණ්‍යකමහාභයස්ථවිර ව:
10. සිරිනාග වස්තුව.
11. සඞ්ඝතිස්ස අමාත්‍යයාගේ ව:
16. සමණගාම වස්තුව.
18. අභයස්ථවිර වස්තුව.
22. නාග වස්තුව.
23. චූල්ලපබ්බත වස්තුව.

**මිගපොතකවග්ගො පඨමො.**

25. උත්තරෙලිය වස්තුව.
28. තම්බසුමනස්ථවිර වස්තුව.
32. පූවපබ්බතතිස්සස්ථවිරවස්තු:
34. චූලතිස්ස වස්තුව.
36. තිස්සාය වස්තුව
42. අරියගාලතිස්ස වස්තුව.
43. ගාමදරිකා වස්තුව.
45. ධම්මාය වස්තුව.
50. කිම්සඞ්ඛාවස්තුව.
52. සඞ්ඝාසුමනා වස්තුව.

**උත්තරෙලියවග්ගො ඡට්ඨො.**

53. කාක වස්තුව.
59. කාකවණ්ණතිස්ස වස්තුව.
74. දුට්ඨගාමණීඅභයමහාරජ ව:
76. නන්දිමිත්‍ර වස්තුව.
83. සුරනිම්මල වස්තුව.
84. මහාසොන වස්තුව.
90. ගොඨඉම්බර වස්තුව.
93. ථෙරපුත්තාභය වස්තුව.
94. භරණ වස්තුව.
96. වෙළුසුමන වස්තුව.

**සොධවග්ගො සත්තමො.**

97. ඛඤ්ජදෙව වස්තුව.
99. ඵුස්සදෙව වස්තුව.

පිට.

102. ලභියවසභ වස්තුව.
111. දඨාසෙන වස්තුව.
113. මහානෙල වස්තුව.
121. සාලිරජ කුමාර වස්තුව.
123. චූලනාගස්ථවිර වස්තුව.
128. මෙඝවණ්ණ වස්තුව.
131. ධම්මදින්නථෙර වස්තුව.
132. රට්ඨිකපුත්‍ර වස්තුව.

**දුතියසොධවග්ගො අට්ඨමො.**

134. සිලුත්ත වස්තුව.
142. නෙසාද වස්තුව.
145. හෙමා වස්තුව.
147. කානසිගාල වස්තුව.
154. නන්දිවාණිජ වස්තුව.
155. නකුල වස්තුව.
158. අම්බාමාත්‍ය වස්තුව.
160. වානර වස්තුව.
165. ජයම්පතිකා වස්තුව.
167. දෙවපුත්ත වස්තුව.

**සිලුත්තවග්ගො නවමො.**

186. චූලගල්ල වස්තුව.
189. පණ්ඩරඞ්ග පරිබ්‍රාජක වස්තු:
191. දුබ්බිට්ඨි මහාතිස්ස වස්තුව.
195. තිස්ස සාමණෙර වස්තුව.
198. ගොළ උපාසක වස්තුව.
200. බත්මුලදුන් ස්ත්‍රියගේ වස්තු:
205. දෙවෙනි අඹුසැමි දෙදෙනාගේ ව:
208. සඞ්ඛදත්ත ස්ථවිරයන්ගේ ව:
211. එක්තරකුමාරිකාවකගේ ව:
214. තිස්සමහානාගස්ථවිර වස්තු:

**චූලගල්ල වග්ගො දසමො.**

216. මැහැල්ලියගේ කථාවස්තුව.
219. පන්සියයක් භික්ෂූන්ගේ කථා වස්තුව.
220. දත්තකුටුම්බික වස්තුව. *

## ලක්දිව කථාවස්තූන්ගේ

# ශුද්ධ පත්‍රය.

---

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 4 | 17 | අපොවිය | ආපොවිය |
| 7 | 6 | මතා | මාතා |
| 12 | 24 | ලය | ලයා |
| 19 | 34 | රජ්ජුනං | රාජ්ජුනං |
| 46 | 1 | රජ | රාජ |
| 60 | 7 | අග්ගෙයධස්ස | අග්ගයොධස්ස |
| 68 | 22 | සිසලුම | සියලුම |
| 80 | 7 | කිලසොව | කිලාසොව |
| 88 | 20 | වායමානො | වායමානා |
| 98 | 36 | සකල | සකලං |
| 100 | 23 | රාක්තාඞ්ගුලි | රක්තාඞ්ගුලී |
| 118 | 19 | පරිරිශුද්ධය | පරිශුද්ධය |
| 120 | 12 | හෙතමේම; (යන තැනට) | සබ්බපථ, හැමතන්හි; |
| 139 | 13 | එකෙක්හුගේ | එකෙක්කම්යක්හුගේ |
| 149 | 9 | විනාතිතො | චිනාතිතො |
| ,, | 29 | නීක්ඛාමෙනොතා | නික්ඛාමෙනොතා |
| 152 | 25 | ප්‍රදීයක් | ප්‍රදීපයක් |
| 153 | 5 | මාය | මයා |
| 155 | 16 | තිස්සතථ | තිස්සපථ |
| ,, | 18 | (රහහත්ව) | (රහත්ව) |
| 160 | 23 | (පසස්ලද්දේ) | (පසස්නාලද්දේ) |
| 170 | 16 | උපසංකමමං | උපසංකමම |
| 171 | 31 | පතාකොයො | පතාකායො |
| 172 | 20 | එක්විසිලසින් | එක්සියවිසිලසින් |
| 173 | 1 | ඛුද්දනං | ඛුද්දවනං |
| 183 | 19 | සීඝවස්ස | සිඝවස්ස |
| 184 | 19 | සුහොපිතං | සුගොපිතං |
| ,, | 29 | මම් | මව |
| 189 | 24 | සහායක | සහායකං |
| 190 | 10 | කරනන්තාහු | කරන්තාහු |
| 203 | 13 | සඞ්ඝයෙ | සඞ්ඝයො |
| 209 | 32 | නිඞ්ඝානිකා | සිඞ්ඝානිකා |
| 211 | 11 | පැවදි | දැවිදි |